321 වන කාණ්ඩය - 05 වන කලාපය
தொகுதி 321 - இல. 05
Volume 321 - No. 05

2025 සැප්තැම්බර් 23 වන අඟහරුවාදා
2025 செப்ரெம்பர் 23, செவ்வாய்க்கிழமை
Tuesday, 23rd September, 2025

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය:**
නාවික හමුදා පනත: ප්‍රකාශනය [තීරුව 683]

**නිවේදන:**
කථානායකතුමාගේ සහතිකය [තීරුව 684]

**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 684]

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා** [තීරුව 686]

**පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 686]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 692-748]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
විරැකියාව අවම කිරීම [තීරුව 748]
වාහන වායු විමෝචන පරීක්ෂණවල තත්ත්වය වැඩිදියුණු කිරීම [තීරුව 749]

**ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී [තීරු 755-844]

**කල්තැබීමේ යෝජනාව:**
2025 නීති විද්‍යාල ප්‍රවේශ විභාගයේ ප්‍රතිඵල නැවත සමීක්ෂණය [තීරු 844-856]

# பிரதான உள்ளடக்கம்

**சனாதிபதியிடமிருந்து வந்த செய்தி:**
கடற்படைச் சட்டம்: பிரகடனம் [ப: 683]

**அறிவிப்புகள்:**
சபாநாயகரது சான்றுரை [ப: 684]

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை** [ப: 684]

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்** [ப: 686]

**அரசாங்க பொறுப்புமுயற்சிகள் பற்றிய குழுவின் அறிக்கை** [ப: 686]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 692-748]

**தனி அறிவித்தல் மூல வினா:**
வேலையின்மையைக் குறைத்தல் [ப: 748]
வாகனப் புகை வெளியேற்றப் பரிசோதனையின் தரத்தை மேம்படுத்தல் [ப: 749]

**தேசியக் கட்டிட ஆராய்ச்சி நிறுவகம் சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது [ப: 755- 844]

**ஒத்திவைப்புப் பிரேரணை:**
2025 சட்டக் கல்லூரி அனுமதிப் பரீட்சைப் பெறுபேறுகளை மீள்மதிப்பீடு செய்தல் [ப: 844-856]

# PRINCIPAL CONTENTS

MESSAGE FROM THE PRESIDENT:
Navy Act: Proclamation [Col. 683]

ANNOUNCEMENTS:
Speaker's Certificate [Col. 684]

AUDITOR-GENERAL'S REPORT [Col. 684]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 686]

REPORT OF THE COMMITTEE ON PUBLIC ENTERPRISES [Col. 686]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 692-748]

QUESTION BY PRIVATE NOTICE:
Minimization of Unemployment [Col. 748]
Improvement of Quality of Vehicle Emission Testing [Col. 749]

NATIONAL BUILDING RESEARCH INSTITUTE BILL:
Read a Second, and the Third time, and passed [Cols. 755-844]

ADJOURNMENT MOTION:
Re-scrutinization of Results of Law College Entrance Exam, 2025 [Cols. 844-856]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 සැප්තැම්බර් 23 වන අඟහරුවාදා***
*2025 செப்ரெம்பர் 23, செவ்வாய்க்கிழமை*
*Tuesday, 23rd September, 2025*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன ] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE ] in the Chair.

## ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය
## சனாதிபதியிடமிருந்து வந்த செய்தி
## MESSAGE FROM THE PRESIDENT

### නාවික හමුදා පනත: ප්‍රකාශනය
### கடற்படைச் சட்டம்: பிரகடனம்
### NAVY ACT: PROCLAMATION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පහත සඳහන් සන්දේශය ගරු ජනාධිපතිතුමාගෙන් මා වෙත ලැබී තිබෙනවා.

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
**President of Sri Lanka**

මගේ අංකය : PS/CSA/00/4/4/2

2025 සැප්තැම්බර් මස 20 වන දින

**ගරු අයි.ඩබ්ලිව්.එම්. ජගත් වික්‍රමරත්න මැතිතුමා**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(358 වැනි අධිකාරය වූ) නාවික හමුදා පනත**

(358 වන අධිකාරය වූ) නාවික හමුදා පනතේ 21 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජාතික අභිවෘද්ධිය සඳහා ඇති අවශ්‍යතාවය සලකමින්, නාවික නොවන රාජකාරි ලෙස, ශ්‍රී ලංකා නාවික හමුදාවේ සාමාජිකයින්ට, වෙළඳ නෞකාවන්ට ආරක්ෂක සේවා සපයනු ලබන විදේශීය පෞද්ගලික සමුද්‍රීය ආරක්ෂක සමාගම් වෙත එහි සේවා හා පහසුකම් සැපයීම සඳහා සමුද්‍රීය ආරක්ෂක මෙහෙයුම් ව්‍යාපෘතියක් පවත්වාගෙන යාම, එම ව්‍යාපෘතියේ සියලුම මෙහෙයුම්, පරිපාලන සහ මූල්‍ය කටයුතු ආරක්ෂක අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ සුදුසු පරිදි සිදුකිරීම පිණිස විදේශීය පෞද්ගලික සමුද්‍රීය ආරක්ෂක සමාගම්වලට අයත් ගිනි අවි, උණ්ඩ සහ අනෙකුත් උපාංග ශ්‍රී ලංකා නාවික හමුදාවට අයත් අවි ගබඩා තුළ ගබඩා කිරීම සහ එකී ගිණි අවි, උණ්ඩ සහ අනෙකුත් උපාංග මෙහෙයුම් අවශ්‍යතා අනුව ශ්‍රී ලංකා නාවික හමුදාවේ අධීක්ෂණය හා ආරක්ෂාව යටතේ විදේශීය පෞද්ගලික සමුද්‍රීය ආරක්ෂක සමාගම්වල දේශීය නියෝජිතයින් විසින් සපයනු ලබන වාහන හෝ යාත්‍රා උපයෝගී කරගනිමින් ප්‍රවාහනය කිරීම ඇතුළුව ඉහත කාර්යයන් හා සම්බන්ධිත හෝ ඊට ආනුශංගික සියලු කාරණා ඉටු කිරීම සඳහා ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත පනතේ 21 වැනි වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්
අනුර කුමාර දිසානායක
ජනාධිපති

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, මවිසින් 2025 සැප්තැම්බර් 22 දින "ජාතික විගණන (සංශෝධන)" නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## II

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2025 සැප්තැම්බර් 23වන අඟහරුවාදා, එනම් අද දින අපර භාග 1.00ට කාරක සභා කාමර අංක 2හි දී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සාමාජික මන්ත්‍රීවරයන් සියලුදෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ VIII හා IX කොටස් සහ සිව්වැනි කාණ්ඩයේ III හා IV කොටස් මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතු ය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## II

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ VII කොටස සහ නවවැනි කාණ්ඩයේ IV කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතු ය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

- Report on the details pertaining to "Transfers of Allocations through Virement Procedure" from 01st January, 2025 to 30th June, 2025, in terms of Section 24(4) of the Public Financial Management Act, No. 44 of 2024, and Section 5 of the Appropriation Act, No. 3 of 2025;
- Order made by the Minister of Education, Higher Education and Vocational Education under Section 27(1)(b) read with Section 25A of the Universities Act, No. 16 of 1978 with regard to the Bachelor of Science Honours in Psychology Degree awarded by Sri Lanka Institute of Information Technology (Guarantee) Limited and published in Gazette Extraordinary No. 2415/20 of 16th December, 2024;
- Order made by the Minister of Education, Higher Education and Vocational Education under Section 27(1)(b) read with Section 25A of the Universities Act, No. 16 of 1978 with regard to the Bachelor of Science Honours in Quantity Surveying, Bachelor of Science Honours in Biomedical Science and Master of Science in Artificial Intelligence Degrees awarded by Sri Lanka Institute of Information Technology (Guarantee) Limited and published in Gazette Extraordinary No. 2424/59 of 20th February, 2025;
- Order made by the Minister of Education, Higher Education and Vocational Education under Section 25A of the Universities Act, No. 16 of 1978 with regard to the Bachelor of Hotel and Resort Management Honours Degree awarded by Sri Lanka Institute of Tourism and Hotel Management and published in Gazette Extraordinary No. 2428/12 of 19th March, 2025; and
- Proclamation made and published in Gazette Extraordinary No. 2454/68 of 21st September, 2025 and Schedule thereto, by virtue of the powers vested with the President in terms of Section 2 of the Essential Public Services Act, No. 61 of 1979. - [The Hon. (Dr.) Harini Amarasuriya]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)
ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා ජෙෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා (විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன - விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சர்)
(The Hon. (Prof.) Chrishantha Abeysena - Minister of Science and Technology)
ගරු කථානායකතුමනි, 2022 සහ 2023 වර්ෂ සඳහා ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනයේ වාර්ෂික වාර්තා මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තා විද්‍යා, තාක්ෂණය සහ ඩිජිටල් පරිණාමනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
ගරු කථානායකතුමනි, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க பொறுப்புமுயற்சிகள் பற்றிய குழுவின் அறிக்கை
## REPORT OF THE COMMITTEE ON PUBLIC ENTERPRISES

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
ගරු කථානායකතුමනි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සිව්වැනි වාර්තාව මම ඉදිරිපත් කරමි.

ඉදිරියේදී - මේ සතිය තුළ - මෙම වාර්තාව හා COPE එක විසින් කරන ලද විමර්ශන පිළිබඳව සාකච්ඡාවක් පැවැත්වීමට සූදානම් වෙන බවත් මේ මොහොතේදී මම සිහිපත් කරනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතු ය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

# පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) පාදෙණිය, මගුලාගම, "නිසංසල" යන ලිපිනයෙහි පදිංචි ඩී.එම්. ගුණරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ
(2) ගල්ගමුව, මහගල්කඩවල, ජයලන්ද, අංක 113 දරන ස්ථානයෙහි පදිංචි කේ.ඩී. තිලකරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් පී. පෙරේරා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු අජිත් අගලකඩ මහතා**
(மாண்புமிகு அஜித் அகலகட)
(The Hon. Ajith Agalakada)
ගරු කථානායකතුමනි, බුත්තල, 11 කණුව, ළිඳ ළඟ අතුරු පාර යන ලිපිනයෙහි පදිංචි ඒ.එම්. පියරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு சட்டத்தரணி யூ.பீ. அபேவிக்ரம)
(The Hon. U.P. Abeywickrama, Attorney-at-Law)
Hon. Speaker, I present,

1. A petition from Mr. B.A.B.S. Jayawardhana of No. 139/3, Kandy Road, Imbulgoda;
2. A petition from Mr. H.K. Asanka of No. 163/D, Medalanda Watta, Jayanthi Road, Dompe; and
3. A petition from Mr. P.N.C. Wickramanayake of No. 465, Kurunegala Road, Divulapitiya.

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)
கௌரவ சபாநாயகர் அவர்களே, வவுனியா, தாண்டிக்குளம், 215/25 ஏ எனும் முகவரியில் வதியும் திரு. ஐ. யோகராசா அவர்களிடமிருந்து கிடைக்கப்பெற்ற மனுவை நான் சமர்ப்பிக்கின்றேன்.

**ගරු ධර්මප්‍රිය දිසානායක මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)
ගරු කථානායකතුමනි, වදාකඩ, කෙහෙල්වත්ත හේන යන ලිපිනයෙහි පදිංචි ආර්. ශාන්ත දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ජගත් මනුවර්ණ මහතා**
(மாண்புமிகு ஜகத் மனுவர்ண)
(The Hon. Jagath Manuwarna)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) මාතලේ, උඩස්ගිරිය, උඩුපිටිය, අංක 1/3 දරන ස්ථානයෙහි පදිංචි ජී.ඒ.එම්.යූ.ජී.සී.එච්.කේ. සෙනෙවිරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ
(2) ඇල්කඩුව, මාතලේ පාර, අංක 58 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.බී.ඩබ්ලිව්.එම්.ආර්.යූ.එන්.ටී.බී. අලුවිහාරේ මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න ඉස්සෙල්ලා ඔබතුමාගේ අවධානය පිණිස කාරණයක් යොමු කරන්න මට මිනිත්තු එකහමාරක් ලබා දෙන්න.

ගරු කථානායකතුමනි, ජනාධිපතිතුමා මේ වනකොට විදේශගත වී සිටිනවා. ජනාධිපති මාධ්‍ය අංශය නිවේදනයක් නිකුත් කර තිබෙනවා, ජනාධිපතිතුමා අමාත්‍ය ධුර දරන අමාත්‍යාංශ තුනකට වැඩබලන ඇමතිවරු ලෙස නියෝජ්‍ය ඇමතිවරු තිදෙනෙක් පත් කරපු බවට. ගරු කථානායකතුමනි, මම කැමැතියි අර්ථ නිරූපණය ආඥාපනතේ 2 (ඇ) වගන්තිය ඔබතුමාගේ අවධානයට යොමු කරන්න. එහි මෙසේ සඳහන් වනවා:

> "අමාත්‍යවරයා" යන්න ආණ්ඩුවේ යම් විෂයක් හෝ කර්තව්‍යයක් සම්බන්ධයෙන් යෙදුණු විට ජනාධිපතිවරයා විසින් ඒ විෂය හෝ කර්තව්‍ය පවරනු ලැබ සිටින අමාත්‍යවරයා ඉන් අදහස් වන අතර ඒ අමාත්‍යවරයා වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා යථා පරිදි පත් කරනු ලැබූ තැනැත්තෙක් එයට ඇතුළත් වේ."

ඒ අනුව ජනාධිපතිතුමා විසින් ආරක්ෂක අමාත්‍යාංශයේ වැඩබලන ඇමතිවරයා ලෙස මේ වතාවේත් නියෝජ්‍ය ඇමතිවරයාව පත් කරලා තිබෙනවා. අපි විශ්වාස භංගයක් ඉදිරිපත් කළාම ඔබතුමා ඒක ප්‍රතික්ෂේප කළේ නියෝජ්‍ය ඇමතිවරුන්ට බලතල නැහැ කියලායි. අපි මේ විශ්වාස භංගය ගෙනාවේ එතුමාත් එක්ක තිබෙන පෞද්ගලික ප්‍රශ්නයකට නොවෙයි. අපි සද්භාවයෙන් ඒක ගෙනාවේ. අපි භාර දුන්න විශ්වාස භංගය නිවැරදියි කියලා ඔබතුමා දැන්වත් පිළිගන්නවාද කියලා දැනගන්න කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, Parliamentary Business Committee එකේ එදා - 11වැනි දා - පැවැති රැස්වීමෙන් පසුව පැවැති සාකච්ඡාවේදී ඒ විශ්වාස භංගය ලබා දුන්න මන්ත්‍රීවරුන් සමඟ සාකච්ඡාවක් පැවැත්වීමට මම අවස්ථාවක් ලබා දුන්නා. මට මතක විධියට, ඒ වෙලාවේදී ඔබතුමාට මේ කාරණාව සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තරයක් ලබා දීමට කටයුතු කරනවා කියලා මම දැනුම් දුන්නා. ඒ අනුව අපි ඔබතුමා හමුවෙලා, අදාළ මන්ත්‍රී මණ්ඩලයත් හමුවෙලා සාකච්ඡා කරමු. මොකද, ඒ සම්බන්ධයෙන් දීර්ඝ විස්තරයක් ලබා දීමට අපට හැකියාව තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න. *[බාධා කිරීමක්]* ඒ කාරණාවට දැන් ඔබතුමන්ලාට සාකච්ඡාවක් ලබා දුන්නා නේ. අපි ඒ සාකච්ඡාවට අනුව වැඩ කටයුතු කළොත් හොඳයි කියලා මම විශ්වාස කරනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් බොහොම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා, පුංචි කාරණා දෙකක් ඉදිරිපත් කරන්න මට අවස්ථාව ලබා දෙන්න කියලා. විශේෂයෙන් අරුණ ජයසේකර මැතිතුමා පිළිබඳව පෞද්ගලික ප්‍රශ්න අපට නැහැ. ඇත්තවශයෙන්ම එතුමා අද වනවිට වැඩබලන ආරක්ෂක අමාත්‍යවරයා. ඉතින් එතුමාට විරුද්ධව විශ්වාස භංගයක් ඉදිරිපත් වුණාම,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට විනාඩියක අවස්ථාවක් දෙන්න.

ඒ විශ්වාස භංගය ප්‍රතික්ෂේප කිරීම සඳහා පදනම් වුණු කරුණු කාරණා ගත්තාම, පළමුවෙන්ම අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඒ ලබා දුන්නු තීන්දුව වඩාත් පදනම් සහිතව අපට -මේ සභාවට- ලබා දෙන්න කියලා. ඒ වාගේම අවසන් වශයෙන් මේ කාරණය මම ඔබතුමාට මතක් කරන්න කැමැතියි. ඇත්තටම, වින්දිතයින් ඉල්ලන්නේ පාස්කු ප්‍රහාරය පිළිබඳව සාධාරණ පරීක්ෂණයක්. ඒක කොයි තරම් දුරට,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට විනාඩියක් දෙන්න. මට අවසන් කරන්න ඉඩ දෙන්න. මේ කාරණය දැන් කොයිතරම් දුර ගිහිල්ලා තිබෙනවාද කිව්වොත්, ජිනීවාවල දැනට ක්‍රියාත්මක වෙන ඒ සාකච්ඡාවලට,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, මේ කාරණාව දැන් හැමෝම දන්නවා නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
විනාඩියක් දෙන්න. රට වෙනුවෙන් කථා කරන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන්,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
විනාඩියක් ලබා දෙන්න. *[බාධා කිරීමක්]* විනාඩියක් දෙන්නකෝ. විශේෂයෙන්ම මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා, මේ කාරණයට. විහඟ තේජාන්ත කියන දරුවාට ෂැන්ග්‍රි-ලා එකේදි ජීවිතය අහිමි වුණා. ඔහුගේ පියා සුරාජ් නිලංග. ඔහු Zoom තාක්ෂණය ඔස්සේ ජිනීවා සාකච්ඡාවත් එක්ක සම්බන්ධ වෙලා කියනවා, මේ කෙරෙන පරීක්ෂණ ක්‍රියාවලිය පිළිබඳව ඔහු කිසිසේත්ම සෑහීමකට පත් වෙන්නේ නැහැ කියලා. එහෙම දෙයක් සිදු වෙනකොට ඒක රටට හොඳද? ඒක හොඳ නැහැ. ඒ නිසා ඔබතුමන්ලා පියවරක් ගන්න ඕනෑ ඒ වින්දිතයින්ට විශ්වාසය - credibility එක - ලබා දෙන්න. ඇත්තවශයෙන්ම,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, ඒ සම්බන්ධයෙන්,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට කථා කරන්න ඉඩ දෙන්න. පොඩ්ඩක් කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් dialogues ගේන්න විධියක් නැහැ. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාත්, ඒ වාගේම ගරු මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමාත් එදා Parliamentary Business Committee එකේ හිටියා නේ. අපි එකඟතාවට පත් වුණා මේ සම්බන්ධයෙන්. ඒ අනුව වැඩ කටයුතු කරමු. *[බාධා කිරීමක්]* මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න මධ්‍යාහ්න 12.00ට ඔබතුමා මාව හමුවෙනවාය කිව්වා නේ. *[බාධා කිරීමක්]* 12.00ට සාකච්ඡා කළාට පසුව,- *[බාධා කිරීමක්]* ඒ කාරණාව ගැන කථා කරන්න තමයි ගරු විපක්ෂ නායකතුමා. ඊට පස්සේ මම දීර්ඝ වාර්තාවක් හෙට උදේට ඉදිරිපත් කරන්නම්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
තත්පර පහළොවක් දෙන්න බැරිද, මේක කියලා ඉවර කරන්න?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඔබතුමාට විනාඩි එකහමාරක් දුන්නා. විනාඩි දෙකම ඉවරයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
තත්පර පහළොවක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, කියන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ඔබතුමා ඒ විශ්වාස භංගය ප්‍රතික්ෂේප කරන්න ලබා දුන් තීන්දුව මත පදනම් වුණු ලේකම් මණ්ඩලයේ වාර්තාවයි, නීතිපති වාර්තාවයි සභාගත කරන්න. සභාගත කරන්න ඒ වාර්තා දෙක.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක මට පෞද්ගලිකව ලබා දුන් වාර්තාවක් නේ. ඒක පරිශීලනය කරලා තමයි ඒ තීන්දුව දුන්නේ. ගරු කරුණාතිලක මන්ත්‍රීතුමනි, ඔබතුමා අර මන්ත්‍රීවරු කණ්ඩායමත් එක්ක ඇවිල්ලා මාව හම්බවෙන්නකෝ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
කවදාද, කීයටද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එදා කිව්වාට පස්සේ, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, අහහරුවාදා,-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
වෙලාව කීයද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පොඩ්ඩක් ඉන්නකෝ. මේක අහගන්න. පසුගිය 11වැනිදා තිබුණු රැස්වීමේදී සිකුරාදා පස්වරු 1.00ට වෙලාව ලබා දුන්නා. ඊට පස්සේ කිව්වා, කට්ටියට පල්ලිවලට යන්න තිබෙනවා කියලා. ඊට පස්සේ එදාම -සිකුරාදාම- පස්වරු 4.00ට වෙලාව ලබා දුන්නා. නමුත් ඒ වෙලාවත් ගන්න බැරි වුණා. ඒ නිසා මම ලේකම් මණ්ඩලයට කිව්වා, ගයන්ත මන්ත්‍රීතුමා එක්ක කථා කරලා දිනයක් සහ වෙලාවක් වෙන් කර ගන්න කියලා, කථා කරන්න.

අපි දැන් සභාවේ ඉදිරි කටයුතුවලට යමු.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මේ නියෝජ්‍ය ඇමතිතුමා,- *[බාධා කිරීමක්]* වෙන්න කලින් මේක කරමු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක dialogue එකක් නොවෙයි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ජනාධිපතිතුමා ආපු ගමන් එතුමා නියෝජ්‍ය ඇමතිතුමා වෙනවා. ඒ වෙනතුරු මේක අදින්න එපා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මධ්‍යාහ්න 12.00ට එන්න කියලා දැන් කිව්වා නේ.

මීළඟට, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ස්වාභාවික දොළ මාර්ග සහ දොළ රක්ෂිත: ආරක්ෂා කිරීම
### இயற்கை நீரோடைகள் மற்றும் நீரோடை ஒதுக்கங்கள்: பாதுகாத்தல்
### NATURAL STREAMS AND STREAM RESERVATIONS: PROTECTION

717/2025

**1. ගරු ධනුෂ්ක රංගනාත් මහතා**
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)
පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ස්වාභාවික දොළ මාර්ග ආරක්ෂා කර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) ස්වාභාවික දොළ මාර්ග ආශ්‍රිතව පැවතිය යුතු දොළ රක්ෂිතයට අදාළ භූමි ප්‍රමාණය කොපමණද;

(iii) දොළ රක්ෂිත බලහත්කාරයෙන් අත්පත් කර ගෙන ඇති පුද්ගලයන් සඳහා නීතිය ක්‍රියාත්මක කරන්නේද;

(iv) එසේ නම්, ඒ වෙනුවෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) දොළ රක්ෂිත සින්නක්කර ඉඩම් ලෙස ලබාදී ඇති බව දන්නේද;

(ii) එලෙස ලබාදී ඇති කළුතර දිස්ත්‍රික්කයේ දොළ රක්ෂිත භූමි ප්‍රමාණය කොපමණද;

(iii) එම දොළ රක්ෂිත භූමි නැවත පවරා ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු ධනුෂ්ක රංගනාත් මහතා]

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இயற்கை நீரோடைகளைப் பாதுகாக்கும் பொருட்டு எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(ii) இயற்கை நீரோடைகளை அண்டியதாக இருக்கவேண்டிய நீரோடை ஒதுக்கத்துக்குரிய நிலப் பிரதேசத்தின் அளவு எவ்வளவு என்பதையும்;

(iii) நீரோடை ஒதுக்கங்களைப் பலாத்காரமாகக் கையகப்படுத்தியுள்ள நபர்கள் தொடர்பில் சட்ட நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

(iv) ஆமெனில், அது தொடர்பில் எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) நீரோடை ஒதுக்கங்கள் அறுதி உறுதிக் காணிகளாக வழங்கப்பட்டுள்ளதை அறிவாரா என்பதையும்;

(ii) அவ்வாறு களுத்துறை மாவட்டத்தில் வழங்கப்பட்டுள்ள நீரோடை ஒதுக்கக் காணிகளின் அளவு எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி நீரோடை ஒதுக்கக் காணிகளை மீண்டும் சுவீகரிப்பதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) the measures that have been taken to protect natural streams;

(ii) the extent of land related to stream reservations that should be available alongside the natural streams;

(iii) whether the law is enforced against persons who have forcibly acquired stream reservations; and

(iv) if so, the measures that will be taken in that regard?

(b) Will he also inform this House -

(i) whether he is aware that stream reservations have been given as freehold lands;

(ii) the extent of stream reservations in Kalutara District that have been given on freehold basis; and

(iii) whether measures will be taken to reacquire the stream reservations referred to above?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ශ්‍රී ලංකාවේ ජල මූලාශ්‍ර, ඒවායේ පෝෂක ප්‍රදේශ හා රක්ෂිත ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක්, අංක 1894/3 දරන 2014.12.22 දිනැති ගැසට් නිවේදනය මඟින් ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කර ඇත.

`එම ජාතික ප්‍රතිපත්තිය මඟින් අදාළ වගකීම් දරන ආයතන වෙත වගකීම් පවරා ඇති අතර, ජාතික ප්‍රතිපත්තියට අනුව ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා ගැසට් නිවේදනය තුළ සඳහන් පරිදි ක්‍රියාත්මක යන්ත්‍රණයක් පවතින අතර, එම ආයතන මඟින් පහත පරිදි අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව සංවේදී පරිසර පද්ධතින්හි පිහිටා ඇති ජල දේහයන් හා ජල මූලාශ්‍ර සහ රක්ෂිත ප්‍රදේශ පාරිසරික ආරක්ෂක ප්‍රදේශ වශයෙන් පහත සඳහන් අතිවිශේෂ ගැසට් නිවේදන මඟින් මධ්‍යම පරිසර අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කර සංරක්ෂණයට හා කළමනාකරණයට අදාළව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

- හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වතු ඉඩම් තුළ පිහිටි ජල මූලාශ්‍ර හා ඒවායේ රක්ෂිත ප්‍රදේශ 362 - අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2335/21 දරන 2023.06.09 දිනැති
- නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ පිහිටි ග්‍රෙගරි වැව - අතිවිශේෂ ගැසට් නිවේදන අංක 1487/10 දරන 2007.03.05 දිනැති
- කොළඹ හා කළුතර යන දිස්ත්‍රික්ක තුළ ව්‍යාප්තව පවතින බොල්ගොඩ ජලදේහය - අතිවිශේෂ ගැසට් නිවේදන අංක 1634/23 දරන 2009.10.30 දිනැති
- මඩකලපුව දිස්ත්‍රික්කය තුළ පිහිටි ඒතාලෙයිකුලම් වැව - අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2369/39 දරන 2024.02.02 දිනැති ගැසට් මඟින් ප්‍රකාශයට පත් කර ඇත. මෙරට තුළ පවතින සියලු ගංගා සහ ගංගා ද්‍රෝණි තුළ ජල සම්පත් සංවර්ධනය හා ආරක්ෂා කර ගැනීම වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ආරම්භයේ සිටම සිදු කරන ලද අතර, මුළු ගංගා පද්ධතියම තවදුරටත් අවධානයෙන් කළමනාකරණය කළ යුතු බැවින්, 2018 වර්ෂයේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව සඳහා නව උප අංශයක් පිහිටුවා ඇත. එම ගංගාධාර කළමනාකරණ ඒකකය මඟින් ගංගා, ඇළ, දොළ ආරක්ෂා කර ගැනීම සඳහා පහත සඳහන් කරුණු ගැන අවධානය යොමු කරයි.

- රක්ෂිත පවත්වා ගැනීම
- වැලි ගොඩ දැමීම නියාමනය
- කුඩා ජල විදුලි බලාගාර නියාමනය

- ගංගා රක්ෂිත ආරක්ෂා කිරීම
- කුඩා ව්‍යාපෘති සඳහා පරිසර හානි අධ්‍යයන වාර්තා ලබා දීමේදී කමිටු සාමාජිකයකු ලෙස ක්‍රියා කිරීම
- ගංගා ආශ්‍රිතව සහ ද්‍රෝණිය තුළ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා නිර්දේශ නිකුත් කිරීම
- ගංගා ආසන්න නිවාස හා කර්මාන්තශාලා ආදිය නිසි පරිදි නියාමනය නොවීම/ අපද්‍රව්‍ය සෘජුවම බැහැර කිරීම
- අපද්‍රව්‍ය යොමු කරන නිවාස හා කර්මාන්තශාලා දැනුවත් කිරීම සහ නඩු පැවරීම
- දැනට ඝන අපද්‍රව්‍ය සහ අනවශ්‍ය ජලජ පැළෑටි ඇති ස්ථාන පිරිසිදු කිරීම
- ශ්‍රමදාන
- දැනුවත් කිරීම්
- ගංගාවේ හැඩය හා ස්වරූපය පවත්වාගෙන යාම
- පරිසර හිතකාමී විසඳුම් මගින් ගංගා ඉවුරු ආරක්ෂා කිරීම
- ගංගා ජලයෙහි ගුණාත්මක බව - water quality - පරීක්ෂා කිරීම මෙලෙස ගංගා ජලය නිසි පරිදි නියාමනය කිරීම සඳහා ඒ වෙනුවෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ බිම් මට්ටමේ නිලධාරින් පත් කිරීමට බලාපොරොත්තු වන අතර, ඒ සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරින් දැනුවත් කිරීමේ වැඩසටහන් වාරිමාර්ග කලාප මට්ටමින් පසුගිය වසරේදී ආරම්භ කර ඇත.<br>එසේම, දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් ගනු ලබන ක්‍රියාමාර්ග පහත පරිදි වේ.
- ස්වාභාවික දොළ මාර්ගවල හා ඉවුරෙහි අඛණ්ඩභාවයට හා තිරසාරභාවයට එරෙහි මානව ක්‍රියාකාරකම් සඳහා ඉඩ නොදීම
- දොළ තුළ පවතින සම්පත් ගැනීමේදී පනත් හා අණපනත්වලට අදාළ නීතිමය රාමුවක් තුළ ක්‍රියාත්මක වීම
- දොළ රක්ෂිත ආරක්ෂා කිරීම සඳහා වන රක්ෂිත සීමාව වෙනත් කටයුතු සඳහා යොදා ගැනීම අධපණ කිරීම. පෞද්ගලික ඉඩමක් මායිම්ව ඇත්නම් ගැටලුවක් ඇති සෑම අවස්ථාවකම ඒ සඳහා රක්ෂිත වෙන් කිරීමට යෝජනා කිරීම
- දොළ රක්ෂිත ආරක්ෂා කරමින් ඇළ මාර්ගවල තිරසර පැවැත්ම ආරක්ෂා කර ගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශ අනුබද්ධිතව මායිම් ලකුණු කිරීම සහ වන වගා ඇති කිරීම හා පවත්නා ශාක ප්‍රජාව සංරක්ෂණය කිරීම
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රජාව දැනුවත් කිරීමේ කටයුතු (දැනුවත් කිරීමේ පුවරු සවි කිරීම)
- ජල උල්පත් පිහිටන ස්ථාන හඳුනා ගැනීම, ඒ සඳහා දත්ත පද්ධතියක් ගොඩනැඟීම හා සංරක්ෂණ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය අවස්ථාවලදී එකී දත්ත ලබා දීම
- ඉඩම් නිවාස හෝ වගා කටයුතු සඳහා බෙදා දීමකදී දොළ මාර්ගය, ජල උල්පත් හා ඒවායේ රක්ෂිත ආරක්ෂා වන පරිදි භූමිය මැන වෙන් කර සංවර්ධන කටයුතු සඳහා යෙදවීම
- ප්‍රජාව මගින් ජල මූලාශ්‍ර, ජල තල ආදියට ඝන අපද්‍රව්‍ය, අපජලය හා රසායන ද්‍රව්‍ය ආදිය එක්වීම වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් දැනුවත් කිරීම, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව හා ප්‍රාදේශීය පරිසර කමිටුව දැනුවත් කිරීම ජල මාර්ග හා ජල රක්ෂිත, ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කර ගැනීම හා අවිධිමත් භූමි පරිහරණය වළක්වා ගැනීම සඳහා ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටුව හා දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව හරහා නිර්දේශ සැපයීම

(ii) 1947 අංක 8 දරන රජයේ ඉඩම් ආඥා පනත මගින් ස්වාභාවික දොළ මාර්ගවලට අදාළව, රක්ෂිතයට අදාළ භූමි ප්‍රමාණය ලබා දීමේදී ප්‍රධාන වශයෙන් ඇළ දොළෙහි මතුපිට පළල පදනම් කරගෙන රක්ෂිත සීමා දක්වා ඇත.

<u>ස්වාභාවික දොළ පහරෙහි පතුලේ පළල පැවැතිය යුතු රක්ෂිත සීමාව</u>

| | |
|---|---|
| මීටර 3ට අඩු | දෙපස මීටර 5 බැගින් |
| මීටර 3ත් 8ත් අතර | දෙපස මීටර 10 බැගින් |
| මීටර 8ත් 15ත් අතර | දෙපස මීටර 20 බැගින් |
| මීටර 15ත් 22ත් අතර | දෙපස මීටර 40 බැගින් |

රජයේ ඉඩම්වල රක්ෂිත සීමාව වෙන් කර ඇත.

පෞද්ගලික ඉඩම්වල ඉවුරට කිසිසේත් හානි කළ නොහැක.

(iii) ඔව්.

(iv) දොළ රක්ෂිතයට හානි වූ බව ඉඩම් නිලධාරි, ඉඩම් පරිහරණ නිලධාරි, ග්‍රාම නිලධාරි යන අයගේ සාමූහික පරීක්ෂණයකින් තහවුරු වීමෙන් පසු ප්‍රාදේශීය ලේකම් විසින් පදිංචිකරුවන් ඉවත් කරනු ලැබේ.

(ආ) (i) දොළ රක්ෂිත සීමාවට සින්නක්කර ඉඩම් ඇතුළත් විය හැක. නමුත් රජයේ ඉඩම්වලට බලපත්‍ර ලබා දීමේදී ඉඩම් යෝග්‍යතාව පිළිබඳව නිරීක්ෂණ වාර්තාවක් ලබා ගැනීමෙන් පසු දොළ රක්ෂිත සීමාවට බලපත්‍ර ලබා දීම නවත්වනු ලැබේ.

(ii) කළුතර දිස්ත්‍රික් ලේකම්ට අනුව දොළ රක්ෂිත ඉඩම් සින්නක්කර ලෙස ලබා දී නොමැත.

(iii) එසේ සිදු වුවහොත්, ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණයකින් පසු නැවත පවරා ගැනීම සිදු කෙරේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු ධනුෂ්ක රංගනාත් මහතා**
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)
ගරු කථානායකතුමනි, සවිස්තරාත්මක පිළිතුරක් ලබා දීම සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට මම බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම මම මේ ප්‍රශ්නය මතු කරන්න හිතුවේ මෙන්න මේ නිසායි. අපට සඳහන් කළ විධියට ජල මූලාශ්‍ර සංරක්ෂණයට අදාළ කරුණු ඇතුළත් අණපනත් 40කට ආසන්න ප්‍රමාණයක තිබෙනවා. ගරු ඇමතිතුමනි, සමහර අණපනත් ප්‍රමාණවත් ලෙස තිබුණත්, නීතිය ක්‍රියාත්මක වෙද්දී ගැටලු මතු වෙන තත්ත්ව තිබෙනවා. එම නිසා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, අතීතයේදී පනවා තිබෙන අණපනත් වර්තමානයට ගැළපෙන පරිදි නිසි ලෙස නැවත විමසා බැලීමක් කරනවාද කියලා. ඒකට හේතුව මේකයි. කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත, බුලත්සිංහල වාගේ ප්‍රදේශ මේ වෙනකොට සංචාරක ව්‍යාපාරයත් එක්ක අලුත් තත්ත්වයකට ඇවිල්ලා තිබෙනවා. එම නිසා එම ප්‍රදේශවල ජල මූලාශ්‍ර රැක ගැනීම පිළිබඳ ගැටලුවක් මතු වෙමින් තිබෙනවා. ඒ නිසා තමයි මම මේ ප්‍රශ්නය යොමු කළේ. මෙම අතුරු ප්‍රශ්නය පමණයි මම ඔබතුමාගෙන් අහන්නේ.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
ගරු මන්ත්‍රීතුමනි, දැනට අපි එම පනත් සංශෝධනය සඳහා නිශ්චිත තීරණයක් අරගෙන නැහැ. නමුත්, පරිසර අමාත්‍යාංශය විසින් අපේ රටේ තිබෙන ජල මූලාශ්‍ර හඳුනා ගනිමින්, එම ජල මූලාශ්‍ර සංරක්ෂණය සඳහා වැඩ පිළිවෙළක් ආරම්භ කරලා තිබෙනවා.

කළුතර දිස්ත්‍රික්කයේ එවැනි ජල මූලාශ්‍ර සහිත ප්‍රදේශ පිළිබඳව ඔබ යෝජනා කරනවා නම්, අපට ඒ වැඩ පිළිවෙළ හරහා එවැනි ස්ථාන සංරක්ෂණය කිරීමට ඉඩකඩ හදා ගන්න පුළුවන්. ඒ වාගේම අපි පරිසර අමාත්‍යාංශයේ ජල සම්පත් මණ්ඩලය හරහා භූගත ජල සිතියම් සකස් කිරීම සඳහාත් යෝජනා ක්‍රියාත්මක කරමින් ඉන්නවා. කළුතර දිස්ත්‍රික්කයේ එවැනි ගැටලු සහිත තැන් තිබෙනවා නම්, එම සිතියම හැදුවාට පසුව ඒ හඳුනාගත් තැන් සංරක්ෂණය කිරීමේ වැඩ පිළිවෙළකට යැමට අපට ඉඩකඩ හදා ගන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නයත් අහන්න.

**ගරු ධනුෂ්ක රංගනාත් මහතා**
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)
ගරු කථානායකතුමනි, මම දෙවන අතුරු ප්‍රශ්නයක් අහන්නේ නැහැ.

## යාපනය සහ කිලිනොච්චි දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය රෝහල්: විස්තර

### யாழ்ப்பாணம் மற்றும் கிளிநொச்சி மாவட்டங்களிலுள்ள பிரதேச வைத்தியசாலைகள்: விபரம்

### DIVISIONAL HOSPITALS IN JAFFNA AND KILINOCHCHI DISTRICTS: DETAILS

972/2025

**2. ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) යාපනය සහ කිලිනොච්චි දිස්ත්‍රික්කවල රජයේ ප්‍රාදේශීය රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් රෝහලේ අනුමත වෛද්‍යවරුන්, හෙදියන් සහ වෙනත් සේවකයන් සංඛ්‍යාව සහ මේ වනවිට සේවය කරන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පුරප්පාඩු පිරවීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(iv) ඉහත දිස්ත්‍රික්කවල රෝහල්වල ඖෂධවේදීන්ගේ පුරප්පාඩු තිබේද;

(v) එම පුරප්පාඩු පුරවන දිනය කවරේද;

(vi) ඖෂධවේදීන් බඳවා ගැනීමට සම්මුඛ පරීක්ෂණ පැවැත්වුවද, පත්වීම් ලබාදී නොමැති බැවින් පත්වීම් ලබා දෙන දිනය කවරේද;

(vii) ඉහත රෝහල්වල ගිලන් රථ රියදුරන්ගේ පුරප්පාඩු තිබේද;

(viii) එම පුරප්පාඩු පුරවන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) යාපනය, වේලනෛයි ප්‍රාදේශීය රෝහල B ශ්‍රේණියට ශ්‍රේණිගත කර තිබේද;

(ii) එය බලපැවැත්වෙන දිනය කවරේද;

(iii) ශ්‍රේණිගත කිරීමට අනුකූලව එම රෝහලේ අනුමත සේවකයන් සංඛ්‍යාව සහ මේ වනවිට සේවය කරන සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ශ්‍රේණිගත කිරීමට සාපේක්ෂව රසායනාගාර සහ කාර්ය මණ්ඩල පහසුකම් ලබා දී තිබේද;

(v) නොඑසේ නම්, ඒවා ලබා දීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) யாழ்ப்பாணம் மற்றும் கிளிநொச்சி மாவட்டங்களிலுள்ள பிரதேச அரச வைத்தியசாலைகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) அவ்வொவ்வொரு வைத்தியசாலைக்குமென அங்கீகரிக்கப்பட்ட வைத்தியர்கள், தாதியர்கள், ஏனைய ஆளணியினரின் எண்ணிக்கை மற்றும் தற்போது அங்கு பணிபுரிவோரின் எண்ணிக்கை என்பன வெவ்வேறாக எத்தனை என்பதையும்;

(iii) அவ்வெற்றிடங்களை நிரப்புவதற்கு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iv) மேற்படி மாவட்டங்களிலுள்ள வைத்தியசாலைகளில் மருந்தாளர்களுக்கான வெற்றிடங்கள் காணப்படுகின்றனவா என்பதையும்;

(v) எத்திகதியில் அவ்வெற்றிடங்கள் நிரப்பப்படும் என்பதையும்;

(vi) மருந்தாளர்களை ஆட்சேர்ப்பதற்கான நேர்முகப் பரீட்சை நடத்தப்பட்டுள்ளபோதும் நியமனங்கள் வழங்கப்படவில்லை என்பதால், எத்திகதியில் அந்நியமனங்கள் வழங்கப்படும் என்பதையும்;

(vii) மேற்படி வைத்தியசாலைகளில் நோயாளர் காவுவண்டி சாரதிகளுக்கான வெற்றிடங்கள் நிலவுகின்றனவா என்பதையும்;

(viii) அவ்வெற்றிடங்களை நிரப்பும் திகதி யாது என்பதையும்;

அவர் அறிவிப்பாரா?

(ஆ) (i) யாழ்ப்பாணம் மாவட்டத்திலுள்ள வேலணை பிரதேச வைத்தியசாலை B தர வைத்திய சாலையாகத் தரவரிசைப்படுத்தப்பட்டுள்ளதா என்பதையும்;

(ii) இவ்விடயம் எத்திகதியிலிருந்து நடைமுறைக்கு வருகின்றது என்பதையும்;

(iii) மேற்படி வைத்தியசாலையின் தரவரிசைப் படுத்தலின் பிரகாரம் அங்கீகரிக்கப்பட்ட ஆளணி யின் எண்ணிக்கை மற்றும் தற்போது பணியாற்றி வரும் ஆளணியின் எண்ணிக்கை என்பன வெவ்வேறாக எத்தனை என்பதையும்;

(iv) தரவரிசைப்படுத்தலுக்கு அமைவாக, ஆய்வுகூட மற்றும் ஆளணி வசதிகள் ஏற்படுத்திக் கொடுக்கப்பட்டுள்ளனவா என்பதையும்;

(v) இன்றேல், அவற்றை ஏற்படுத்திக் கொடுப்பதற்கு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he state -

(i) the number of government divisional hospitals in the Jaffna and Kilinochchi Districts;

(ii) the approved and the actual cadre of doctors, nurses and other employees of each of the hospitals, separately;

(iii) the measures taken to fill those vacancies;

(iv) whether there are vacancies for pharmacists in hospitals in above districts;

(v) the date on which those vacancies are filled;

(vi) the date on which appointments will be given, whereas no appointments have been given although interviews have been conducted for recruiting pharmacists;

(vii) whether there are vacancies for ambulance drivers in the above hospitals; and

(viii) the date on which those vacancies will be filled?

(b) Will he also state -

(i) whether the Velanai Divisional Hospital in Jaffna has been placed in Grade B;

(ii) the date on which it will take effect;

(iii) the number of approved employees and the actual number of employees serving in that hospital at present according to the grading, separately;

(iv) whether laboratory facilities and staff has been provided according to the grading; and

(v) if not, the measures that will be taken to provide them?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

| රෝහල් වර්ගය | යාපනය | කිලිනොච්චිය | එකතුව |
|---|---|---|---|
| A වර්ගයේ ප්‍රාදේශීය රෝහල් | - | - | - |
| B වර්ගයේ ප්‍රාදේශීය රෝහල් | 05 | 01 | 06 |
| C වර්ගයේ ප්‍රාදේශීය රෝහල් | 18 | 06 | 24 |
| එකතුව | 23 | 07 | 30 |

(ii) ඇමුණුම මඟින් දක්වා ඇත. එය දීර්ඝ විස්තරයක් සහිත ඇමුණුමක් බැවින් මම එය **සභාගත*** කරනවා.

(iii) පශ්චාත් සීමාවාසික වෛද්‍ය නිලධාරීන් 1,374ක් සඳහා 2025 සැප්තැම්බර් 15වන දින රාජකාරියට වාර්තා කිරීමට හැකිවන පරිදි පත්වීම් ලබා දීම සිදු කර ඇති අතර එම නිලධාරීන්ගෙන් යාපනය සහ කිලිනොච්චි දිස්ත්‍රික්කවල ප්‍රකාශයට පත් කර ඇති වෛද්‍ය නිලධාරී පුරප්පාඩු ලේඛනය සලකා සේවා අවශ්‍යතාව අනුව වෛද්‍යවරුන් අනුයුක්ත කිරීම සිදු කර තිබෙනවා.

දැනට සිසු හෙද පුහුණුවේ නිරත, ඉදිරියේදී පුහුණුව අවසන් කිරීමට නියමිත හෙද ඩිප්ලෝමාධාරීන් කණ්ඩායම් හා මාස හයක හෙද අනුස්ථාපන හා සමායෝජන පුහුණුව සඳහා බඳවාගෙන පත්වීම් ලබා දීමට නියමිත හෙද උපාධිධාරීන් සඳහා පත්වීම් ලබා දීමේ දී මෙම රෝහලට අනුයුක්ත කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

ගරු කථානායකතුමනි, 2019 සිසු හෙද කණ්ඩායමේ 294දෙනෙකුට ඔක්තෝබර් මුල හෙද නිලධාරි පත්වීම් ලබා දෙනවා. ඒ සියලු දෙනාම උතුරු, නැඟෙනහිරට තමයි යොමු කරන්නේ.

මේ වනවිට උපාධිධාරින් 875ක් බඳවා ගැනීමට අනුමැතිය ලබා ගෙන ඒ අයගෙන් 700ක් පමණ බඳවා ගන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒගොල්ලන්ගේ සම්මුඛ පරීක්ෂණ මේ වනවිට පැවැත්වෙනවා. ඔක්තෝබර් මැද ඒ අයගේ අනුස්ථාපන පාඨමාලාව ආරම්භ කරනවා. ඒක මාස හයක් පැවැත්වෙනවා. ඒ අනුව අප්‍රේල් මැද වෙන කොට ඒ 700දෙනාටත් පත්වීම් ලබා දෙන්න පුළුවන්කම ලැබෙනවා. ඒවායිනුත් මේ පුරප්පාඩු පිරවෙනවා.

වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ - MLT, භෞත චිකිත්සක, විකිරණ ශිල්පී, වාග් චිකිත්සක සහ ශ්‍රවණවේදී කාර්මික ශිල්පී යන තනතුරු සඳහා ඉදිරි බඳවා ගැනීම් සිදු කිරීමට අවශ්‍ය අනුමැතිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් මේ වනවිට ලබා ගෙන තිබෙනවා. ඊට අදාළ කටයුතු සිදු කරමින් තිබෙනවා. ඒ අනුව උතුරු, නැඟෙනහිරටත් අනුයුක්ත කරනවා.

උතුරු පළාත් සභාව මඟින් ඉදිරි බඳවා ගැනීම් සිදු කිරීමේදී අනෙකුත් සහායක කාර්ය මණ්ඩලය සහ සුළු සේවක පුරප්පාඩු සඳහා බඳවාගෙන සේවා අවශ්‍යතාව අනුව ඔවුන් යාපනය සහ කිලිනොච්චි දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය රෝහල් වෙත අනුයුක්ත කිරීම සිදු කරනු ලබනවා.

අපි මේ වන විට සෞඛ්‍ය කාර්ය සහායකයින් 1,900ක් බඳවා ගැනීමේ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. රේඛීය අමාත්‍යාංශයේ රෝහල්වලට තමයි එසේ බඳවා ගන්නේ. ඒ විධියට රේඛීය අමාත්‍යාංශයේ පුරප්පාඩු පිරවූවාට පස්සේ ආණ්ඩුකාරවරුන් සමඟ සාකච්ඡා කරලා, පළාත් සභාවලට අයිති ප්‍රාදේශීය රෝහල්වලට අවශ්‍ය ප්‍රමාණය අනුව ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

(iv) ඔව්.

(v) ඖෂධවේදී උපාධිධාරින් 164ක් බඳවා ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා 2025.08.05 දිනැතිව රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීමේ කමිටුව වෙත යොමු කර තිබෙනවා. ඊට අදාළ අනුමැතිය ලැබීමෙන් පසු බඳවා ගැනීමේ පටිපාටිය අනුව බඳවා ගැනීම් කටයුතු සිදු කරනු ලබන අතර, ඒ අනුව පුරප්පාඩු පවතින රෝහල් වෙත අනුයුක්ත කිරීම් සිදු කරනු ලබනවා.

(vi) ඖෂධවේදී බඳවා ගැනීම් සිදු කිරීම සඳහා මේ වන තෙක් අනුමැතිය ලැබිලා නැහැ. ඒක නිසා සම්මුඛ පරීක්ෂණ තවම සිදු කරලා නැහැ.

(vii) ඔව්.

(viii) පළාත් සභා යටතේ පාලනය වන රෝහල් සඳහා රියදුරන් පත් කිරීම අදාළ පළාත් සභාව මඟින් සිදු කරනවා. ඒ අනුව උතුරු පළාත් සභාව මඟින් අදාළ බඳවා ගැනීම් සිදු කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා මේ වන විටත් ඉල්ලීම් ඉදිරිපත් කර තිබෙන අතර, අනුමැතිය ලද පසු රියදුරන් බඳවා ගැනීම සිදු කරනවා.

(ආ) (i) ඔව්.

(ii) 2020.01.31

(iii) අනුමත කාර්ය මණ්ඩලය ඇමුණුම 02 හැටියට මම ඉදිරිපත් කරලා තිබෙනවා.

** Annex: 2*

**As per the Cadre revision done in 2013 and 2018.**

| District | Institution | Designation | DMS Approved Cadre | In Position |
|---|---|---|---|---|
| Jaffna | Divisional Hospital - Velanai (Type B) | Medical Officer | 2 | 2 |
| Jaffna | Divisional Hospital - Velanai (Type B) | Dental Surgeon | 1 | 1 |
| Jaffna | Divisional Hospital - Velanai (Type B) | Public Health Midwife | 2 | 1 |
| Jaffna | Divisional Hospital - Velanai (Type B) | Dispenser | 2 | 1 |
| Jaffna | Divisional Hospital - Velanai (Type B) | Driver | 1 | 1 |
| Jaffna | Divisional Hospital - Velanai (Type B) | Attendant | 6 | 6 |
| Jaffna | Divisional Hospital - Velanai (Type B) | Watcher | 1 | 0 |
| Jaffna | Divisional Hospital - Velanai (Type B) | Saukyaya Karyaya Sahayaka (Ordinary) | 2 | 0 |
| Jaffna | Divisional Hospital - Velanai (Type B) | Saukyaya Karyaya Sahayaka (Junior) | 6 | 5 |
| Jaffna | Divisional Hospital - Velanai (Type B) | Nursing Officer | 0 | 0 |
| Jaffna | Divisional Hospital - Velanai (Type B) | Development Officer | 0 | 1 |
| Jaffna | Divisional Hospital - Velanai (Type B) | Community Health Worker (Personal to the holder) | 4 | 4 |

කෙටියෙන් කිව්වොත්, එම අනුමත කාර්ය මණ්ඩලය අනුව දැනට වෛද්‍ය නිලධාරීන් දෙදෙනෙක් සිටිය යුතුයි, ඒ දෙදෙනාම ඉන්නවා. දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් එක්කෙනෙක් ඉන්න ඕනෑ, ඒ එක්කෙනා ඉන්නවා. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් දෙදෙනෙක් ඉන්න ඕනෑ, ඉන් එක්කෙනෙක් ඉන්නවා. Dispensersලා දෙදෙනෙක් ඉන්න ඕනෑ, ඉන් එක්කෙනෙක් ඉන්නවා. එක රියදුරෙක් ඉන්න ඕනෑ, ඒ අනුව එක්කෙනෙක් ඉන්නවා. Attendantsලා හයදෙනෙක් ඉන්න ඕනෑ, ඒ හයදෙනාම ඉන්නවා.

වොචර් කෙනෙක් ඉන්න ඕනෑ. ඒ කෙනා නැහැ. සෞඛ්‍ය කාර්ය සහායකයන් ඔක්කෝම 8දෙනෙක් ඉන්න ඕනෑ. ඉන් 5දෙනෙක් ඉන්නවා. මේ වේලනෙයි රෝහලේ හෙද කාර්ය මණ්ඩලය අනුමත කරගෙන නැහැ. ඒක අනුමත කරගෙන අපි කටයුතු කරනවා. ඊළඟට, සංවර්ධන නිලධාරීන්. එතැන ඇත්තටම cadre එකක් නැහැ, නමුත් එක්කෙනෙක් ඉන්නවා. Community Health Workersලා 4දෙනෙක් ඉන්න ඕනෑ. ඒ 4දෙනාම ඉන්නවා.

(iv) ශ්‍රේණිගත කිරීම්වලට සාපේක්ෂව කාර්ය මණ්ඩල පහසුකම් ලබා දී නැති බව මම සඳහන් කළා.

(v) වේලනෙයි ප්‍රාදේශීය රෝහල සඳහා කාර්ය මණ්ඩල ප්‍රතිමානයන්ට - cadre normsවලට - අනුව කාර්ය මණ්ඩලය යාවත්කාලීන කර නොමැති අතර, ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම මෙන්ම රසායනාගාර සඳහා අවශ්‍ය පහසුකම් පුළුල් කිරීමේ කටයුතු ඉදිරියේදී උතුරු පළාත් සභාව මඟින් සිදු කරනු ලැබේ.

(ඈ) පැන නොනඟී.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

கௌரவ சபாநாயகர் அவர்களே, எனது முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

கிளிநொச்சி மாவட்டத்தில் நெதர்லாந்து அரசாங்கத்தால் கட்டப்பட்ட சிறப்பு மகளிர் சிகிச்சை நிலையமானது பல ஆண்டுகளாக இயங்காமல் காணப்படுகின்றது. கைக்கு எட்டியது இன்னும் வாய்க்கு எட்டவில்லையென மக்கள் தெரிவித்ததை அடுத்து, நாங்கள் அந்த இடத்துக்குச் சென்று பார்வையிட்டோம். இலங்கையில் வேறு எங்கும் காணப்படாத CT scanner, கதிரியக்க இயந்திரங்கள் அங்கு காணப் படுகின்றதென நான் நினைக்கின்றேன். அவ்வாறு அங்கு பொருத்தப்பட்டுள்ள சில இயந்திரங்களின் பயன்பாட்டுத் திகதி காலாவதியாகிவிட்டது. இன்னும் சில இயந்திரங்களின் பயன்பாட்டுத் திகதி காலாவதியாகின்ற நிலையில் இருக்கின்றது.

கடந்த அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டத்திலும் இவ்விடயம் சம்பந்தமாகப் பிரஸ்தாபிக்கப்பட்டது. அதன் போது வட மாகாணத்தில் காணப்படுகின்ற ஆளணியினரை உள்ளடக்கி, சுழற்சி முறையில் அங்கு ஆளணியினரை நியமிப்பதாக உறுதியளிக்கப்பட்டது. அண்மையில்கூட, அங்குள்ள வைத்தியசாலையில் காணப்படுகின்ற சங்கம் ஒன்று அந்த சிகிச்சை நிலையத்தை உடனடியாக இயக்க வேண்டு மெனக் கூறி, மக்களைத் திரட்டி ஆர்ப்பாட்டம் ஒன்றைச் செய்திருந்தது. நான் இங்கு விடுக்கும் கோரிக்கையே மக்களினதும் கோரிக்கையாக இருக்கின்றது. அதாவது, கௌரவ சுகாதார அமைச்சர் மற்றும் துறை சார்ந்த உத்தியோகத்தர்கள் மேற்படி சிகிச்சை நிலையத்துக்குச் சென்று, அங்குள்ள நிலைமையைப் பார்வையிட்டு, நீண்ட காலமாக இயங்காமல் இருக்கின்ற அந்த சிகிச்சை நிலையத்தை இயக்குவதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டும். அதற்குத் தேவையான ஆளணியினரை உடனடியாக நியமித்து, ஏதோ ஒரு வகையில் அந்தச் சிகிச்சை நிலையத்தை இயக்குவதனூடாக, கிளிநொச்சி, முல்லைத்தீவு, மன்னார், வவுனியா மாவட்டங்களில் உள்ள கர்ப்பிணிப் பெண்களும் ஏனைய பெண்களும் சிறந்த சிகிச்சையைப் பெற்றுக்கொள்ள முடியும். எனவே, இது தொடர்பாக எவ்வாறான நடவடிக்கைகள் எடுக்கப்படுமெனக் கூற முடியுமா?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, එතුමා ඉදිරිපත් කරන තොරතුරු ඇත්ත. මොකද, අපට එතැන ගොඩනැඟිලි සහ උපකරණ තිබුණාට ඉන්න කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නැහැ. දැන් ලංකාවට පැමිණෙන විශේෂඥ වෛද්‍යවරුන් කිහිපදෙනෙකුත් අපි එතැනට යොමු කරනවා. හැබැයි ඒ යොමු කිරීමේදී අපි සැලකිලිමත් වෙනවා, ඒ අය ලංකාවේ රැඳී සිටීම සම්බන්ධයෙනුත්. විශේෂයෙන් පරිපූරක වෘත්තීන්ට අදාළ අපේ කාර්ය මණ්ඩලය දැන් අපි පුහුණු කරගෙන යනවා. ඉතින්, මේ කාර්ය මණ්ඩල ප්‍රමාණවත් නොවීම තමයි සමහර උපකරණ ක්‍රියාත්මක නොවීමට බලපා තිබෙන්නේ. ඇත්තටම මේ කාර්ය මණ්ඩලය යොමු කිරීමේදී තිබෙන අසමතුලිතතා සැලකිය යුතු මට්ටමින් දැන් නිරාකරණය කරලා තිබෙන්නේ. නමුත් 2017දී අනුමත කර ගත් cadre එකට අවශ්‍ය බඳවා ගැනීම් මේ වන විට සිදු වන්නේ නැහැ. දැන් අපි පුහුණු කරගෙන යන අයගෙන් ඒ කාර්ය මණ්ඩලය පුරවන්න පුළුවන් කියන බලාපොරොත්තුව තිබෙනවා. ගරු කථානායකතුමනි, එතුමා කියන කාරණය හරි. මම යාපනය ශික්ෂණ රෝහලේදීත් මේ ගැන කථා කළා. ගරු මන්ත්‍රීතුමනි, කිලිනොච්චි දිස්ත්‍රික් මහ රෝහලට අපි විශේෂ අවධානයක් යොමු කරනවා, ඒ පුරප්පාඩු සහ අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

Hon. Speaker, I am very happy that the Hon. Minister replied responsibly. Thank you.

## එම්.එෆ්. මුස්තකීන්, එන්. ගුණපාලසිංගම්, ඒ. රාධා ක්‍රිෂ්ණන් සහ ප්‍රේමසිරි නමැති ධීවරයින්: වන්දි

## மீனவர்களான எம்.எப். முஸ்தகீன், என். குணபாலசிங்கம், ஏ. ராதாகிருஷ்ணன் மற்றும் பிரேமசிறி: நட்டஈடு

FISHERMEN M.F. MUSTAKEEN, N. GUNAPALASINGAM, A. RADHA KRISHNAN AND PREMASIRI: COMPENSATION

978/2025

**3.** **ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2024.07.07 වන දින පේදුරුතුඩුවේ (වෙට්ටිලෙයි කේණික්කඩල්) සිට ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීම සඳහා පිටත්ව ගිය එම්.එෆ්. මුස්තකීන්, එන්. ගුණපාලසිංගම්, ඒ. රාධා ක්‍රිෂ්ණන් සහ ප්‍රේමසිරි නමැති ධීවරයන් දින 194කට පසුව ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවට ගෙන්වා ගනු ලැබූ බව දන්නේද;

[ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා]

(ii) එම ධීවරයන් වෙනුවෙන් වන්දි මුදල් ලබා දුන්නේද;

(iii) එසේ නම්, එම වන්දි මුදල් සම්බන්ධයෙන් විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2024.07.07ஆந் திகதி பருத்தித்துறையிலிருந்து (வெற்றிலைக்கேணிக் கடல்) ஆழ்கடலில் மீன் பிடிக்கச் சென்ற எம்.எப். முஸ்தகீன், என். குணபாலசிங்கம், ஏ. ராதாகிருஷ்ணன் மற்றும் பிரேமசிறி ஆகிய மீனவர்கள் 194 நாட்களுக்குப் பின்னர் இந்தியாவிலிருந்து இலங்கைக்கு அழைத்துவரப்பட்டனர் என்பதை அறிவாரா;

(ii) மேற்படி மீனவர்களுக்கு நட்டஈடு வழங்கப் பட்டுள்ளதா;

(iii) ஆமெனில், மேற்படி நட்டஈடு தொடர்பிலான விபரங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries, Aquatic and Ocean Resources:

(a) Will he inform this House -

(i) whether he is aware that the fishermen named M.F. Mustakeen, N. Gunapalasingam, A. Radha Krishnan and Premasiri, who left for deep sea fishing from Point Pedro (Vetrilai Kenikkadal) on 07.07.2024, were brought back to Sri Lanka from India after 194 days;

(ii) whether compensation was paid for the said fishermen; and

(iii) if so, the details, relating to the compensation?

(b) If not, why?

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**

(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)

(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

கௌரவ சபாநாயகர் அவர்களே, இந்தக் கேள்விக்கான பதில்கள் பின்வருமாறு:

(அ) (i) ஆம்.

2025.03.17ஆம் திகதி யாழ். மாவட்டக் கடற்றொழில் அலுவலகத்தில் குறித்த படகின் உரிமையாளர் மற்றும் படகோட்டியிடமிருந்து பெறப்பட்ட வாக்குமூலத்தின்படி, யாழ்ப்பாணம், பருத்தித்துறை, இன்பசிட்டியில் வசிக்கும் சி. அமிர்தலிங்கம் என்பவருக்குச் சொந்தமான, IDAY -A-0184 KMN இலக்கமுடைய மீன்பிடிப் படகில் 2024.07.07ஆம் திகதி பருத்தித்துறை மீன்பிடித் துறைமுகத்திலிருந்து மீன்பிடிப்பதற் காகக் கடலுக்குச் சென்றுள்ள மேற்படி நான்கு மீனவர்களும் பலத்த காற்று காரணமாகப் படகு அடித்துச் செல்லப்பட்டுக் காணாமற்போயிருந்த நிலையில், 29 நாட்களின் பின்னர் இந்திய மீனவர்கள் படகொன்றில் வந்து அவர்களைக் காப்பாற்றியுள்ளதுடன், 9 நாட்கள் அவர்களுடன் இருந்ததாகவும், பின்னர் அவர்கள் இந்தியக் கடற்படையினரால் அழைத்துச் செல்லப்பட்டு, சென்னை பொலிஸாரினால் தடுப்புக் காவலில் வைக்கப்பட்டு, சென்னையில் 3 மாதங்களும் 10 நாட்களும் இருந்துள்ளதாகவும், பின்னர் திருச்சி சிறைச்சாலையில் 4 மாதங்களும் 13 நாட்களும் இருந்துள்ளனர் எனவும், அதன் பின்னர் மீண்டும் சென்னைக்கு அழைத்துச் செல்லப்பட்டு அங்கு 13 நாட்கள் தடுப்பில் வைக்கப்பட்ட பின்னர் ஆகாய மார்க்கமாக இலங்கைக்கு அழைத்து வரப்பட்டுள்ளதாகவும் தெரிவிக்கப்பட்டுள்ளது.

மேற்படி நான்கு மீனவர்களையும் 2025.02.25ஆம் திகதி கடற்றொழில் மற்றும் நீரியல் வளங்கள் திணைக்களத்தின் தலையீட்டின்பேரில் இலங்கைக்கு அழைத்துவர நடவடிக்கை எடுக்கப்பட்டுள்ளது. இதற்காகக் கடற்றொழில் மற்றும் நீரியல் வளங்கள் திணைக்களம் 344,424 ரூபாய் செலவினத்தை ஏற்றுள்ளது. தேவையாயின் மேற்படி விவகாரத்துடன் சம்பந்தப்பட்ட நபர்களின் ஆள் அடையாள அட்டை இலக்கங்களை உங்களுக்கும் வழங்க முடியும்.

(ii) இந்த மீனவர்களுக்கு இழப்பீட்டுத் தொகை வழங்கப்படவில்லை.

கடற்றொழிலில் ஈடுபட்டுக்கொண்டிருக்கும் போது ஏற்படும் இயற்கை அனர்த்தங்கள் காரணமாக உயிரிழக்கும் மீனவர்களுக்கு அரசாங்கத்தினால் இழப்பீடு வழங்கப் படுகின்றது. அதற்கமைய, அவ்வாறு உயிரிழக்கும் கடற்றொழிலாளி ஒருவர் சார்பாக அவரில் தங்கியிருப்போருக்கு ஒரு மில்லியன் ரூபாய் இழப்பீடு வழங்கப்படுகின்றது.

அதற்கு மேலதிகமாக, இலங்கை காப்புறுதிக் கூட்டுத்தாபனம் மற்றும் விவசாய மற்றும் விவசாயக் காப்புறுதி வாரியத்தின்மூலம் இரண்டு மீனவர் காப்புறுதித் திட்டங்கள் நடைமுறைப்படுத்தப்படுகின்றன. அவற்றின் மூலம் நட்டஈடு பெறுவதற்குக் குறித்த மீனவர்கள் அத்திட்டத்திற்குப் பங்களித்தல் வேண்டும். அந்த இரண்டு திட்டங்களின் கீழும் திடீர் அனர்த்தத்தின்போது உயிரிழக்கும் மீனவ ரொருவர் சார்பாக 1 மில்லியன், 1.5 மில்லியன் மற்றும் 2 மில்லியன் ரூபாய் வரை பயன்களைப் பெறுவதற்கான ஏற்பாடுகள் உள்ளன.

அதுதவிர, மீன்பிடிக் கைத்தொழிலில் ஈடுபட்டுக் கொண்டிருக்கும்போது பிற வெளிநாட்டுக் கடற்படைப் படகுகளுடன் மோதுவதனால் ஏற்படும் அனர்த்தங்களின் போது உயிரிழக்கும் மீனவர்களுக்கு, குறித்த தகவல்களை உறுதிப் படுத்திய பின்னர் அதனுடன் தொடர்புடைய கப்பல் நிறுவனத்துடன் தொடர்புகொண்டு

இழப்பீடு பெற்றுக் கொடுக்க நடவடிக்கை எடுக்கப்படுகின்றது. எனினும், இந்த நான்கு மீனவர்களும் பாதுகாப்பாக இலங்கைக்கு அழைத்து வரப்பட்டுள்ளதால் இழப்பீடு வழங்க வேண்டிய அவசியம் இல்லை.

(iii) ஏற்புடையதல்ல.

(ஆ) மேலே குறிப்பிட்டவாறு மூன்று முறைகளின்கீழ் இழப்பீடு வழங்கப்படுகின்றது. ஆனால், இந்த மீனவர்கள் நால்வரும் பாதுகாப்பாக எந்தவித அபாயமுமின்றி நாட்டுக்கு அழைத்துவரப்பட்டிருப்பதால் இழப்பீடு வழங்கப்படவில்லை.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

கௌரவ அமைச்சர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிக வினா:

பருத்தித்துறை மீனவர்கள் நான்கு பேரும் கடலுக்குச் சென்று பாதிக்கப்பட்டதனால், அவர்களுடைய இயந்திரப் படகுக்கு 15 இலட்சம் ரூபாய் பெறுமதியான நஷ்டம் ஏற்பட்டிருக்கின்றது; வலைகள் மற்றும் மீன்பிடி உபகரணங்களுக்கு 14 இலட்சம் ரூபாய் பெறுமதியான நஷ்டம் ஏற்பட்டுள்ளது. அதேபோன்று அவர்களுடைய GPS உபகரணங்களுக்கு 2 இலட்சம் ரூபாய் நஷ்டம் ஏற்பட்டிருக்கின்றது. ஒட்டுமொத்தமாக அவர்கள் 31 இலட்சம் ரூபாய் நஷ்டமடைந்துள்ளனர்.

கௌரவ அமைச்சர் அவர்கள் குறித்த மீனவர்களை இலங்கைக்குக் கொண்டுவந்ததாகச் சொன்னார்; அதற்கு நாங்கள் உண்மையிலேயே கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சுக்கு நன்றி சொல்ல வேண்டும். ஆனால், இவ்வாறு பாதிக்கப்பட்ட மீனவர்களைப் பாதுகாப்பாக இலங்கைக்குக் கொண்டுவந்தது மட்டுமல்லாமல், அவர்களது பாதிக்கப்பட்ட இயந்திர வள்ளங்கள், வலைகள் ஏனைய உபகரணங்களுக்கான நஷ்டஈட்டை அவர்களுக்கு நீங்கள் வழங்குவீர்களா? என்பதுதான் என்னுடைய கேள்வியாகும்.

கௌரவ அமைச்சர் அவர்களே, காப்புறுதி செய்தவர்களுக்கு நிவாரணம் வழங்கப்படும் என்று நீங்கள் சொல்லியிருந்தீர்கள். ஆனால், காப்புறுதி செய்த சில மீனவர்களுக்கும் நஷ்டஈடு வழங்கப்பட முடியாத நிலைமைகள் இருப்பதனால் இந்த 4 மீனவர்களுக்கும் தனித்தனியாக எவ்வளவு நஷ்டஈடு வழங்குவீர்கள் என்பதை உங்களால் சொல்ல முடியுமா?

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

கௌரவ உறுப்பினர் அவர்களே, முதலாவதாக நான் ஒன்றைச் சொல்ல வேண்டும். அதாவது, நீங்கள் கேட்ட கேள்வி, "இவ்வாறு பாதிக்கப்பட்ட 4 மீனவர்கள் தொடர்பாக எடுக்கப்பட்டிருக்கின்ற நடவடிக்கை என்ன? அவர்களுக்கு இழப்பீடு வழங்கப்பட்டிருக்கின்றதா?" என்பது. நீங்கள், "அவர்களுடைய படகு சேதமடைந்திருக்கின்றது; ஏனைய பிரச்சினைகள் ஏற்பட்டிருக்கின்றது. அதற்கு ஏதாவது நட்டஈடு வழங்க முடியுமா?" என்று தெளிவாகக் கேட்டிருந்தால், அது சம்பந்தமாக நிச்சயமாகப் பரிசீலனை செய்து பார்க்கலாம். அதாவது, அது தொடர்பாக ஆராய்ந்து நிச்சயமாக அவ்வாறு பாதிக்கப்பட்டிருக்கின்றவர்களுக்கு எங்களுடைய அமைச்சின் மூலம் ஏதாவது நிவாரணம் வழங்க முடியுமா என்று பார்க்கலாம்.

இரண்டாவது, நான் முதலில் குறிப்பிட்டதுபோன்று நேரடியாக எங்களுடைய அமைச்சின் கீழிருக்கின்ற காப்புறுதித் திட்டத்தின்மூலம் ஒரு மில்லியன் ரூபாய் பெற்றுக்கொள்ள முடியும். அதேபோன்று இன்னுமொரு திட்டம் இருக்கின்றது; அதன்மூலம் 1.5 மில்லியன் ரூபாய் பெற்றுக்கொள்ள முடியும். அதைவிட, இன்னுமொரு திட்டம் இருக்கின்றது. அதன்மூலம் 2 மில்லியன் ரூபாய் பெற்றுக் கொள்ள முடியும். அதாவது, இந்தக் காப்புறுதித் திட்டங்களில் மீனவர்கள் பங்காளிகளாக இருக்க வேண்டும். அவ்வாறு பங்காளிகளாக இருக்கின்றபோது நாங்கள் உரிய நடவடிக்கைகளை எடுப்போம். உரிய காப்புறுதி நிதிகளையும் வழங்க முடியும். அதேபோன்று, மேலதிகமாக அவர்களுக்கு ஏனைய பிரச்சினைகள் ஏற்பட்டிருக்குமாயின், நீங்கள் அதற்கான சரியான தகவல்களை எழுத்துமூலமாகத் தருவீர்களானால் அது சம்பந்தமாக நாங்கள் மேலதிக பரிசீலனைக்கு உட்படுத்தலாம்.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக வினா:

07.07.2024 அன்று பருத்தித்துறையில் இருந்து கரையோரப் பாதுகாப்புப் பிரிவினரால் சோதனை செய்யப்பட்டு, உரிய அனுமதியைப் பெற்ற பின்னர் மீன்பிடிக்கச் சென்ற இந்த நான்கு மீனவர்களும் பயணித்த இயந்திரப் படகு பழுதடைந்தமையால்தான் கடலில் 16 கிலோமீற்றர் தூரத்தில் அவர்கள் தத்தளித்திருக்கிறார்கள். இந்த மீனவர்கள் தொடர்பாக மீனவர் சங்கப் பிரதிநிதிகள் - பருத்தித்துறை சுப்பர்மடம் கிராம சேவையாளர் பிரிவின்கீழ் வருகின்ற சுப்பர்மடம் கடற்றொழிலாளர் கூட்டுறவுச் சங்கத்தினர் என நான் நினைக்கின்றேன் - கடற்றொழில் திணைக்கள அதிகாரிகளிடம் "16 கிலோ மீற்றர் தூரத்தில் தத்தளித்துக்கொண்டு இருக்கின்ற மீனவர்களைத் தேடுங்கள்! அதற்கு எரிபொருட் செலவு ஏதும் தேவையென்றால், அதை நாங்கள் வழங்குகின்றோம்" என்று தெரிவித்திருக்கின்றார்கள். ஆனால், அவ்வாறு கண்டுபிடிக்கப்படாமல் கரையொதுங்கிய நிலையில் இருந்துதான் இந்த மீனவர்கள் இந்திய மீனவர்களால் காப்பாற்றப்பட்டு, 194 நாட்களுக்குப் பின்னர் இலங்கைக்கு அழைத்துவரப்பட்டனர்.

இப்போதைய நவீன காலத்தில் ஒவ்வொரு துறையிலும் நாங்கள் முன்னேறி வருகின்றோம். புதிய அரசாங்கம் புதிய திட்டங்களை முன்வைத்து வருகின்றது. மீனவர்களின் உயிர் மிகவும் முக்கியமானது. அவர்களை இந்தியாவிலிருந்து பாதுகாப்பாக அழைத்து வருவதற்கு 300,000 ரூபாய்க்கு மேல் செலவழிக்கப்பட்டது.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නය කෙටියෙන් අහන්න.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

ගරු කථානායකතුමනි, මම රට වෙනුවෙන් මෙතුමාගෙන් මේ කාරණය ඉල්ලන්නේ, ධීවරයින් සම්බන්ධයෙන් නොවෙයි. දෙවැනි අතුරු ප්‍රශ්නයට මට වෙලාව ලැබෙනවා නේ. දෙවැනි අතුරු ප්‍රශ්නය මම අහන්නේ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නයට විනාඩි දෙකක් ගන්න.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
கௌரவ அமைச்சர் அவர்களே, நான் பருத்தித்துறை மீனவர்களுக்காக, அட்டாளைச்சேனை மீனவர்களுக்காக மாத்திரம் பேசவில்லை; நாட்டிலுள்ள அனைத்து மீனவர்களுக் காகப் பேசுகின்றேன். கடலுக்கு மீன்பிடிப்பதற்காகச் செல்கின்ற நமது மீனவர்கள் காணாமற்போகின்றபோது அல்லது இயற்கை அனர்த்தத்தினால் பாதிப்புக்கு உள்ளாகின்ற போது அவர்களைப் பாதுகாப்பதற்காக ஒரு பொதுவான விசேட திட்டத்தை உருவாக்கி அதன்மூலம் உடனடியாக அவர்களைக் காப்பாற்றுவதற்குரிய நடவடிக்கைகளை முன்னெடுக்க முடியுமா? என்று கேட்கின்றேன்.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
கௌரவ பாராளுமன்ற உறுப்பினர் அவர்களே, தற்போது நீங்கள் கூறிய சம்பவம் முன்னைய அரசாங்கக் காலத்தில் இடம்பெற்றது. பாதிக்கப்பட்ட மீனவர்கள், வழிதவறிச் சென்ற மீனவர்கள் அல்லது இந்தியச் சிறையில் இருக்கின்ற மீனவர்கள் தொடர்பாக நாங்கள் நிச்சயமாக நீதியான முறையில் நடவடிக்கை எடுத்து வருகின்றோம். இந்தச் சம்பவம் நடைபெற்றபோது அது தொடர்பில் நான் கடற்படையினரிடம் வினவினேன். அவர்கள் விமானத்தில் சென்றுகூட தேடிப் பார்த்தும் அவர்களைக் கண்டுபிடிக்க முடியாமல் போய்விட்டதாகத் தெரியவந்தது. அந்த நிலையில்தான் அவர்கள் கடலில் மூழ்கிவிட்டார்களோ? என்ற சந்தேகத்தில் மேலதிக நடவடிக்கை எடுக்கப்படாமல் இருந்தது. அதன் பிறகுதான் இவ்வாறு கரையொதுங்கி இருக்கின்றார்கள் என்பது தெரியவந்தது.

எது எவ்வாறாயினும், இப்போது என்னுடைய அமைச்சு நிச்சயமாக பாதிக்கப்பட்டிருக்கின்ற மீனவர்களுக்கு நீதியையும் நியாயத்தையும் நட்ட ஈட்டையும் பெற்றுக்கொடுப்பதற்கு உரிய நடவடிக்கைகளை எடுத்து வருகின்றது. நான் நினைக்கின்றேன், அண்மைக் காலங்களில் அவ்வாறான பிரச்சினைகள் ஏற்படவில்லை என்று. இனிவரும் காலங் களிலும் நாங்கள் மீனவர்களைப் பாதுகாப்பதற்குப் போதுமான நடவடிக்கைகளை எடுப்போம் என்று இந்தச் சபைக்கு உறுதிமொழி அளிக்கின்றோம்.

## "රටලංකාව"නමැති ඉඩම: LRC සේවකයන්ට වෙන් කිරීම

### 'ரட்டலங்காவ' எனும் காணி: LRC பணியாளர்களுக்கு ஒதுக்குதல்

### LAND KNOWN AS "RATALANKAWA": ALLOCATION TO LRC WORKERS

1071/2025

**4. ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් 'රටලංකාව' නමැති ඉඩමේ විශාලත්වය කොපමණද;

(ii) එම ඉඩමෙන් එක් එක් ආයතනය වෙත බැහැර කර ඇති ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත ඉඩමෙන් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත වෙන් කර ඇති ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත ඉඩමේ ඉඩම් කැබලි, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සේවකයන්ට ලබා දීම සඳහා නිසි අනුමැතියක් තිබේද;

(ii) එසේ නම්, එම අනුමැතියට අදාළ ලිපියේ පිටපතක් සභාගත කරන්නේද;

(iii) නොඑසේ නම්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු වෙනත් ඉඩමකට ලබා ගත් අනුමැතිය භාවිත කර, වංචනික හා අනීතික ආකාරයෙන් ඉහත ඉඩමේ කොටස් බෙදා දීමට කටයුතු කර තිබේද;

(iv) ඉහත ඉඩමේ කාලයක සිට අනවසරයෙන් පදිංචි වී සිටින පවුල් සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை மாவட்டத்தின் கம்புறுபிட்டிய பிரதேச செயலாளர் பிரிவிலுள்ள காணி மறுசீரமைப்பு ஆணைக்குழுவுக்குச் சொந்தமான 'ரட்டலங்காவ' எனும் பெயரையுடைய காணியின் பரப்பளவு எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி காணியிலிருந்து ஒவ்வொரு நிறுவனத் துக்கும் கையுதிர்க்கப்பட்டுள்ள காணியின் அளவு வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) மேற்கூறப்பட்ட காணியிலிருந்து லங்கா கைத்தொழில் அபிவிருத்திச் சபைக்கு ஒதுக்கப் பட்ட காணியின் அளவு எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்கூறப்பட்ட காணியில், காணித் துண்டு களைக் காணி மறுசீரமைப்பு ஆணைக்குழுவின் பணியாளர்களுக்கு வழங்குவதற்கான முறை யான அங்கீகாரம் உள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி அங்கீகாரத்துடன் தொடர்புடைய கடிதத்தின் பிரதியொன்றைச் சபையில் சமர்ப்பிக்க முடியுமா என்பதையும்;

(iii) இன்றேல், காணி மறுசீரமைப்பு ஆணைக் குழுவுக்குச் சொந்தமான மற்றொரு காணிக்குப் பெறப்பட்ட அங்கீகாரத்தைப் பயன்படுத்தி, மேற்கூறப்பட்ட காணியின் சில பகுதிகளை மோசடியாகவும் சட்டவிரோதமாகவும் பகிர்ந் தளிக்க நடவடிக்கை எடுக்கப்பட்டு இருந்ததா என்பதையும்;

(iv) மேற்கூறப்பட்ட காணியில் நீண்ட காலமாகச் சட்டவிரோதமாக வசித்து வரும் குடும்பங்கள் தொடர்பாக எடுக்கப்படவுள்ள நடவடிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House the -

(i) extent of the land known as "Ratalankawa" belonging to the Land Reform Commission situated within the Kamburupitiya Divisional Secretary's Division in the Matara District;

(ii) extent of land allotted to each institution from the land concerned, separately; and

(iii) extent of land allotted from the aforesaid land to the Industrial Development Board?

(b) Will he also inform this House -

(i) whether proper approval is available for the allocation of plots from above land to employees of the Land Reform Commission;

(ii) if so, whether a copy of the letter pertaining to such approval will be tabled;

(iii) if not, whether the approval granted for a different land owned by the Land Reform Commission was invoked to allocate parcels of this land fraudulently and unlawfully; and

(iv) the action taken regarding the families who have been unlawfully occupying the said land for some time?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - காணி மற்றும் நீர்ப்பாசனப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) භුක්තිය භාර ගැනීමේ සහතිකය අනුව, අක්කර 101ක ප්‍රමාණයක් ප්‍රායෝගික වශයෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු වී ඇත.

(ii) මේ සඳහා ආයතන 20ක නාම ලේඛනයක් තිබෙනවා. ඒ අනුව, අක්කර 89 රූඩ් 2 පර්චස් 06ක් බෙදා දීලා තිබෙනවා. ඉතුරු ප්‍රමාණය අක්කර 11 රූඩ් 1 පර්චස් 34යි.

(iii) අක්කර 27 රූඩ් 0 පර්චස් 23.79.

(ආ) (i) පසුකාලීනව 1995 වර්ෂයේ සිට නැවත කොමිෂන් සභාවේ කාර්යය කටයුතු සක්‍රිය කිරීමෙන් පසුව 2005 වර්ෂයේදී එවකට විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව කොමිෂන් සභාවේ අනුමැතිය මත මේ වනවිට ඉඩම් කොටසක් නොලැබුණු සේවකයින් සඳහා

1. වරිපනම් ගෙවනු ලබන ප්‍රදේශයක් නම් පර්චස් 10ක ප්‍රමාණයක්
2. වරිපනම් නොගෙවනු ලබන ප්‍රදේශයක් නම් පර්චස් 20ක ප්‍රමාණයක්

වශයෙන් ඉඩම් කොටසක හිමිකම ලබා දීමට ඉඩ ප්‍රස්ථාව සලසා ඇත. එහිදී ඉඩම් කොටසකට හිමිකම් ලබනුයේ කොමිෂන් සභාවේ වසර 05ක අඛණ්ඩ සේවා කාලයක් සපුරා ඇති කිසිදු විනය විරෝධී කටයුත්තකට භාජන නොවූ සේවක සේවිකාවන්ටය. ඒ අනුව, පොදු ප්‍රතිපත්ති හා නිර්ණායකයන් අදාළ කර ගනිමින් ලබා ගත් කොමිෂන් සභා අනුමැතීන් මත ක්‍රියාත්මක වෙමින් සේවකයන්ට ඉඩම් කොටස් ලබා දීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

(ii) කොමිෂන් තීරණ ඇමුණුම් 01 හා 02 වශයෙන් අමුණා ඇත.

(iii) ශීර්ෂගත ප්‍රශ්නයට විෂයගත වන බිම් කොටස්වල ප්‍රතිලාභී සේවකයින් විසින් භුක්තියට ඇතුළු වූ අවස්ථාවේදී ප්‍රතිවිරෝධතාවන් මතු වූ විට ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය සභාව හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට එරෙහිව සේවකයින් විසින් ගොනු කරන ලද නඩුකරයට අදාළව ගරු අභියාචනාධිකරණය විසින් අංක CA(Writ)-0288 දරන නඩු තීන්දුව ලබා දී ඇති අතර එමඟින් සේවකයින්ගේ හිමිකම තහවුරු කර ඇත. එකී තහනම් නියෝගයෙහි පිටපතක් ඇමුණුම 03 වශයෙන් මේ සමඟ ඉදිරිපත් කරමි.

ඇමුණුම් 01, 02 සහ 03 **සභාගත*** කරමි.

(iv) දැනටමත් අනවසරකරුවන් නියමානුකූල කිරීම සඳහා පිඹුරු අංක 1584 පිඹුර සකසා ඇති අතර, එහි කැබලි සංඛ්‍යාව 23කි. ඉන් 15දෙනෙකුට ඔප්පු ලබා දී ඇත. අනවසරකරුවන් නියමානුකූල කිරීමට අදාළව වරින් වර එළඹ ඇති රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුගතව හා කොමිෂන් සභාවේ අනුමත ක්‍රමවේදයන්ට යටත්ව ඉතුරු අනවසරකරුවන් නියමානුකූල කිරීම සඳහා ඉදිරි කටයුතු කෙරෙමින් පවතී.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමනි, සමහර ප්‍රශ්නවලට දීර්ඝ පිළිතුරු තිබෙන්නේ. මම කෙටියෙන් තමයි උත්තර කිව්වේ. අවශ්‍ය නම් ගරු මන්ත්‍රීතුමාට ඇමුණුම් සහිතව සවිස්තරාත්මකව පිළිතුර ලබා ගන්න පුළුවන්. සවිස්තරාත්මක පිළිතුර මම **සභාගත*** කරනවා.

**ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)

පිළිතුර ලබා දීම සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා. ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා]

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, LRC එක කාලාන්තරයක් තිස්සේ එම ආයතනයේ අවුරුදු 5ක් වැඩ කරපු අයට පර්චස් 10ක හෝ පර්චස් 20ක ඉඩමක් ලබා දෙන ප්‍රතිපත්තියක ඉඳලා තිබෙනවා. ඒ අනුව තමයි මේ ආයතනයේ අවුරුදු 5කට වඩා සේවය කරපු සේවකයන්ට "රටලංකාව" කියන මේ උක්ත ඉඩමෙන් පර්චස් 20 ගාණේ ලබා දීලා තිබෙන්නේ. සාමාන්‍යයෙන් මේ ඉඩම වටේ තිබෙන ඉඩම්වල වටිනාකම පර්චසයක් රුපියල් ලක්ෂ 10ක් විතර වෙනවා. එහෙම බලද්දී මේ ආයතනයේ අවුරුදු 5කට වැඩියෙන් වැඩ කරපු සේවකයන්ට රුපියල් කෝටි දෙකක් විතර වටිනා ඉඩමක් තමයි ලබා දීලා තිබෙන්නේ. මේ සේවකයෙක් එම ආයතනයේ අවුරුදු 5ක් වැඩ කළා කියන්නේ මාස 60යි. ඔහුට ලබා දී තිබෙන ඉඩම රුපියල් කෝටි දෙකක් විතර වටිනවා. මේ රුපියල් කෝටි දෙක, මාස 60න් බෙදලා බැලුවාම එක මාසයකට රුපියල් 333,000ක විතර ප්‍රසාද දීමනාවක් මේ LRC එකේ සේවකයන්ට ලැබෙනවා. හැබැයි, මේ සේවකයන් එච්චර අනතුරුදායක රැකියාවක් නොවෙයි කරන්නේ. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, දුම්රිය දෙපාර්තමේන්තුව වාගේ ඉඩම් තිබෙන තවත් ආයතන තිබෙනවා. ඒ වාගේම, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වැඩ කරන අය ඉන්නවා. ඒ අය මුළු ජීවිත කාලයම වැඩ කළත්, ප්‍රසාද දීමනාවක් විධියට ඒ අයට කිසිම ඉඩමක් ලැබෙන්නේ නැහැ. අපට තිබෙන ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, LRC එකේ අයට මේ වාගේ විශාල වරප්‍රසාදයක් ලබා දෙන්න ඒගොල්ලන්ගේ රැකියාවේ විශාල අවදානමක් තිබෙනවාද, එහෙම නැත්නම් මේ ප්‍රතිපත්තියම අනුගමනය කරමින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, දුම්රිය දෙපාර්තමේන්තුව ඇතුළු අනෙකුත් ආයතනවල සේවකයන්ටත් මේ වරප්‍රසාදය ලබා දෙන්න පුළුවන් ද? ඒ වාගේම ඔබතුමන්ලා මේ නිර්ණායක සම්බන්ධයෙන් නැවත සලකා බලන්න බලාපොරොත්තු වෙනවා ද කියන කාරණයත් මම දැනගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු කථානායකතුමනි, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ - LRC එකේ - සේවයේ නියුතු සේවකයන්ට නිවාස කටයුතු සඳහා ඉඩම් ලබා දීමේ සම්ප්‍රදායක් LRC එක විසින් පවත්වාගෙන යනවා. මේ කොමිෂන් සභාවේ සේවය කරන සේවකයන්ට ඉඩම් ලබා දිය යුතුයි කියලා නිශ්චිත ප්‍රතිපාදනයක් ඒ පනතේ නිශ්චිතවම නැහැ. නමුත්, සුබසාධන කටයුතු සඳහා ලබා දිය හැකි යැයි කියන වගන්තියක් තිබෙනවා. ඒ වගන්තිය අර්ථ දක්වා ගනිමින් තමයි නිවාස කටයුතු සඳහා මේ ඉඩම් ලබා දී තිබෙන්නේ. මේක 1982 ඉඳලා තිබෙන එකක්. අවුරුදු 5ක සේවා කාලයක් සම්පූර්ණ කරපු, විනය විරෝධීව කටයුතු කරලා නැති සේවකයන් සඳහා තමයි මේ ඉඩම් ලබා දෙනවා කියන සම්ප්‍රදාය අරගෙන යන්නේ. මේ වගන්තිය හරහා සමහර සේවකයන්ට නිවසක් හදා ගැනීම සඳහා සුදුසු ඉඩමක් -වාණිජ නොවන පැතිවලින් බිමක්- ලබා දීලා තිබෙනවා. නමුත්, සමහර සේවකයන් දේශපාලන හිතවත්කම් මත, ඔවුන්ගේ තිබෙන ප්‍රබලත්ව මත නගරාශ්‍රිතව වාණිජ වශයෙන් වටිනා තැන්වලින් ඉඩම් ලබාගෙන තිබෙනවා. මේ සේවකයන්ට ඉඩමක් ලබා දුන්නු එක දැන් අහෝසි කරන්න අපට බැහැ.

අපට ඒ තරම් අමානුෂික වෙන්න බැහැ. අපට ඕනෑ නම් මේ සම්බන්ධයෙන් නීතියෙන් challenge කරන්න පුළුවන් වෙයි. නමුත්, අපට ඒ ඉඩම් අහෝසි කරන තැනට යන්න බැහැ. මේකේ ප්‍රතිපාදනයක් තිබෙනවා, මේ ලබා දුන්නු ඉඩම් ඒ ප්‍රදේශයේ වෙනත් කටයුත්තක් සඳහා යොදා ගත යුතු නම්, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී සහ ඒ අදාළ ආයතනත් එක්ක කථා කරලා අපට මේවා පවරා ගන්න පුළුවන් කියලා. ඒ නිසා අපට කළ හැකි වන්නේ මෙයයි. මේ ලබා දී තිබෙන ඉඩම් යම් වෙනත් පොදු රජයේ කටයුත්තක් සඳහා වටිනවා යැයි කියා හිතෙනවා නම්, ඒ ඉඩම් පවරා ගැනීම සඳහා අදාළ කටයුතු කරන්න අපට පුළුවන්. මේක එක අතකින් ප්‍රශ්නයක්. මොකද, මේ ඉඩම් නැවත පවරා ගැනීමට ගියොත් අසාධාරණකම් සිද්ධ වෙන්න පුළුවන්. මේ සම්ප්‍රදාය පාවිච්චි කරලා තමන්ට ඕනෑ කරන තැන්වලින් වටිනා ඉඩම් අරගත්ත අයත් ඉන්නවා. ඒක මම පිළිගන්නවා. ඒ නිසා මම ගරු මන්ත්‍රීතුමාට කියන්න කැමැතියි, මේ කියන නිශ්චිත ඉඩම පොදු කටයුත්තක් වෙනුවෙන් පවරා ගැනීමේ ඕනෑකමක් තිබෙනවා නම්, ඒ වෙනුවෙන් මේ ඉඩම පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරන්න පුළුවන් කියන කාරණය.

**ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මෙම ඉඩමේ පාර අයිනේ තිබෙන බිම් කොටස් බෙදාගෙන තිබෙන ආකාරය අනුව එම ඉඩමේ අනෙකුත් කොටස්වලට ඇතුළුවීම සම්බන්ධයෙනුත් ගැටලුවක් ඇතිවෙලා තිබෙනවා. අනෙක් කාරණය තමයි, 2006දී චක්‍රලේඛයක් මඟින් නිකුත් කර තිබෙනවා, මෙවැනි ආකාරයට ඉඩම් වෙන් කිරීමේදී ඇමතිතුමාගේ අනුමැතිය අවශ්‍යයි කියලා.

නමුත්, මේ ඉඩම සම්බන්ධව කිසිම ලිපිලේඛනයක් නැහැ. අපට දැන ගන්නට ලැබුණු විධියට, සේවකයන්ට බෙදා දෙන්න තීරණය කරලා රුපියල් 1,000 ගානේ තක්සේරු කරලා තිබෙන්නේ වෙනත් ඉඩමක්. තෙලිජ්ජවිල ප්‍රදේශයේ තිබෙන ඉඩමක් තක්සේරු කරලා තමයි රුපියල් 1,000ක තක්සේරු වටිනාකමක් අරගෙන තිබෙන්නේ. හැබැයි, වෙන ආයතනවලට දීලා තිබෙන්නේ මේ වාගේ ගණන්වලට නොවෙයි, මීට වඩා විශාල ගණන්වලට. ඒක, එක කාරණයක්.

අනෙක් කාරණය තමයි, මේ ඉඩම තක්සේරු කිරීම සහ බෙදා දීම සම්බන්ධව අපට කිසිම ලිපිලේඛනයක් ලැබී නැහැ. මම මේ ප්‍රශ්නයේත් ඉදිරිපත් කර තිබෙනවා ඒ සම්බන්ධව ලේඛනයක් සභාගත කරන්න කියලා. නමුත්, මේ පිළිතුරේදී එහෙම ඉදිරිපත් කර නැහැ. 2006 චක්‍රලේඛය අනුව මේ ඉඩම බෙදා දීමට ඇමතිතුමාගේ අනුමැතිය ලබාගෙනත් නැහැ. මේ ඉඩමට එහෙම එකක් ලබා දීලාත් නැහැ. අනෙක් පැත්තෙන් තක්සේරු කිරීම සම්බන්ධව ගැටලුවක් මතු වෙලා තිබෙනවා. මේ ඉඩම් ගත්ත අය ඒවා විකුණන්න යාම නිසා තමයි මේ ප්‍රශ්නය මතු වුණේ. එම නිසා මම නැවත වාරයක් නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධව පරීක්ෂණයක් කරන්න කියලා. ඒ නීතිමය ක්‍රියාමාර්ගය අරගෙන තිබෙන්නේ මේ ඉඩම බෙදා දීම සම්බන්ධව නොවෙයි. ඉඩම බෙදා දුන්නාට පස්සේ ඒක තහනම් කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට බලයක් නැතැයි කියන කාරණය තමයි ඒ නීතිමය කාරණයට ගිහිල්ලා තිබෙන්නේ. එහෙම නැතිව ඉඩම සම්බන්ධ කාරණයක් නොවෙයි.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු කථානායකතුමනි, අපේ ගරු මන්ත්‍රීතුමා නඟන ප්‍රශ්නය අනුව, මේ නිශ්චිත ඉඩම සේවකයන්ට ලබා දීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් අපි අමාත්‍යාංශය මට්ටමින් පරීක්ෂණයක් කරන්නම්.

## කුරුඳු වගාව දියුණු කිරීම සඳහා පිහිටුවා ඇති රාජ්‍ය ආයතන: විස්තර
## கறுவா பயிர்ச்செய்கையை அபிவிருத்தி செய்வதற்காகத் தாபிக்கப்பட்டுள்ள அரச நிறுவனங்கள்: விபரம்
## GOVERNMENT INSTITUTIONS ESTABLISHED TO DEVELOP CINNAMON CULTIVATION: DETAILS

1074/2025

**5. ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා**
(மாண்புமிகு அஜந்த கம்மெத்தெகே)
(The Hon. Ajantha Gammeddage)
වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ කුරුඳු වගා කරනු ලබන දිස්ත්‍රික්ක කවරේද;

(ii) කුරුඳු වගා කර ඇති බිම් ප්‍රමාණය කොපමණද;

(iii) කුරුඳු වගාව සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් පිහිටුවා ඇති රජයේ ආයතන කවරේද;

(iv) එම ආයතන අතරින් ගාල්ල දිස්ත්‍රික්කයේ පිහිටුවා ඇති ආයතන කවරේද;

(v) එම ආයතන පිහිටුවීම සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(vi) එම ආයතන මේ වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින්නේද;

(vii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் கறுவா பயிர்ச்செய்கை மேற்கொள்ளப்படும் மாவட்டங்கள் யாவை என்பதையும்;

(ii) கறுவா பயிர்ச்செய்கை மேற்கொள்ளப்பட்டுள்ள காணியின் அளவு யாது என்பதையும்;

(iii) கறுவா பயிர்ச்செய்கையை அபிவிருத்தி செய்வதற்காகத் தாபிக்கப்பட்டுள்ள அரச நிறுவனங்கள் யாவை என்பதையும்;

(iv) மேற்படி நிறுவனங்களில், காலி மாவட்டத்தில் தாபிக்கப்பட்டுள்ள நிறுவனங்கள் யாவை என்பதையும்;

(v) அந்த நிறுவனங்களைத் தாபிப்பதற்காகச் செலவிடப்பட்டுள்ள தொகை எவ்வளவு என்பதையும்;

(vi) மேற்படி நிறுவனங்கள் இன்றளவில் இயங்கு நிலையில் காணப்படுகின்றனவா என்பதையும்;

(vii) இன்றேல், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House -

(i) the names of the districts in which cinnamon is cultivated in Sri Lanka;

(ii) the total area of land under cinnamon cultivation in Sri Lanka;

(iii) the names of the government institutions that have been established for the development of cinnamon cultivation;

(iv) the names of the institutions that have been established in the Galle District, out of them;

(v) the amount of money that has been spent on establishing those institutions;

(vi) whether those institutions are currently in operational status; and

(vii) if not, the reasons for it?

(b) If not, why?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ශ්‍රී ලංකාවේ කුරුඳු වගා භූමිවලින් සියයට 90ක් පහත දිස්ත්‍රික්ක 5 තුළ වගා කර ඇත.

1. ගාල්ල
2. මාතර
3. රත්නපුර
4. හම්බන්තොට
5. කළුතර

ඊට අමතරව පහත දිස්ත්‍රික්කවලද සාපේක්ෂව සුළු පරිමාණයෙන් කුරුඳු වගා කර ඇත.

1. බදුල්ල
2. කුරුණෑගල
3. මාතලේ
4. ගම්පහ
5. පුත්තලම
6. මොනරාගල
7. කොළඹ
8. කෑගල්ල
9. අම්පාර
10. ත්‍රිකුණාමලය
11. මහනුවර
12. අනුරාධපුරය
13. පොළොන්නරුව
14. නුවරඑළිය

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

(ii) මුළු ප්‍රමාණය හෙක්ටෙයාර 37,500ක්. ඒ කියන්නේ, 2024 වර්ෂය වෙනකොට අක්කරවලින් කිව්වොත් 93,750යි.

ප්‍රධාන දිස්ත්‍රික්ක

| දිස්ත්‍රික්කය | භූමි ප්‍රමාණය (හෙක්ටෙයාර) |
|---|---|
| ගාල්ල | 12,350.55 |
| මාතර | 9,683.3 |
| රත්නපුර | 5,231.28 |
| හම්බන්තොට | 3,576.27 |
| කළුතර | 2,766.44 |

සෙසු දිස්ත්‍රික්කවල හෙක්ටෙයාර 3,892ක කුරුඳු වගා කරලා තිබෙනවා.

(iii) කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව.

(iv) ගාල්ල දිස්ත්‍රික්කයේ කරන්දෙනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය ස්ථාපිත කර ඇත.

(v) අවශ්‍ය මූලික භෞතික සම්පත් පමණක් වෙන් කළ අය වැය ප්‍රතිපාදන මඟින් සලසාගෙන ඇති අතර, 2024.01.01 දින සිට කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය ගාල්ල දිස්ත්‍රික්කයේ කරන්දෙනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බොරකන්ද ග්‍රාම නිලධාරි වසමෙහි මසකට රුපියල් 300,000ක කුලී පදනම මත ලබාගන්නා ලද ගොඩනැඟිල්ලක ආරම්භ කර ඇත.

(vi) ඔව්.

- ප්‍රධාන කාර්යාලය - ගාල්ල, කරන්දෙනිය
- කලාප කාර්යාලය - ගම්පහ
- ක්ෂේත්‍ර රාජකාරී කටයුතු කරන නිලධාරින් සංඛ්‍යාව 26යි.

ක්‍රියාත්මක කරන වැඩසටහන් ගැන ඔබතුමා අසා තිබෙනවා. ඒකට ටිකක් දීර්ඝ පිළිතුරක් තිබෙන්නේ. මම කීපයක් කියන්නම්.

- සුළු හා මධ්‍ය පරිමාණ කුරුඳු ව්‍යවසායකයන්හට නව අපනයන වෙළෙඳ පොළ විවෘත කර දීම හා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- සුළු හා මධ්‍ය පරිමාණ කුරුඳු ව්‍යවසායකයන්හට ජාත්‍යන්තර ප්‍රදර්ශන සඳහා සහභාගි කරවීමට අවශ්‍ය සහාය ලබා දීම මඟින් කුරුඳු අපනයනය ප්‍රවර්ධනය කිරීම.
- ව්‍යවසායකයන්හට විදේශ ගැණුම්කරුවන් හඳුන්වා දීම.
- විදේශ දූත මණ්ඩල සමඟ එක්ව කුරුඳු සඳහා නව අපනයන වෙළෙඳ පොළ විවෘත කර දීම.

  උදා - චීනය
- කුරුඳු සඳහා භූගෝලීය තත්ත්ව දර්ශක සහතිකය (GI) ලබා දීමට අවශ්‍ය විගණන කටයුතු කිරීම.
- ජාත්‍යන්තර කුරුඳු සඳහා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල නව වගා සංවර්ධන වැඩසටහන හා ආයෝජන ආධාර ලබා දීම සිදු කරනවා.

මේ යටතේ පර්චස් 20 සිට අක්කර 5 දක්වා නව වගාවන් සඳහා පැළ ලබා දීමේදී එක් පැළයක් සඳහා රුපියල් 15ක රජයේ දායකත්වයක් දරන අතර, අවශ්‍ය සියලු තාක්ෂණික උපදෙස් හා මඟ පෙන්වීම කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ලබා දේ.

ගරු කථානායකතුමනි, පිළිතුරේ ඉතිරි කොටස මා **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුරේ ඉතිරි කොටස:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடையின் எஞ்சிய பகுதி:*
** Rest of the Answer tabled:*

- සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල කුරුඳු වගාවන්ගේ ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන සඳහා ආයෝජන ආධාර ලබා දීම.
  - a. අවුරුදු 01කට වඩා පැරණි කුරුඳු වගා ඉඩම්වල පාළු සිටුවීම සඳහා පැළ සහ අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දෙන අතර එක් පැළයක් සඳහා රජය විසින් සියයට 50ක දායකත්වයක් ලබා දේ.
  - b. කුරුඳු වගාවන්ට සිදුවන පළිබෝධ හා සත්ව හානි වැළැක්වීම සඳහා උපාංග/පද්ධති හඳුන්වා දීම.
  - c. කාලගුණ විපර්යාසවලට අනුහුරු කිරීම සඳහා සුදුසු ජල සම්පාදන ක්‍රම හඳුන්වා දීම.
- උචිත තාක්ෂණය භාවිතයෙන් කුරුඳු නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම.
  - a. ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය උපකරණ/ යන්ත්‍ර සූත්‍ර සැපයීම.
  - b. අස්වනු සැකසීමේ උපකරණ/යන්ත්‍ර සූත්‍ර සැපයීම.
  - c. කුඩා/මධ්‍යම ප්‍රමාණයේ සැකසුම් මධ්‍යස්ථාන පිහිටුවීම/ අලුත්වැඩියා කිරීම.
  - d. කේන්ද්‍රීය සැකසුම් මධ්‍යස්ථාන පිහිටුවීම.
  - e. වාෂ්පශීලී තෙල් නිස්සාරණ ඒකක අලුතින් ඉදිකිරීම/ අලුත්වැඩියාව.
  - f. ගබඩා පහසුකම් සංවර්ධනය.
  - g. අගය එකතු කළ නිෂ්පාදන කර්මාන්ත පහසුකම්.
- කුරුඳු පශ්චාත් අස්වනු සැකසුම්/ අගය එකතු කිරීමේ නිෂ්පාදන සැකසුම් මධ්‍යස්ථාන සඳහා GMP/ISO 22000/HACCP/FSSC 22000/BRCGS ඇතුළු ප්‍රමිති සහතික ලබා ගැනීම සඳහා සහාය වීම.
- උපදේශන සේවාවන්
  - a. පැළ තවාන් ලියාපදිංචි කිරීම සහ මාර්ගෝපදේශනය
  - b. ගොවි පුහුණු හා ක්ෂේත්‍ර දින වැඩසටහන්.
  - c. යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ක්‍රියාත්මක කිරීම සහ සහතික කිරීමේ මාර්ගෝපදේශනය.
  - d. භූගෝලීය දර්ශක සහතිකය (GI) අනුකූලතාව පිළිබඳ මාර්ගෝපදේශනය
  - e. ස්ථානීය පාංශු pH පරීක්ෂණ.
  - f. සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
  - g. ක්ෂේත්‍ර පරීක්ෂණ හා උපදේශන සේවා
  - h. කුරුඳු කර්මාන්තශාලා සඳහා තාක්ෂණික සහාය
  - i. අගය එකතු කිරීම සහ අපනයනය ඉලක්ක කරගත් පුහුණු වැඩසටහන්
  - j. සහතික කිරීමේ සහාය

- තිහගොඩ ජාතික කුරුඳු පර්යේෂණ සහ පුහුණු මධ්‍යස්ථානය මඟින් සපයනු ලබන සේවාවන්.
    - a. විද්‍යාගාර විශ්ලේෂණ සේවා
    - b. ක්ෂේත්‍ර පරීක්ෂණ සේවා
    - c. උපදේශන සේවා
    - d. පුහුණු සේවා
    - e. පර්යේෂණ සහායන් සහ වෙනත් සේවා
    - f. කුරුඳු සැකසුම් ශිල්පීන් පුහුණු කිරීම
    - g. කුරුඳු ශ්‍රේණිගත කිරීම, සැකසීම සහ අගය එකතු කිරීම
    - h. යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) පිළිබඳ පුහුණුව

(vii) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

**ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා**
(மாண்புமிகு அஜந்த கம்மெத்தெகே)
(The Hon. Ajantha Gammeddage)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාගෙන් මම අහන පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. කුරුඳු කර්මාන්තය ගත්තාම, ප්‍රධාන වශයෙන්ම ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කයේ තමයි මේ කර්මාන්තය ආරම්භ වෙන්නේ. ඊට පස්සේ මේක රට පුරා ව්‍යාප්ත වෙනවා. රට පුරා ව්‍යාප්ත වෙන මේ කුරුඳු කර්මාන්තය පසුකාලීනව - දැන් - පොදුවේ ගත්තාම, විශාල විදේශ මුදල් ප්‍රමාණයක් රට තුළට ගේන කර්මාන්තයක් බවට පත් වෙලා තිබෙනවා.

මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, ගාල්ල දිස්ත්‍රික්කයේ කරන්දෙනිය, ඇල්පිටිය, තවලම හා හිනිදුම වාගේ ප්‍රදේශ සහ මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය, මුලටියන, දෙයියන්දර හා හක්මණ වාගේ ප්‍රදේශ ආශ්‍රිතව ජීවත් වන ජනතාව ප්‍රධානම ජීවනෝපාය කරගෙන තිබෙන්නේ කුරුඳු කර්මාන්තය බව. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුරේත් සඳහන් වුණා, කුරුඳු කර්මාන්තය දැන් රට පුරා ව්‍යාප්ත වෙලා තිබෙනවා කියලා. අපි දැක්කා, එම කර්මාන්තය දියුණු කර ගැනීම සඳහා පසුගිය වකවානුවේ ඒ වෙනුවෙන් යම් මැදිහත් වීමක් අමාත්‍යාංශය යටතේ සිදු කරනවා. කුරුඳු කර්මාන්තය දියුණු කර ගැනීම සඳහා මම හිතන විධියට කුරුඳු සංවර්ධන පනත දැනට සකසා තිබෙනවා. නමුත්, එම පනත තවම සක්‍රිය තත්ත්වයට ගෙනෙන්න කටයුතු කරලා නැහැ.

ගරු අමාත්‍යතුමනි, කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ දිගටම සංවර්ධනය කරන්න කටයුතු කරනවාද? එහෙම නැත්නම් එම ආයතනය අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට නැවත අනුගත කරනවාද කියලා අපට දැන ගන්නට ඕනෑ. මොකද, නිලධාරින් තුළ මතයක් තිබෙනවා කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව නැවත අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ලබා දෙනවා කියලා.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා පැහැදිලි කළා වාගේ, අපේ රටේ වැවිලි ක්ෂේත්‍රයේ ප්‍රධාන වැවිලි භෝග හතරෙන් එකක් හැටියට අපි කුරුඳු සලකනවා. ගිය වසරේ අපි කුරුඳු අපනයනයෙන් ඩොලර් මිලියන 262ක් උපයාගෙන තිබෙනවා. අමාත්‍යාංශයක් හැටියට අපි සෑම වැවිලි භෝගයකටම ප්‍රතිපත්තියක් සකස් කරලා තිබෙනවා. ඒ වාගේම වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. කුරුඳු වගාවේ ප්‍රවර්ධනය වෙනුවෙන් පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්මක් හදලා තිබෙනවා. ඒකට අනුව ගිය අවුරුද්දේ අපි ලැබුවේ, ඩොලර් මිලියන 262ක ආදායමක්. අපි බලාපොරොත්තු වනවා 2030 වනකොට ඩොලර් මිලියන 500 දක්වා අපනයන ආදායමක් උපයා ගන්න තත්ත්වයට එම වගාව වැඩිදියුණු කරන්න. ඒ සඳහා අවශ්‍ය නෛතිකමය පැත්තේ ශක්තියක් ලබා දීම සහ අනෙකුත් යටිතල පහසුකම් දියුණු කිරීම, ගොවීන්ට අදාළ පහසුකම් ලබා දීම අමාත්‍යාංශයක් හැටියට අපේ වැඩ පිළිවෙළ තුළ සැලසුම් කර තිබෙන බව ඔබතුමාට මතක් කරන්න කැමැතියි.

ඔබතුමා ඇසූ ප්‍රශ්නය තමයි, කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව ඉදිරියේදී මොන යම් තත්ත්වයකට පත් වෙයිද කියන එක. අපි දන්නවා, මේ රටේ රාජ්‍ය ආයතන විවිධ අරමුණු සඳහා සකස් කර තිබෙන බව. සමහර ඒවා ඇත්ත අවශ්‍යතාවටම, එම ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් සකස් කරලා තිබෙන දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල. සමහර ආයතන දේශපාලන අරමුණු ඇතිව හදලා තිබෙනවා. සමහර ආයතන නිලධාරින් අරමුණු කරගෙන හදලා තිබෙනවා. හැබැයි, ජාතික ජන බලවේගයේ රජය හැටියට අපි කල්පනා කර තිබෙනවා, රට අරමුණු කර ගත්ත, රාජ්‍ය ව්‍යුහයක් ශක්තිමත් කළ යුතුයි කියලා.

ඒ සඳහා අපි ජනතාවගෙන් වරමක් ලබා තිබෙනවා. එම නිසා අපි මේ වනකොට රාජ්‍ය ආයතන එකසිය ගණනක් සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යතුමියගේ මූලිකත්වයෙන්, අග්‍රාමාත්‍ය කාර්යාලයේ මූලිකත්වයෙන් සාකච්ඡාවක් පවත්වනවා, ඒවා යම්කිසි විධියකට ශක්තිමත් කරන්නේ කොහොමද කියන එක ගැන. අන්න ඒ ගොන්නේ මේ කියන කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවත් තිබෙනවා. මේ දෙපාර්තමේන්තුව පිහිටෙව්වාට මේකට අදාළ පනතක් තවම මේ රටේ සම්මත වෙලා නැහැ. සුළු අපනයන භෝග හැටියට ගම්මිරිස් ආදි තවත් භෝග විශාල ප්‍රමාණයක් තිබෙනවා. කුරුඳු භෝගය ඒක ඇතුළේත් තිබෙනවා. ඒ නිසා මෙහි අවසාන අදහස අපට දැන්ම කියන්න පුළුවන්කමක් නැහැ. අර පවත්වන සාකච්ඡාවෙන් අනතුරුව කුරුඳු ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් හොඳ ශක්තිමත් ව්‍යුහයක් තුළට එය අරගෙන එනවා කියා ඔබතුමාව දැනුවත් කරන්න මා කැමැතියි.

**ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා**
(மாண்புமிகு அஜந்த கம்மெத்தெகே)
(The Hon. Ajantha Gammeddage)

පිළිතුරු ලබා දුන්නාට ගරු ඇමතිතුමාට බොහොම ස්තුතියි. ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය විධියට මා ඉදිරිපත් කරන්නේ කුරුඳුවලට අදාළ නොවන ප්‍රශ්නයක්. ඔබතුමා අවස්ථාව දෙනවා නම්, මට තේ පිළිබඳ ප්‍රශ්නයක් නඟන්න තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, මුල් ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්න අහන්න.

**ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා**
(மாண்புமிகு அஜந்த கம்மெத்தெகே)
(The Hon. Ajantha Gammeddage)

ගරු ඇමතිතුමනි, තේ වගාවත් ඔබතුමාගේ විෂය පථය යටතේයි තිබෙන්නේ. අප ජීවත් වන ප්‍රදේශවල කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මැදිහත් වීමක් කරනවා. තේ වගාවේ අස්වැන්න වැඩි කර ගැනීමට අවශ්‍ය විධියට තේ වගාව සඳහා පොහොර සහනාධාරය ලබා දීමට කටයුතු කරනවාද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අමාත්‍යතුමා, කෙටියෙන් පිළිතුරු දෙන්න.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, වැවිලි ක්ෂේත්‍රයටම අදාළ ප්‍රශ්නයක් එතුමා ඇහුවේ. මේ මොහොතේ වැවිලි ක්ෂේත්‍රයේ නිරත ජනතාව නිරන්තරයෙන් විමසන ප්‍රශ්නයක් මේක. ඒ ප්‍රශ්නය ඇසීම ගැන මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි දන්නවා, මේ රටේ තේ කර්මාන්තය ඇතුළු වැවිලි ක්ෂේත්‍රය පසුගිය කාලයේ විවිධ විධියට අඩාළ වෙලා දුර්වල මට්ටමට වැටුණු බව. ඒකට විශේෂයෙන් බලපෑවා, පොහොර ප්‍රශ්නය. අපේ රටේ පසුගිය ඉතිහාසය ගැන කවුරුත් දන්නවා. පොහොර හිඟකමත් එක්ක, පොහොර නැති කිරීමත් එක්ක, ගත්තු තීන්දු තීරණත් එක්ක කෘෂිකාර්මික ක්ෂේත්‍රය සැලකිය යුතු අර්බුදයකට ලක් වුණා. ඒ වාගේ අර්බුදයකට ලක් වෙච්ච අංශයක් තමයි තේ කර්මාන්තය. ඒකත් එක්ක පසුගිය වසරේ ගොවීන්ට තේ පොහොර ලබා දීම අප විසින් සිදු කරනු ලැබුවා. හැබැයි, එහිදී ගොවීන්ගේ පැත්තෙන් මැසිවිල්ලක් ආවා, පොහොර ලැබෙන්නේ ප්‍රමාද වෙලා කියලා; එක සමාගමකින් විතරක් පොහොර ලබා දෙන්න එපා කියලා. සමහර ගොවීන්ගේ රුචිකත්වයක්, කැමැත්තක් තිබෙනවා, අනෙකුත් සමාගම්වලිනුත් පොහොර ගන්න. ඒ සියල්ල සැලකිල්ලට ලක් කරලා අපි කැබිනට් මණ්ඩලයෙන් අනුමැතියක් ගත්තා, පොහොර ලබා දීමේ නව ක්‍රමවේදයක් සකස් කරන්න.

ඒ වාගේම අපේ තේ මණ්ඩලය විසින් 2025 අවුරුද්දට තේ ගොවීන් සඳහා පොහොර සහනාධාරය ලබා දෙන්න රුපියල් මිලියන 2,000ක මුදලක් වෙන් කර තිබෙනවා. මේ රටේ තේ ක්ෂේත්‍රයේ සියයට 75ක් ඉන්නේ කුඩා තේ වතු ගොවීන්. අපි ඔවුන් ඉලක්ක කරගෙන රුපියල් මිලියන 200ක තේ පොහොර සහනාධාරයක් ලබා දෙන්න මේ වනකොට සැලසුම් කර තිබෙනවා. ඒක QR code එකක් මඟින් ලබා දෙන්න තමයි සැලසුම් කර තිබෙන්නේ.

රාජ්‍ය පොහොර සමාගම ඇතුළු ජාතික පොහොර ලේකම් කාර්යාලයේ ලියාපදිංචි පොහොර සමාගම් ගණනාවකින් QR code එකක් මඟින් පොහොර ලබා ගන්න පුළුවන් විධියට අපි කටයුතු සැලසුම් කර තිබෙනවා. ඒ අනුව මේ මස 26වැනි දා කළුතර, මතුගම ඉත්තෑපාන කියන ප්‍රදේශයේදී පළමු QR code එක ලබා දෙමින් ගොවීන්ට මේ අවුරුද්දට අවශ්‍ය තේ පොහොර ඉතා ඉක්මනින් ලබා දීමේ වැඩ පිළිවෙළ අපි ආරම්භ කරනවා කියා ගරු මන්ත්‍රීතුමාට දැනුවත් කරන්න කැමැතියි.

## අධිසේවක පදනම මත පත් කරන ලද විදුහල්පතිවරුන්: පරිපාලන දීමනාව
### மிகை ஊழியர் அடிப்படையில் நியமிக்கப்பட்ட அதிபர்கள்: நிருவாகக் கொடுப்பனவு
### PRINCIPALS APPOINTED ON SUPERNUMERARY BASIS: ADMINISTRATIVE ALLOWANCE

1100/2025

**6. ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අතිදුෂ්කර පාසල්වල දීර්ඝ කාලයක සිට විදුහල්පතිවරුන් ලෙස සේවය කළ/සේවය කරන විදුහල්පතිවරුන් 2012.08.08 දිනැති අංක අමප/12/1101/530/035 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අධිසේවක පදනම මත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2(ii) ශ්‍රේණියේ හා 3 ශ්‍රේණියේ විදුහල්පතිවරුන් ලෙස පත් කළ බවත්;

(ii) 2021.11.23 දිනැති අංක අමප/21/1824/308/139 දරන අමාත්‍ය මණ්ඩල තීරණය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ 2022.06.02 දිනැති අංක PSC / EST / 02 -05 / 01 / 2020 දරන ලිපිය ප්‍රකාරව ඔවුන්ගේ පත්වීම් ස්ථිර කළ බවත්;

එතුමිය දන්නේද?

(ආ) (i) පාසල් වර්ගීකරණය අනුව අනෙකුත් පාසල්වල විදුහල්පතිවරුන්ට ගෙවනු ලබන පරිපාලන දීමනාව ඉහත (අ)හි සඳහන් විදුහල්පතිවරුන්ටද 2018 මාර්තු දක්වා ගෙවූ නමුත්, මේ වන විට එය නොගෙවන බව දන්නේද;

(ii) ඊට හේතු කවරේද;

(iii) විදුහල්පති පුරප්පාඩු සඳහා පත්වීමට සහ අනෙකුත් විදුහල්පතිවරුන් සමඟ සුහද මාරු සඳහා කරනු ලබන ඉල්ලීම් මේ වන විට ප්‍රතික්ෂේප කරන බව දන්නේද;

(iv) ඊට හේතු කවරේද;

(v) අභ්‍යන්තර හා අන්තර් කලාප ස්ථාන මාරුවීම් සහ උසස්වීම් ඉහත (අ)හි සඳහන් විදුහල්පතිවරුන්ට ලබා දෙන්නේද;

(vi) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමිය සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) அதிகஷ்டப் பிரதேச பாடசாலைகளில் நீண்ட காலமாக அதிபர்களாகப் பணியாற்றிய/பணி யாற்றும் அதிபர்கள் අමප/12/1101/530/035ஆம் இலக்க, 2012.08.08ஆம் திகதிய அமைச்சரவைத் தீர்மானத்துக்கமைய மிகை ஊழியர் அடிப் படையில் இலங்கை அதிபர் சேவையின் தரம் 2 (ii) மற்றும் தரம் 3க்கான அதிபர்களாக நியமிக்கப்பட்டனர் என்பதையும்;

(ii) අමප/21/1824/308/139ஆம் இலக்க, 2021.11.23 ஆம் திகதிய அமைச்சரவைத் தீர்மானம் மற்றும் பகிரங்கச் சேவை ஆணைக்குழுச் செயலாளரின் PSC/EST/02-05/01/2020ஆம் இலக்க, 2022.06.02 ஆம் திகதிய கடிதத்துக்கு அமைவாக அவர்களது நியமனங்கள் நிரந்தரமாக்கப்பட்டன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) பாடசாலைகளின் தரப்படுதலுக்கு அமைவாக ஏனைய பாடசாலைகளின் அதிபர்களுக்குச் செலுத்தப்படுகின்ற நிருவாகக் கொடுப்பனவு மேற்படி (அ)இல் குறிப்பிடப்பட்ட அதிபர் களுக்கும் 2018 மார்ச் வரை செலுத்தப்பட்ட போதிலும், தற்பொழுது அது செலுத்தப் படுவதில்லை என்பதை அறிவாரா என்பதையும்;

(ii) அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(iii) அதிபர் வெற்றிடங்களுக்கான நியமனங் களுக்கும் வேறு அதிபர்களுடனான ஒத்துமாறு தலுக்கும் முன்வைக்கப்படுகின்ற கோரிக்கைகள் தற்பொழுது நிராகரிக்கப்படுகின்றன என்பதை அறிவாரா என்பதையும்;

(iv) அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(v) உள்ளக மற்றும் வலயங்களுக்கு இடையிலான இடமாற்றங்கள் மற்றும் பதவி உயர்வுகள் மேற்படி (அ)இல் குறிப்பிடப்பட்ட அதிபர்களுக்கு வழங்கப்படுகின்றதா என்பதையும்;

(vi) இன்றேல், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Is she aware that -

(i) according to Cabinet Decision No. අමප/12/1101/530/035 dated 08.08.2012, principals who served or are currently serving in schools in remote areas for extended periods have been appointed to Grades 2(ii) and 3 of the Sri Lanka Principals' Service on supernumerary basis; and

(ii) the appointments of them were confirmed as per Cabinet Decision No. අමප/21/1824/308/139 dated 23.11.2021, and the letter No. PSC/EST/02-05/01/2020 dated 02.06.2022, issued by the Secretary to the Public Service Commission?

(b) Will she inform this House -

(i) whether she is aware that the administrative allowance paid to principals of other schools as per the school categorization was also paid to the principals mentioned in (a) above until March 2018, but it is not paid at present?

(ii) the reasons for it;

(iii) whether she is aware that current requests for appointments to fill principal vacancies and for mutual transfers are rejected;

(iv) the reasons for it;

(v) whether internal and inter-zonal transfers and promotions are granted to the principals mentioned in (a) above; and

(vi) if not, the reasons for it?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)

(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ඔව්. අංක අමප/12/1101/530/35 හා 2012.08.08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව හා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/AP/A12/10/2010 හා 2012.09.21 දිනැති උපදෙස් අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 පන්තිය II ශ්‍රේණියට අධිසේවක පදනම මත නිලධාරින් 1399ක් හා 3 පන්තියට අධිසේවක පදනම මත නිලධාරින් 142ක් ලෙස පත්වීම් ලබා දී ඇත.

(ii) ඔව්. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක PSC/EST/02-05/01/2020 හා 2022.06.02 දිනැති ලිපියේ උපදෙස් ප්‍රකාරව එවැනි නිලධාරින් අධිසේවක පදනම මත සේවයේ ස්ථිර කර, ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන අනුව අදාළ අවශ්‍යතා සම්පූර්ණ කර ඇති නිලධාරින්ට අධිසේවක පදනම මත ශ්‍රේණි උසස්වීම් ලබා දීම ද සිදු කරනු ලබයි.

(ආ) (i) විදුහල්පති දීමනාව අනුමත කර තිබෙන්නේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරින්ට වන අතර ඉහත (අ) හි සඳහන් නිලධාරින්ගේ පත්වීම් ලිපියේ කොන්දේසි ප්‍රකාරව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ තනතුරට අදාළ වැටුප් ලබා ගැනීමේ හිමිකම හැර වෙනත් කිසිදු වරප්‍රසාදයක් හිමි නොවේ.

(ii) අධ්‍යාපන ලේකම්ගේ අංක ED/04/60/01/වි.දීමනා/2017 හා 2017.03.29 දිනැති ලිපිය අනුව ආ (I) හි සඳහන් දීමනාව ලබා දිය යුතු වන්නේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ හෝ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1, 2 හා 3 පන්තියේ වරප්‍රසාද හිමි නිලධාරින් සඳහා පමණක් වේ.

(iii) PSC/EST/02-05/01/2020 හා 2022.06.02 දිනැති ලිපියේ උපදෙස් ප්‍රකාරව අධිසේවක පදනම මත පත්වීම් ලබා ඇති මෙවැනි නිලධාරියකුට තවත් එවැනි නිලධාරියකු සමඟ සුහද ස්ථාන මාරු ලබා ගැනීමට පමණක් අවස්ථාව සලසා ඇත. ඊට බැහැරව ලැබෙන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(iv) මෙම නිලධාරින්ට රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/AP/A12/10/2010 හා 2012.09.21 දිනැති ලිපියේ 02 (iv) පරිදි පත්වීම් ලබා දී ඇති අතර මෙවැනි නිලධාරින්ගේ පත්වීම් ලිපියේ 2 ඡේදයේ (II) වගන්තිය අනුව විදුහල්පති සේවයේ නිත්‍ය තනතුරකට පත්වීම ලබා ගැනීම විදුහල්පති සේවා ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසි අනුව සිදු විය යුතු බව දක්වා ඇත. ඒ අනුව මෙවැනි නිලධාරින් නිත්‍ය කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සඳහා පත් කිරීම සේවා ව්‍යවස්ථානුකූල බඳවා ගැනීමක් යටතේ සීමිත තරග විභාගයකින් සමත්ව, ව්‍යවස්ථා ප්‍රකාර සුදුසුකම් සම්පූර්ණ කිරීම මත පමණක් සිදු කරනු ලැබේ. ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳව ඉහත (iii) හි දක්වා ඇති පරිදි PSC/EST/02-05/01/2020 දරන ලිපියේ උපදෙස් ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

(v) ඉහත (iii) හි දක්වා ඇති පරිදි PSC/EST/02-05/01/2020 හා 2022.06.02 දිනැති ලිපියේ උපදෙස් ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

(vi) ඉහත (iii) හි දක්වා ඇති පරිදි PSC/EST/02-05/01/2020 හා 2022.06.02 දිනැති ලිපියේ උපදෙස් ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමනි, මේකට යම්කිසි එකතු කිරීමක් කළ යුතුයි. මෙම පත්වීම් සියල්ල ලබා දී ඇත්තේ විදුහල්පති සේවයේ බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව නොවෙයි. ඒ නිසා තමයි මේ බඳවා ගැනීම් සහ මාරු කිරීමේ පටිපාටිය සම්බන්ධයෙන් මේ ගැටලු සියල්ල අපට එන්නේ.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
கௌரவ பிரதி அமைச்சர் அவர்களே, நன்றி! இலங்கையில் யுத்தம் நடைபெற்றுக் கொண்டிருந்தபோது கல்விச் சூழல் மிகவும் மோசமாக இருந்தது. இந்த நிலை நாடு முழுவதும் காணப்பட்டு இருந்தாலும், நான் எங்களுடைய மாகாணத்தைப் பற்றி சொல்கின்றேன். அக்காலகட்டத்தில் அங்குள்ள பாடசாலைகளில் அதிபர்களுக்கான தேவை காணப்பட்டதன் காரணமாகத்தான் 2012ஆம் ஆண்டு அரசாங்கத்தால் இந்த அதிபர்கள் ஆட்சேர்ப்புச் செய்யப்பட்டனர். 10 வருடங்களின் பின்னர் அவர்களது நியமனங்கள் நிரந்தரமாக்கப்பட்டு, அதிபர் சேவையில் அவர்கள் உள்வாங்கப்பட்டு இருந்தார்கள். அவ்வாறு நிரந்தர அதிபர்களாக உள்வாங்கப்பட்டவர்களுக்கு அவர்களை ஒத்த ஏனைய அதிபர்களைப்போன்று சம்பளம் வழங்கப்படுகின்றது. அதுபோல ஏனைய அதிபர்களுக்குக் கிடைக்கின்ற உரித்துக்கள் இந்த அதிபர்களுக்கும் வழங்கப்பட வேண்டும்.

உதாரணமாக, 2018 வரை பாடசாலைகளின் தரப்படுத் தலுக்கு ஏற்ற வகையில் அதிபர்களுக்கு ஒரு மேலதிகக் கொடுப்பனவு வழங்கப்பட்டது. அந்தக் கொடுப்பனவு என்பது அதிபர்களுக்கான சம்பளமல்ல. பாடசாலைகளின் தரத்துக் கேற்ப அந்தக் கொடுப்பனவு வழங்கப்படுவதற்கான காரணம், அந்த அதிபர்கள் விசேட தேவை கருதி அந்தப் பணத்தைச் செலவழிப்பதற்காகும். உதாரணமாக, inspection team ஒன்று வருகின்றபோது அவர்களை உபசரிப்பதுபோன்ற ஏனைய சில தேவைகளுக்காகத்தான் அந்தக் கொடுப்பனவு செலுத்தப் பட்டது. அந்தக் கொடுப்பனவு 2018 வரை வழங்கப் பட்டபோதிலும் தற்பொழுது நிறுத்தப்பட்டிருக்கின்றது. இங்கு குறிப்பிடப்பட்டிருக்கின்ற சுற்றுநிருபங்கள் மற்றும் ஆட்சேர்ப்புப் பிரமாணக்கோவையில் இதுபோன்ற பல திருத்தங்கள் செய்யப்பட வேண்டும். இவ்வளவு காலமும் இந்தத் திருத்தங்கள் செய்யப்படாமலிருக்கின்றது. 2012ஆம் ஆண்டிலிருந்து இந்த அதிபர்களுக்கு இடமாற்றம் வழங்கப் படவில்லை. எந்தக் கஷ்டப் பிரதேசத்தில் 2012ஆம் ஆண்டு அதிபர்களாக நியமனம் பெற்றார்களோ இன்றுவரையும் அதே பாடசாலையில் அவர்கள் அதிபர்களாக இருக்கின்றார்கள்.

என்னுடைய முதலாவது கேள்வி என்னவென்றால், அமைச்சரவையின் அங்கீகாரத்தைப் பெற்று, ஏற்கனவே இருக்கின்ற இந்தச் சுற்றுநிருபங்களில் மாற்றங்களை ஏற்படுத்தி, இவர்களுக்கு இழைக்கப்பட்டுள்ள அநீதிக்கு இந்த அரசினுடைய ஆட்சிக் காலத்தில் கௌரவ கல்வி அமைச்சர் அவர்கள் ஒரு தீர்வைக் காண்பாரா? என்பதுதான். அதற்குத் தீர்வு காணவேண்டும் எனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නය කෙටි කරන්න.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
දැන් ඉවරයි.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු මන්ත්‍රීතුමනි, ඒ ප්‍රශ්නය ඇසුවාට බොහොම ස්තුතියි. අපි මේ පිළිබඳව අදාළ නිලධාරින් සමඟ සාකච්ඡා වට කිහිපයක් පැවැත්වූවා, විශේෂයෙන්ම උතුරු ප්‍රදේශයේ. මෙහිදී මූලික ගැටලුව පැන නඟින්නේ, සේවා ව්‍යවස්ථාවේ බඳවා ගැනීමේ පටිපාටිය අනුව බඳවා නොගැනීමේ කාරණාවත් එක්ක. ඒ නිසා මේ ගුරුවරුන්ට සිද්ධ වෙලා තිබෙනවා, විදුහල්පති සේවයේ සේවය කරමින් එම පාසලේම රැඳී සිටින්න. ඒ වාගේම මාරුවීම් සඳහාත් නිසි ක්‍රමයක් නැහැ. මේ මූලික ප්‍රශ්නය පැන නඟින්නේම බඳවා ගැනීමත් එක්කයි. විදුහල්පති සේවයේ නිසි බඳවා ගැනීමේ පටිපාටිය අනුව මේක කළා නම්, ඒ බඳවා ගැනීමට අදාළයි, මාරුවීම් පටිපාටිය සහ උසස්වීම් පටිපාටිය. ඒ නිසා මූලික ප්‍රශ්නය පැන නඟින්නේ ඒ කාරණාවත් එක්ක. ඇත්තටම ඒ පිරිසට ඒ ගැටලුවට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. අපි ඒ ගැන සාකච්ඡා කළා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කාරණා දෙකක් සඳහන් කළා. එකක්, අමතර දීමනාව සම්බන්ධව. අමතර දීමනාව ගැන මම පැහැදිලි කළා වාගේම, ඒ සඳහා නීතිමය ප්‍රතිපාදන තිබෙන්නේ විදුහල්පතිවරුන්ට. ඒක, එකක්. ඊළඟට මාරුවීම් පටිපාටියේදී සුහද මාරුවීම් - mutual transfers - කරන්න පුළුවන් වෙන්නෙත් මේ කියන කාරණාව අනුව ඒ සේවයට අදාළ තව කෙනෙකු සමඟ විතරයි. එතකොට, සීමාසහිත කොටසකට විතරයි ඒක බලපාන්නේ. ඒ අනුව ඒක පොදු වෙන්න විධියක් නැහැ, විදුහල්පති සේවයේ ඉන්න අනෙක් පිරිසට වාගේ. ගරු කථානායකතුමනි, අපි අදාළ පිරිසත් සමඟ සාකච්ඡා කරලා, ඉදිරියේදී සියලු සේවා සම්බන්ධයෙන් අධ්‍යාපන කවුන්සලය පත් කළාට පස්සේ මේ නිශ්චිත සේවාව සම්බන්ධයෙන්, - මේක සේවාවක් නොවෙයි - මේ නිශ්චිත කණ්ඩායම වෙනුවෙන් යම්කිසි තීරණයක් ගැනීමට එකඟතාව පළ කර ගත්තා. ඒ අනුව අපි සාකච්ඡා කරමු.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
கௌரவ பிரதி அமைச்சர் அவர்களே, உங்களுடைய பதிலுக்கு நன்றி!

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக வினாவை கௌரவ சிறீதரன் அவர்கள் கேட்பார்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ சபாநாயகர் அவர்களே, இந்த வினாவைக் கேட்பதற்கு அனுமதி வழங்கியமைக்கு நன்றி!

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, ஓர் ஆசிரியராகவும் அதிபராகவும் இருந்தவன் என்ற வகையில், எனது அனுபவத்தில் நான் இந்த விடயத்தைக் குறிப்பிடுகின்றேன். என்னோடு இருந்த சக அதிபர்கள்தான் இதில் சம்பந்தப் பட்டிருக்கிறார்கள். கடந்த 09ஆவது பாராளுமன்ற அமர்விலும் மிகை ஊழியர் அடிப்படையில் நியமிக்கப்பட்ட அதிபர்கள் தொடர்பாக நான் ஓர் ஒத்திவைப்புப் பிரேரணையைக் கொண்டுவந்து இவ்வாறான ஒரு கேள்வியையும்கூட நான் கேட்டிருந்தேன். அதற்குரிய நிவாரணம் கிடைக்கும் என அப்போது சொன்னார்கள். இப்போது நீங்கள் சொல்கின்றீர்கள், கடந்த அரசாங்கங்கள் பிழைவிட்டதாக. இப்போதிருக்கின்ற இந்த அரசாங்கக் காலத்திலாவது நீதி கிடைக்க வேண்டும்.

குறிப்பாக, கிளிநொச்சி, முழங்காவில் மகா வித்தியாலயம் ஒரு தேசியப் பாடசாலையாகும். அங்கு 12 வருடங்களாக மிகை ஊழியர் அடிப்படையில் அதிபராக இருந்த

ஆனந்தராஜா என்பவரைத் திடீரென நிறுத்திவிட்டு, இன்னொருவர் நேர்முகப் பரீட்சையின் அடிப்படையில் நியமனம் செய்யப்பட்டுள்ளார். கொழும்பில் கல்வி அமைச்சின் அதிபர் சேவைப் பிரிவில் தகுதியான தமிழ் உத்தியோகத்தர்கள் இல்லை. குறிப்பாக, கல்வி அமைச்சில் இருக்கின்ற பிரணவநாதன் என்ற தகுதியான ஒரு தமிழ் உத்தியோகத்தர் இவ்விடயத்தில் மிகவும் பிழையாக நடந்திருக்கின்றார். ஆனந்தராஜா அவர்கள் பழிவாங்கப்பட்டு நிறுத்தப் பட்டிருக்கின்றார். அதேநேரம், இன்னுமொரு அதிபர் அங்கு நியமனம் செய்யப்பட்டுள்ளார். அதிபர் சேவையில் Grade 1இல் இருக்கின்ற, 12 வருடங்கள் அதிபராக இருந்த ஆனந்தராஜா அவர்கள் இப்பொழுது அந்தப் பாடசாலை யில் ஆசிரியராக இருக்கின்றார். Prime Minister ஆகவும் இருக்கின்ற கல்வி அமைச்சர் அவர்களே, இது உங்களுடைய அரசாங்கக் காலத்தில் அவருக்கு நடந்துள்ள மிகப் பெரிய அநீதி! நான் இந்த விடயம் தொடர்பாக உங்களுக்கு எழுத்துமூலமான கடிதமும் அனுப்பியிருந்தேன். எனினும் இதுவரை நீதி கிடைக்கவில்லை. 'மிகை ஊழியர்' என்ற இவ்வாறான சொல் தொடர்பாக கௌரவ பிரதி அமைச்சர் "இதுவொரு சேவையல்ல" என்று சொல்கின்றார். ஆசிரியர் சேவைக்கு நியமிக்கப்பட்டு, பின்னர் சேவையின் அடிப்படையில் அதிபர் சேவைக்கு உள்வாங்கப்பட்டவர் களைக் 'குழு' எனச் சொல்வது எந்தளவுக்கு நியாயம்? ஆசிரியராக, அதிபராக மாணவர் களுக்குப் பணியாற்றியவர்களின் சேவையை அது சேவையல்ல, குழு என்று சொல்வது நியாயமானதா?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය කෙටි කරන්න.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
தயவுசெய்து நல்ல தீர்வைத் தாருங்கள்! இதற்குரிய நியாயமான தீர்வைச் சொல்லுங்கள்!

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු කථානායකතුමනි, මම කලින් කිව්වා වාගේ මේ කාරණය අපි සාකච්ඡා කර තිබෙනවා, විශේෂයෙන් උතුරුකරයේ ඉන්න නිශ්චිත පිරිස එකතු වෙලා. ගරු මන්ත්‍රීතුමා මතු කළ නිශ්චිත කාරණාව පිළිබඳව අපව දැනුවත් කරන්න. අපි ඒ අවශ්‍ය මැදිහත්වීම කරන්නම්. මේ කාරණය අපි ඉදිරියේදී පිහිටුවන අධ්‍යාපන කවුන්සලයට යොමු කරනවා.

## බඩඉරිඟු නිෂ්පාදනය, ආනයනය සහ මිල පාලනය: විස්තර

## சோள உற்பத்தி, இறக்குமதி, விலைக் கட்டுப்பாடு: விபரம்

## PRODUCTION, IMPORT AND PRICE CONTROL OF MAIZE: DETAILS

1104/2025

**7.** **ගරු සුරංග රත්නායක මහතා**
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2023, 2024 සහ 2025 වර්ෂයේ පළමු කාර්තුව තුළ ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද බඩඉරිඟු ප්‍රමාණය සහ ආනයනය කරන ලද බඩඉරිඟු ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් මෙට්‍රික්ටොන්වලින් කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ බඩඉරිඟු නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා මේ වනවිට සකස් කර ඇති වැඩ පිළිවෙළ කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ බඩඉරිඟු අස්වැන්න නෙළන කාලවලදී ගොවියාට සාධාරණ මිලක් ලබා දීමට හැකියාවක් තිබේද;

(iv) බඩඉරිඟු මිල උච්චාවචනය වීම පාලනය කිරීම සඳහා සකස් කර ඇති වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2023, 2024 ஆண்டுகளிலும் 2025ஆம் ஆண்டின் முதலாவது காலாண்டிலும் இலங்கையில் உற்பத்தி செய்யப்பட்ட சோளத்தின் அளவு மற்றும் இறக்குமதி செய்யப்பட்ட சோளத்தின் அளவு என்பன ஒவ்வோர் ஆண்டு வாரியாக வெவ்வேறாக மெட்ரிக் டொன்களில் எவ்வளவு என்பதையும்;

(ii) இன்றளவில் இலங்கையில் சோள உற்பத்தியை மேம்படுத்துவதற்காக வகுக்கப்பட்டுள்ள வேலைத்திட்டம் யாது என்பதையும்;

(iii) இலங்கையில் சோள அறுவடை மேற் கொள்ளப்படும் காலங்களில் விவசாயிகளுக்கு நியாயமான விலையைப் பெற்றுக்கொடுப்பதற் கான இயலுமை உள்ளதா என்பதையும்;

(iv) சோளத்தின் விலை ஏற்ற இறக்கங்களைக் கட்டுப்படுத்துவதற்காக வகுக்கப்பட்டுள்ள வேலைத்திட்டம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House-

(i) the quantity of maize produced in Sri Lanka and the quantity imported to Sri Lanka during each of the years 2023, 2024 and during the first quarter of 2025, separately in metric tons;

(ii) the course of action that has been put in place at present to promote maize production in Sri Lanka;

(iii) whether a reasonable price can be given to farmers during the maize harvesting periods in Sri Lanka; and

(iv) the programme in place to control the fluctuation of maize prices?

(b) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)

(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i)

| වර්ෂය | වගා වපසරිය (හෙක්.) | නිෂ්පාදනය (මෙ.ටො.) | ආනයනය කළ ප්‍රමාණය (මෙ.ටො) | | |
|---|---|---|---|---|---|
| | | | බීජ සඳහා | බීජ නොවන | එකතුව |
| 2023 | 75,982 | 221,249 | 1,181 | 196,061 | 197,242 |
| 2024 | 72,701 | 223,496 | 1,681 | 251,843 | 253,524 |
| *2025 | 90,766 | 341,595 | 58 | 67,876 | 67,934 |

*2025 මුල් කාර්තුව - 2024/25 මහ අවසන් භෝග පුරෝකථන වාර්තාව

නව රජය විධියට අපි බඩඉරිඟු නිෂ්පාදනයට අදාළ ප්‍රවර්ධන වැඩසටහනක් ආරම්භ කළා. ඒ අනුව වගා වපසරිය එනවා, හෙක්ටෙයාර 90,766ක්. නිෂ්පාදනය මෙට්‍රික්ටොන් 341,595ක්. ආනයනය කරනවා, මෙට්‍රික්ටොන් 67,934ක්. ඒ අනුව, ආනයනය කරන ප්‍රමාණය අඩු කර ගැනීමට මේ වනවිට කටයුතු කරමින් තිබෙනවා.

(ii)

- බඩඉරිඟු කර්මාන්තයේ ඉදිරි සැලැස්ම ලෙස 2026 සිට 2030 දක්වා සැලසුම් සකස් කර ඇති අතර, දැනට පවතින මුළු නිෂ්පාදනය හෙක්ටෙයාරයට මෙට්‍රික්ටොන් 6.1ක් දක්වා ඉහළ නංවමින් නිෂ්පාදන පිරිවැය අවම කිරීමටත් සැලසුම් සකස් කර ඇත.
- රටේ අවශ්‍යතාවෙන් දේශීයව සපයා ගන්නා ප්‍රමාණය වැඩි කර ගනිමින් ආනයනය කරන ප්‍රමාණයද ක්‍රමානුකූලව අඩු කිරීම ඔස්සේ දේශීය බඩඉරිඟු ගොවීන් දිරිගැන්වීමට බලාපොරොත්තු වේ.
- රටේ සමස්ත නිෂ්පාදනයට ඉහළම දායකත්වයක් ලබා දෙන අනුරාධපුර, මොනරාගල, බදුල්ල, අම්පාර යන දිස්ත්‍රික්ක මූලික කර ගනිමින් අස්වනු ඉහළ නැංවීමට බඩඉරිඟු වගා තාක්ෂණික පැකේජය වැඩි වශයෙන් ප්‍රචලිත කිරීම.
- ඉහළ අස්වනු විභවයක් සහිත දෙමුහුන් ප්‍රභේද හඳුන්වාදීමට සැලසුම් සකස් කර ඇත.
- බඩඉරිඟු කර්මාන්තය හා සම්බන්ධ ගොවීන් ඇතුළු අගයදාමයට සම්බන්ධ සියලු පාර්ශ්ව සම්බන්ධ කර ගනිමින් බඩඉරිඟු කාර්ය සාධන බලකායක් පිහිටුවා ඇත.
- බඩඉරිඟු වගා කරන ගොවීන් සම්බන්ධ කර ගනිමින් ශක්තිමත් සමුපකාර සමිති ජාලයක් පිහිටුවා එය පුළුල් කිරීමේ කටයුතු මේ වන විට සිදු වෙමින් පවතී. අනුරාධපුර දිස්ත්‍රික්කය පුරා සමුපකාර සමිති නිර්මාණය කර ඇත.
- මෙම වසරේදී කෘෂි සමුපකාර සමිතිවලට වියළීමේ යන්ත්‍ර - dryers - ලබාදීමට බලාපොරොත්තු වේ. ඒ මඟින් බඩඉරිඟුවල තෙතමනය සියයට 14ක් වන තෙක් වියළා නිෂ්පාදනවල දිලීර - aflatoxins - ඇතිවීම අවම කිරීමට සැලසුම් සකස් කර ඇත.
- පෙර අස්වනු අවස්ථාවේ ඇති වන දිලීර හානි / ආසාදන - aflatoxins - අවම කර, ඒවා ඇතිවීම වැළැක්වීමට අවශ්‍ය පසුඅස්වනු තාක්ෂණය බඩඉරිඟු නිෂ්පාදන හා අලෙවි සමුපකාර සමිති හරහා ලබා දීම සිදු වේ.
- සමුපකාර සමිති හරහා නිෂ්පාදිත බඩඉරිඟුවල දිලීර - aflatoxins - ඇතිවීම වළක්වාලන ලෙස ගබඩා කර අවශ්‍යතාව අනුව ත්‍රිපෝෂ සමාගම වෙත ලබා දීමට කටයුතු කරන මෙන් ආහාර ප්‍රවර්ධන මණ්ඩලයෙන් හෝ වී අලෙවි මණ්ඩලයෙන් ඉල්ලීමක් කිරීමට බඩඉරිඟු කාර්ය සාධන බලකාය හරහා සිදු කර ඇත.

(iii)

| කන්නය | වාරි ක්‍රමය | ප්‍රදේශය | නිෂ්පාදනය පිරිවැය (කිලෝග්‍රෑමයට රුපියල්) | සාමාන්‍ය අස්වැන්න (හෙක්ටෙයාරයට මෙට්‍රික් ටොන්) |
|---|---|---|---|---|
| 2023/24 මහ | වර්ෂාපෝෂිත | අනුරාධපුර | 89.97 | 3.78 |
| | | අම්පාර | 111.67 | 2.9 |
| | | මොනරාගල | 93.03 | 2.94 |
| 2024 යල | ජල සම්පාදිත | බදුල්ල | 111.70 | 4.48 |
| | | මහවැලි H | 102.79 | 4.35 |

- ඉහත නිෂ්පාදන පිරිවැය පවුලේ ශ්‍රමය සඳහා ද මිල ඇතුළත්ව ගණනය කර ඇති අතර, 2023/24 මහ කන්නයේ පැවති වර්ෂා තත්ත්වය නිසා සාමාන්‍ය අස්වැන්නේ අඩුවීමක් පෙන්නුම් කර ඇත.

මෙවර 2024/25 මහ කන්නය සඳහා හෙක්ටෙයාරයකට මෙට්‍රික් ටොන් 4.5ක සාමාන්‍ය අස්වැන්නක් ලබා ගන්නා ගොවියෙක් සඳහා රුපියල් 106ක නිෂ්පාදන පිරිවැයක් ලෙස ඇස්තමේන්තු කර නිෂ්පාදන පිරිවැයට සියයට 30ක ලාභයක් සහිතව රුපියල් 135ක ගොවිපොළ මිලක් ප්‍රමිතියෙන් යුතු බඩඉරිඟු කිලෝ එකක් සඳහා නියම කිරීමට බඩඉරිඟු කාර්ය සාධන බලකා සාකච්ඡාවේදී සියලු ගොවි සමිති නියෝජනයෙන් හා අගයදාම නියෝජිතයන්ගේ එකඟත්වයෙන් තීරණය විය.

(iv) පහත සඳහන් කටයුතු බඩඉරිඟු කාර්ය සාධන බලකාය සම්බන්ධීකරණය යටතේ සිදු කිරීමට අවශ්‍ය මූලික සාකච්ඡා සිදු කර ඇත.

- සෑම වර්ෂයකම මැයි මස වන විට ඉදිරි වර්ෂය සඳහා අවශ්‍ය බඩඉරිඟු ප්‍රසම්පාදනය සඳහා අවශ්‍ය නිර්ණායක නිර්දේශ කිරීම.

- බඩඉරිඟු ආශ්‍රිත නිෂ්පාදන සිදු කරන සමාගම වෙත සෞඛ්‍යාරක්ෂිත - ප්‍රධාන වශයෙන් aflatoxin රහිත - අස්වනු නිෂ්පාදනය කර සැපයීම.
- බඩඉරිඟු නිෂ්පාදන හා අළෙවි සමුපකාර සමිති සම්බන්ධීකරණය කිරීම.

(ආ) අදාළ නොවේ.

**ගරු සුරංග රත්නායක මහතා**
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමන්ලා බඩඉරිඟු වගාව ප්‍රවර්ධනය සඳහා යම් යම් ක්‍රමවේද සකස් කළා. හැබැයි, වුවමනාම දේ තමයි ගොවියාට නිසි මිලක් ලබා දීම. පසුගිය කන්නයේ බඩඉරිඟු අස්වැන්න නෙළන කාලයේ දී තමයි ලංකාවට බඩඉරිඟු ටික ගෙනෙන්න අවශ්‍ය අවසරයන් දීලා තිබුණේ. ඔබතුමන්ලා ඒක පිළිගන්නවා ඇති. ඒ නිසා පසුගිය කන්නයේ දී බඩඉරිඟු වගා කළ ගොවීන් විශාල වශයෙන් අර්බුදයෙන් අර්බුදයට පත් වුණා. මිලක් ලැබුණේ නැහැ. ගොවීන් නැත්තටම නැති වුණා. බඩඉරිඟු කිලෝ එකකට රුපියල් 135ක සහතික මිලක් ලබා දෙනවා කියලා දැන් ඔබතුමා පුරෝකථනය කරලා තිබෙනවා. එතකොට, ඔබතුමා මෙතැන කරුණු ඉදිරිපත් කරද්දි කිව්වා, රුපියල් 110ක වාගේ නිෂ්පාදන මිලක් යනවා කියලා. ඔබතුමා හරියට ගණන් හදලා බලන්න. බඩඉරිඟු ගොවියාට කිලෝවකින් තිබෙන ලාභය රුපියල් 25යි නම්, බඩඉරිඟු ගොවියාගේ පවුලේ ශ්‍රමය ඇතුළත් කරන්නේත් නැතිව තමයි මිල තීරණය කරලා තිබෙන්නේ.

ඊළඟට ඔබතුමා කිව්වා, හෙක්ටෙයාරයකින් ගන්න පුළුවන් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 4.8යි කියලා. කිලෝ එකකින් ලැබෙන ලාභය රුපියල් 25යි නම්, එතකොට රුපියල් 80,000ක් තමයි ගොවියාට තිබෙන්නේ. පවුලේ ශ්‍රමයත් එකතු නොකර ඒ මිල සාධාරණද කියලා ඔබතුමා කල්පනා කර බලන්න. අනෙක් කාරණය, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනයේ A/C කාමරවල ඉඳගෙන ඔබතුමන්ලා හදන මිල, ගොවි බිමේ ඇත්තටම ලැබෙන මිල පිළිබඳව අවබෝධයක් නැතුව හදන එකක්. ඒ නිසා ඒ ගැන අවධානය යොමු කරන්න.

මගේ ඊළඟ අතුරු ප්‍රශ්නය මේකයි. බඩඉරිඟු ගොවියා නැත්තටම නැති වුණා. උඳු ගොවියාටත් මේ ප්‍රශ්නය තිබෙනවා. දැන් උඳු නිෂ්පාදන කටයුතු පටන් ගෙන තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ මුල් ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්න අහන්න.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නය ඇතුළේ වැරදි තොරතුරු කිහිපයක් මතු වුණා. ඒවා නිවැරදි කරන්න ඕනෑ. පවුලේ ශ්‍රමය ඉවත් කරලා නොවෙයි, නිෂ්පාදන වියදම හදලා තිබෙන්නේ. පවුලේ ශ්‍රමයත් එයට ඇතුළත් කර තිබෙනවා. එහෙම තමයි මම උත්තරේට කිව්වේ. ඒක පළමුවැනි කාරණය.

ඊළඟට, නිෂ්පාදන පිරිවැය ගණන් බැලීමේදී ගොවි සංවිධානත් ඒ සඳහා සම්බන්ධ කර ගත්තා. නිෂ්පාදන පිරිවැය රුපියල් 110ක් කියලා නොවෙයි කිව්වේ, එය රුපියල් 106යි. ඒ අගය දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට වෙනස් වෙනවා. සමහර තැන්වල අනූ ගණන්, සමහර තැන්වල එකසිය ගණන් ආදී වශයෙන් වෙනස් වෙනවා. පොදු අගය ගත්තාම, රුපියල් 106යි කියලා තමයි මම පිළිතුරේ සඳහන් කළේ. එතකොට, ඒකට සියයට 30ක් ලාභ පංගුව එකතු කරලා තමයි බඩඉරිඟු කිලෝ එකක මිල රුපියල් 135යි කියලා නියම කරන්නේ. පිළිතුරේත් ඒක කිව්වා. ගොවි සංවිධාන තිබෙනවා. ජාතික බඩඉරිඟු කාර්ය සාධක බලකාය, ඒ වාගේම ඊට අදාළ අනෙකුත් සංවිධාන ගණනාවක් ඒ සඳහා සම්බන්ධ වෙනවා. මහාචාර්ය බුද්ධි මාරඹේ මැතිතුමා වැනි අයගෙන් සමන්විත කණ්ඩායමක් තමයි ඒ කාර්ය සාධක බලකායේ ඉන්නේ. එතුමන්ලාගේ මැදිහත් වීමෙන්, ගොවි සංවිධානවලත් එකඟතාවෙන් තමයි ඒ මිල ගණන් තීරණය කෙරුණේ. ඒ නිසා ඒකට ගොවීන් සම්බන්ධ වුණා, ගරු මන්ත්‍රීතුමනි.

ඊළඟට බඩඉරිඟු මිල සම්බන්ධයෙන් ගත්තොත්, ඇත්තටම බඩඉරිඟු ගොවියාට ලොකු ප්‍රශ්නයක් ආවේ නැහැ. සමහර තැන්වල යම් යම් ගැටලු මතු වුණා. නමුත් ගොවියාට ගැටලුවක් මතු වුණේ නැහැ. සාමාන්‍යයෙන් හොඳ මිලක් ලැබුණා. ඔබතුමා ඔය මතු කරන කාරණය මෙන්න මේකයි. බඩඉරිඟු මිලදී ගත් අතරමැදි කණ්ඩායමකට ගැටලුවක් මතු වුණා. ඒ අතරමැදි කණ්ඩායම තමයි අමාත්‍යාංශයට ආවේ. එතැනදීත් ගොවියෙක් voice-cut එකක් දුන්නා; ඒකත් මාධ්‍යවල ගියා. "අපේ බඩඉරිඟු අපි වික්කා. අපි වික්කේ මේ කට්ටියට. මේක අපේ ගැටලුවක් නොවෙයි. මේ කට්ටිය වෙනුවෙන් තමයි අපි ආවේ" කියලා කිව්වා. ඒ අනුව බඩඉරිඟු එක් රැස් කරපු අයට යම් ගැටලුවක් මතු වුණා. ගොවියාට ගැටලුවක් මතු වුණේ නැහැ.

ඊළඟ කාරණය තමයි බඩඉරිඟු පිට රටින් ගෙන්වන එක. මීට කලින් අවුරුද්ද ගත්තොත්, මෙට්‍රික් ටොන් 253,000කට වැඩි ප්‍රමාණයක් රටින් ගෙනැල්ලා තිබෙනවා. හැබැයි අපි දැන් මේ අවුරුද්දටම ගෙන්වන්න පුරෝකථනය කරලා තිබෙන්නේ, මෙට්‍රික් ටොන් 67,000යි. මේ වෙනකොට ගෙනැල්ලා තිබෙන්නේ පොඩි ප්‍රමාණයයි.

කොහොම වුණත්, අපේ ඉලක්කය අනුව අපේ අවශ්‍යතාව සම්පූර්ණ කරන්න මෙට්‍රික්ටොන් ලක්ෂ 7කට ආසන්න ප්‍රමාණයක් අවශ්‍ය වෙනවා. එයින් සියයට 90ක්ම යන්නේ සත්ව ආහාර සඳහා. අපේ ඉලක්කය තමයි, ආනයනය කරන බඩඉරිඟු ප්‍රමාණය ක්‍රමානුකූලව අඩු කරමින්, එය බින්දුව දක්වා ගෙනෙන එක. ඊට අදාළව අපි මේ වෙනකොට ඉතාම විද්‍යාත්මක වැඩ පිළිවෙළක් සහ සැලැස්මක් ක්‍රියාත්මක කර තිබෙන බව මම මේ වෙලාවේ මතක් කරනවා.

**ගරු සුරංග රත්නායක මහතා**
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ඇසීමේ අවස්ථාව ගරු විපක්ෂ නායකතුමාට ලබා දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாச)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා සඳහන් කළ අම්පාර, මොනරාගල, අනුරාධපුර වැනි ප්‍රදේශවලට පසුගිය දිනවල ගියාම ගොවි ජනතාව මතු කරපු ප්‍රශ්නයක් තමයි මම ඔබතුමාට යොමු කරන්නේ. ඇත්ත වශයෙන්ම ඔබතුමන්ලා බඩඉරිඟුවලට රුපියල් 140ක සහතික මිලක් ලබා දුන්නා. හැබැයි, එහෙම සහතික මිලක් ලබා දීලා මෙට්‍රික්ටොන් ලක්ෂ 3ක් ආනයනය කළා. ඒක කරපු

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

හැටියේම බඩඉරිඟුවල මිල රුපියල් 115ට, 120ට අඩු වුණා. ඔබතුමා දැනගන්නට ඕනෑ, ඇත්ත වශයෙන්ම අස්වැන්න නෙළීම දක්වා එම වගා කටයුතු සම්පූර්ණ කරන්න දින 110ක් විතර ගත වන බව. නමුත්, ගොවීන් මොකක්ද කළේ? මෙම ක්‍රියාවලියේ තිබෙන පාඩුව නිසා දින 70ක්, 80ක් යනකොට කිලෝ එක රුපියල් 25 ගණනේ ගස් පිටින් වික්කා. මේක මම හදපු කථාවක් නොවෙයි. මේක ගොවීන්ගෙන්ම ආපු තොරතුරක්. මොකද, දින 70කට පස්සේ තවත් දින 40ක් රිළවුන්ගෙන්, වඳුරන්ගෙන්, ඉත්තෑවන්ගෙන් තම වගාව ආරක්ෂා කරනවාට වඩා, අර වාගේ මිල පහළ වැටීමක් තිබියදී ගස් පිටින් උදුරලා අරගෙන විකුණන එක ලාභයි කියලා ගොවීන් තීන්දු කළා. ඉතින්, මම ඔබතුමාගෙන් මෙන්න මේ කාරණය අහන්න කැමැතියි.

2020 වර්ෂයේදී පොහොර තහනම එනකොට මේ රටට ආනයනය කළේ බඩඉරිඟු මෙට්‍රික්ටොන් 178,000යි. මහවැලි බල ප්‍රදේශවල අස්වැන්න සාමාන්‍ය බල ප්‍රදේශවලට වැඩිය තුන් ගුණයක් කියලා ඔබතුමා හොඳින් දන්නවා. 2018, 2019 වර්ෂවල සේනා දළඹුවාගේ ප්‍රශ්නය මතු වුණු කාලයේවත් මේ විධියට බඩඉරිඟු ආනයනය කළේ නැහැ. ඇත්ත වශයෙන්ම සත්‍ය කථාව තමයි, ඔබතුමන්ලා පොරොන්දු වුණු සහතික මිල ගොවි ජනතාවට ලැබුණේ නැහැ කියන එක. සහතික මිල ලබා දෙනවා කියලා මෙට්‍රික්ටොන් ලක්ෂ 3ක් ආනයනය කරනකොට, මිනිස්සු මොකක්ද කළේ? දින 110න් අස්වැන්න ගන්නා වගාවට යන්නේ නැතුව, දින 70ක් යනකොට පඳුරු පිටින් අරගෙන ඒ ගස් ටික විකුණුවා, බඩඉරිඟු ඇටේ වෙනුවට. ඔබතුමන්ලාට මේ සඳහා දැන්වත් සැලැස්මක් නැද්ද? ඔබතුමා මහාචාර්ය බුද්ධි මාරඹේ ගැන සඳහන් කළා නේ. මේ ප්‍රශ්නය ගැන එතුමාගෙන් අහන්නකෝ.

එතුමාගෙන් අහන්න. මම ඔබතුමාගෙන් කාරුණික ඉල්ලීමක් කරනවා, මේ සම්බන්ධව ලබන කන්නයට හෝ පැහැදිලි, තිරසර වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා. ඇයි, ඔබතුමන්ලා ඒ සඳහා කටයුතු නොකරන්නේ?

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා මෙම කාරණය ඉදිරිපත් කිරීම ගැන මම කනගාටු වෙනවා. ඔබතුමා දැනගෙනද, නොදැනද මේ කාරණය මතු කළේ කියන එක මට ගැටලුවක්. සතුන්ට, විශේෂයෙන්ම කිරි ගවයින්ට බඩඉරිඟු ගස් ආහාරයට ලබා ගැනීම සඳහා වෙනම වවනවා. ඒවා වවන්නේ කිරි කරල්වලට හෝ ඇට ගන්න නොවෙයි. කිරි ගවයින්ට දීමට වවන බඩඉරිඟු ගස්වල කරල යාන්තම් මතු වෙනකොට ගහ කපනවා. ඒ ගස් කපලා අරගෙන ගිහින් දෙනවා, කිරි ගවයින්ට. ඒක වෙනම වගාවක්. කිරි කරල්වලට සහ ඇටවලට බඩඉරිඟු වවන්නේ වෙනම වගාවක් විධියට. ඒ දෙක, වගාවන් දෙකක්. ඒක ඉගෙන ගන්න.

දැන් ඔබතුමා කිව්වා, බඩඉරිඟු මෙට්‍රික්ටොන් ලක්ෂ 3ක් ගෙනා කථාවක්. ඒක අසත්‍යයක්. අසත්‍ය කථා කියන්න එපා. ගිය අවුරුද්දේ ගෙනැල්ලා තිබෙනවා, මෙට්‍රික්ටොන් 253,000ක්. පුරෝකථනය කර තිබෙන්නේ මේ අවුරුද්දටම මෙට්‍රික්ටොන් 67,000ක් ගෙනෙන්න. මම මේ කියන්නේ රවුම් ගණන්වලින්. ඒ අනුව ගිය අවුරුදුවලට වඩා මේ අවුරුද්දේ බඩඉරිඟු වගා කරන ප්‍රමාණය වැඩි වෙලා තිබෙන්නේ. අපි මුලින්ම කන්තලේ වගා කළා, රජයේ මැදිහත්වීම යටතේ.

ඊළඟ කාරණය මේකයි. බඩඉරිඟුවලට අපි සියයට 30ක ලාභ පංගුවක් එකතු කරනවා. වීවලටත් එහෙමයි දුන්නේ. වීවලටත් නිෂ්පාදන වියදමට සියයට 30ක් එකතු කෙරුවා. එහෙම එකතු කරලා තමයි වීවල අවම මිල නියම කෙරුවේ. බඩඉරිඟුවලටත් එහෙමයි. ඒ තීන්දුව ගත්තේ ඔබතුමා කියන ඔය මහාචාර්යතුමා ඇතුළු එම කණ්ඩායම, කාර්ය සාධක බලකාය, ගොවි සංවිධාන, මීට අදාළ අමාත්‍යාංශයේ සියලුම නිලධාරින් සහ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය කියන ඒ සියලු පාර්ශ්ව එකතු වෙලා. මේ නිෂ්පාදන පිරිවැය හැදුවේත්, බඩඉරිඟුවලට අවම මිලක් නියම කළේත් විද්‍යාත්මක ක්‍රමවේදයකට අනුවයි කියන කාරණය අපි කියනවා.

අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, ප්‍රවර්ධනය කරන්න අපි භෝග 13ක් තෝරාගෙන තිබෙන බව. අනිවාර්යයෙන්ම ආනයනය කරන ප්‍රමාණය අඩු කරන්න, එහෙම නැත්නම් ආනයනය බින්දුව කිරීමට තමයි අපි මේ කටයුතු කරගෙන යන්නේ. අපි මේ වෙනකොට එම ඉලක්කයට සාර්ථකව යමින් තිබෙන බව මේ වෙලාවේ මම මතක් කරනවා.

## මුලතිව් දිස්ත්‍රික් මහ රෝහල: ස්ත්‍රී/පුරුෂ වාට්ටු සඳහා ස්ථිර ගොඩනැඟිල්ලක්

முல்லைத்தீவு மாவட்ட வைத்தியசாலை: ஆண்/பெண் நோயாளர் விடுதிகளுக்கான நிரந்தரக் கட்டிடம்

DISTRICT GENERAL HOSPITAL, MULLAITIVU: PERMANENT BUILDING FOR MALE/ FEMALE WARDS

1111/2025

**8. ගරු තුරෙරෙරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මුලතිව් දිස්ත්‍රික් මහ රෝහලේ ස්ත්‍රී සහ පුරුෂ වාට්ටු සඳහා ස්ථිර ගොඩනැඟිල්ලක් නොමැති අතර එම වාට්ටු තාවකාලික ගොඩනැඟිලිවල පවත්වාගෙන යන බවත්;

(ii) ඉන්දීය රජයේ ආධාර මත එම වාට්ටු සඳහා ස්ථිර ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට වර්ෂ 2017-2018 කාල වකවානුවේදී සැලසුම් කිරීම ආරම්භ කරන ලද බවත්;

(iii) 2024 වර්ෂයේදී ඊට අදාළ පාංශු පරීක්ෂණය සිදු කරන ලද බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) මේ වනතෙක් ඉහත ගොඩනැඟිල්ල ඉදිකිරීමේ කටයුතු ආරම්භ නොකිරීමට හේතු;

(ii) ඉහත සැලසුම මේ වන විටත් බලපවත්වන්නේ නම්, එම ගොඩනැඟිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරනු ලබන දිනය;

(iii) ඉහත ගොඩනැඟිල්ල ඉදිකිරීම අත්හිටුවා හෝ අවලංගු කර තිබේ නම්, ඊට හේතු;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) முல்லைத்தீவு மாவட்ட வைத்தியசாலையில் ஆண் மற்றும் பெண் நோயாளர் விடுதி களுக்கென நிரந்தரக் கட்டிடமொன்று இல்லை என்பதுடன், மேற்படி விடுதிகள் தற்காலிகக் கட்டிடங்களிலேயே பேணிவரப்படுகின்றன என்பதையும்;

(ii) இந்திய அரசின் உதவியின்கீழ் அவ்விடுதிகளுக்காக நிரந்தரக் கட்டிடமொன்றை நிர்மாணிப்பதற்காக 2017-2018 காலப்பகுதியில் திட்டமிடல் பணிகள் ஆரம்பிக்கப்பட்டன என்பதையும்;

(iii) 2024ஆம் ஆண்டு இதற்கான மண் பரிசோதனை மேற்கொள்ளப்பட்டது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) இதுவரை மேற்படி கட்டிடத்தின் நிர்மாணப் பணிகள் ஆரம்பிக்கப்படாமைக்கான காரணங்கள் யாவை;

(ii) மேற்படி திட்டம் தொடர்ந்தும் செல்லுபடியானதாக இருப்பின், மேற்படி கட்டிடத்தின் நிர்மாணப் பணிகள் ஆரம்பிக்கப்படும் திகதி யாது;

(iii) மேற்படி கட்டிடத்தை நிர்மாணிப்பது இடைநிறுத்தப்பட்டு இருப்பின் அல்லது இரத்துச் செய்யப்பட்டு இருப்பின், அதற்கான காரணங்கள் யாவை;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Is he aware that -

(i) a permanent building is not available for male and female patients' wards at the Mullaitivu District General Hospital and those wards are housed in temporary buildings;

(ii) the planning was commenced for the construction of a permanent building for those wards with aid from the Government of India during the period 2017-2018; and

(iii) the soil test was conducted for the construction in the year 2024?

(b) Will he inform this House -

(i) the reasons for not commencing the construction of the building so far;

(ii) if the plan concerned is still in effect, the date on which the construction work of the said building will be commenced; and

(iii) if the construction work of the building has been suspended or cancelled, the reasons for it?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මුලතිව් දිස්ත්‍රික් මහ රෝහලෙහි ස්ත්‍රී සහ පුරුෂ වෛද්‍ය වාට්ටු තාවකාලික ගොඩනැඟිලි දෙකක පවත්වාගෙන යනු ලැබේ.

(ii) ඉන්දියානු ආධාර මත සිව් මහල් වෛද්‍ය වාට්ටු සංකීර්ණයක් ඉදිකිරීමට සැලසුම් කර ඇත. එම ව්‍යාපෘති යෝජනාව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අනුමැතිය ලැබී ඇති අතර, ඊට අදාළ අවබෝධතා ගිවිසුම ඉදිරියේදී අත්සන් කිරීමට නියමිතයි.

මන්නාරම දිස්ත්‍රික් මහ රෝහලේ හදිසි ප්‍රතිකාර ඒකකය ඉන්දියානු ආධාර සහිතව ඉදිකිරීම සඳහා වන අවබෝධතා ගිවිසුම අත්සන් කළා. ඊළඟට මේ ගිවිසුම අත්සන් කරනවා.

(iii) යෝජිත සිව් මහල් වෛද්‍ය වාට්ටු සංකීර්ණය ඉදිකිරීමට අදාළ පාංශු පරීක්ෂණය සිදු කර ඇති අතර, ඊට අදාළ වාර්තාව Soil and Mineral Engineering (Pvt.) Limited වෙතින් 2024.06.24 දින ලබා දී ඇත.

(ආ) (i), (ii)

රටවල් දෙකක් අතර පවත්නා අවබෝධතා මඟින් මෙම ගොඩනැඟිල්ල ඉදිකිරීමට නියමිත බැවින් දෙරට අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කළ යුතුය. ඒ සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ එකඟතාව මෙන්ම නීතිපති දෙපාර්තමේන්තුවේ එකඟතාව ලබා ගත යුතුය. එමෙන්ම අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලබා ගත යුතුය. එම කටයුතු සිදු කිරීමෙන් අනතුරුව නිසි ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කර ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නියමිතයි.

(iii) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

**ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ அமைச்சர் அவர்களே, என்னுடைய முதலாவது வினாவுக்கு, முல்லைத்தீவு மாவட்ட வைத்தியசாலையில் ஆண், பெண் நோயாளர் விடுதிகள் தற்காலிகக் கட்டிடங்களிலேயே இயங்கி வருவதாக நீங்கள் விடை அளித்தீர்கள். அந்த விடயத்துடன் சம்பந்தப்படுத்தி என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

கஷ்டப் பிரதேச மருத்துவமனைகளின் பட்டியலிலுள்ள மாவட்ட பொது மருத்துவமனைகளில், நான் வசிக்கும் வன்னிப் பிரதேசத்திலுள்ள மன்னார் மாவட்ட பொது மருத்துவமனையும் முல்லைத்தீவு மாவட்ட பொது மருத்துவமனையும் மட்டும்தான் அடங்கும். கடந்த பல ஆண்டுகளாக நிரந்தர நோயாளர் விடுதிகளை நாங்கள் எதிர்பார்த்துக்கொண்டே இருக்கின்றோம். கட்டில்கள் நிரம்பி, வழியோரங்களில் பாய் விரித்துப் படுத்திருந்து மருத்துவம் பெறும் அவல நிலை தொடர்ந்தும் இந்த மாவட்ட மருத்துவமனைகளில்தான் உள்ளது. நாங்கள் இதனை அரசின் ஓரவஞ்சனையாகவே பார்க்கவேண்டி உள்ளது. ஏனைய மாவட்ட மருத்துவமனைகளில் உள்ளதைப்போல, எங்களுடைய மாவட்ட மருத்துவமனைகளுக்கும் நிரந்தர நோயாளர் விடுதிகளை அமைத்துக் கொடுப்பதற்கு அதிக முன்னுரிமை கொடுக்க வேண்டுமென கேட்டுக் கொள்கின்றேன். இதற்குரிய பதிலை நான் உங்களிடமிருந்து எதிர்பார்க்கின்றேன்.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු මන්ත්‍රීතුමනි, අනිවාර්යයෙන්ම එම රෝහලට ප්‍රමුඛතාව ලබා දෙනවා. නමුත් ඔබතුමාත් දන්නවා, පසුගිය කාලයේ ඉදිකිරීම් ආරම්භ කරලා අතරමඟ නතර කරපු ව්‍යාපෘති ගණනාවක් තිබෙන බව. එම ව්‍යාපෘති 17ක වැඩ කටයුතු සම්පූර්ණ කරන්න අපි කැබිනට් මණ්ඩලයේ අනුමැතිය අරගෙන ඉදිරි දෙවසරේදී රුපියල් බිලියන 45ක් -රුපියල් කෝටි 4,500ක්- අමතර වශයෙන් ඒ සඳහා වෙන් කරනවා. ඒක මතක තියාගන්න.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

නියමිත කාලයේදී ඒවා අවසන් කළා නම්, රුපියල් බිලියන 29කින් ඒ කටයුතු කරගන්න තිබුණා. නමුත්, අපට දැන් දෙගුණයක් වියදම් කරලා ඒ කටයුත්ත අවසන් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ අනුව මුලතිව් දිස්ත්‍රික් මහ රෝහලටත් ඒ ප්‍රමුඛතාව ලබා දෙනවා, අවශ්‍ය වාට්ටු සංකීර්ණ ඉදිකරන්න. අපි මේ සඳහා ශ්‍රී ලංකා රජයේ මුදල්වලට පරිබාහිරව ඉන්දියානු රජයේත් විශේෂ සහයෝගය ලබා ගන්නවා. ඒ කටයුතුවලට යම් කාලයක් ගත වෙයි. නමුත්, මේක කර ගන්න පුළුවන්.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

என்னுடைய இரண்டாவது மேலதிக வினாவை கௌரவ (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா அவர்கள் கேட்பார்.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ගරු කථානායකතුමනි, මට මේ question එක අහන්න තත්පර කීයක් ගන්න පුළුවන්ද? මොකද, එකවරම නවත්වන්න කිව්වාම මට ප්‍රශ්නය මැදින් නවත්වන්න වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, උපරිම විනාඩි දෙකයි. ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය විනාඩි එකහමාරකට සීමා කරන්නකෝ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

හොඳයි, විනාඩි එකහමාරයි. මම stopwatch එක on කළා.

கௌரவ சுகாதார அமைச்சர் அவர்களே, நான் படபட வென எனது வினாவைக் கேட்கின்றேன். ஏனெனில், ஒன்றரை நிமிடங்கள்தான் இருக்கின்றன.

முல்லைத்தீவு என்பது மிகவும் மோசமான நிலையிலுள்ள ஒரு மாவட்டமாகும். அங்குள்ள ஒரு வைத்தியசாலைதான் மல்லாவி வைத்தியசாலை! அது "B" தர ஆதார வைத்தியசாலை என்பது உங்களுக்கு நன்றாகவே தெரியும்! இந்த மாதம் transfer list போடப்பட்டு இருக்கிறது. அந்த வகையில், சாவகச்சேரி வைத்தியசாலையிலிருந்து மல்லாவி வைத்திய சாலைக்கு இந்த முறை முதன்முதலாக VP - Visiting Physician - ஒருவரை நீங்கள் transfer பண்ணி இருக்கிறீர்கள். Transfer list போடப்பட்டும் டயானா என்ற வைத்தியரை மல்லாவி வைத்தியசாலைக்கு அனுப்பாமல் GMOA சாவகச்சேரி வைத்தியசாலையிலேயே வைத்திருக்கிறது. மல்லாவி வைத்திய சாலைக்கு ஒரு வைத்திய அதிகாரியை transfer order மூலம் நியமித்தால், அவரை நீங்கள் அங்கு அனுப்ப வேண்டும். அதேநேரம், அங்கு பணிபுரிகின்ற வைத்தியர்கள் ஒரு மாதத்தில் ஒரு கிழமைதான் அங்கு இருப்பார்கள்; மூன்று கிழமைகள் இருப்பதில்லை. ஒரு பாராளுமன்ற உறுப்பினராக நான் அதை ஆதாரத்துடன் prove பண்ணினால், அதற்கு உரிய நடவடிக்கை எடுக்க முடியுமா? எனக் கேட்கின்றேன். ගරු කථානායකතුමනි, one minuteවලින් ඉවර කළා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ පැමිණිල්ල ඉදිරිපත් කරන්න. අපි ඒ ගැන සොයා බලන්නම්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සඳහා කාලය වෙන් කර තිබෙන්නේ උදේ 10.00 ඉඳලා 11.00 දක්වා කියලා. දැන් අවසන් වුණේ 8වන ප්‍රශ්නය. අද විවාදයකුත් තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා, කාල කළමනාකරණය ගැන මැදිහත්වීමක් කරන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමන්ලා අතුරු ප්‍රශ්න ඇසීමේදී විනාඩි එකහමාරකට සීමා කර ගන්න. ගරු අමාත්‍යතුමන්ලා උත්තර ලබා දීමේදී ඒ උත්තර ලබා දීමත් කෙටි කරන්න. එහෙම නැති වුණොත්, කාල කළමනාකරණය සම්බන්ධව ප්‍රශ්නයක් ඇති වෙනවා. කාලය ගැන හොඳ අවධානයකින් යුතුව අතුරු ප්‍රශ්න ඇසීමත්, ප්‍රශ්නවලට උත්තර දීමත් කරන මෙන් ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් හා ගරු ඇමතිතුමන්ලාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

## ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම: විස්තර
### ஸ்ரீ லங்கா டெலிகொம் நிறுவனம்: விபரம்
### SRI LANKA TELECOM: DETAILS

1252/2025

**9. ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ මේ වන විට සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වන විට එම සමාගමේ සේවක පුරප්පාඩු තිබේද;

(iii) 2024 වර්ෂයේදී සමාගම උපයා ඇති ලාභය කොපමණද;

(iv) එම සමාගමේ සේවා ලබාගෙන ගෙවීම පැහැර හැර ඇති මුළු වටිනාකම කොපමණද;

(v) එම වටිනාකම අය කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

டிஜிட்டல் பொருளாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஸ்ரீ லங்கா டெலிகொம் நிறுவனத்தில் தற்போது பணிபுரிகின்ற ஊழியர்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) தற்போது அந்நிறுவனத்தில் ஊழியர்களுக்கான வெற்றிடங்கள் நிலவுகின்றனவா என்பதையும்;

(iii) 2024ஆம் ஆண்டில் இந்நிறுவனம் ஈட்டியுள்ள இலாபம் எவ்வளவு என்பதையும்;

(iv) மேற்படி நிறுவனத்தின் சேவைகளைப் பெற்றுக் கொண்டு செலுத்தத் தவறிய கட்டணங்களின் மொத்தப் பெறுமதி எவ்வளவு என்பதையும்;

(v) அந்தப் பெறுமதியை அறவிடுவதற்கு மேற் கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Digital Economy:

(a) Will he inform this House -

(i) the number of employees serving in the Sri Lanka Telecom at present;

(ii) whether there are positions vacant in the company at present;

(iii) the profit made by the company in 2024;

(iv) the amount defaulted on payments for services obtained from the company; and

(v) the measures taken for the recovery of that value?

(b) If not, why?

**ගරු එරංග වීරරත්න මහතා (වැඩබලන ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමා)**

(மாண்புமிகு எரங்க வீரரத்ன - டிஜிட்டல் பொருளாதார பதில் அமைச்சர்)

(The Hon. Eranga Weeraratne - Acting Minister of Digital Economy)

ගරු කථානායකතුමනි, ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) සේවකයින් සංඛ්‍යාව

| | |
|---|---|
| ස්ථිර | 5,848 |
| කොන්ත්‍රාත්තු | 50 |
| මුළු | 5,898 |

(ii) අද වන විට හඳුනාගෙන ඇති මුළු බාහිර පුරප්පාඩු සංඛ්‍යාව (වෙනස්කම්වලට යටත් වේ)

| | |
|---|---|
| තාක්ෂණික | 25 |
| තාක්ෂණික නිලධාරීන් | 26 |
| IT NW නිලධාරීන්/මෘදුකාංග සංවර්ධකයින් | 14 |
| ඉංජිනේරුවන් | 6 |
| අළෙවිකරණ නිලධාරි | 17 |
| AI විසඳුම් ගෘහ නිර්මාණ ශිල්පී | 1 |
| AI/ML ඉංජිනේරු | 1 |
| දත්ත විද්‍යාඥ | 1 |
| මෘදුකාංග ඉංජිනේරු - AI - | 1 |
| දත්ත සහ AI ආරක්ෂක ඉංජිනේරු | 1 |
| Cloud සහාය විශේෂඥ | 3 |
| එකතුව | 96 |

(iii) SLT සමූහය 3,120යි. SLT සමාගම 2,113යි. ඒ, 2024 වාර්ෂික වාර්තාව අනුවයි.

(iv) පහත ඇමුණුමේ දැක්වේ.

INTRODUCTION | EXECUTIVE STATEMENTS | BUSINESS CONTEXT AND STRATEGY | BUSINESS | ENVIRONMENT | SOCIAL | GOVERNANCE | FINANCIAL REPORTS | SUPPLEMENTARY INFORMATION

# Statement of Profit or Loss and Other Comprehensive Income

*(All amounts in Sri Lanka Rupees million)*

| For the year ended 31 December | | Group | | Company | |
|---|---|---|---|---|---|
| | Notes | 2024 | 2023 | 2024 | 2023 |
| Revenue | 6 | **111,148** | 106,418 | **71,309** | 69,711 |
| Direct costs | 7 | **(65,009)** | (67,840) | **(39,941)** | (41,256) |
| **Gross profit** | | **46,139** | 38,578 | **31,368** | 28,455 |
| Sales and marketing costs | 7 | **(10,940)** | (11,100) | **(6,370)** | (5,589) |
| Administrative costs | 7 | **(24,010)** | (23,376) | **(17,709)** | (17,785) |
| **Operating profit** | | **11,189** | 4,102 | **7,289** | 5,081 |
| Other income | | **1,850** | 2,079 | **1,841** | 2,074 |
| Dividend income | | **190** | 71 | **190** | 71 |
| Finance costs | 8 | **(8,979)** | (11,292) | **(6,977)** | (9,772) |
| Foreign exchange gain/(loss) | 9 | **699** | 629 | **(136)** | (420) |
| Interest income | 10 | **1,087** | 1,685 | **812** | 1,280 |
| Share of profit from associates company | 18.2 | **1** | 75 | **1** | 75 |
| **Profit/(loss) before tax for the year** | | **6,037** | (2,651) | **3,020** | (1,611) |
| Income tax (expenses)/reversals | 11 | **(2,917)** | (1,270) | **(907)** | 479 |
| **Profit/(loss) for the year** | | **3,120** | (3,921) | **2,113** | (1,132) |
| **Other comprehensive income** | | | | | |
| **Other comprehensive income that will not be reclassified to profit or loss in subsequent period** | | | | | |
| Net change in fair value of financial assets | | **1** | – | – | – |
| Defined benefit plan actuarial gain | 29 | **222** | 384 | **322** | 295 |
| Tax on other comprehensive income | 11 | **35** | (41) | **(97)** | (118) |
| **Other comprehensive income for the year net of tax** | | **258** | 343 | **225** | 177 |
| **Total comprehensive income for the year** | | **3,378** | (3,578) | **2,338** | (955) |
| **Profit/loss attributable to:** | | | | | |
| Owners of the Company | | **3,116** | (3,925) | **2,113** | (1,132) |
| Non-controlling interest | | **4** | 4 | – | – |
| | | **3,120** | (3,921) | **2,113** | (1,132) |
| **Total comprehensive income attributable to:** | | | | | |
| Owners of the Company | | **3,374** | (3,582) | **2,338** | (955) |
| Non-controlling interest | | **4** | 4 | – | – |
| | | **3,378** | (3,578) | **2,338** | (955) |
| Earnings per share (LKR) | | | | | |
| – Basic | 13 | **1.73** | (2.17) | **1.17** | (0.63) |

The Notes on pages 149 to 208 form an integral part of these Financial Statements.

[ගරු එරංග වීරරත්න මහතා]

(v) පැහැර හරින ලද ගනුදෙනුකරුවන් සඳහා හිඟ මුදල් අයකර ගැනීමට ගත් ක්‍රියාමාර්ග කීපයකි. පළමුවන ක්‍රමවේදය තමයි, ණය අයකර ගැනීම් බාහිර නියෝජිතයෙකුට භාර දීම. ඒ අනුව, ණය අයකර ගැනීමේ සමාගමේ ඇමතුම් මධ්‍යස්ථාන නිලධාරින් හරහා ගනුදෙනුකරුවන් ඇමතීම, සම්බන්ධ කර ගත නොහැකි ගනුදෙනුකරුවන්ට ලිපි යැවීම, අයකර ගැනීමේ නිලධාරි ණයකරුගේ නිවෙස වෙත යැවීම සිදු වනවා.

දෙවන ක්‍රමවේදය විධියට සමථ මණ්ඩල ක්‍රියාමාර්ගය ගන්නවා. සමථ මණ්ඩල පනත හරහා ඒකට ක්‍රියාමාර්ග පනවා තිබෙනවා. මෙට්‍රෝ කලාපයේ - කොළඹ ප්‍රදේශයේ- නම් රුපියල් 50,000ට වැඩි ගිණුම් සඳහා සහ අනෙකුත් කලාපවල රුපියල් 100,000ට වැඩි ගිණුම් සඳහා හිඟ මුදල් සමථ මණ්ඩල වෙත යොමු කරන්න පුළුවන්. ඒ වාගේම රුපියල් 1,000,000ට වැඩි හිඟ මුදල් තිබෙනවා නම්, ඒක සමථ මණ්ඩලය නැතුව ඊට එහා නීතිමය කර්තව්‍යයකට යනවා. සමථ මණ්ඩලය හරහා හිඟ මුදල් පියවීමට ගනුදෙනුකරු එකඟ නොවුණොත් ඒ සඳහා නීතිමය මාර්ගයට යන්න කටයුතු කරන්න පුළුවන්.

ඒ වාගේම තුන්වන ක්‍රමවේදය විධියට SLT මඟින් එන්තරවාසි - LOD - යැවීම සිදු වනවා. අවසාන මතක් කිරීමේ ලිපිය විධියට LOD යවන එක තමයි කරන්නේ. ඒ සඳහා දින දර්ශන - calendar - මාසයක් ඇතුළත ගෙවීම කරන්න කියා තමයි මේ LOD එක යවන්නේ. ඒකේදී අවම හිඟ මුදල් රුපියල් 10,000ක වාගේ මට්ටමකවත් තිබෙන්න ඕනෑ.

හතරවන ක්‍රමවේදය අනුව කරන්නේ LOD හරහා යවන කට්ටියට විද්‍යුත් තැපැල මාර්ගයෙන් සහ ලිපි, ඇමතුම් දීලා ඔවුන්ට ඒ සඳහා සිහි කැඳවීමයි. ඒත් මුදල් පියවීමක් නොකෙරුණොත් ඊට පසුව නීතිමය මාර්ගයට යනවා. Letter of Demand - LOD එකක් - යවලා දින 14ක් ඇතුළත ගෙවීම් කළේ නැත්නම් නීති මාර්ගයට ගිහිල්ලා කටයුතු කරනවා. ඒකේදී මෙට්‍රෝ කලාපයේ නම්, ඒ කියන්නේ කොළඹ නම්, රුපියල් 50,000ට වැඩි හිඟ මුදල් අය කර ගන්නත්, අනෙකුත් කලාපවල රුපියල් 100,000ට වැඩි හිඟ මුදලක් අය කර ගන්නත් තමයි නීතිමය මාර්ගයට යන්නේ. ඊට පසුව මෙහෙම නීතිමය මාර්ගයෙන් ඒ ගෙවීම් කළ යුතු පුද්ගලයාට ගෙවන්න කියලා කියා තිබියදී ඒකත් පැහැර හැරියොත්, ඊටත් එහාට රිට් නඩු මාර්ගයට ගිහිල්ලා ඒ මුදල අය කර ගන්න ක්‍රියාත්මක වෙනවා. ඒ අනුව රිට් ක්‍රියාමාර්ගයට යන්නේ රුපියල් 50,000ට වැඩි මුදලක් පියවා ගන්න තිබෙනවා නම් තමයි.

(ආ) අදාළ නොවේ.

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. 1880දී Oriental Telephone සමාගම පිහිටුවීමෙන් ආරම්භ වෙනවා, ලංකාවේ සන්නිවේදන ජාලය. එදා ඉඳලා අද වෙනකොට වසර 145ක් ගත වෙලා තිබෙනවා. නමුත් අද අපේ ටෙලිකොම් ආයතනය පවතින්නේ වසර 32කට පෙරාතුව හදපු සමාගමකට දෙවැනි වෙලා. දුරකථන ග්‍රාහකයින්ගෙන් සියයට 30යි අත්පත් කර ගන්න හැකියාව තිබිලා තිබෙන්නේ. මේකට මූලිකම හේතුව මොකක්ද කියලා මම ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් දැනගන්නට කැමැතියි.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)

ගරු මන්ත්‍රීතුමනි, ටෙලිකොම් කියන මේ ක්ෂේත්‍රය ඉතාම දැවැන්ත competition එකක් තිබෙන ක්ෂේත්‍රයක්. SLT එකේ management එකේ තිබුණු දුර්වලතා නිසා තමයි පාරිභෝගිකයන් ප්‍රමාණය පහළ ගිහිල්ලා, ඔවුන්ට තිබෙන ආදායම පහළට ගිහිල්ලා, SLT එක 2023 වාගේ වෙනකොට පාඩු ලබන ආයතනයක් බවට පත් වෙලා තිබෙන්නේ. නමුත් අපේ රජය බලයට පත් වුණාට පසුව මේ පාඩු ලබන ආයතනය නැවත ලාභ ලබන ආයතනයක් බවට පත් කරලා තිබෙනවා. උදාහරණයක් හැටියට අපි කළ වැඩකටයුතු කිහිපයක් මා කියන්නම්.

SLT Mobitel එක ගත්තාම, 2024 පළමුවෙනි මාස හයේ රුපියල් බිලියන 1.1ක් වාගේ ප්‍රමාණයක් අලාභ වෙලා තිබෙනවා. ඒක 2025 පළමු මාස හය ගත්තාම, රුපියල් බිලියන 1.1කින් ලාභ ලබන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම SLT Mobitel එක group එකක් විධියට ගත්තාම, 2024 පළමු මාස හයට රුපියල් මිලියන 323ක් පාඩුයි; SLT, Mobitel දෙකම ගත්තාම. නමුත් 2025 පළමු මාස හයේදී ඒක රුපියල් බිලියන 4,276ක් ලාභයි. ඉතින් මේ සියල්ලම කරලා තිබෙන්නේ අපි පත් කළ අලුත් කළමනාකාරිත්වය හරහා. ඒ කළමනාකාරිත්වයේ සභාපති විධියට අපි මේ ක්ෂේත්‍රයේ ඉතාම පළපුරුදු පුද්ගලයෙක් මේ සමාගම්වලට පත් කරලා තිබෙනවා. ඔහුට මේ ක්ෂේත්‍රයේ වසර 40කට වැඩි පළපුරුද්දක් තිබෙනවා. ඒ හරහා අපි ඒ සමාගම්වල ආදායම රුපියල් බිලියන 1.6කින් වර්ධනය කරලා තිබෙනවා. ඒ වාගේම ඒ සමාගම්වල වියදම - OpEx cost - රුපියල් බිලියන 1.1කින් අඩු කරලා තිබෙනවා. එමෙන්ම අපි දන්නවා, SLT සහ Mobitel කියන ආයතන දෙක ඒකාබද්ධ කළාට මේකේ ඇතුළේ පද්ධතිය සහ කරන වැඩකටයුතු ඒකාබද්ධ වෙලා තිබුණේ නැහැ කියලා.

ඒ වැඩකටයුතු ඒකාබද්ධ කිරීම හරහා අපි වියදම අඩු කරගෙන තිබෙනවා. ඒ වාගේම, ප්‍රාග්ධන වියදම් අඩු කරගෙන තිබෙනවා; සියයට 9ක් වාගේ ප්‍රමාණයකට ප්‍රාග්ධන වියදම අඩු කර තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පිළිතුර කෙටි කරන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)

හොඳයි, ගරු කථානායකතුමනි. අනෙක් කාරණාව මේකයි. ඒ හරහා අපි ඒ සමාගම්වල තිබෙන ණය ප්‍රමාණය රුපියල් බිලියන 13කින් අඩු කර තිබෙනවා, මේ ලැබුණු ලාභයෙන්. ඒ හරහා ඇත්තටම ඒ සමාගම අපි ලාභ ලබන ආයතනයක් බවට පත් කර තිබෙනවා.

## අලව්ව ජල යෝජනා ක්‍රමය: ආවරණය වන ප්‍රදේශ
## அளவ்வ குடிநீர்த் திட்டம்: உள்வாங்கப்படும் பிரதேசங்கள்
## ALAWWA WATER SCHEME: COVERAGE

1265/2025

**10.** ගරු අශෝක ගුණසේන මහතා
(மாண்புமிகு அசோக குணசேன)
(The Hon. Ashoka Gunasena)

නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පොල්ගහවෙල, පොතුහැර, අලව්ව ජල යෝජනා ක්‍රමයෙන් පානීය ජලය ලබා දීමට නියමිත ප්‍රදේශ කවරේද;

(ii) එමඟින් පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ආවරණය නොවන ප්‍රදේශ කවරේද;

(iii) මේ වනවිට උග්‍ර පානීය ජල හිඟයකින් පීඩා විඳින පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ග්‍රාම නිලධාරි වසම් 13ක පවුල් 2,500කට අධික සංඛ්‍යාවක් ඉහත යෝජනා ක්‍රමයෙන් ආවරණය නොවන බව දන්නේද;

(iv) ඊට හේතු කවරේද;

(v) ඉහත යෝජනා ක්‍රමයේ මුල් සැලසුමෙහි එම වසම්වලට ජලය ලබා දීමට පැවති වැඩ පිළිවෙළ පසුව වෙනස් කර තිබේද;

(vi) ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) 2025 අය වැයෙන් ඉහත යෝජනා ක්‍රමයට වෙන් කරන ලද ප්‍රතිපාදන වැය කරන අරමුණු කවරේද;

(ii) එමඟින් ඉහත අ(iii)හි සඳහන් ගැටලුවට විසඳුම් ලබා දෙන්නේද;

(iii) ඉහත යෝජනා ක්‍රමය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරා ගෙන තිබේද;

(iv) එසේ නම්, ඉහත පවුල්වලට පානීය ජලය ලබා දීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, ඉහත යෝජනා ක්‍රමයෙන් ආවරණය නොවීමට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பொல்கஹவெல, பொத்துஹெர, அளவ்வ குடிநீர்த் திட்டத்திலிருந்து குடிநீர் விநியோகிக்கப் படவுள்ள பிரதேசங்கள் யாவை;

(ii) இத்திட்டத்தில் உள்வாங்கப்படாத பொல்கஹவெல பிரதேச செயலாளர் பிரிவிலுள்ள பிரதேசங்கள் யாவை;

(iii) தற்போது கடுமையான குடிநீர்த் தட்டுப் பாட்டால் இன்னலுக்கு உள்ளாகியுள்ள பொல்கஹவெல பிரதேச செயலாளர் பிரிவிலுள்ள, 13 கிராம அலுவலர் பிரிவுகளைச் சேர்ந்த 2,500க்கும் மேற்பட்ட குடும்பங்கள் மேற்படி குடிநீர்த் திட்டத்தில் உள்வாங்கப் படவில்லை என்பதை அவர் அறிவாரா;

(iv) இதற்கான காரணங்கள் யாவை;

(v) இக்குடிநீர்த் திட்டத்தின் பூர்வாங்கத் திட்டத்தில் மேற்படி கிராம அலுவலர் பிரிவுகளுக்கும் குடிநீரை விநியோகிப்பதற்கு ஏற்கனவே முன்மொழியப்பட்டிருந்த வேலைத்திட்டம் பின்னர் மாற்றம் செய்யப்பட்டதா;

(vi) அதற்கான காரணங்கள் யாவை;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) 2025ஆம் ஆண்டு வரவு செலவுத்திட்டத்தில் மேற்படி குடிநீர்த் திட்டத்துக்கென ஒதுக்கப்பட்ட நிதி எவ்வாறான நோக்கங்களுக்காகச் செலவிடப்படும்;

(ii) இதன்மூலம் அ(iii) இல் குறிப்பிடப்பட்டுள்ள பிரச்சினைகளுக்குத் தீர்வு வழங்கப்படுமா;

(iii) மேற்படி குடிநீர்த் திட்டத்தை தேசிய நீர் வழங்கல், வடிகாலமைப்புச் சபை பொறுப்பேற்றுள்ளதா;

(iv) ஆமெனின், மேற்படி குடும்பங்களுக்கு குடிநீரை விநியோகிப்பதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை;

(v) மேற்படி குடிநீர்த் திட்டத்தில் வீரம்புகெதர பிரதேச செயலாளர் பிரிவு உள்வாங்கப்படாமைக்கான காரணங்கள் யாவை;

என்பதையும் அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Urban Development, Construction and Housing:

(a) Will he state -

(i) the areas to which drinking water is to be supplied from the Alawwa Water Scheme in Pothuhera, Polgahawela;

(ii) the areas which are not covered by it within the Polgahawela DS Division;

(iii) whether he is aware that over 2,500 families in 13 Grama Niladhari Divisions within the Polgahawela DS Division, who suffer due to an acute drinking water scarcity, are not covered by the above scheme;

(iv) the reasons for it;

(v) whether the move to provide water to the above divisions according to the original plan has been changed later; and

(vi) the reasons for it?

(b) Will he also state -

(i) the objectives for which the provisions allocated from the 2025 Budget for the above scheme are spent;

(ii) whether solutions will be given from it to the problem referred to in (a)(iii) above;

(iii) whether the above scheme has been acquired to the NWSDB;

(iv) if so, the measures that will be taken to supply drinking water to the above families; and

[ගරු අශෝක ගුණසේන මහතා]

(v) the reasons why the Weerambugedara DS Division is not covered by the above scheme?

(c) If not, why?

**ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්ගහවෙල, අලව්ව, කුරුණෑගල, මල්ලවපිටිය සහ වීරඹුගෙදර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 5 තුළ පිහිටි ග්‍රාම නිලධාරි වසම් 167ක ජනතාවට මෙම ව්‍යාපෘතිය මඟින් පානීය ජලය ලබා දීමට අපේක්ෂා කරනවා. එම ග්‍රාම නිලධාරි වසම් පිළිබඳ විස්තරය ඇමුණුම ලෙස ඉදිරිපත් කර තිබෙනවා. ඇමුණුම **සභාගත*** කරමි.

(ii) පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ මායිමේ පිහිටි අහුගොඩ නැඟෙනහිර, ඉහළ උඩපොළ, මාවත්ත සහ මැද අහුගොඩ යන ග්‍රාම නිලධාරි වසම් හතර මේ ජල යෝජනා ක්‍රමයෙන් ආවරණය වෙන්නේ නැහැ.

(iii) මෙම ව්‍යාපෘතිය සැලසුම් කර තිබෙන්නේ 2037 වනවිට උක්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 5හි ග්‍රාම නිලධාරි වසම් 167ක් සම්පූර්ණයෙන්ම ආවරණය වන පරිදි. එමඟින් පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි, ඇමුණුමෙහි සඳහන් ග්‍රාම නිලධාරි වසම් 80හි උස් බිම්වල ජීවත් වන ජනතාවටද පිරිසිදු පානීය නළ ජල පහසුකම් සැපයීම අපේක්ෂා කරනවා. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ සැලසුම්වලට අනුව ඇතුළත් නොවන ග්‍රාම නිලධාරි වසම් හැර ඉතුරු වසම් සඳහා ජලය සැපයෙනවා.

(iv) ග්‍රාම නිලධාරි වසම් 4 පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි මායිම්වල පිහිටි ග්‍රාම නිලධාරි වසම් වන හෙයින් මෙම ජල සම්පාදන ව්‍යාපෘතියෙහි තාක්ෂණික නිර්ණායකයන්ට අනුකූලව නිර්දේශ කරලා නැහැ. ඒ සඳහා වෙනම විකල්ප යෝජනා ක්‍රමයක් යෝජනා වෙලා තිබෙනවා. මම ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් විස්තර ඉදිරිපත් කරන්නම්.

(v) නැත.

(vi) අදාළ නොවේ.

(ආ) (i) මේ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුගේ කාලයේ හිඟ බිල්පත් සඳහා ගෙවීම් සිදු කිරීම සහ ව්‍යාපෘතියෙහි පොතුහැර සහ බෝයගනේ කලාපයන්හි බෙදා හැරීම් ජල නළ පද්ධතියෙහි ඉතිරි වැඩ නිම කිරීම වෙනුවෙන් ගෙවීම් සිදු කිරීම සඳහා තමයි 2025 අය වැය අපි පාවිච්චි කර තිබෙන්නේ.

(ii) ඇත්තටම 2025 අය වැයෙන් ඒකට විසඳුම් ලැබෙන්නේ නැහැ. කෙසේ වෙතත්, මෙම ව්‍යාපෘතිය මඟින් 2037 වර්ෂය වන විට මම කලින් කිව්වා වාගේ පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරි වසම් 80 සම්පූර්ණයෙන් ආවරණය කරන්න බලාපොරොත්තු වනවා.

ඒ වාගේම පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ මායිමේ පිහිටි අහුගොඩ නැඟෙනහිර, ඉහළ උඩපොළ, මාවත්ත සහ මැද අහුගොඩ යන ග්‍රාම නිලධාරි වසම් සඳහා ජල සැපයුම ලබා දීම සම්බන්ධයෙන් අධ්‍යයනයක් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒක වීරඹුගෙදර ජල සම්පාදන යෝජනා ක්‍රමයෙන් වෙන්නේ.

(iii) ඔව්.

මේ ව්‍යාපෘතියේ තුලුමුව - water intake, ජල පවිත්‍රාගාර, අලව්ව සහ පොල්ගහවෙල බෙදාහැරීම් කලාපයන්ට අයත් සම්ප්‍රේෂණ ජල නළ පද්ධතිය, ජල ගබඩා සහ බෙදාහැරීම් පද්ධතිය යන ව්‍යාපෘතියෙන් දළ වශයෙන් සියයට 80ක පමණ කොටසක් මේ වනකොට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරාගෙන ඒ අදාළ කටයුතු කරගෙන යනවා.

(iv) මේ ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ ඉහත පවුල්වලට පානීය ජලය ලබා දීමට ගනු ලබන පියවර කවරේද කියන එක.

මම කලිනුත් සඳහන් කළා වාගේ, 2037 වෙනකොට සම්පූර්ණ කරන්න බලාපොරොත්තු වෙන පොල්ගහවෙල, පොතුහැර, අලව්ව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය මඟින් මේ ප්‍රදේශයේ ජනතාවට අඛණ්ඩ ජල සැපයුමක් ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා. ඒකට සරිලන ජල පවිත්‍රාගාර, water tanks සහ අනෙකුත් දේවල් හදන්න බලාපොරොත්තු වෙනවා. මේ ඉදිකිරීම් කටයුතුවල මුල් සැලසුමේදී, මේ නිෂ්පාදනය වන ජල ප්‍රමාණය මුළු ජනතාවට බෙදාහැරීම සඳහා කිලෝමීටර 320ක ජල නල අතුරන්න සැලසුම් කරලා තිබුණා. නමුත්, ව්‍යාපෘතියේ පැවති මූල්‍ය සීමාවන් නිසා මේ ප්‍රමාණය කිලෝමීටර 182 දක්වා අඩු කරන්න සිද්ධ වුණා. මේ අනුව මෙම බෙදාහැරීමේ නල පද්ධතිය කිලෝමීටර 320ක් සේවා දිගු කිරීමේදී අවශ්‍ය වන උස් ස්ථාන හැර, අනෙකුත් ස්ථානවලට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් මේ වෙනකොට අදාළ ඉදිකිරීම් කටයුතු කරගෙන යනවා. ඒ වාගේම, මේ ව්‍යාපෘතියේ ආවරණ කලාපය තුළ ඇති උස් ස්ථානවල තිබෙන ස්ථාන 64ක්, ග්‍රාම නිලධාරි වසම් 64ක පානීය ජලය සැපයීම සඳහා සවිස්තරාත්මක තොරතුරු අධ්‍යයනයක් මේ වන විටත් මණ්ඩලය විසින් කරගෙන යනවා. ඒ සැලසුම් සකස් කරලා අවසාන වුණාට පස්සේ අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දීමත් එක්ක අපට ඒ අනුව කටයුතු කරන්න පුළුවන්.

මම කලින් සඳහන් කළ වසම් හතර තිබෙන්නේ පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මායිමේ. ඒ හතර වීරඹුගෙදර ජල සම්පාදන ව්‍යාපෘතිය, ගිරිඋල්ල, දඹදෙණිය සහ නාරම්මල ජල සම්පාදන ව්‍යාපෘතිය මඟින් ආවරණය කරන්න සැලසුම් කර තිබෙනවා. ඒ අනුව වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

සැවැන්දන ග්‍රාම නිලධාරි වසම පමණක් මෙම ව්‍යාපෘතියෙහි විෂය පථයට අන්තර්ගත කොට තිබෙනවා. අනෙක් කොටස් වීරඹුගෙදර ජල සම්පාදන ව්‍යාපෘතිය මඟින් ආවරණය කරන්න බලාපොරොත්තු වෙනවා.

(v) ගරු මන්ත්‍රීතුමනි, ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනෙකුත් ග්‍රාම නිලධාරි වසම් මේ ජල සම්පාදන ව්‍යාපෘතියේ තිබෙන තාක්ෂණික නිර්ණායකයන්ට සහ ශක්‍යතාවට අනුකූල නොවීම නිසා තමයි එම ප්‍රදේශය මේ ජල ව්‍යාපෘතියෙන් ඉවත් කරලා, ඒ වෙනුවෙන් විශේෂ ජල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙන්නේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු අශෝක ගුණසේන මහතා**
(மாண்புமிகு அசோக குணசேன)
(The Hon. Ashoka Gunasena)
ස්තුතියි, ගරු අමාත්‍යතුමනි. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මා ඔය ආශ්‍රිතව තමයි මේ ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙන්නේ. මා ඔය ආශ්‍රිතව අලව්ව සහ පොල්ගහවෙල ප්‍රදේශ ඇතුළේ පිහිටි උස් ස්ථානවලට ජලය සපයන්නේ නැහැ. උස් ස්ථානවලට තමයි ජලය අත්‍යවශ්‍ය වෙලා තිබෙන්නේ. National Water Supply and Drainage Board එක හඳුනාගෙන තිබෙනවා, දැනට ස්ථාන 48කට අයත් පවුල් 1,400ක විතර ප්‍රමාණයකට මේ ජල සැපයුමේ දැඩි අවශ්‍යතාවක් තිබෙනවා කියලා. නමුත්, දැන් ඒ ටික අතහැරලා මේ ව්‍යාපෘතිය සකස් වෙන්නේ ඇයි? උස් බිම්වලට නේ, ජලය සැපයීමේ වැඩි අවශ්‍යතාවක් තිබෙන්නේ.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු මන්ත්‍රීතුමනි, මගේ පිළිතුරේත් සඳහන් කළා වාගේ උස් ස්ථාන 80කට මේ ජල ව්‍යාපෘතිය මඟින් ජලය සම්පාදනය කරන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ. නමුත්, මේ උස් ස්ථාන 80න්, ස්ථාන 64කට පමණක් පානීය ජලය සැපයීම සඳහා මේ වෙනකොට අධ්‍යයනයක් කරමින් ඉන්නවා. ඒ වාගේම, ඒ අධ්‍යයනය කිරීමෙන් පස්සේ අදාළ සැලසුම් සකස් කරලා මූල්‍ය ප්‍රතිපාදන ලැබෙන විධියට අපට ඒ ස්ථානවල පිහිටි ග්‍රාම නිලධාරි වසම් 64ට අදාළ එම ප්‍රදේශවලට ජලය සම්පාදනය කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න පුළුවන්. නමුත්, මේ වන විට ඒක තිබෙන්නේ සැලසුම් මට්ටමේ.

**ගරු අශෝක ගුණසේන මහතා**
(மாண்புமிகு அசோக குணசேன)
(The Hon. Ashoka Gunasena)
ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

පොතුහැර කියන්නේ වීරඹුගෙදර ප්‍රදේශයට ආසන්න ප්‍රදේශයක්. වීරඹුගෙදර තමයි ජල ප්‍රභවයක්, ජල මූලාශ්‍රයක් නැති තැන. ඇත්තටම ප්‍රජා ජල ව්‍යාපෘතියකට පවා තැන් සොයා ගන්න අපහසු ප්‍රදේශය හැටියට තිබෙන්නේ එම ප්‍රදේශයයි. එම නිසා පොතුහැර හදලා තිබෙන ටැංකිය ආශ්‍රයෙන් වීරඹුගෙදර ප්‍රදේශයට ජලය සැපයීමේ හැකියාවක් තිබෙනවා ද? එහෙම නැත්නම් ඒ වෙනුවෙන් ඉදිරියේදී කටයුතු කරන්න ඔබතුමා මැදිහත් වෙනවා ද?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ඔබතුමා අසන ලද ප්‍රශ්නයේ (ආ) (v) යටතේ මම ඔය කාරණයට අදාළව පිළිතුරු සඳහන් කළා. වීරඹුගෙදර ජල සම්පාදන ව්‍යාපෘතියක් මේ වෙනකොට යෝජනා වෙලා තිබෙනවා. ඒකට සැලසුම් සකස් කර තිබෙනවා.

ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළාට පස්සේ ඔබතුමා සඳහන් කරන ප්‍රදේශ ආවරණය කරලා ඒ ප්‍රදේශයේ ජනතාවට පානීය ජලය ලබා දෙන්න පුළුවන්කම තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sajith Premadasa, you may raise your Question under Standing Order 27(2).

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### විරැකියාව අවම කිරීම
### வேலையின்மையைக் குறைத்தல்
### MINIMIZATION OF UNEMPLOYMENT

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකාවේ රැකියා විරහිතභාවය සමස්ත සමාජයට මෙන්ම ආර්ථිකයටද දැඩි බලපෑමක් ඇති කරන ජාතික ගැටලුවක් වේ. විශේෂයෙන්ම අධ්‍යාපන සුදුසුකම් ලබමින් උසස් කුසලතා සහිත තරුණ තරුණියන් රැකියාවකින් තොරව සිටීම ඔවුන්ගේ පෞද්ගලික අනාගතය පමණක් නොව, රටේ සමස්ත ආර්ථිකයට ද අහිතකර අන්දමින් බලපානු ලබයි. රැකියා විරහිතභාවය හේතුවෙන් තරුණ තරුණියන් නීති විරෝධී ක්‍රියාකාරකම්, අපරාධ හා මත්ද්‍රව්‍ය භාවිතය වැනි දෑ සඳහා යොමු වීමේ ඉඩකඩ වැඩි වේ. එබැවින් රැකියා විරහිතභාවය අවම කිරීම සඳහා සෑම රජයක්ම ප්‍රමුඛතාවකින් යුතුව කටයුතු කළ යුතුව තිබෙනවා. ඒ අනුව පහත සඳහන් ප්‍රශ්න මම ඉදිරිපත් කරනවා.

01. වර්තමානයේ ශ්‍රී ලංකාවේ රැකියා විරහිතභාවය කොපමණද?

02. අපොස (සාමාන්‍ය පෙළ) සමත්, අපොස (උසස් පෙළ) සමත් සහ උපාධිධාරීන් වැනි අධ්‍යාපන සුදුසුකම් අනුව ඒ ප්‍රමාණය සංඛ්‍යාත්මකව කොපමණද?

03. රැකියා විරහිතභාවය සමාජය තුළ ව්‍යසනකාරී තත්ත්වයක් නිර්මාණය කළ හැකි දෙයක් බවට රජය පිළිගන්නේද?

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

04. රැකියා විරහිතභාවය අවම කිරීම සඳහා රජය විසින් ගෙන ඇති කෙටි කාලීන, මධ්‍ය කාලීන, දිගු කාලීන පියවර කවරේද?

05. රැකියා විරහිතභාවය අවම කිරීම සාර්ව ආර්ථික ඉලක්කයන් ලෙස සලකන බැවින් ඉදිරි වසර කිහිපය තුළ (2025, 2026, 2027 යන වර්ෂවල) රජය බලාපොරොත්තු වන රැකියා විරහිතභාවය අවම කර ගැනීමේ ප්‍රතිශතාත්මක ඉලක්කයන් කවරේද?

06. ඒ වාගේම උපාධිධාරීන් 35,000ත්, 40,000ත් අතර ප්‍රමාණයක් රැකියා නොමැතිව අද මහ පාරේළත වෙනවා. විශේෂයෙන්ම 20,000ක් ගුරු වෘත්තියටත්, 3,000ක් STEM ක්ෂේත්‍රයටත්, 9,000ක් non-STEM ක්ෂේත්‍රයටත්, Sri Lanka Customs එකට, Inland Revenue Department එකට, Excise Department එකට 3,000කුත්; මුළුමනින්ම ගත් කල 35,000ක් වන උපාධිධාරීන්ට රැකියා ලබා දෙනවා කියපු වර්තමාන රජය තමන්ගේ ප්‍රතිපත්තියට අනුකූලව - ඕනෑ නම් මම මෙය සභාගත කරන්නම්, තමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය කාට හරි අමතක වෙලා තිබෙනවා නම් - මේ 35,000ක් උපාධිධාරීන්ට රැකීරක්ෂා ටික ලබා දෙන කාල වකවානුව කවරේද කියන එකත් මම අහන්නට කැමැතියි.

ගරු අග්‍රාමාත්‍යතුමිය පැහැදිලිව කියලා තිබෙනවා, උපාධි ක්ෂේත්‍රයේ රැකියා ඇබෑර්තු 50,000කට වැඩි ප්‍රමාණයක් තිබෙන බව. ඒ තුළින් මේ 35,000ට රැකීරක්ෂා ලබා දීමත්, ගුරු වෘත්තියේ නියැළී සිටින සංවර්ධන නිලධාරීන්ට ගුරු වෘත්තියේ රැකියා ලබා දීමත් ඉතාම පහසු කාරණාවක්. මේ සම්බන්ධව රජයෙන් උත්තර බලාපොරොත්තු වෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ප්‍රශ්නය text එකට සීමා කරන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අගමැතිතුමිය දැනුම් දීලා තිබෙනවා, ඉදිරියේදී පිළිතුර ලබා දෙනවා කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා.

## II

## වාහන වායු විමෝචන පරීක්ෂණවල තත්ත්වය වැඩිදියුණු කිරීම
### வாகனப் புகை வெளியேற்றப் பரிசோதனையின் தரத்தை மேம்படுத்தல்
### IMPROVEMENT OF QUALITY OF VEHICLE EMISSION TESTING

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27(2)இன்கீழ் போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர் அவர்களிடம் கேள்வி கேட்பதற்கு அனுமதித்ததற்கு நன்றி!

2024 மார்ச் 18ஆம் திகதியன்று வெளியிடப்பட்ட ஐரோப்பிய ஆணைக்குழுவின் அறிக்கையின்படி, புதிய பயணிகள் 'கார்' மற்றும் 'வேன்' என்பவற்றின் உண்மையான காபனீரொட்சைட் ($CO_2$) வெளியேற்ற அளவுக்கும் வாகனப் பரிசோதனைச் சான்றிதழ் அறிக்கைக்கும் இடையே பல மடங்கு வித்தியாசம் காணப்படுகின்றது. இலங்கையில் நடைமுறையிலுள்ள புகை வெளியேற்றப் பரிசோதனை முறைமையானது, வெறுமனே வருவாய் ஈட்டும் ஒரு கருவியாக மட்டும் செயற்படாமல், வளிமண்டல வாயு மாசடைதலைக் கட்டுப்படுத்தும் ஒரு சிறந்த செயற்றிட்டமாகவும் அமைய வேண்டும். தற்போதைய சூழ்நிலையில் அரச திணைக்கள வாகனங்கள் வீதியில் செல்லும்போது வெளியிடும் மிகையான புகை காரணமாக பொது மக்கள், குறிப்பாக சிறுவர்கள், குழந்தைகள், பாடசாலை மாணவர்கள் பல்வேறு சிரமங்களை எதிர்கொள்வதுடன் சுவாச நோய்களுக்கும் உட்படுகின்றனர். அதன் அடிப்படையில், பின்வரும் வினாக்களை நான் கேட்கின்றேன்.

1. கடந்த ஐந்து ஆண்டுகளில் புகை வெளியேற்றப் பரிசோதனை முறைமையின்கீழ், பரிசோதிக்கப்பட்ட வாகனங்களின் மொத்த எண்ணிக்கை, அதன்மூலம் கிடைத்த மொத்த வருமானம், அதில் அரசாங்கத்துக்கும் முகவர் நிறுவனங்களுக்கும் கிடைக்கப்பெற்ற வருடாந்த தேறிய வருமானம் எவ்வளவு?

2. 2024ஆம் ஆண்டில் புகை வெளியேற்றப் பரிசோதனைக்கு உட்படுத்தப்பட்ட தனியார் மற்றும் அரசாங்க வாகனங்களின் மொத்த எண்ணிக்கை எத்தனை?

3. மொத்த அரசாங்க வாகனங்களில், குறிப்பாக இராணுவம், காவல்துறை மற்றும் பொதுப் போக்குவரத்துச் சேவையில் ஈடுபடும் வாகனங்களில் எத்தனை வாகனங்கள் 2024ஆம் ஆண்டில் புகை வெளியேற்றச் சான்றிதழைப் பெறுவதற்காகப் பரிசோதிக்கப்பட்டன?

4. புகை வெளியேற்றப் பரிசோதனை முறைமை குறித்த மதிப்பீடு மற்றும் ஆய்வு அறிக்கைகள் இருப்பின், அதனை மேம்படுத்துவதற்காக அவற்றில் குறிப்பிடப்பட்டுள்ள முக்கிய பரிந்துரைகள் என்ன?

5. புகை வெளியேற்றப் பரிசோதனைக் கட்டணத்தை மீள்பரிசீலனை செய்ய இந்த அரசாங்கம் உத்தேசித்துள்ளதா? அவ்வாறாயின், திருத்தப்பட்ட புதிய கட்டணம் எவ்வளவு?

6. இன்று நாளாந்தம் வீதி விபத்துகள் அதிகரித்துவரும் சூழ்நிலையில், வாகனங்களின் தரம், அவை வீதியில் ஓடுவதற்கான பொருத்தப்பாடு பற்றி பரிசீலிப்பதற்கான சிறந்ததொரு பொறிமுறையை ஏற்படுத்த முடியுமா?

7. இன்றேல் ஏன்?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

Hon. Deputy Speaker, the Answer to the Question raised by the Hon. Member under Standing Order No. 27 (2) is as follows:

01.

| Year | Total Initial Test count | Total Revenue (LKR in Million) | Contractor's fee (LKR in Million) | VET Fund (LKR in Million) | Gov. Tax (LKR in Million) |
|---|---|---|---|---|---|
| 2020 | 5,238,823 | 3067.6 | 2582.2 | 258.2 | 227.2 |
| 2021 | 5.550,473 | 3232.7 | 2721.1 | 272.1 | 239.5 |
| 2022 | 5,573,865 | 3388 | 2722.3 | 273 | 393.4 |
| 2023 | 5,720,021 | 4365.5 | 3364.7 | 336.5 | 664.3 |
| 2024 | 5,799,683 | 4843.8 | 3638.5 | 363.3 | 841.5 |

02. The emission testing database does not categorize vehicles as government or private. However, under the Motor Traffic Act, every vehicle must obtain an annual emission certificate in order to renew its revenue licence. Vehicles without a valid certificate cannot legally operate on the road.

03. Disaggregated data for these categories is not available. Nevertheless:

- Almost all government vehicles require a revenue licence, and therefore, must obtain an emission certificate.
- Military vehicles are exempt from presenting at regular test centres. Instead, VET officers conduct inspections within military camps. Many military camps have their own testing machines. So, what we do is, we send VET officers to examine the testing.
- In 2024, 4,565 Army vehicles were tested under this arrangement.

04. Yes. The Cabinet has approved a comprehensive study for the next phase of vehicle testing, which will integrate a roadworthiness test from 01st of January, 2028.

Key findings and recommendations include:

- Testing Method: Current "no-load" tests do not reflect the real-world conditions of vehicles. Introduction of "loaded" testing is recommended.
- Misuse of Certificates: Some vehicle owners make temporary adjustments solely to pass tests. Regulations should be updated to include garage accreditation and improved technician training.
- Public Awareness: Awareness of the health risks of air pollution remains low. Continuous awareness campaigns are required.
- Fuel Quality: Existing tests cannot detect adulterated fuel. Penalty systems should be updated accordingly.
- Enforcement: No spot-fine system exists for failed vehicles or non-compliant contractors. Enforcement mechanisms must be strengthened.
- Police Role: Current procedures are too complex, discouraging roadside checks. Simpler practices should be introduced by law.
- Old Vehicles: The absence of a scrapping policy allows very old vehicles to remain in use. Phased retirement is recommended.
- Institutional Authority: The Vehicle Emission Testing (VET) Fund is the only body overseeing the programme. The VET Fund lacks legal standing. It should be strengthened and recognized by law to ensure proper oversight.

05. Since the programme began in 2008, the contractor's test fee has been revised five times. The most recent fees effective from 01st of October, 2025 are as follows:

| | |
|---|---|
| Motor Cycle (Petrol) | LKR 640.00 |
| Motor Tricycle (Petrol/ Diesel) | LKR 770.00 |
| Motor Car (Petrol/ Diesel) | LKR 1,690.00 |
| Dual Purpose Vehicle/Van (Petrol/ Diesel) | LKR 1,840.00 |
| Motor Lorry (Petrol/ Diesel) | LKR 2,400.00 |
| Motor Coach (Petrol/ Diesel) | LKR 1,550.00 |
| Prime Movers (Diesel) | LKR 2,540.00 |

06. Yes. The Government has recognized the need to strengthen mechanisms for reducing accidents. While human error is the leading cause, poor vehicle condition increases accident severity.

Measures that are being introduced include:

- Establishing a special permit system for public transport drivers.
- Upgrading the Road Safety Council to commission level for stronger enforcement.
- Increasing roadside inspections.
- Introducing a roadworthiness test to be conducted annually alongside the emission test.
- Launching multi-level awareness programmes and school-based road safety units.

ගරු කථානායකතුමනි, මේක තමයි ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට සම්පූර්ණ පිළිතුර. අප මාධ්‍ය සාකච්ඡාවක් පවත්වලා වාර්තා කරනු ලැබුවා, ඉදිරියේදී කරන්න බලාපොරොත්තු වන ක්‍රියාමාර්ග ගණනාවක්. ඒකෙදි අපි බලාපොරොත්තු වෙනවා, සියලු පොදු වාහන පදවන, පොදු මගී ප්‍රවාහනය - public transport - සිදු කරන සියලු රියැදුරු මහත්වරුන්ට විශේෂ driving licence එකක් ලබා දෙන්න. ඒක දැනුත් තිබෙන දෙයක්. ඒක ලබන දෙසැම්බර් 31වැනි දා වෙනකොට හරියාකාරව ලබා ගන්න කියලා අපි ඉල්ලා සිටිනවා. ඊට අදාළ පහසුකම් සකස් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම, අපි මෝටර් රථ වාහන නියාමකයන්ට, පරීක්ෂකයන්ට දැනට උපදෙස් දීලා තිබෙනවා, school vans, office vans, buses පරීක්ෂා කරන්න කියලා.

[ගරු බිමල් රත්නායක මහතා]

ගරු මන්ත්‍රීතුමනි, මෑතකදී සිද්ධ වෙච්ච ඇල්ල බේදවාචකයේ වාර්තාව අපට ඊයේ ලබා දුන්නා. එය upload කරලා තිබෙනවා. ඕනෑ කෙනෙකුට ගන්න පුළුවන්, website එකෙන්. එයට අනුව ඉතා පැහැදිලි කාරණා රාශියක් තිබෙනවා. ඒ රියැදුරු මහත්මයා කිසිදු විවේකයකින් තොරව අධික පැය ප්‍රමාණයක් drive කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඒකේ බ්‍රේක්වල බරපතළ ගැටලු තිබිලා තිබෙනවා මේ ගමන එන්න කලින් පවා. ඒ වාගේ, වාහනවල ප්‍රශ්න, රියැදුරන්ගේ ප්‍රශ්න තිබෙනවා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, වාහනවලට, විශේෂයෙන් පොදු ගමනාගමනයේ යන වාහනවලට මොන ලයිසන් තිබුණත්, වාහනය පාරට දාන්න කලින් මාර්ගයේ ධාවනය කරන්න පුළුවන්ද කියන එක, roadworthiness සම්බන්ධ පරීක්ෂණයක් කරන්න. අපි බලාපොරොත්තු වෙනවා, පාර්ලිමේන්තුව පැත්තෙන් මේකට සහයෝගයක් ලබා දෙයි කියලා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුර පැහැදිලියිද?

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

கௌரவ அமைச்சர் அவர்களே, எதிர்காலத்தில் மக்களைப் பாதிக்காத வகையில், தெளிவானதும் விரிவானதுமான விடைகளைத் தந்ததற்கு நன்றி!

நாளாந்தம் அதிகரித்துவரும் வீதி விபத்துகளைக் கட்டுப்படுத்துவதற்கான ஒரு பொறிமுறையை ஏற்படுத்த வேண்டிய தேவை இருக்கின்றது. எனவே, தொடர்ந்தும் இந்த vehicle emission testingஐ இதே மட்டத்தில் பேணாமல், இவ்விடயம் தொடர்பில் அரசாங்கம் விசேட கவனத்தைச் செலுத்தி, போக்குவரத்தில் ஈடுபடும் வாகனங்கள் உரிய தரத்தில் இருக்கின்றனவா என்பதைப் பரிசோதிப்பதற்கு நடவடிக்கை எடுக்கப்பட வேண்டும். மேலும், வாகனத்தின் engine, brake, signal lights, tyres போன்றவற்றை உள்ளடக்கி, மத்திய மயப்படுத்திய சான்றிதழ் வழங்கும் திட்டத்தை எதிர்காலத்தில் கொண்டுவந்தால், வீதி விபத்துகளைக் குறைத்து, நல்ல முறையில் போக்குவரத்துச் சேவையை மேற்கொள்ளலாமென நான் நினைக்கின்றேன். எனவே, இதனை உங்களுடைய எதிர்காலச் செயற்றிட்டங்களில் உள்வாங்குமாறு தயவாகக் கேட்டுக் கொள்கின்றேன். நன்றி!

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා, දැනටම vehicle emission testing එක කරන්නේ වාහනයේ running condition එකේදී නොවෙයි, neutral තත්ත්වයේදී බව. එම නිසා ඇත්තටම එහි real situation එක එන්නේ නැහැ. ඉදිරියේදී එවැනි මට්ටමේ testsවලට අපට යන්න සිද්ධ වනවා. ඒ සඳහා පසුගිය කාලයේ යම් යම් තීරණ අරගෙන තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගකින් තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, VET Fund එක පිහිටුවන්නේ. 1999දී පංච පුද්ගල විනිසුරු මඩුල්ලක් මඟින් තමයි වාහනවල emission level එක පරීක්ෂා කරන ආයතනයක් පිහිටුවන්න කියලා නියෝග දීලා තිබෙන්නේ. එය හුදු පනතකින් පමණක් නියම කර තිබෙන දෙයක් නොවෙයි. එය ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයක්. ඒ කෙසේ වෙතත්, මේකත් එක්ක බැඳුණු විශාල ගැටලු ප්‍රමාණයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇල්ල accident එකට සම්බන්ධ බස් එක ගත්තත්, ඒක මිලදී අරගෙන තිබෙන්නේ රුපියල් ලක්ෂ 55කට. ඒකේ modificationsවලට රුපියල් ලක්ෂ 80ක් විතර වියදම් කරලා තිබෙනවා. පෙනෙන හැටියට ඒ රියැදුරු මහත්මයා පැය 30කට වැඩි කාලයක් විවේකයෙන් තොරව රිය ධාවනය කරලා තිබෙනවා. අපි කඳුකර ප්‍රදේශවල පමණක් වංගු සහිත පාරවල්වල guard mirrors සවි කරන්න රුපියල් මිලියන 1,000ක් වෙන් කරලා තිබෙනවා. එය කලින් වෙන් කරලා තිබුණු මුදලක්. මේ අනතුර නිසා වෙන් කළා නොවෙයි. අපි දැන් කඳුකර ප්‍රදේශවල අලුත් වැඩ පිළිවෙළක් පටන් අරගෙන තිබෙනවා, "තවත් ටිකක් පරිස්සමෙන්" කියලා. අපි මහන්සි වෙනවා. නමුත්, මේ අනතුරු වළක්වා ගැනීම සංස්කෘතියක් බවටම පත් වෙන්න ඕනෑ, වාහන, මිනිස්සු, driversලා කියන තුන්ගොල්ලන්ම කැප වන.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩියක් දෙන්න, මේ කාරණයත් කියලා කථාව අවසන් කරන්න.

මේ මෑතකදී අධිකරණ නියෝගයක් ලබා දුන්නා. ආබාධිතයන් වෙනුවෙන් සියලු දුම්රිය ස්ථානවල ප්‍රවේශ පහසුකම් සලසන්න කියලා. අපි ඒමට පෙර දුම්රිය දෙපාර්තමේන්තුව පැත්තෙන් නිසියාකාර ප්‍රතිපත්තිමය පිළිතුරු උසාවියට ලබා දීලා තිබුණේ නැහැ. එම නිසා අපි දුම්රිය දෙපාර්තමේන්තුවට උපදෙස් ලබා දුන්නා. අපේ ආණ්ඩුවේ ප්‍රතිපත්තියක්, ආබාධිත ජනතාවට සලකන එක. අපි ඒකට පාර්ලිමේන්තුව නියෝජනය කරන්න මන්ත්‍රීවරයෙකුම රැගෙන ඇවිත් පෙන්වා තිබෙනවා. අපට එක වතාවක ඒ සියල්ල කරන්න බැරි වුණත්, අපි දුම්රිය ස්ථානවල සහ පොදු මහජන ස්ථානවල ආබාධිත අයට ප්‍රවේශ පහසුකම් සලසන්න උපරිම වශයෙන් කටයුතු කරනවා. අපි අධිකරණයටත් දැනුම් දීලා තිබෙනවා, අපේ ප්‍රතිපත්තිය එය බව.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Members, we have intruded into the time allotted for Public Business by 20 minutes.

දිනට නියමිත කටයුතු.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, Hon. Leader of the Opposition? As I reminded you, we have intruded by full 20 minutes into the time allotted for Public Business.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

Sir, give me just a few seconds, please.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට දැන් තිබෙන්නේ දිනට නියමිත ප්‍රධාන වැඩකටයුතු ආරම්භ කරන්න. දැනුත් අපට විනාඩි 25ක් පහු වෙලා තිබෙන්නේ. ආණ්ඩුවේ ප්‍රධාන වැඩකටයුතු ආරම්භ කරන්න කියලා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, එය අත්‍යවශ්‍ය කාරණයක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, we have far exceeded the time, Hon. Leader of the Opposition and all Hon. Members of the House. Therefore, let us get on with the Public Business of the day.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 ඉදිරිපත් කිරීම, ගරු අනුර කරුණාතිලක අමාත්‍යතුමා.

## ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පනත් කෙටුම්පත
## தேசியக் கட்டிட ஆராய்ச்சி நிறுவகம் சட்டமூலம்
## NATIONAL BUILDING RESEARCH INSTITUTE BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Anton Jayakody to start the Debate. You have 15 minutes.

[පූ.භා.11.53]

**ගරු ඇන්ටන් ජයකොඩි මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Anton Jayakody - Deputy Minister of Environment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දිනට නියමිතව තිබෙන්නේ ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පනත් කෙටුම්පත දෙවැනි වර කියවීමේ විවාදයයි. මේ පනත් කෙටුම්පත මඟින් සරල ව්‍යවහාරයේ භාවිත වන National Building Research Organization - NBRO - කියන නම NBRI බවට පරිවර්තනය වෙනවා; "O" වෙනුවට "I" යෙදෙනවා; "Organization" කියන එක "Institute" බවට පරිවර්තනය වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත අපට මෙච්චර වැදගත් වෙන්නේ ඇයි කියලා මම කියන්නම්. අපි දන්නවා, 1300 වාගේ කාලයේ ඉතාලියේ පීසා කියන ප්‍රදේශයේ කුලුනක් ඉදි කළ බව. අපි දැන් ඒකට කියනවා, "පීසා කුලුන" කියලා. මේකට "ඇලවෙන කුලුන" කියලාත් කියනවා. අපි දන්නවා, මේක ලෝක පුදුමයක් බවට පරිවර්තනය වුණා කියලා. මේ කුලුන ලෝක පුදුමයක් බවට පරිවර්තනය වෙන්නේ ඇයි? ලෝකය පිළිගන්නවා, මේක පුදුමයක් කියලා. හැබැයි, මෙතැන තිබෙන තාක්ෂණික ක්‍රියාවලිය තමයි මේ කුලුන මෙතැන තිබෙන පොළොව විසින් reject කිරීම. මෙතැන තිබෙන්නේ geotechnical failure එකක්. ඒ කියන්නේ ඉංජිනේරුමය භූ විද්‍යාව පැත්තෙන් සිද්ධ වෙන දුර්වලතාවක්. ඉදිකරන්න හොඳ නැති තැනක කරපු ඉදිකිරීමක් තමයි අද අපි පුදුමයක් හැටියට දකින්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටෙත් ලෝක ප්‍රසිද්ධියට පත් නොවුණු පුදුමයක් තිබෙනවා. ඒක තමයි වසර 41ක් තිස්සේ මේ සම්බන්ධයෙන් අධ්‍යයනය කරන රාජ්‍ය ආයතනයක් වන, විශාල වැඩ කොටසක් සිද්ධ කරන ආයතනයක් වන ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය - NBRO - කියලා අපි හඳුන්වන ආයතනය. මේකට පනතක් නැහැ. ඒ වාගේම ලෝක ප්‍රසිද්ධ නැහැ. අපි NBRO එකේ ආරම්භය හැටියට දකින්නේ මෙයයි. 1984 වසරේ එවකට සිටි අග්‍රාමාත්‍යතුමා, එහෙම නැත්නම් රාජ්‍ය පරිපාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා එවක තිබුණු ගම් උදාවට අවශ්‍ය කරන අමුද්‍රව්‍ය - materials - check කිරීම සඳහා labs තුනක් එකතු කරලා ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය - NBRO එක - හදා ගන්නවා. මේකේ විෂය පථය වෙන්නේ ගොඩනැඟිලි සඳහා ගනු ලබන ඉදිකිරීම් ද්‍රව්‍ය පරීක්ෂා කිරීමයි. දමනු ලබන කොන්ක්‍රීට්වල තත්ත්වය, යෝග්‍යතාව කොච්චරද, එහෙම නැත්නම් ඒ සඳහා ගනු ලබන අමුද්‍රව්‍යවල quality එක සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමයි. මේකට හේතුව කරනු ලබන ඉදිකිරීම්වල, බිල්ඩින්වල, නිවාසවල ස්ථායිතාව රැක ගැනීමයි.

මේ ආයතනය අද වනවිට විශාල වශයෙන් දියුණුවක් අත්පත් කරගෙන තිබෙනවා කියලා අපි දකිනවා. අද වනවිට මේ ආයතනය සතුව ස්වභාවික විපත්, එහෙම නැත්නම් නාය යෑම් අධ්‍යයන අංශයක් තිබෙනවා. ඒ වාගේම පොළොව තුළ ඉදිකිරීමේදී එහි ශක්‍යතාව සම්බන්ධයෙන් අධීක්ෂණය කරන්න Geotechnical Engineering Division එකක් තිබෙනවා. ඒ වාගේම ගොඩනැඟිලි ද්‍රව්‍ය - materials - සම්බන්ධයෙන් test කරන්න අංශයක් තිබෙනවා. පරිසරයේ තිබෙන දේවල් සම්බන්ධයෙන් අධ්‍යයනය කරන්න තව අංශයත් තිබෙනවා. ඒ වාගේම මේ පාරිසරික තත්ත්ව මත කරනු ලබන ඉදිකිරීම්වල ගුණාත්මකභාවය, structure එක කොහොමද කියලා බලන්න තවත් අංශයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉදිකිරීමක් එහෙම නැත්නම් ගොඩනැඟිල්ලක් අස්ථායි වන ආකාර පිළිබඳ අපි දන්නවා. එකක් තමයි නාය යෑම් වැනි ස්වභාවික විපත්වලින් අස්ථායි වෙලා කැඩිලා බිඳිලා යන්න පුළුවන්. අනෙක් පැත්තෙන් කරනු ලබන ඉදිකිරීම පොළොව විසින් reject කිරීම නිසා අස්ථායි වෙන්න පුළුවන්. අපි හරියට සොයා බලන්නේ නැතිව ඉදිකිරීමක් සිද්ධ කළාට පස්සේ ඒක පොළොව විසින් reject කිරීම නිසා අභාවයට යන්න පුළුවන්. අනෙක් පැත්තෙන් ඉදිකිරීම් සඳහා ගනු ලබන අමුද්‍රව්‍යවල තිබෙන ගුණාත්මකභාවය අඩු වීම නිසාත් මේ ඉදිකිරීම් අසාර්ථක වෙන්න පුළුවන්. අනෙක් පැත්තෙන් මේවායේ structure එක. මේ පරිසරය තුළ, මේ තිබෙන තත්ත්ව යටතේ කරනු ලබන ඉදිකිරීම් ව්‍යුහයේ - structure එකේ - failure එකක්, එහෙම නැත්නම් දුර්වලකමක් නිසා මේ ගොඩනැඟිලි අභාවයට යන්න පුළුවන්.

මේ ආයතනය විසින් මේ සියලු දේවල් ආවරණය වන පරිදි ඉතාම ගුණාත්මක සේවයක් දැනට සිද්ධ කරනු ලබනවා. 1984දී - මීට වසර 41ට පෙර - ආරම්භ කරපු මේ ආයතනයට 1991දී

[ගරු ඇන්ටන් ජයකොඩි මහතා]

නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ අංශයත් එකතු වුණා. මොකද, 1990 දශකයේ මේ රටේ නාය යෑම් පිළිබඳව විශාල වශයෙන් සාකච්ඡා වුණා. විශේෂයෙන්ම බදුල්ල දිස්ත්‍රික්කයේත්, නුවරඑළිය දිස්ත්‍රික්කයේත් නාය යෑම් අධ්‍යයනය කරන්න, ඒ භූමි පරීක්ෂා කරන්න එක්සත් ජාතීන්ගේ සංවිධානය - UN - මඟින් ලොකු grant එකක් කළා. මට මතක විධියට එය US Dollars 1 million විතර වාගේ එකක්. ඒ අනුව ඒ කාලයේ හැටියට විශාල මුදලක් මේ රටට ප්‍රදානය වුණා. මේ වෙනකොට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ඒ අදාළ කටයුතු ටික සිද්ධ කරනු ලබනවා. මගේ දැනීමේ හැටියට, මගේ මතකයේ හැටියට එවකට කර්මාන්ත ඇමතිවරයා හැටියට හිටියේ, රනිල් වික්‍රමසිංහ මහත්මයා. එතුමා සහ අදාළ නිලධාරීන් මේ මුදල දැකලා බය වෙලා මේ ව්‍යාපෘතිය භාර ගත්තේ නැහැ. ඊට පස්සේ NBRO එක බදුල්ල දිස්ත්‍රික්කයේ සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ නාය යෑම් පිළිබඳව අධීක්ෂණය කරන්න, සිතියම්ගත කරන්න, අවදානම් කලාප ටික හඳුනා ගැනීම සඳහා මේ ව්‍යාපෘතිය භාර ගත්තා.

එදා සිට ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයට - NBRO - නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ අංශය එක්කාසු වුණා. 2007දී වාගේ විශාල ආපදා ප්‍රමාණයක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය බිහි වුණා. ඒ යටතට NBRO එක පත් වුණා. වර්තමානය වෙනකොට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙනවා. 2011දී NBRO එකට රජයෙන් නියෝග කළා, ඉදිකිරීමක් කරනකොට, විශේෂයෙන් කඳුකර ප්‍රදේශයක ඉදිකිරීමක් කරනකොට ඒ ඉදිකිරීමෙහි ස්ථායිතාව සඳහා geotechnical report එකක් දෙන්න කියලා. ඒක චක්‍රලේඛයකින් කෙරෙන්නේ. ඒ වාගේ දේවල් ටිකක් විශාල වශයෙන් සිද්ධ කෙරෙනවා. හැබැයි පනතක් නැහැ. කිසිම report එකකට මේ දක්වා නඩු කටයුත්තක් ගිහිල්ලා නැහැ. පනතක් නැතිවුණාම ඒ ආයතනය කොච්චර අපහසුතාවට පත් වෙනවාද කියලා අපට දැකගන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රණසිංහ ප්‍රේමදාස මහත්මයාත් මේක ආරම්භ කළේ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයෙන්. ඔහුගේ පුත්‍රයා වන වර්තමාන විපක්ෂ නායකතුමාත් මේ ආයතනයේ වැඩ කර තිබෙනවා. වසර 41ක් තිස්සේ පනතක් නැතුව රාජ්‍ය ආයතනයක් වැඩ කරගෙන ගිහිල්ලා තිබෙනවා. විශාල වැඩ කොටසක් කර තිබෙනවා. හැබැයි, මේ ආයතනයට පනතක් තිබීම ඉතාම වැදගත්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත් කෙටුම්පතේ නියාමන කටයුතු ගත්තොත්, වැඩිම දායකත්වයක් දීලා තිබෙන්නේ නාය යෑම් අවදානම කළමනාකරණය කිරීමේ පැත්තට. නාය යෑම් වන ආකාර දෙකක් තිබෙනවා. එකක් තමයි, ස්වාභාවිකව කඳු බෑවුම්වල තිබෙන පස් ස්ථර හා ගල් -පාෂාණ- බිමට කඩාගෙන වැටීම. අනෙක් පැත්තෙන් මානව ක්‍රියාකාරකම්. මානව ක්‍රියාකාරකම් හැටියට අපි දකිනවා, ඉදිකිරීම් සහ ඇළ වේලි කපලා ගොඩ නැඟෙන අස්ථායිතාව. ඒ හේතුව නිසා නාය යනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ක්‍රියාවලි දෙකෙන්ම ආපදා සිද්ධ වෙනවා. මේකට සබැඳියාවක් තිබෙනවා, අපේ රටේ වර්ෂාපතනයත් එක්ක. වර්ෂාපතනය වැඩි වෙනකොට නාය යෑම් ප්‍රමාණය ක්‍රමානුකූලව වැඩි වෙනවා. සරලම උදාහරණය විධියට පස් ඝන මීටර් කියුබ් එකක් ගත්තොත්, හොඳට වහින කාලයක හොඳටම සංතෘප්ත වෙච්ච පසක ඒ ඝන මීටර් කියුබ් එකට කිලෝ ග්‍රෑම් 200ක් විතර වාගේ තව වැඩි බර ප්‍රමාණයක් එක්කාසු වෙනවා. ඒ පස් අංශු අතර තිබෙන කුඩා සිදුරුවලට වතුර පිරීම නිසා කිලෝ 150ක් 200ක් වාගේ වැඩි බර ප්‍රමාණයක් එකතු වෙනවා. මේ අස්ථාවරත්වය නිසා නාය යෑම් ප්‍රමාණයක් සිද්ධ වෙන බව අපි දන්නවා.

නාය යෑම් ගත්තොත්, සැලකිය යුතු විශාලතම නාය යෑම අපට දකින්න පුළුවන් වුණේ, 2003 මැයි 17වැනි දා. විශේෂයෙන්ම නිරිත දිග මෝසම් ක්‍රියාවලියත් එක්ක මේ රටට විශාල වර්ෂාපතනයක් ඇති වුණා.

සමහර අවස්ථාවලදී record වෙලා තිබෙනවා, පැයට මිලිමීටර් 400ක පමණ වර්ෂාපතනයක් ලැබී තිබෙන බවට. පැයක් ඇතුළත මිලිමීටර් 100කට වඩා වැඩි වර්ෂාපතනයක් ලැබුණු බවටත් වාර්තා වී තිබෙනවා. මෙන්න මේ නිසා ජීවිත 256ක් පමණ අපේ රටට අහිමි වෙලා තිබෙනවා. ඒ වාගේම විශාල දේපළ ප්‍රමාණයකුත් අහිමි වෙලා තිබෙනවා. මේ වසර කිහිපයම ගැන සැලකුවොත්, දළ වශයෙන් මිනිස් ජීවිත 850ක්, 900ක් වාගේ සංඛ්‍යාවක් අපේ රටට අහිමි වෙලා තිබෙනවා. ඒ වාගේම විශාල දේපළ ප්‍රමාණයකුත් අහිමි වෙලා තිබෙනවා. මේවා සම්බන්ධයෙන් කටයුතු කරන්න ආයතනයක් තිබුණත්, ඒවා නියාමනය කරන්න අවශ්‍ය පනතක් නැති වීම විශාල දුර්වලකමක් කියලා මම හිතනවා. මේ වන විට මෙම ආයතනය පනතක් නැතිව වසර 41ක් ගෙවා තිබෙනවා. නමුත් එලෙස ඔවුන් 42වැනි වසරට පය තියන්න, ඉස්සරහට ගමන් කරන්න ඕනෑ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තොරතුරු දැනගැනීම සඳහා automated rain gauges එහෙම නැත්නම් automated ජලමාපක 350ක් විතර මෙම ආයතනය විසින් කරලා තිබෙනවා. මේ වෙනකොට මෙම ආයතනය විසින් තවත් ජලමාපක සවි කරමින් පවතිනවා. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේවත් මේ තරම් උපකරණ ප්‍රමාණයක් අපට දැකගන්න ලැබෙන්නේ නැහැ. ඒ වාගේම මේ ආයතනය විසින් අස්ථායී වෙච්ච ප්‍රදේශ කළමනාකරණය කරලා එම ප්‍රදේශ තුළ සිදුවිය හැකි නාය යෑම් - landslides - ප්‍රමාණය අවම කරන්නත් කටයුතු කරලා තිබෙනවා. ඒවා සියයට සියයක්ම වළක්වන්න බැහැ. නමුත් යම් ප්‍රමාණයකට ඒ තත්ත්වය අවම කරලා තිබෙනවා. විශේෂයෙන්ම JICA වාගේ ආයතනවලින් ගනු ලබන ණය මුදල්වලින්, වෙනත් ආයතනවලින් ගනු ලබන මුදල්වලින්, සමහර වෙලාවට මහා භාණ්ඩාගාරයෙන් ගනු ලබන මුදල්වලින් ඒ තත්ත්වය යම් ප්‍රමාණයකට අවම කරලා තිබෙනවා. නමුත් ඒ මුදල් ටික වෙන්කර ගැනීමටවත් මේ වන තෙක් පනතක් ක්‍රියාත්මක වෙලා නැහැ. මෙය පනතක් තිබිලාම නැති ආයතනයක්.

මීට අදාළව ගොඩනැඟිලි අස්ථාවර වීම් සම්බන්ධයෙනුත් අපට විශාල වශයෙන් කථා කරන්න තිබෙනවා. මැටි, සිල්ට් වැනි පස් වර්ග වැඩි ප්‍රදේශවල, විශේෂයෙන්ම ගංගාවල පිටාර තැනිවල soil expansion එහෙම නැත්නම් expansive soil කියන එක අපි දකිනවා. විශාල වශයෙන් expansive soil වන තැන්වල ඇති නිවාස ඉරි තැළීම්වලට ලක්ව තිබෙනවා. සමහර නිවාස ජීවත් වෙන්න බැරි මට්ටමට පත්ව තිබෙනවා. විශේෂයෙන්ම හිඟුරක්ගොඩ, හම්බන්තොට, මොනරාගල, බිබිල, පුත්තලම වැනි ප්‍රදේශවල. මෙවැනි දේවල් අධීක්ෂණය කරන්න මෙන්න මේ ආයතනය ඉතාම වැදගත් වනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
( மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Anton Jayakody, your time is up. Could you please wind up?

**ගරු ඇන්ටන් ජයකොඩි මහතා**
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி)
(The Hon. Anton Jayakody)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩියක් කථා කරන්න අවසර දෙන්න.

මීට අමතරව මෙම ආයතනය පරිසරයට අවශ්‍ය දත්ත ලබා ගැනීම සඳහා, විශේෂයෙන්ම වායුගෝලීය තත්ත්ව සම්බන්ධව අධීක්ෂණය කරලා එම දත්ත ලබා ගැනීමට කටයුතු කරමින් ඉන්නවා. ඒ වාගේම ශබ්ද දූෂණයක් සිද්ධ වෙනවාද කියන එක ගැන සොයා බලන්නත් මේ ආයතනය කටයුතු කරමින් ඉන්නවා. ඒ දත්ත මධ්‍යම පරිසර අධිකාරියට, නියාමන ආයතනවලට ලබා දෙමින් මේ ආයතනය ක්‍රියාත්මක වෙනවා. ඊට අමතරව ගොඩනැඟිලි ඉදිකිරීම් සඳහා ගනු ලබන ඉදිකිරීම් ද්‍රව්‍ය සම්බන්ධයෙනුත් මෙම ආයතනය පරීක්ෂණ විශාල ප්‍රමාණයක් සිදු කරනවා. ඒ වාගේම මේ ආයතනය රටේ හොඳම labs තිබෙන, රටේ හොඳම උපකරණ තිබෙන ආයතනය බවටත් පරිවර්තනය වෙලා තිබෙනවා. ඒ වාගේම ඉදිකිරීම් පිළිබඳව බොහෝ researches මෙම ආයතනය සිදු කරනවා. ඉදිකිරීම්වල structure එක - ව්‍යුහය - සම්බන්ධයෙනුත් පරීක්ෂණ ගණනාවක් සිදු කරනවා. මේ පරිසරයත් එක්ක අස්ථායි බිම්වල ඉදිකිරීම් කරන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් පරීක්ෂණ කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

මෙවැනි ආයතනයක් නියාමනයක් නැතිව විශාල වැඩ ප්‍රමාණයක් සිද්ධ කරලා තිබෙනවා. වසර 41ක් කියන්නේ පොඩි කාලයක් නොවෙයි. පරම්පරාවකට ආසන්න කාලයක්. මේ කාලයෙන් පස්සේ එනම් ඉදිරි වසරේ සිට - 42 වන වසරේ සිට - හෝ මේ ආයතනයට පනතක් සම්මත කරලා ඒ පනත ක්‍රියාත්මක කරන්න, නියාමනය කරන්න අවශ්‍ය වටපිටාව අපි සකස් කරලා දෙන්න ඕනෑ.

ඒ සකසා දීම තුළ රටේ සංවර්ධනය වෙනුවෙන් හොඳ කාර්යභාරයක් ඉටු කරන, රටේ සංවර්ධනය වෙනුවෙන් කරනු ලබන ඉදිකිරීම්වලදී ස්ථායීතාව සලකා බලන, එම කටයුතු නියාමනය කරන ආයතනයක් බවට මෙම ආයතනය පරිවර්තනය වෙයි කියලා අපි විශ්වාස කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Waruna Liyanage. You have ten minutes.

[අ.භා.12.09]

**ගරු වරුණ ලියනගේ මහතා**
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පිහිටුවීම සම්බන්ධ පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කරන අවස්ථාවේදී ඒ ගැන කථා කරන්න ලැබීම පිළිබඳව මම සන්තෝෂ වනවා. පසුගිය ආණ්ඩුව කාලයේදීත් මේ ආයතනය පිහිටුවමු කියලා අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවලදීත් දිගින් දිගටම අපි යෝජනා කළා. අග්‍රාමාත්‍යතුමිය, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය විධියට මේ පනත ගෙන ඒම කාලීන අවශ්‍යතාවක් විධියට දැකලා ඒ සම්බන්ධව කටයුතු කිරීම සම්බන්ධයෙන් මම එතුමියට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය -NBRO- පිහිටුවූයේ 1984 වර්ෂයේදීයි. ඒ, හිටපු අග්‍රාමාත්‍ය සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය ගරු රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ කාලයේ ක්‍රියාත්මක වූ නිවාස වැඩසටහන යටතේයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ මේ කාරණා ඉෂ්ට කිරීම සඳහා තමයි එම ආයතනය එකල පිහිටුවූයේ.

මේ අවස්ථාවේදී මම නියෝජ්‍ය ඇමතිතුමාට පොඩි කාරණයක් කියන්න ඕනෑ. එතුමාගේ පැහැදිලි කිරීමේදී අපේ විපක්ෂ නායකතුමා ගැනත් මතක් කළා. නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය භාරව එතුමා කටයුතු කළත්, මේ ආයතනය පිහිටුවීමට යම් වැඩ පිළිවෙළක් සකස් කළේ නැහැ කියන එක කියපු නිසායි මම ඔබතුමාට පැහැදිලි කිරීමක් කරන්නේ. එතකොට එතුමා යටතේ නොවෙයි, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ තමයි මේ ආයතනය තිබුණේ. ඒ නිසා තමයි එතුමාට මේ වැඩසටහන ක්‍රියාත්මක කරන්න බැරි වුණේ කියන කාරණය මේ වෙලාවේ මම කියන්න ඕනෑ. එහෙම නොවුණොත් මේක සභාව නොමඟ යැමක් විධියට මම දකිනවා.

**ගරු ඇන්ටන් ජයකොඩි මහතා**
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி)
(The Hon. Anton Jayakody)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Deputy Minister?

**ගරු වරුණ ලියනගේ මහතා**
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)
මම නම කිව්වේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නමුත්, අවස්ථාව දුන්නාට කමක් නැහැ. කියන්න කෝ, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු ඇන්ටන් ජයකොඩි මහතා**
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி)
(The Hon. Anton Jayakody)
මට නිවැරදි කිරීමක් කරන්න තත්පර 30ක කාලයක් ලබා දෙන්න. ආයතනය පිහිටුවීම සම්බන්ධයෙන් නොවෙයි මම කරුණු මතු කළේ. ගරු සජිත් ප්‍රේමදාස මහතාත් ඇත්තටම මේ විෂයය භාර අමාත්‍යවරයා හැටියට සිටියා. නමුත්, වසර 41ක් තුළ අපට පනතක් ගෙනෙන්න බැරි වෙලා තිබෙනවා, මේ ආයතනය සම්බන්ධයෙන්. ආයතනය පිහිටුවීම සම්බන්ධයෙන් නොවෙයි, පනතක් ගෙනෙන්න බැරි වීම සම්බන්ධයෙනුයි මම කිව්වේ. මම හිතන්නේ, මේ විෂයය භාරව ඇමතිවරු ගණනාවක් හිටියා. ඒ තුළ අපේ විපක්ෂ නායකතුමාත් හිටියා කියන එක තමයි මම මතු කළේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
( மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Waruna Liyanage, please continue.

**ගරු වරුණ ලියනගේ මහතා**
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)
අවුරුදු 41කට පස්සේ හෝ මෙවැනි පනතක් ගෙන ඒම සම්බන්ධයෙන් මම අගමැතිතුමියට ස්තුතිවන්ත වෙනවා.

ආපදා කළමනාකරණයේදී රත්නපුර දිස්ත්‍රික්කය ඉතාම වැදගත් වනවා කියලා අපි විශ්වාස කරනවා. බදුල්ල දිස්ත්‍රික්කයේ අංක එකට නාය යෑම් සිද්ධ වනකොට දෙවනුව රත්නපුර දිස්ත්‍රික්කයේත්, ඊළඟට කෑගල්ල දිස්ත්‍රික්කයේත් නාය යෑම් සිද්ධ වෙනවා. අපට මතකයි, ඉතිහාසයේ -මට දවස මතක නැහැ- කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක ප්‍රදේශයේ සාමසර කන්ද නාය යෑමට ලක් වුණා. මේ නිසා ජීවිත 125ක් නැති වුණා, ගරු

[ගරු වරුණ ලියනගේ මහතා]

නියෝජ්‍ය කථානායකතුමනි. මෙය ඉතාම ශෝකජනක ඛේදවාචකයක්. එම සිදුවීමෙන් ගම් දෙකක් විනාශ වුණා.

ඒ වාගේම 2003දී අපේ රත්නපුර දිස්ත්‍රික්කයේ නිවිතිගල ආසනයේ -මගේ ආසනයේ- පලාවෙල කියන ගමේ 67දෙනෙකු මිය ගියා. ඒ වාගේම 2017දී ඇති වූ ගංවතුරෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ 100කගේ ජීවිත නැති වනකොට අපේ ආසනයේ කිරිබත්ගල කියන ගමේ 26දෙනෙකු මිය ගියා. ඒ නිසා මේක බරපතළ කාරණයක් විධියට අපි දකිනවා. ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පිහිටුවීම මඟින් මේ වාගේ සිද්ධි නැති වෙනවා නම් ඒක තමයි අපි සභාවක් විධියට ඉෂ්ට කළ යුතු වගකීම වන්නේ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ පනත් කෙටුම්පතේ 6(1)හි සඳහන් වනවා, පාලන ව්‍යුහයේදී ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයාම මේ ආයතනයේ සභාපතිවරයා විය යුතු බවට. ඇත්තටම අපි සන්තෝෂ වනවා, වෙන තනතුරක් දරන අයෙකු නැතිව අමාත්‍යාංශයේ ලේකම්වරයාම මේ ආයතනයේ සභාපතිවරයා විධියට පත් කිරීම සම්බන්ධයෙන්.

ඒ වාගේම මුදල් අමාත්‍යාංශයේ අනුයෝජිතවරයකු, පළාත් පාලන අමාත්‍යාංශයේ අනුයෝජිතවරයකු හා ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් කියන සාමාජිකයන් මේ ආයතනයට නිල බලයෙන් පත් වෙනවා. ඒ වාගේම, තවත් සාමාජිකයන් තුන්දෙනෙකු පත් කළ යුතුයි කියලා තිබෙනවා.

ඇත්තටම මම ඔබතුමන්ලාගෙන් ඉල්ලන්නේ මෙයයි. මේ ආයතනයට මීට අමතරව තවත් කවුරු හරි පත් කරන්න පුළුවන් නම් වැවිලි කර්මාන්ත විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා යෝජනා කරන නිලධාරියෙක් පත් කරන එක තවත් හොඳයි. මොකද, 2011/01 චක්‍රලේඛයේ නිතර ආපදාවට ලක් වෙන දිස්ත්‍රික්ක 14ක් නම් කරලා තිබෙනවා. මේ දිස්ත්‍රික්ක 14න් වැඩිම කොටසක් නියෝජනය වෙන්නේ වතු ආශ්‍රිතව. ඒ නිසා තමයි මම වැවිලි කර්මාන්ත විෂයභාර අමාත්‍යාංශයේ නිලධාරියෙකුත් මේකට ඇතුළත් කරන්න පුළුවන් නම් ඉතාම වැදගත් වෙයි කියන කාරණය මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මේ පනත් කෙටුම්පතේ නිලධාරියෙකුට කරන්න පුළුවන් සීමා පිළිබඳව සඳහන්ව තිබෙන බව අපි දකිනවා. යම් නාය යෑමකට ලක් වෙන ඉඩමකට ඇතුළු වෙනවා නම් ඒ සඳහා පොලිස් නිලධාරියෙක් රැගෙන යා යුතුයි කියන කාරණය මෙහි තිබෙනවා. මේ වෙනකොට හැම පොලිස් ස්ථානයකම පොලිස් නිලධාරින් අඩු ස්වභාවයක් තමයි දක්නට තිබෙන්නේ. දැන් තිබෙන්නේ NBRO නොවෙයි, NBRI එක. NBRI එකේ නිලධාරියෙක් පොලීසියේ කෙනෙක් එක්ක යන්න පරක්කු වුණොත් ඒ කටයුත්ත කර ගන්න බැහැ. අපි දකින විධියට අමාත්‍යාංශ ගණනාවකට මේ වගකීම් භාර දීලා තිබෙනවා. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ නිලධාරියෙකුට ඉඩමකට ඇතුළත්වීමට කිසිම බාධාවක් නැහැ. ඕනෑම වෙලාවක නීතිය ක්‍රියාත්මක කරන්න ඒ අයට පුළුවන්. ඒ වාගේ අමාත්‍යාංශ ගණනාවක් තිබෙනවා. ඒ නිසා NBRI එකේ නිලධාරියාටත් ඕනෑම වෙලාවක ගිහින් පර්යේෂණ කටයුතු කරන්න නෛතික බලය ලබා දෙන්න පුළුවන් නම් ඒක ඉතා වැදගත් වෙයි කියලා මම විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය - NBRI එක - හා සමානව තමයි ප්‍රාදේශීය සභාවේත් බලය තිබෙන්නේ. මේ වෙනකොට ඒ දිස්ත්‍රික්ක 14ටම අලුත් ප්‍රාදේශීය සභා සභාපතිවරු පත් වෙලා ඉන්නවා. මේ නීත්‍යානුකූල තත්ත්වය ගැන වැඩමුළු පවත්වලා අපි ඒ අයටත් උපදෙස් ලබා දෙන්න ඕනෑ කියලා මම විශ්වාස කරනවා. මොකද, පළාත් පාලන ආයතනයක හිටපු සභාපතිවරයකු විධියට මම දන්නවා, ඉවුරක් කැපීමට බලය තිබෙන්නේ අඩි 7ක් වැනි ප්‍රමාණයක් බව. නමුත් අඩි 7ට වඩා කපලා යම් හානියක් සිද්ධ වුණොත් ඒකට වගකියන්න කවුරුවත් නැහැ. තමුන්නාන්සේලාත් ඒ ගැන දන්නවා ඇති. පසුගිය කාලවලදී අපි දැක්කා, ප්‍රාදේශීය සභා සීමාවට එහා ගිහින් කටයුතු කළ අවස්ථා. ඉහළ ප්‍රදේශයේ ගෙයක් තිබුණත් යටින් තිබෙන ඉවුර කපනවා. එහෙම ඉවුර කැපුවාට පස්සේ ඊට ඉහළින් ගෙයක් හදාගෙන ඉන්න පුද්ගලයාට විශාල අසාධාරණයක් වෙනවා. ඒ නිසා මෙවැනි අවස්ථාවල ක්‍රියාත්මක වීමට ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයට අවශ්‍ය ශක්තිය අපි ලබා දෙන්න ඕනෑ. එහෙම නැත්නම් අපි බලාපොරොත්තු වෙන කටයුත්ත ඉෂ්ට වෙන්නේ නැහැ කියලා මම විශ්වාස කරනවා. මේ ආයතන ශක්තිමත් කළොත් පමණයි අපට මේවායින් උපරිම ප්‍රයෝජනය ගන්න පුළුවන් වෙන්නේ කියන කාරණයත් මම මතක් කරන්න ඕනෑ. ඒ නිසා මේ ආයතන සකස් කරලා රටට ශක්තියක් ලබා දෙන්න කටයුතු කිරීම වෙනුවෙන් තමුන්නාන්සේලාගේ ආණ්ඩුවටත්, අපේ ගරු අග්‍රාමාත්‍යතුමියටත් ස්තුතිවන්ත වෙමින්, මට කථා කරන්න අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The next speaker is the Hon. Ravindra Bandara. You have nine minutes.

[අ.භා. 12.18]

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පනත් කෙටුම්පත සම්බන්ධයෙන් තමයි අද මේ විවාදය පැවැත්වෙන්නේ. විශේෂයෙන්ම ඉදිකිරීම් කිව්වාම අපේ රටේ ගොඩක්දෙනා එය දකින්නේ හුදෙක් ගොඩනැඟිල්ලක් හෝ මොන යම් හෝ දෙයක් හදන එකක් කියලා. නමුත්, ඇත්තවශයෙන්ම ඉදි කිරීමක් කියන්නේ අනාගත ලෝකය ගොඩ නඟන එක. අන්න ඒක තමයි ඉදිකිරීම් ක්ෂේත්‍රය කියන්නේ.

මේ අවස්ථාවේ මහජන ගැලරියේ සිට පාසල් දරු දැරියන් මේ විවාදය අහගෙන ඉන්නවා.

පසුගිය කාලයේ යම් ව්‍යසනකාරි සිද්ධි ගොඩාක් සිදු වුණු බව අපි දැක්කා. ඒ සිද්ධි අපි මතක් කළා. ඒ වාගේම කෑගල්ලේ අරණායක සාමසර කන්දේ නාය යෑම ගැනත් අපි මතක් කළා. ඉදිකිරීම් කියන එක අවිධිමත් වීම තුළ ගැටලු රාශියකට අපි මුහුණ පානවා. මට මතකයි, අපි බලයට පත් වුණු ඒ මැතිවරණ සමයේදී මා නියෝජනය කරන හපුතලේ ආසනයේ, කබරගල ප්‍රදේශයේ නාය යෑමක් සිදු වුණු බව. එයින් අවතැන් වුණු පවුල් 52ක් අත්හැර දාපු තේ කර්මාන්තශාලාවක - tea factory එකක - දරුවෝත් සමඟ හිටියා. ඔවුන් අධ්‍යාපන කටයුතු, රැකියා කියන සියල්ලටම ගියේ එතැන සිටයි.

ඒ වාගේම අපි දැක්කා, මීරියබැද්ද ප්‍රදේශයේ සිදු වුණු නාය යෑම. ඒ සිද්ධිය ගැන මුළු ලෝකයේම අවධානයට ලක් වුණා. අනාගත ලෝකයේ ඉදිකිරීම් කටයුතු සිදු වෙනකොට වඩාත් විධිමත්ව එය කළ යුතු වෙනවා. කලින් කිව්වා වාගේ හානි අවම වෙන විධියට ඉදිකිරීම් කරන එක නියාමනය වෙන්න ඕනෑ. නමුත් අපි කනගාටු වෙන්න ඕනෑ, අවුරුදු 30ක් තිස්සේ ඒ සම්බන්ධයෙන් නීතිමය තත්ත්වයක් නොතිබුණු එක ගැන. රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ කාලයේ මේ සම්බන්ධයෙන් නීතිමය තත්ත්වයක්

ආවාය කිව්වා. නමුත්, අපි කනගාටු වෙන්න ඕනෑ, අවුරුදු 30ක් යනතෙක් නීතිමය තත්ත්වයක් විධියට, පනතක් විධියට මේක ගෙනෙන්න බැරි වුණු එක ගැන. අන්න, ඒ දේ තමයි දැන් මේ සිදු වෙන්නේ.

අරණායක සාමසර කන්දේ නාය යෑම හේතුවෙන් අවතැන්ව තවමත් විසඳුම් ලැබී නැති පිරිස් කෑගල්ල ප්‍රදේශයේ ඉන්න බව අපි දන්නවා. අනාගතයේදී අපේ දූ දරුවන්ට මේ වාගේ අවාසනාවන්ත තත්ත්වයන් උරුම නොකරන්න නම් ඒකට නීතිමය රාමුව වඩාත් ශක්තිමත්ව ලබා දීම තමයි අපි කළ යුතු වෙන්නේ.

හල්දුම්මුල්ල ප්‍රදේශයේ කැලිපානාවල ගම්මානයේත් නාය යෑමක් සිදු වුණා. අපි ඒ ස්ථානයට ගියා. ඒ නාය යෑම නිසා අවතැන් වූ ජනතාව තවමත් තාවකාලික ගෙවල්වල ඉන්නවා. ඒගොල්ලන්ට විදුලිය නැහැ. විදුලිය ලබා ගැනීම සම්බන්ධයෙන් ප්‍රශ්න තිබෙනවා. මොකද, ඒ වාගේ තැන්වලට විදුලිය ලබා දීමේ ගැටලු තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කාරණාවත් එක්කම යම්කිසි සමාජමය කථා බහක් තිබෙන ගැටලුවක් ගැනත් කියන්න කැමතියි. මේ දවස්වල විදුලිබල මණ්ඩලයේ ලොකු සටනක් යනවා. මම හිතන්නේ අපේ විපක්ෂයේ දේශපාලනඥ මහත්වරුත් ඒ සම්බන්ධව මැදිහත් වෙලා ඉන්නවා. ගරු ජනාධිපතිතුමා ඉතා පැහැදිලිව කිව්වා, "මේ ආයතනයේ සියයට සියයක හිමිකාරිත්වය රජය සතුව තිබෙනවා" කියලා. ඒ වාගේම සමාජය තුළ දුර්මතයන් පැතිරෙමින් යනවා, ලංකා විදුලිබල මණ්ඩලය විකුණනවාද කියලා. පසුගිය කාලයේ පැවති පනතේ තමයි එහෙම තිබුණේ. විශේෂයෙන් සම්ප්‍රේෂණයේදී සියයට 50ක් තමයි රජය සතුව තිබෙනවාය කියලා තිබුණේ. නමුත් ඒ සියල්ල වෙනස් කරලා, ඒ කැඩෙන සමාගම් 6න්, ප්‍රධාන සමාගම් 4යි ජනනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම, පද්ධති පාලනය සිදු කරන්නේ. ඒ 4ම සියයට සියයක් රජය සතු බව රටේ නායකයාත් කියනවා. ඒ වාගේම අදාළ පනත තුළිනුත් එය තහවුරු වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම සේවකයන් දොට්ට දානවා, සේවකයන් ඉවත් කරනවා කියලා පුහු මතයක් යනවා. ඒ නිසා තමයි සේවකයෝ එහෙම කලබල වෙලා තිබෙන්නේ. නමුත්, සේවකයන් 12,000ක් අයින් කරන කතන්දරය තිබුණේ පසුගිය කාලයේ. දැන් කියනවා, ඒ සේවකයෝ කිසිවෙක් ඉවත් කරන්නේ නැත කියලා. හැබැයි, මේ ඇති වන වෙනසත් එක්ක මේ අලුත් සමාගම් හතරට තමන් අනුයුක්ත වෙනවාද කියන කාරණය කෙරෙහි යම්කිසි කෙනෙකුට සැක සංකාවක් තිබිලා මේකෙන් අයින් වෙන්න හිතනවා නම් තමන්ගේ කැමැත්තෙන් අයින් වෙන්න පුළුවන්, ඒකට අදාළ වන්දි මුදලත් සහිතව. ඒක තමයි ඔය වරදවා කියන්නේ.

ඊළඟ එක තමයි, විශ්‍රාම වැටුපට, සේවක අර්ථසාධක අරමුදලට අත තියනවා ද කියන එක. මම කියන්න ඕනෑ, කිසිසේත්ම මේ සේවකයන්ට ලැබෙන කිසිම වරප්‍රසාදයක් ඒකෙන් කප්පාදු වෙන්නේ නැහැ කියන එක. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න මම මේක අවස්ථාවක් කර ගන්න කැමතියි. මේක රටේ ලොකු ප්‍රශ්නයක් බවට මේ දවස්වල පත් වෙලා තිබෙනවා. නොයෙක් විධියේ බොරු කතන්දර කියමින් යන නිසා එය රටේ ස්ථාවරභාවයට බලපානවා.

අපි දන්නවා, භූමිය අස්ථාවර වුණාම ගොඩනැඟිලි නාය යනවා වාගේ තමයි, රට අස්ථාවර කරන්න යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙමින් තිබෙනවාය කියන එක. විශේෂයෙන්ම මම මේ කාරණයත් කියන්න ඕනෑ. පසුගිය පනතේ සමාගම් 12කට කඩන එක තිබුණා. සමහර ඒවා සියයට 50ක් පෞද්ගලික වශයෙන් තිබුණා. නමුත්, ඒක ඉස්සරහට යන වැඩ පිළිවෙළ මොකක්ද කියන එක තිබුණේ නැහැ. ඒ සියල්ල දැන් නිවැරදිව සකස් කරලා තිබෙන වෙලාවේදීත් ඔය කියන විපක්ෂ දේශපාලන පක්ෂවලට සම්බන්ධ සමහර වෘත්තීය සමිති වන ජාතික සේවක සංගමය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට අදාළ ඒ සියලු අය එකතු වෙලා තමයි දැන් මේ කටයුත්ත කරන්නේ කියන එක අපි දන්නවා. නමුත්, ක්‍රමක්‍රමයෙන් ඒගොල්ලන්ට තිබෙන බලය දැන් ගිලිහෙමින් යනවා. මේකේ ඇත්ත තත්ත්වය සේවකයන් තේරුම් අරගෙන තිබෙනවා. මොකද, සේවකයන්ට තිබුණු ප්‍රධාන ගැටලු ටික මෙතැනින් විසඳා දෙනවා නම් මම හිතන්නේ ඒක තමයි සිද්ධ විය යුතු දේ. මොකද, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පනත් කෙටුම්පත තුළ ඒ වෙනුවෙන් අවශ්‍ය ශක්තිය දෙනවා වාගේම තමයි අපට විදුලිබල මණ්ඩලය විනිවිදභාවය හා කාර්යක්ෂමතාව කියන එක ලබා දෙන්නේ. විනිවිදභාවය කිව්වාම, පසුගිය කාලයේ හදිසි මිලදී ගැනීම් තිබුණු බව අපි දන්නවා. මේ සියල්ල එකට පාලනය වෙනකොට හදිසි මිලදී ගැනීම් කොහොමද වෙන්නේ, ඒක තාප බලාගාරයක්ද කියන ඒ සියල්ල විනිවිදභාවය ඇතුව ඒකට වගකියන නිශ්චිත ආයතන හරහා යනකොට තමයි මම හිතන්නේ ඒ කාර්යක්ෂමතාව ඇති වන්නේ.

තව එකක් තමයි, තරගකාරිත්වය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආයතනයේ හිමිකාරිත්වය සියයට සියයක් රජය සතුව තියා ගත්තත් අපේ රටේ සුළං බලයෙන් විතරක් මෙගාවොට් 50,000ක් නිපදවන්න පුළුවන් කියලා පර්යේෂණවලින් හොයා ගෙන තිබෙනවා.

එතකොට මෙගාවොට් 5,000ක් විතරක් අවශ්‍ය රටක මෙගාවොට් 45,000ක අතිරික්තයක් එනවා. මම කියන්නේ, සුළං බලයෙන් විතරක් මෙගාවොට් 50,000ක් එනවා නම්, එතකොට අපට ඒ ඉතිරි ප්‍රමාණය අපනයනය කරන්න පුළුවන්. පෙට්ටියක ආලා රට රටවලට යවන්න බැහැ, විදුලිය කියන එක. ඒ සඳහා ක්‍රම තිබෙනවා. ඉතින් ඒ සියල්ල අනාගත ලෝකය වෙනුවෙන් කරන්න අවශ්‍ය දේවල්. ගොඩනැඟිලි ඉදිකිරීමේදී අපි රටක් වශයෙන් ඉස්සරහට යන්න බොහොම ශක්තිමත් විධියට ඒවා ගොඩ නඟනවා වාගේම, විදුලිබල මණ්ඩලයට අදාළව ගත්තොත් ඒවා තමයි අනාගතයේදී මේ රටට ආදායම් උපද්දන්න පුළුවන් ක්‍රම. මම ඒ කිව්වේ, සූර්ය ශක්තිය අමතක කරලා.

ඒ වාගේම මම දැක්කා, කිසිම ජන පදනමක් නැති සමහර අය කියා තිබෙනවා, smart grid එකක්, smart meters -ඒ කියන්නේ සුහුරු ජාලයක්- ගෙනැල්ලා මේ කරන්න යන්නේ, අර meter reading යන 8,000ක් විතර සේවකයන් එළියට දැම්මයි කියලා. නමුත් අපි දන්නවා, බර කරත්ත යුගය නිමා කරලා වාහනයෙන් යන්න ගියා වාගේ තමයි smart meters හඳුන්වා දීලා තිබුණා නම් system එක unbalance වෙන්නේ නැහැ. ඒකේදී සූර්ය ශක්තියෙන්, rooftop solar panelsවලින් මෙන්න මෙච්චරක් එනවාය කියන එක පෙනෙනවා. ඒක පද්ධතිය පාලනය කරන කෙනාට පෙනෙනවා. නමුත් දැන් ඒක නොපෙනීම නිසා තමයි ගැටලු මතු වෙලා තිබෙන්නේ. වහලවල සූර්ය පැනල ගහගෙන ගියාම හරි, ඒ දායකත්වය ලැබෙනවා කියලා තමයි සමහරු හිතන්නේ. නමුත් ඒ පද්ධතිය පාලනය කරන්න ඕනෑ. ජල බලයෙන් විදුලිය නිපදවීම, තාප බලයෙන් විදුලිය නිපදවීම -ඒ හැම එකක්ම- ගත්තාම ඒ control room එකට පෙනෙනවා, මෙන්න මෙච්චර ප්‍රමාණයක් මේ වෙලාවේ ජනනය වෙනවා කියලා ඉල්ලුම හා සැපයුමට අනුව. නමුත් සූර්ය ශක්තියෙන් විදුලිය නිපදවීමේදී ඒක පෙනෙන්නේ නැහැ. ඒක හදන්න ගියාම සේවකයෝ කියනවා, අර මනු කියවන්නන් -meter readers- 8,000ක් එළියට දමනවා, ඒකට තමයි smart meters ගෙනැල්ලා සුහුරු වෙන්න යන්නේ කියලා.

ලෝකය ඉස්සරහට යන්න ඕනෑ. අනාගත දරුවන් අලුත් තත්ත්වයට යන්න ඕනෑ, AIවලට යන්න ඕනෑ. වලාකුළක් එන අවස්ථාව AI හරහා කලින් පුරෝකථනය කරලා, මෙන්න මේ වෙලාවේ වලාකුළක් එනවා, එතකොට සූර්ය ශක්තියෙන් විදුලි

[ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා]

බලය ජනනය වීම ප්‍රශ්නයක් වෙනවා කියලා කලින් දකින්න ඕනෑ. ඒකට හැඩ ගැහෙන්න ඕනෑ. අන්න එහෙම ඉදිරිගාමීව යනකොට පසුගාමී චින්තන ගෙනැල්ලා සේවකයන් අතර ගැටුම් ඇති කරනවා.

මතක තියා ගන්න, ඒ හැදෙන ප්‍රධාන සමාගම් හතරට අමතරව විශ්‍රාම වැටුප් අරමුදල ගැන වග කියන වෙනම සමාගමක් තිබෙන බව, අතිරේක වැඩ කටයුතු සඳහා වෙනම සමාගමක් තිබෙන බව. විශ්‍රාම වැටුප් සඳහා තිබෙන සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉන්න ඕනෑ නවදෙනාගෙන් හතරදෙනෙකුම තෝරා ගන්නේ සේවකයන්ගෙන්. ඒ ගැන නොයෙක් කථා කියන්න පුළුවන්. කලින් කිව්වා නේද, පන්සලට දානේ ටික හම්බ වෙන්නේ නැහැ, පෙරහැර නැහැ කියලා? එහෙම කිව්වා නේද? නමුත් අද ප්‍රායෝගික තත්ත්වය එහෙම නොවෙයි නේද? එදා ඔය පක්ෂ ටික ඔක්කෝම එකතු වෙලාත් 500ක්-600ක් ගෙන්වා ගන්න බැරි වුණු දවසේම -එදාම- ජාතික භික්ෂු සම්මේලනයට 5,000කට අධික ස්වාමීන් වහන්සේලා වැඩියා. ඉතින් ඒක තමයි කියන්නේ, රටේ ජන මතය තේරුම් අරගෙන වැඩ කටයුතු කරන්න ඕනෑ කියලා. ඒ සේවකයන්ගේ ප්‍රශ්න තිබෙන්න පුළුවන්. වෘත්තිකයන්ගේ, ඉංජිනේරුවන්ගේ ප්‍රශ්න තිබෙනවා. ඒ සියලු ප්‍රශ්න කථා කරන්න පුළුවන්. ඒක තමයි ජනාධිපතිතුමා කියන්නේ. ඒ විධියට සමාගම් වශයෙන් කඩන එක විද්‍යානුකූල පදනමක් මත තමයි කරන්නේ. ඒක කලින් සමාගම් 12කට කැඩුවා වාගේ නොවෙයි. ජනනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම, පද්ධති පාලනය කිව්වාම එතැන තිබෙනවා, විද්‍යාත්මක පදනමක්. එතැනදී ඒ සේවකයන්ගේ, ඉංජිනේරුවන්ගේ සියලු ප්‍රශ්න කථා කරන්න පුළුවන්. කථා කරලා විසඳාගෙන වැඩකටයුතු කරගෙන යන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

ඒ කියන්නේ, රටේ හැම දේකදීම යම් කිසි පිළිවෙළකට, යම් කිසි දැක්මක් ඔස්සේ යනවා. ආණ්ඩුවට අවුරුද්දක් පිරෙන වෙලාවේ මම තව දෙයක් කියන්න ඕනෑ. මීට කලින් එක එක අය එක එක කථා කිව්වා නේ. මොනවාද කිව්වේ? ජාත්‍යන්තර මූල්‍ය අරමුදල යන්න යනවා, ආයෝජන එන්නේ නැහැ කිව්වා නේද? එහෙම කථාත් කව්වා නේ. ඒ නිසා මම කියන්නේ, මේ කරන හැම දෙයක් ගැනම විශ්වාසය තියා ගන්න කියලායි. විදුලිබල මණ්ඩලය ගැනත් කියන්න තිබෙන්නේ ඒකම තමයි. හිටපු රාජ්‍ය නායකයෝ කිව්වේ මොනවාද? මිල්කෝ එක විකුණන්න වෙනවා, පාඩු ලබනවා, ගොඩක් ණයයි කිව්වා. නමුත් දැන් ඒ සියලු ණය ගෙවා අවසන්; ලාභ ලබමින් යනවා. ත්‍රිපෝෂ සමාගම වහනවා කිව්වා. විපක්ෂ නායකතුමාත් කිව්වා. නමුත් මොකද වෙන්නේ? අලුත් නිෂ්පාදන හඳුන්වා දෙමින් ඉස්සරහට යනවා. ශ්‍රී ලංකන් ගුවන් සමාගම විකුණන්න ඕනෑ කිව්වා. ලාභ ලැබුවත් එවැනි ආයතන විකුණන්න ඕනෑ, විකුණලා තමයි අපි ඉස්සරහට යන්න ඕනෑ කිව්වා. නමුත් අද ඒ ආයතන මෙහෙයුම් ලාභ ලබමින් යනවා. පාඩු ලබපු ආයතනත් මෙහෙයුම් ලාභ ලබමින් යනවා.

අන්න ඒ අලුත් දැක්ම, අලුත් රටාව, අලුත් දේශපාලන සංස්කෘතිය ගැන ජනතාව කථා කරන්න ඕනෑ. ඒක මුළු රටේම කථා බහට ලක් වෙන්න ඕනෑ. මේ රටේ දරුවන්ගේ අනාගතය විනාශ කරන අයිස්, කුඩු, හෙරොයින් ඇතුළු මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 705ක් එක දවසක එනවා නම්, ඒක නේද මුළු රටම වික්ෂිප්ත වෙන්න ඕනෑ කාරණය? නමුත් ඒ දේවල් වහන්න, යම් කිසි කෙනෙක් වත්කම් බැරකම් ප්‍රකාශ දුන්නේ නැහැ කියන එක, අනීතිකව කෝටි 4,000ක්-5,000ක් ගිණුම්වලට ආවාය කියන එක වහන්න වෙනත් වෙනත් මාතෘකා එළියට ගන්නවා. ඒ මාතෘකා බොහොම කෙටි කාලීනයි. මෙච්චර කල් තිබුණු හැම එකම එහෙම තමයි. එදා බිත්තර ගැන කිව්වා. දැන් ඒක නැහැ. ලුණු ගැන කිව්වා. ඒක දියවෙලා ගියා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, your time is up.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

ඒ වාගේ එදා වේල කතාවට යන්නේ නැතුව, මේ වාගේ මාතෘකා ගැන කථා කරන්න ඕනෑ. මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළවත් ඔබතුමන්ලාට දමන්න බැරි වෙච්ච නීතිමය පදනම තමයි මේ හරහා දමන්නේ. මම කලිනුත් කිව්වා වාගේ අනාගත ලෝකයට සරිලන විධියට මේ රට නිර්මාණය වෙන්න ඕනෑ. මොකද, බස් එකක් පෙරළුණා වාගේ නොවෙයි, ස්වාභාවික උපද්‍රව ඊටත් වඩා දරුණුයි. අන්න ඒ වාගේ දේවල් සිදු නොවෙන්න, මේ රට ලස්සන කරන්න මේ පනත් කෙටුම්පත සම්මත කරලා අපි බලය ලබා දෙමු කියන කාරණය කියමින්, මාගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The ongoing proceedings of the House shall stay suspended until 1.00 p.m. for the lunch break.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam. You have 15 minutes.

[பி.ப. 1.00]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Hon. Deputy Speaker, இன்றைய நாளில் தேசிய கட்டிட ஆராய்ச்சி நிறுவகம் எனும் புதிய சட்டமூலம் தேசிய மக்கள் சக்தி அரசால் முன்வைக்கப்பட்டுள்ளது. இந்தச் சட்டமூலத்தினூடாக இயற்கை அனர்த்தங்களால் பாதிக்கப்படும் பிரதேசங்களில், குறிப்பாக மண்சரிவுகள் போன்ற இயற்கை அனர்த்தங்கள் சம்பந்தமாகக் கடந்த காலத்தில் ஓர் அமைப்பாக இயங்கிவந்த நிறுவனம் இனிவரும் காலங்களில் சட்டமுறையாக ஒழுங்கமைக்கப்பட்ட ஒரு நிறுவனமாக இயங்கப்போவதாக கௌரவ அமைச்சர் தனது விளக்க உரையில் சொல்லியிருந்தார். குறிப்பாக, மண்சரிவால் பாதிக்கப்பட்ட பிரதேசங்களைச் சீர்செய்வது, இயற்கை அனர்த்தங்களால் சேதமடைந்த கட்டிடங்களைப் புனரமைப்பது சம்பந்தமாகப் பேசும்போது, மண்சரிவுகளால்

மாத்திரமன்றி வெள்ளத்தால் பாதிக்கப்பட்டுப் பாரிய நெருக்கடிகளை எதிர்நோக்கும் பிரதேசங்கள் பற்றியும் கவனஞ்செலுத்த வேண்டும். அவ்வாறான பிரதேசங்கள் நாடு முழுவதும் காணப்படுகின்றன.

ஓர் உதாரணமாக மட்டக்களப்பு மாவட்டத்தை எடுத்துக்கொண்டால், மட்டக்களப்பு மாவட்டத்தைப் பொறுத்தவரையில் கடந்த வருடம் வெள்ளத்தால் ஏற்பட்ட அழிவுகள், பாதிப்புகள் இன்னும் சீர்செய்யப்படாத நிலை காணப்படுகின்றது. Disaster Management Centre ஊடாகச் சில விடயங்களைச் சீர்செய்து தருவதாக அந்த நேரத்தில் இருந்த மாவட்ட அபிவிருத்திக் குழுத் தலைவர், அமைச்சர், ஆளுநர்கள் போன்றோர் வாக்குறுதி அளித்திருந்தாலும்கூட இன்றுவரைக்கும் எதுவும் நடைபெறவில்லை. குறிப்பாக, போரதீவுப்பற்று, மாலையர்கட்டு பிரதேசங்களுக்குப் போகும் சில பாதைகள் இன்னும் சீர் செய்யப்படாத நிலையில் இருக்கின்றன. அவை ஒவ்வொரு வருடமும் கடுமையாக வெள்ளத்தினால் பாதிக்கப்படுகின்ற பாதைகளாகும்.

இப்பிரதேசங்களில் கட்டிடங்கள் மற்றும் வீதிகளை அமைக்கும்போது மண்சரிவு, வெள்ளம் போன்ற இயற்கை அனர்த்தங்களால் ஏற்படக்கூடிய பாதிப்புகளையும் இந்தத் தேசிய கட்டிட ஆராய்ச்சி நிறுவகத்தினூடாக மதிப்பிட்டு அங்கீகரிக்கும் விடயம் இதில் உள்வாங்கப்பட்டிருந்தால் இன்னும் சிறப்பாக இருந்திருக்கும். இதற்கான முயற்சிகளைக் கடந்த காலத்தில் இருந்த அரசாங்கங்கள் எடுத்திருந் தாலும்கூட, இந்த அரசாங்கம்தான் இச்சட்டமூலத்தைக் கொண்டுவந்திருக்கின்றது. ஆனால், சுற்றாடல் பிரதி அமைச்சர் என்ற வகையில் இந்தச் சட்டமூலத்தைச் சமர்ப்பித்த அன்ரன் ஜயக்கொடி அவர்களுக்குத் தெரியும், எங்களுடைய மாவட்டங்களிலுள்ள சில பிரதேசங்களில் இயற்கை அனர்த்தமான மண்சரிவால் ஏற்படுகின்ற பாதிப்புக்களைவிட அதிகமான பாதிப்புக்கள் அவர்களது அமைச்சின்கீழ் இருக்கின்ற மத்திய சுற்றாடல் அதிகாரசபைக்குகீழ் வருகின்ற GSMBஆனது திருக்கோவில், வாகரை போன்ற பிரதேசங்களில் சட்டவிரோதமான மண் அகழ்வு, இல்மனைட் அகழ்வுக்கான அனுமதிப் பத்திரங்களை வழங்குவதால் ஏற்படுமென்பது. இதனால் அங்கு எதிர்காலத்தில் பல அனர்த்தங்கள் ஏற்படக்கூடிய சந்தர்ப்பம் இருக்கிறது. எனவே, இந்த விடயங்களிலும் கௌரவ அமைச்சரவர்கள் கவனஞ்செலுத்த வேண்டுமென்று நான் நினைக்கின்றேன்.

தேசிய மக்கள் சக்தி அரசாங்கம் ஒரு வருடத்தைப் பூர்த்தி செய்யவிருக்கின்றது. கடந்த வருடம் செப்ரெம்பர் மாதம் 21ஆம் திகதி மாண்புமிகு ஜனாதிபதி அவர்கள் தெரிவுசெய்யப்பட்டு இன்று ஒரு வருடம் பூர்த்தியாகியிருக்கின்றது. ஆனால், இந்த ஒரு வருட காலப்பகுதிக்குள் இந்த நாட்டில் தமிழ் மக்கள் முகங்கொடுக்கும் பிரச்சினைகளுக்கு அவர் என்ன தீர்வுகளை முன்வைத்திருக்கிறார் என்றால், விரல்விட்டுச் சொல்லக்கூடியளவுக்கு எதுவுமில்லை. நாட்டிலுள்ள அனைத்து மக்களுக்கும் தீர்வுகள் எதுவும் வழங்கப்படவில்லை என்பது ஒருபுறம் இருக்கட்டும்! குறிப்பாக, தமிழ் மக்கள் முகங்கொடுக்கும் முக்கிய பிரச்சினைகளுக்கு இதுவரைக்கும் இந்த அரசாங்கம் என்ன தீர்வை வழங்கியிருக்கின்றது என்று பார்த்தால், திருப்தியடையக்கூடியதாக எந்தவொரு தீர்வையும் எங்களால் அடையாளப்படுத்த முடியாது.

சனாதிபதி அவர்கள் பதவியேற்று ஒரு வருடம் பூர்த்தியடையப் போகின்றது என்பது அனைவருக்கும் தெரிந்த விடயம் என்பதால், இந்த ஒரு வருட காலத்துக்குள் என்ன செய்திருக்கிறீர்கள்? என யாராவது கேட்டால், சொல்வதற்கு ஒன்றுமே இல்லை என்பதற்காக, அவசர அவசரமாக இந்த மாதத்தின் முதல் வாரத்திலே யாழ்ப்பாணத்துக்குச் சென்று, அங்கு சில அபிவிருத்தித் திட்டங்களை அவர் ஆரம்பித்து வைத்திருக்கிறார். அதேபோன்று, கொழும்பிலும் அவசர அவசரமாகச் சில அபிவிருத்தித் திட்டங்களை முன்னெடுத்திருக்கிறார். அதாவது, ஒரு வருடம் பூர்த்தியான இந்த 21ஆம் திகதி ஆகும்பொழுது, "நீங்கள் கடந்த ஒரு வருட காலப் பகுதியில் என்ன செய்திருக்கிறீர்கள்?" என்று யாராவது கேட்டால், சொல்வதற்கு எதுவுமே இல்லாமல் அவமானப்படக்கூடாது என்பதற்காக, அவர் அவசர அவசரமாகச் சில அபிவிருத்தித் திட்டங்களை ஆரம்பித்து வைத்திருக்கிறார். கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நீங்களும் அந்த நிகழ்வுகளில் கலந்துகொண்டிருந்ததை நான் பார்த்தேன். ஆனால், தமிழ் மக்கள் முகங்கொடுக்கும் முக்கியமான பிரச்சினைகளுக்கு ஏற்றுக்கொள்ளக்கூடிய ஒரு தீர்வை வழங்குவதற்கு இதுவரை இந்த அரசாங்கம் நடவடிக்கை எடுக்கவில்லை. சில விடயங்களுக்கு ஒரு வருடத்துக்குள் தீர்வு காண முடியாது என்பதை நாங்கள் ஏற்றுக்கொள்கின்றோம்.

You have to have a trajectory; the Government's trajectory towards resolving this issue should be there. Within this year of your being in Government, we should, at least, see that you all are keen on resolving some of the issues that the Tamil people of this country are facing.

Hon. Deputy Speaker, I have listed out some of their issues. If we take land-related issues - it has been a year since President Anura Kumara Dissanayake has come into office - within a year, you all have not been able to resolve any of those issues. I saw that the Minister in charge of transport had gone to Jaffna and attended the Jaffna District Development Committee meeting, and he was very proudly telling the media and everybody present that the NPP Government has opened up a road there. Sir, on that road, you can only travel; you cannot get down from the vehicle. Let us say, hypothetically, that the length of the road is two kilometres and on that length of two kilometres, you can only travel; you cannot get down from the vehicle because the lands beside the road are still occupied by the military. So, you cannot really call this release of lands or opening up roads.

இந்த நாட்டில், மிக முக்கியமாக வடக்கு, கிழக்கில் காணி மற்றும் மேய்ச்சல் தரை தொடர்பான பிரச்சினைகள் இருக்கின்றன. குறிப்பாக, மயிலத்தமடு மாதவனை மேய்ச்சல் தரையானது மட்டக்களப்பு மாவட்டத்தில் இருக்கின்றது. அதனை வர்த்தமானிமூலம் மேய்ச்சல் தரையாக அறிவிக்காதுவிட்டால், மகாவலி அதிகாரசபையின்கீழேயே அந்த நிலம் இருக்குமாகவிருந்தால், தொடர்ச்சியாக இனரீதியான முரண்பாடுகள் வரும். கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, அங்குள்ள பண்ணையாளர்கள் அந்தப் பிரதேசத்தை வர்த்தமானிமூலம் மேய்ச்சல் தரையாக அறிவிக்குமாறு கோரிக்கை முன்வைத்துப் போராடி 730 நாட்கள் கடந்தும், அதனை உங்களுடைய அரசாங்கத்திடமும் கேட்டிருந்தும் இதுவரையில் அதற்கான ஆரம்பகட்ட நடவடிக்கைகூட எடுக்கப்படவில்லை. தற்போது விவசாயிகள் பெரும்போக விவசாயம் செய்யும் காலப்பகுதியாகும். இன்னும் ஒரு குறிப்பிட்ட காலப்பகுதிக்குள்ளே அத்துமீறி வரும் விவசாயிகள் அந்தப் பண்ணையாளர்களுடைய மேய்ச்சல்தரைக்குள் வந்து நிலத்தை அபகரிக்கப் போகின்றார்கள். இந்த அரசாங்கம் இதுவரைக்கும் அதற்கான நிரந்தரத் தீர்வுக்குரிய ஆய்வைக்கூட செய்யவில்லை.

அதுபோல, எங்களுடைய பிரதேசத்தில் இராணுவ முகாம்கள் அமைக்கப்பட்டுள்ள காணிகளை விடுவிப்பது

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

தொடர்பாக நான் சொல்லியிருந்தேன். அங்கு சென்று பார்த்தால் எதுவும் நடைபெறவில்லை என்பது தெரிய வரும். அதேபோன்றுதான் - forest- வன இலாகாவின்கீழ் உள்ள காணிகளை விடுவிப்பதாக இன்றைய விவாதத் தலைப்புக்குப் பொறுப்பாக இருக்கின்ற அமைச்சர் மட்டக்களப்பு மாவட்டத்துக்கு வந்தபோது சொன்னார். அவ்வாறு சொல்லி மூன்று மாதங்களாகின்றது. இதுவரை எதுவும் நடைபெறவில்லை. எல்லாம் வாயால் சொல்வது மாத்திரம்தான்.

எங்களுடைய மக்கள் கடந்த காலங்களில் முகம்கொடுத்த மனித உரிமை மீறல்கள் தொடர்பாக இந்த அரசாங்கத்தின் தீர்வை ஏற்றுக்கொள்ள முடியாது. இன்று காலையில் நான் யாழ்ப்பாணம் மண்டைதீவில் நவீன சர்வதேச 'கிரிக்கெட்' மைதானம் அமைப்பதற்காகத் தெரிவுசெய்யப்பட்டுள்ள இடத்தில் துப்பாக்கி ரவைகள் சில கண்டெடுக்கப்பட்டுள்ளதாக ஒரு செய்தியைப் படித்தேன். செம்மணியில் மனித எலும்புக்கூடுகள் கண்டெடுக்கப்பட்டுக் கொண்டிருக்கின்றது. இதுவரையும் அது தொடர்பில் எந்தவித நடவடிக்கையும் எடுக்கப்படவில்லை.

நாட்டின் சனாதிபதி அவர்களும் சரி, கௌரவ பிரதம அமைச்சர் அவர்களும் சரி, அமைச்சர்களும் சரி, மாகாண சபைத் தேர்தல் 2025ஆம் ஆண்டின் ஆரம்பப் பகுதியில் நடைபெறும் என்றார்கள்; பின்னர் 2025இன் பிற்பகுதியில் என்றார்கள்; தற்போது 2026ஆம் ஆண்டில் நடைபெறும் எனச் சொல்கின்றார்கள். அதற்கான சட்டமூலத்தைக் கொண்டுவருவோம் என்றால், அதற்கு விருப்பமில்லை. "நிறைவேற்று அதிகார ஜனாதிபதி முறையை இல்லாது செய்வோம்" என்று சொன்னார்கள். இதுவரைக்கும் பேச்சளவில்கூட அது சம்பந்தமாகக் கூறப்படவில்லை. புதிய அரசியல் அமைப்பு உருவாக்கம் தொடர்பாக இதுவரைக்கும் பேச்சுவார்த்தை இடம்பெறவில்லை. இப்படி அடுக்கடுக்காகச் சொல்லிக்கொண்டு போகலாம்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, மிகத் தெளிவாகச் சொல்கின்றேன், எங்கள் மக்களுடைய பிரச்சினைகள் இருந்ததைவிட மிகவும் மோசமான நிலைக்குப் போய்க்கொண்டு இருக்கின்றது. கடந்தகால அரசாங்கமாவது வெளிப்படையாகச் சொன்னது, "நாங்கள் அவற்றைச் செய்ய மாட்டோம்" என்று. ஆனால், "நாங்கள் இனவாதிகள் இல்லை; வடக்கு மாகாணத்தில் இருக்கின்ற மக்கள்மீது எங்களுக்குத்தான் அதிகமான கரிசனைகள் இருக்கின்றது" எனச் சொல்லிச் சொல்லியே இவர்கள் எங்களுடைய மக்களை ஏமாற்றிக் கொண்டிருக்கிறார்கள். நாங்கள் இதனைத் தொடர்ந்தும் அனுமதிக்க முடியாது.

මම කාරණා කිහිපයක් සිංහලෙනුත් කියන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! Will an Hon. Member propose the Hon. Sanjeewa Ranasingha to the Chair?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.*

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු නියෝජ්‍ය කථානායකතුමා දවල්ට කන්නද දන්නේ නැහැ යන්නේ. මම දැක්කා, ගරු කථානායකතුමා නම් කියලා තිබෙනවා, පාර්ලිමේන්තුවේ කුස්සියේ මීයෝ එහෙම ඉන්නවා කියලා. හැබැයි, මම නම් ගිහිල්ලා කාලා ආවා. මී කතුරු තියලා දැන් ඒ ප්‍රශ්නය විසඳගෙනද දන්නේ නැහැ. මම නම් කන්න ගියා. ජාතික ජන බලවේගයේ මන්ත්‍රීවරු 94දෙනෙක් විතර අද උදේ කාලා තිබුණා ලු. ඒක පාර්ලිමේන්තුවේ කුස්සියේ රාජකාරි කරන නිලධාරින්ට කරපු අගෞරවයක් කියලා තමයි මම හිතන්නේ. හොඳ PHI මහත්මයෙක් ගෙනැල්ලා ඒ ප්‍රශ්නය විසඳගත්තා නම් හොඳයි, ගරු ඇමතිතුමා. ඉස්සරහා පේළියේ එක කැබිනට් ඇමතිවරයායි මේ වෙලාවේ ඉන්නේ. ගරු සමන්ත විද්‍යාරත්න ඇමතිතුමනි, ඔබතුමා පොඩ්ඩක් ඒ ගැන බලන්න. ඔබතුමාත් කෑවාද දන්නේ නැහැ. මම නම් ගිහිල්ලා lunch එක ගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ගෙනැවිත් තිබෙන පනත් කෙටුම්පත පිළිබඳව මගේ කථාවේදී කිව්වා. ඊත් එක්කම මම තව කාරණයක් මතු කරන්න ඕනෑ. සැප්තැම්බර් 21වන දා වන විට මේ ආණ්ඩුව බලයට ඇවිල්ලා අවුරුද්දක කාලයක් ගතවෙලා තිබෙනවා. මේ ආණ්ඩුව නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගේ පක්ෂයට මීට අවුරුද්දකට කලින් කිව්වේ "ජාතික ජන බලවේගය" කියලා. ඊට ටික කාලයකට පස්සේ "ජාතික පව බලවේගය" කියලා කිව්වා. මොකද, බොරු කියන නිසා. දැන් කියන්නේ "ජාතික ධන බලවේගය" කියලා. මම අද උදේ සමාජ මාධ්‍යවල ඒක දැක්කා. ඇමතිවරුන්ගේ, මන්ත්‍රීවරුන්ගේ වත්කම් සහ බැරකම් බැලුවාම, ඒවායේ තිබෙන දේපළ දැක්කාම, මාධ්‍ය සාකච්ඡාවලට ගිහිල්ලා කථා කරන දේවල් දිහා බැලුවාම, ඇත්තටම රටේ ජනතාවට මේක විශාල ගැටලුවක් වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වත්කම්, බැරකම් ප්‍රකාශ බාර දීම 2015 යහපාලන ආණ්ඩුව කාලයේ පටන් ගත්ත දෙයක්. මට මතකයි, වත්කම්, බැරකම් ප්‍රකාශ බාර දෙනකොට අපේ පක්ෂයේ වත්මන් මහ ලේකම්, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සුමන්තිරන් මැතිතුමායි, සමගි ජන බලවේගයේ ඉරාන් වික්‍රමරත්න මැතිතුමායි දෙදෙනා එතුමන්ලාගේ වත්කම්, බැරකම් ප්‍රකාශ online දමන්න කියලා Transparency International Sri Lanka එකට භාර දුන්නා. ඒ වාගේ තව අය හිටියාද දන්නේ නැහැ. පාර්ලිමේන්තුවට භාර දෙනවා විතරක් නොවෙයි, අපි ඒවා public domain එකට දෙනවා කියලා තමයි භාර දුන්නේ. මම 2020 වර්ෂයේ පාර්ලිමේන්තුවට තේරී පත් වුණාට පස්සේ මගේ වත්කම්, බැරකම් ප්‍රකාශය පළ කරන්න කියලා මම Transparency International Sri Lanka එකට මගේ consent එක දුන්නා. ඒක නිසා අද මේ ආණ්ඩුවේ ක්‍රියා කලාපය පිළිබඳව මම යම් කාරණයක් කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වෙනකොට ආණ්ඩුවේ සිටින සමහර කට්ටියගේ ක්‍රියා කලාපය ඉතාම පිළිකුල්.

පොලීසිය භාරව සිටින මහජන ආරක්ෂක ඇමතිතුමා අද මෙතැන සිටියා නම් හොඳයි. මොකද, ප්‍රාදේශීය සභා සභාපතිවරයෙකුට තර්ජනය කිරීමක් සම්බන්ධයෙන් ත්‍රිකුණාමලය

දිස්ත්‍රික්කය නියෝජනය කරන නියෝජ්‍ය ඇමතිවරයකු වන අරුන් හේමචන්ද්‍ර මහත්මයාට විරුද්ධව පොලීසියේ entry එකක් දාලා තිබෙනවා. ඉතා නුසුදුසු භාෂාවෙන් කථා කරලා තර්ජනය කිරීමක් සම්බන්ධයෙන් තමයි ඒ පැමිණිල්ල දාලා තිබෙන්නේ. නිලාවෙලි පොලීසියේ තමයි මේ පැමිණිල්ල දාලා තිබෙන්නේ. පැමිණිල්ල දැම්මාට පස්සේ ලබා දෙන ලදුපත මම **සභාගත*** කරනවා.

ගරු ඇමතිතුමා ඒ පැමිණිල්ල අරගෙන බලන්න. පොලීසියට කියන්න, මේ පිළිබඳව වහාම පරීක්ෂණයක් ආරම්භ කරන්න කියලා. ඊට අමතරව ජාතික ජන බලවේගයේ සංවිධායකට විරුද්ධවත් මඩකලපුව දිස්ත්‍රික්කයේ සන්දිවෙලි පොලීසියේ පැමිණිල්ලක් දාලා තිබෙනවා. ඒ පැමිණිල්ල දාලා දැන් මාසයක් වෙනවා. මඩකලපුව පොලිස් ස්ථානයේ සිටින නිලධාරින් හොඳයි. හැබැයි, ඒ සංවිධායකතුමා කියමින් යනවා, "මට DIG කියලා තිබෙන්නේ මම ජාතික ජන බලවේගයේ සංවිධායක නිසා පරීක්ෂණවලට ගෙන්වන්නේ නැහැ" යනුවෙන්. පසුගිය කාලයේ පිල්ලෙයාන්ලාත් එක්කයි අපි දේශපාලනය කළේ. මේ ආණ්ඩුවේ සිටින අය තර්ජනය කරනවා වාගේම, වෙන්කලඩි ප්‍රදේශයේ NPP සංවිධායකතුමාට විරුද්ධව entry එකක් දාලා තිබෙන්නේ library එකට ගිහිල්ලා තර්ජනය කළා කියලා. මේ වාගේ ක්‍රියාදාම එක්ක තමයි ජාතික ජන බලවේග ආණ්ඩුව අද යන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මතක තියාගන්න, මේ ආණ්ඩුවේ සිටින විශාල පිරිසක් අතරින් පසුගිය සැප්තැම්බර් මාසයේ 21වන දාට පෙර මුහුණ හැටියට පෙන්නුවේ අනුර කුමාර දිසානායක, හරිනි අමරසූරිය, විජිත හේරත් වාගේ කිහිපදෙනායි. මොකද, පාර්ලිමේන්තුවේ සිටියේ ඒ තුන්දෙනා විතරයි. දැන් සංවාදවලට, විවාදවලට එන සමහර අයගේ මුහුණු, ජනතාවගේ ඡන්දයෙන් තේරී පත් නොවී ජාතික ලැයිස්තුවෙන් ඇවිල්ලා රට පාලනය කරන්න හදන සමහර අයගේ මුහුණු සැප්තැම්බර් 21වන දාට කලින් තිබුණා නම්, ජනාධිපතිතුමා දිනන්නේත් නැහැ, ඔබතුමන්ලා පාර්ලිමේන්තුවට එන්නේත් නැහැ. ඒක නිසා මේ mandate එක හරියට මතක තියාගන්න. ජාතික ලැයිස්තුවලින් පාර්ලිමේන්තුවට රිංගගෙන, රනිල් වික්‍රමසිංහ legitimate නැති නායකයෙක් කියලා පසුගිය කාලයේ කියපු අය ඉන්නවා. ඒගොල්ලෝ ඡන්දයෙන් තේරී පත්වෙලා ආවා නම් කමක් නැහැ. අපට ජාතික ජන බලවේගයේ මන්ත්‍රීවරු කියනවා, "අපි ජනතා ඡන්දයෙන් තේරී පත්වෙලා ආවේ, අප සංවාදයකට යවන්නේ නැහැ, අපට පාර්ලිමේන්තුවේ කථාවක් දෙන්නේ නැහැ, අපට කමිටුවක සාමාජිකත්වය දෙන්නේ නැහැ, සමහර අයට විතරක් සැලකිලි තිබෙනවා" කියලා.

ඒක ආණ්ඩුවේ ප්‍රශ්නයක්. ජනතාව ඒක තීරණය කරාවි. හැබැයි, ජනතාවට වැදගත් කාරණයක් කියන්න ඕනෑ, මේ ආර්ථිකය පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම මේ ඉදිරිපත් කරන්නේ World Bank, Central Bank වාගේ ආයතනවලින් employment rate එක සම්බන්ධව ලබා ගත් දත්ත. Verite Research ආයතනයෙන් කියා තිබෙන පරිදි 1990 සිට 2024 දක්වා ගත්තාම, 2024 අවුරුද්දේ තමයි unemployment rate එක වැඩියෙන්ම වාර්තා වෙලා තිබෙන්නේ. ඒ කියන්නේ, ලංකාවේ රැකියා විරහිත ප්‍රමාණය වැඩියෙන්ම වාර්තා වෙලා තිබෙන්නේ 2024 අවුරුද්දේ. එම ප්‍රමාණය සියයට 46.3ක්. ලංකාවේ ජීවත් වෙන රැකියා කරන්න පුළුවන් වයස් මට්ටමේ සිටින ප්‍රමාණයෙන් සියයට 46.3ක් 2024 අවුරුද්දේ රැකියා විරහිතව ඉඳලා තිබෙනවා. 1990 වර්ෂයේ සිට බැලුවාම රැකියා නියුක්තිය අඩුම අවුරුද්ද තමයි 2024 කියන්නේ. එතැනින් එහාට ගත්තාම -

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කථාව පටන් ගත්තේ පස්වරු 1.00ට. මට විනාඩි 15ක් තිබෙනවා කිව්වා. දැන් වෙලාව 1.14යි. ඊට පසුව ඔබතුමා මූලසුනට ආවා. මට තව විනාඩියක විතර කාලයක් තිබෙනවා. දැන් වෙලාව පස්වරු 1.14යි. ඉතින් මට ලබා දුන් වෙලාව අවසන් වෙන්නේ කොහොමද? පස්වරු 1.15ටනේ මගේ වෙලාව අවසන් වෙන්න ඕනෑ.

The real incomes are still below the level of 2018. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Wage Index එක අනුව 2018 සිට public sector එක සහ informal private sector එකේ Real Wage Rate Index එක 78.7යි. ඒ කියන්නේ 100ට තිබුණු එක 78.7ට අඩුවෙලා තිබෙනවා. Verite Research ආයතනයෙන් තමයි මේ ගැන කියන්නේ. එහෙම නැතුව මේවා මම කියන දේවල් නොවෙයි.

එතැනින් එහාට ගත්තාම, 2021දී සියයට 13.1ක තිබුණු poverty rate එක මේ වෙනකොට 24.5ක් වෙලා තිබෙනවා. සියයට 13ක්ව තිබුණු එක සියයට 24.5ක් වෙලා තිබෙනවා. මේක මේ විධියටම ගියත්, 2027 විතර වෙනකොට 21.2කට විතර අඩු වේවි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණා කියන්න හේතුව මේකයි. ආණ්ඩුවේ අය කොච්චර පුරාජේරු කිව්වත්, මේ ඉන්න සමහර මන්ත්‍රීවරු, ඇමතිවරු කොච්චර උද්ධච්ච කථා කිව්වත් රටේ බිම් මට්ටමේ ජනතාවගේ අතේ වියදම් කරන්න තිබෙන මුදල් ප්‍රමාණය කොපමණද කියලා බලන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න. ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසන්.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
හොඳයි, මම කථාව අවසන් කරන්නම්.

ඒ අයගේ වියදම් කිරීමේ හැකියාව බලන්න ඕනෑ. අද පවතින මේ සංඛ්‍යා දත්ත අනුවයි මම මේවා කියන්නේ. එහෙම නැතුව මේවා මම උපකල්පනය කරපු දේවල් හෝ පාරේ යනකොට කවුරු හරි කියපු දේවල් නොවෙයි. මේවා World Bank, Central Bank වාගේ ආයතනවලින් ලබා දෙන දත්ත. මේ දත්ත අනුව මනුස්සයෙකුට ලැබෙන ආදායමින් ජීවත් වෙන්න පුළුවන් හැකියාව බැලුවොත්, ඇත්තටම එහෙම හැකියාවක් නැහැ. Employment rate එක අඩු වෙලා තිබෙනවා; වියදම් කරන්න තිබෙන මුදල් ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මම අවසන් කරන්නම්.

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

මේ ආණ්ඩුව බලයට ඇවිත් අද වෙනකොට අවුරුද්දක විතර කාලයක් ගත වෙලා තිබෙනවා. මේක ජන බලවේගයද, පව බලවේගයද, ධන බලවේගයද කියන එක අපට අදාළ නැහැ. මේ ආණ්ඩුවෙන් අපි ඉල්ලා සිටින්නේ, මේකයි. ජනාධිපතිතුමාට ජනතාව දුන් ඒ mandate එක හෑල්ලුවට ලක් කරන්න එපා, ඔබතුමන්ලාගේ උද්ධච්චකම නිසා. ජනතාව ජනාධිපතිතුමාට දුන් mandate එක හෑල්ලුවට ලක් කරන්න එපා. මොකද, එහෙම වුණොත් ඉතාම භයානක තැනකට මේ රට පත් වෙන්න පුළුවන්. ඒක මතක තියාගෙන වැඩ කටයුතු කරගෙන යන්න කියා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අනුර කරුණාතිලක නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.17]

**ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් අපි දන්නවා, ඉතිහාසයේ පාලකයන් තමන්ගේ පැවැත්ම තහවුරු කරගන්න නීති සම්පාදනය කළ බව. බ්‍රිතාන්‍ය යුගය ගත්තොත්, 1840දී Crown Lands Encroachments Ordinance එක ගෙනාවා. ඇත්තටම එම ආඥාපනත සම්මත කළේ ගොවිබිම් රජයට පවරා ගැනීම සඳහායි. ඒ වාගේම බ්‍රිතාන්‍ය පාලනය පැවැති කාලයේම 1897දී, Waste Lands Ordinance එක සම්මත කළා. ඒකෙන් බලාපොරොත්තු වුණේ සාම්ප්‍රදායික කෘෂි ඉඩම් ගොවීන්ගෙන් අරගෙන තේ, රබර් වාගේ වාණිජ වගා කටයුතු සඳහා ලබා දීමයි. ඒ වාගේම අපි දන්නවා, 2005දී Emergency (Miscellaneous Provisions and Powers) Regulation එක Extraordinary Gazette Notification එකක් හරහා ගෙනාපු බව.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ point of Order එක මේකයි. මේ ඇමතිතුමාට ඔබතුමා ආමන්ත්‍රණය කළේ "නියෝජ්‍ය ඇමති" කියලා. එතුමා ඇමතිද, නියෝජ්‍ය ඇමතිද?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
කමක් නැහැ. මට ඒක ප්‍රශ්නයක් නැහැ.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මේවා රටේ මිනිස්සුත් බලනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හරි, මම පිළිගන්නවා. ගරු ඇමතිතුමා, කථාව කරන්න.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
මට ප්‍රශ්නයක් නැහැ, චාමර සම්පත් මන්ත්‍රීතුමා. කොහොම වුණත්, පෙන්වා දුන්නාට ස්තුතියි.

දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගත්තොත්, ඒක ගෙනාවේත් ජනාධිපතිවරයාට අත්තනෝමතික ලෙස බලය පවරා ගන්න තමයි. එවැනි කටයුතු සඳහා තමයි එවැනි පනත් සම්මත කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කෙටි උදාහරණ කිහිපය පෙන්වා දෙන්න හේතුව මේකයි. ඉතිහාසයේ හිටපු පාලකයෝ අමතක කළේ නැහැ, බලය වැඩි කර ගැනීම සඳහා, බලය අත්පත් කර ගැනීම සඳහා පනත් සම්මත කර ගැනීමට.

ඒ වාගේම බලය අවසන් වුණාට පස්සේත් ජනතා බදු මුදල්වලින් ජීවත් වෙන්න අවශ්‍ය අණපනත් සම්මත කර ගන්න කොයි වෙලාවකවත් පැකිළුණේ නැහැ. පසුගිය දවස්වල අහෝසි කරපු, විශ්‍රාමික ජනාධිපතිවරුන්ගේ සහ ඔවුන්ගේ වැන්දඹුවන්ට වරප්‍රසාද හිමිවෙන ජනාධිපතිවරයන්ගේ හිමිකම් පනතත් අන්න ඒ වාගේ එකක්. ඒක බලය නැති වුණාමත් තමන්ගේ වරප්‍රසාද ලබා ගන්න සම්මත කරපු පනතක්. මේ අතරේ පාලකයන් විසින් හිතාමතාම, එහෙම නැත්නම් නොසැලකිල්ල නිසා හෝ අත්හැර දමපු, මහ හැරපු පනත් හැටියට සම්මත විය යුතුව තිබූ කරුණු ගණනාවක් තිබෙනවා. අද අපි මේ කථා කරන ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පනත් කෙටුම්පත කියන්නේ, අන්න ඒ වාගේ අතීත පාලකයන් විසින් නොසැලකිල්ල මත, එහෙම නැත්නම් වුවමනාවෙන් හෝ මහ හැරපු, නොසලකා හැරපු පනත් කෙටුම්පතක්. ජනතා විරෝධී අණපනත් වරක් අහෝසි කරන්නත්, ඒ වාගේම ජනතාව වෙනුවෙන් අත්‍යවශ්‍යයෙන්ම පැනවිය යුතු, සම්මත කළ යුතු අණපනත් සම්මත කර ගන්නත් ජාතික ජන බලවේගය හැටියට අපට සිදු වෙනවා. මේ පනත් කෙටුම්පතත් අන්න ඒ වාගේ ජනතාව ගැන හිතලා, ජනතාව වෙනුවෙන් අත්‍යවශ්‍යයෙන්ම සම්මත කරගත යුතු පනත් කෙටුම්පතක්.

මෙහි මුල් පනතේ ඉතිහාසය ගත්තොත්, 1980 දශකයේ මැද භාගය දක්වා යනවා. සංවර්ධන ක්‍රියාවලිය කඩිනම් කරන්න, ඒ වාගේම ඒකට අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දෙන්න, සංවර්ධනයට අවශ්‍ය රාජ්‍ය සේවා සපයන ආයතන සම්බන්ධීකරණය කිරීම පිළිබඳ සාකච්ඡාවක් 80 දශකයේ මැද භාගය තුළ සමාජය තුළින් ආවා. ඒ අනුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සතුව තිබූ රසායනාගාරයකට පාංශු පිරික්සුම් උපකරණ ගෙන ඒම මඟින් මේ ආයතන ආරම්භ කළා. ඒ, අදින් අවුරුදු 41කට පෙර.

සාමාන්‍යයෙන් අපේ රටේ ප්‍රතිශතයක් හැටියට ගත්තොත් නාය යෑමේ උවදුරුවලට භාජන වෙන්න පුළුවන් -ලක්විය හැකි- ප්‍රදේශ සියයට 30ක් තිබෙන බව අපි දන්නවා. ඒ ප්‍රදේශ දිස්ත්‍රික්ක 14ක ව්‍යාප්ත වෙලා තිබෙනවා. අද අපි මේ කථා කරන ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය කියන්නේ අන්න ඒ වාගේ නාය යෑම් වැනි අවදානමකට ලක්විය හැකි ප්‍රදේශ හඳුනාගෙන,

ඒවා සිතියම්ගත කරලා, ඒ තුළ කිසියම් නාය යෑමේ නැඹුරුවක් ඇති ප්‍රදේශ, භූ තාක්ෂණික අස්ථාවරත්වයක් පවතින ප්‍රදේශ විමර්ශනය කරලා, ඒවායේ නාය යෑමක් ඇති වෙන්න පුළුවන් නැඹුරුව කොයි තරම් දුරද කියලා හඳුනාගෙන ඒ වෙනුවෙන් කටයුතු කරන ආයතනයක්. ඒ විතරක් නොවෙයි. අවශ්‍ය නම්, ඒ වාගේ නාය යෑමේ අවදානම වැඩි ප්‍රදේශවලින් පුද්ගලයන් ඉවත් කරන්න, අනතුරු කලාප හැටියට ඒවා ප්‍රකාශ කිරීමේ බලය තිබෙන්නේ ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයට. නාය යෑමේ ප්‍රදේශයක් හඳුනා ගත්තාට පස්සේ නාය යෑමේ පූර්ව අනතුරු නිකුත් කිරීමේ බලයත්, හැකියාවත් තිබෙන්නේ ඒ ආයතනයට. ඒ විතරක් නොවෙයි. නාය යෑම් වැනි අවදානම් කලාප හඳුනා ගන්නවා වාගේම, භූ තාක්ෂණික අස්ථාවරත්වය පවතින ප්‍රදේශවල ඉදිකිරීම්වලට අවශ්‍ය නිර්ණායක ලබා දෙන්නේත්, ඒ ආයතනය. ඒ ප්‍රදේශවල ඉදිකිරීමක් සිදු වෙනවා නම්, මොන වාගේ නිර්ණායක යටතේද ඒක සිදු වන්න ඕනෑ කියන එක පිළිබඳ නිර්ණායක නිකුත් කිරීමත්, ඒ තාක්ෂණික සහාය ලබා දීමත් ඇත්තටම ඒ ආයතනයෙන් සිදු කරනවා. ඒ විතරක් නොවෙයි. කිසියම් විධියකින් අවදානම් සීමාව වැඩි වීම නිසා, එහෙම නැත්නම් ගොඩනැඟිල්ලේ තිබෙන පැරණි ස්වභාවය නිසා පදිංචිකරුවන් එම ගොඩනැඟිල්ලෙන් ඉවත් කරන්න අවශ්‍ය නම්, ඒක භාවිතයට සුදුසු ද, නැද්ද කියන එක තීරණය කිරීමේ වගකීම ඒ ආයතනය විසින් කරනු ලබනවා. ඒ වාගේම තමයි වායු දූෂණය වාගේ දේවලදී වුණත් ඒ ආයතනයට විශාල මැදිහත් වීමකින් කටයුතු කරන්න පුළුවන්. වායු දූෂණ සීමා උල්ලංඝනය වෙලා තිබෙනවාද, වැඩි වෙලා තිබෙනවාද කියන කරුණු නිර්ණායක හැටියට ඉදිරිපත් කිරීමේ වගකීම ඒ ආයතනයට තිබෙනවා.

මේ විධියට බැලුවාම, සාමාන්‍ය ජනතාවගේ ජීවිතයට ඉතා සමීප ආයතනයක් හැටියට තමයි ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය කියන එක අපට දකින්න පුළුවන් වන්නේ. මිනිස් ජීවිත අවදානමාන් ගලවා ගැනීම සඳහා නිර්ණායක ඉදිරිපත් කරමින් කොයි තරම් වැදගත් කාර්යයක් මේ ආයතනය ඉෂ්ට කළත්, අවාසනාවකට ඒ ආයතනයට අවශ්‍ය නීතිමය බලය ලබා දීමට පසුගිය කාලයේ කටයුතු කරලා තිබුණේ නැහැ. අද සාකච්ඡා කරන ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පනත් කෙටුම්පත මඟින් අන්න ඒ නීතිමය සුජාතභාවය, ඒ නීතිමය සුරක්ෂිතභාවය, පුරවැසියා අවදානමින් ගලවා ගැනීම සඳහා අවශ්‍ය වන නෛතික බලය ලබා දීම තමයි සිදු කරනු ලබන්නේ.

ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ කාර්යභාරය මොකක්ද, අභිමතාර්ථ මොනවාද, පාලන ව්‍යුහය හා කළමනාකරණය සිද්ධ වෙන්න ඕනෑ කොහොමද, අරමුදල් සම්පාදනය වෙන්න ඕනෑ කොහොමද කියන ඒවා වාගේම, සාමාන්‍ය විධිවිධාන පිළිබඳ සියලු විස්තර ඇතුළත් කරලා, පරිපූර්ණ ආයතනයකට අවශ්‍ය නීතිමය බලය ඒ ආයතනයට ලබා දීම මේ පනත් කෙටුම්පත හරහා සිද්ධ කරන්න බලාපොරොත්තු වෙනවා.

මේ පනත් කෙටුම්පතට අවධානය යොමු කරනවා වාගේම, මේ පනත් කෙටුම්පතට සෘජුවම අදාළ නොවුණත් ජාතික වශයෙන් වැදගත් වන කාරණයකට මේ මොහොතේ මගේ අවධානය යොමු කරන්න කැමැතියි. අපි කවුරුත් දන්නවා, මේ දවස්වල ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් අතර නොසන්සුන්තාවක්, ගැටලුවක් පැන නැඟී තිබෙන බව. පසුගිය රජයන් විසින් ලංකා විදුලිබල මණ්ඩලය කොටස් 12කට කඩලා පෞද්ගලීකරණය කිරීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කරලා, පනතක් සම්මත කරලා තිබුණු බව අපි දන්නවා. ඒ කාරණය නවත්වන්න නම්, අලුත් පනත් කෙටුම්පතක් ගෙන එන්න අපට සිද්ධ වුණා. ඒ අනුව 12කට කඩන්න තිබුණු ලංකා විදුලිබල මණ්ඩලය සම්පූර්ණ රාජ්‍ය අයිතිය තිබෙන සමාගම් පහකට ලබා දෙන පනතක් අපි පසුගිය කාලයේ සම්මත කළා. නමුත්, ඒ පිළිබඳ නිසි අවබෝධයක් නැති සමහර කණ්ඩායම් ඉල්ලීම් 21ක් මුල් කරගෙන දැන් උද්සෝෂණ ක්‍රියාමාර්ගයක්, වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක් ගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ඉල්ලීම් 21 දිහා බැලුවාම අපට පෙනෙන කාරණය තමයි, ඒ ඉල්ලීම්වලින් සැලකිය යුතු ප්‍රමාණයක් පනත තුළින්ම ආවරණය වෙලා, මේ වෙනකොටත් සහතික වෙලා තිබෙන ඉල්ලීම් බව. ඒ නිසා අලුතින් ඉල්ලීම් ඉදිරිපත් කරන්න අවශ්‍යතාවක් නැහැ. ඒ වාගේම සමහර ඉල්ලීම් සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගෙන, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒවාට අවශ්‍ය විසඳුම් දැනටමත් තීන්දු කරලා තිබෙනවා. සමහර ඉල්ලීම් තිබෙනවා ඒවා කවදාවත් ඉෂ්ට කරන්න හැකියාවක් නැහැ. මම උදාහරණ කිහිපයක් කියන්නම්. එකක් තමයි, මේ ඉල්ලීම් 21හි පළමුවැනි ඉල්ලීම විධියට තිබෙනවා, 2023 වසරේ ලබා නොගත් අසනීප නිවාඩු, - 2023 වසරේ. මේවා අපේ පවි නොවෙයි - වෙනුවෙන් නොගෙවූ, සේවකයන්ට හිමි දීමනාව මේ අවුරුද්දේ සැප්තැම්බර් 15ට කලින් ගෙවන්න කියලා. ඒක තමයි පළමුවැනි ඉල්ලීම. ඒ ඉල්ලීම විදුලි සේවක සංගමය විසින් 2025.07.29වෙනි දා ලිපියකින් ඉදිරිපත් කරලා තිබුණා. දැන් අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අනුමැතිය ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම, වෛද්‍යාධාර යෝජනා ක්‍රමය. වෛද්‍යාධාර සීයයට 50කින් වැඩි කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දැනටමත් තීන්දුවක් ගෙන තිබෙනවා. ඒ නිසා මේ ඉල්ලීම්වලින් සැලකිය යුතු ප්‍රමාණයක් දැනටත් ඉෂ්ට කරලා තිබෙනවා.

ඒ වාගේම, කම්කරු පනත යටතේ වෘත්තීය සමිති වෙත ලැබිය යුතු අයිතිවාසිකම් තහවුරු කළ යුතු අතර, මේ වන විට කප්පාදුවට ලක් වී ඇති සියලු අයිතිවාසිකම් වහා සුරක්ෂිත කළ යුතුය කියන එක පස්වැනි ඉල්ලීම හැටියට ඉදිරිපත් කර තිබෙනවා. හැබැයි, අවාසනාවකට මේ වෘත්තීය සමිති සඳහන් කරන්නේ නැහැ, මොන අයිතිවාසිකම් ද කප්පාදු කරලා තිබෙන්නේ කියලා. ඔබට මතක ඇති, අපි මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත කරනකොට, පනත් කෙටුම්පත අවසානයේ සඳහන් වෙලා තිබුණා, මේ වන විට ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් ලබන වරප්‍රසාද හා අයිතිවාසිකම් මේ සමාගම්වලට ගියාට පස්සේත් ඒ විධියටම ලැබෙන්න ඕනෑය කියන එක. ඒක පනත තුළින්ම සම්මත වෙලා තිබෙනවා. ඒ නිසා මේවා අලුතින් සාකච්ඡා කරන්න අවශ්‍ය දේවල් නොවෙයි.

ඒ වාගේම, මේ සමාගම් පහට යන්න අකමැති අයට අවශ්‍ය නම් ස්වේච්ඡාවෙන් විශ්‍රාම යන්න පුළුවන්. හැබැයි, ඒ විශ්‍රාම යෑමේදී ගෙවනු ලබන වන්දි මුදල රුපියල් ලක්ෂ පනහකට සීමා කරලා තිබෙනවා. සේවය කර තිබෙන කාලය, ඒ වාගේම ඉස්සරහට කොච්චර කාලයක් සේවය කරන්න තිබෙනවාද කියන එක මත සහ දැනට ලබන වැටුප මත තමයි ස්වේච්ඡාවෙන් විශ්‍රාම යන කොට කොච්චර වන්දියක් ගෙවනවාද කියන එක තීරණය කරන්නේ. හැබැයි, මේ අයගේ 15වැනි ඉල්ලීමෙන් ඒ රුපියල් ලක්ෂ පනහක උපරිම සීමාව වැඩි කරන්න කියලා, ඒගොල්ලෝ formula එකක් ඉදිරිපත් කරනවා. අපි ඒක ගණනය කරලා බැලුවාම, ඒගොල්ලන්ගේ ඉල්ලීම දුන්නොත් ස්වේච්ඡාවෙන් විශ්‍රාම යන අයට වන්දි ගෙවන්න අමතර රුපියල් බිලියන 200ක් වැය කරන්න වෙනවා.

ඊළඟට අපට තිබෙන ප්‍රශ්නය තමයි, ලංකාවේ විදුලි බිල. ඒ පිළිබඳව කවදාත් සාකච්ඡාවක් තිබුණා. අපේ ආණ්ඩුවේ තිබෙන ප්‍රතිපත්තිය තමයි, එක පැත්තකින් ජනන වියදම අඩු කරලා පාරිභෝගිකයන්ට අවශ්‍ය සහනය ලබා දීම. මොකද අපේ කර්මාන්ත ක්ෂේත්‍රය සංවර්ධනය වෙනකොට, ආර්ථිකය වර්ධනය වෙනකොට අපේ ව්‍යවසායකයන්ට මෙච්චර විදුලි බිලක් දරාගන්න බැහැ. නමුත් දැන් මේ සේවකයන් ඉල්ලන විධියට මේ උපරිම සීමාව වන රුපියල් ලක්ෂ 50 සීමාව අයින් කළොත්, ඒ රුපියල් බිලියන 200ක වැය බරත් දරන්න සිද්ධ වෙන්නේ මේ

[ගරු අනුර කරුණාතිලක මහතා]

රටේ අහිංසක පාරිභෝගික ජනතාවට සහ කර්මාන්තකරුවාට. ඉතින් ඒ සේවකයන්ගෙන් අපට අහන්න සිද්ධ වෙනවා, ඔයගොල්ලන්ගේ අනවශ්‍ය ඉල්ලීමක් මත තිබෙන බර පාරිභෝගිකයන් මතට දමනවාද, එහෙම නැත්නම් මේ ලබා දෙන වන්දි මුදල අරගෙන සේවයෙන් ඉවත් වී යනවාද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර ඉල්ලීම් තිබෙනවා කවදාවත් ඉදිරිපත් කරන්න බැරි දේවල් ඇතුළත්ව. මම එවැනි එක උදාහරණයක් සඳහන් කරලා මගේ කථාව අවසන් කරන්නම්. 16වෙනි ඉල්ලීමේ තිබෙනවා, ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේදී ලබා දෙන වන්දි මුදල්වල කාල සීමාව සහ ඒ අදාළ නිර්ණායක සම්බන්ධයෙන් තිබෙන ලිපි සැප්තැම්බර් 15වෙනි දාට කලින් ලබා දෙන්න කියලා. හැබැයි, මේ පනත සම්මත වෙලා මාස දෙකක කාලයක් සේවකයන්ට දෙනවා, තමන් යන්න කැමැති ආයතනය කුමක්ද, තවදුරටත් ඒ අදාළ සමාගම තුළ ඉන්නවාද නැද්ද කියලා තීරණය කරලා අවශ්‍ය දැනුම් දීම ලබා දීම සඳහා. ඒ බලය ලංකා විදුලිබල මණ්ඩලයට ලබා දෙන්නේ ඔක්තෝබර් 27වෙනි දා. නමුත් ඔක්තෝබර් 27වෙනි දාට කලින් මෙන්න මේ ලිපිය ලබා දෙන්න කියලා වෘත්තීය අයිතිවාසිකමක් හැටියට මේ අය ඉල්ලනවා. මේ සේවකයන්ට ඔක්තෝබර් 27 දක්වා අවස්ථාව දීලා තිබෙනවා, තමන්ගේ කැමැත්ත ප්‍රකාශ කරන්න. හැබැයි මේ අය කියනවා, ඒ ලිපිය සැප්තැම්බර් 15ට කලින් නිකුත් කරන්න කියලා. ඒ වාගේම මේ ඉල්ලීම් අතර තිබෙනවා, ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපතිවරයා ඉවත් කරන්න, අමාත්‍යාංශයේ ලේකම් ඉවත් කරන්න, සමහර ආයතන ප්‍රධානීන් ඉවත් කරන්න කියන කාරණාත්. තමන්ගේ වෘත්තීය අයිතිවාසිකම් සහ සේවකයන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින එක, ඒ වෙනුවෙන් කටයුතු කරන එක අපට තේරුම් ගන්න පුළුවන්. ඒක සාධාරණයි. හැබැයි මේ අයගේ ඉල්ලීම් අතරේ, තවත් කෙනෙකු තනතුරෙන් ඉවත් කරන්න කියන ඉල්ලීම තිබෙනවා නම්, ඒක අපට පිළිගන්න පුළුවන් එකක් නොවෙයි. අපි මේ පනත තුළින් ලංකා විදුලිබල මණ්ඩලය පෞද්ගලික අංශයට විකුණන්න තිබෙන අවදානම ඉවත් කළා. ඒ අනුව සියයට 100ක් රාජ්‍ය වගකීම යටතේ, රාජ්‍ය අයිතිය යටතේ ඒ සමාගම් පවත්වාගෙන යන්න අපි කටයුතු කළා. ඒ නිසා ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන්ට කැමැති නම් තවදුරටත් ඒ පූර්ණ රාජ්‍ය අයිතිය තිබෙන සමාගම් යටතේ ඉදිරියේදීත් සේවය කරන්න පුළුවන්. එහෙම නැත්නම් කැමැත්තෙන් විශ්‍රාම අරගෙන යන්න අවස්ථාවකුත් හදලා දීලා තිබෙනවා. කිසිම විධියකින් ඔවුන්ගේ අයිතිවාසිකම් හෝ ඔවුන්ට තිබෙන වරප්‍රසාද බින්දුවකින්වත් කපා හැරීමක් සිද්ධ වෙන්නේ නැහැ කියන සහතිකය මේ වෙලාවේ මම ලබා දෙන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී unemployment rate එක ගැනත් කථා කළා. ඔව්, ඇත්ත. ඒක සියයට 49.7ක්. මේ සියයට 49.7 කියන්නේ 2025 මැයි මාසය වෙනකොට. හැබැයි ඒ මන්ත්‍රීතුමාට අමතක වුණා, ගිය අවුරුද්දේ මැයි මාසය වෙනකොට ඒක සියයට 47.7ක් බව. අපේ ආර්ථික වර්ධන වේගය වැඩිවෙනකොට, ඒ වාගේම අනෙකුත් ආයෝජන ලංකාවට එනකොට මේ employment rate එක අවුරුද්දක් ඇතුළත වැඩි වෙලා තිබෙනවා, සියයට 2කින්. එතකොට අපි කථා කරන්න ඕනෑ, කරුණු ඉදිරිපත් කරන්න ඕනෑ, සංඛ්‍යාලේඛන, දත්ත ඉදිරිපත් කරන්න ඕනෑ ගිය අවුරුද්දට සාපේක්ෂවයි. ඒ නිසා පසුගිය අවුරුද්දේ සංඛ්‍යාව අමතක කරලා මේ අවුරුද්දේ සංඛ්‍යාව විතරක් ඉදිරිපත් කරන එක තර්කානුකූල නැහැ. ඒවා වෘත්තීමය තර්ක නොවෙයි කියන එකත් මේ අවස්ථාවේ මම මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව එක කරුණක් සඳහන් කරලා මගේ කථාව නතර කරන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2022, 2023 කාලයේ ඉඳලා වසර ගණනාවක් තිස්සේ රාජ්‍ය සේවයට බඳවා ගැනීම් කරලා තිබුණේ නැහැ. මේ වෙනකොට අපි රාජ්‍ය ආයතන, අමාත්‍යාංශ ගණනාවකට 70,000කට ආසන්න පිරිසක් බඳවා ගැනීම සඳහා කැබිනට් අනුමැතිය ලබා දීලා තිබෙනවා. එක පැත්තකින් රාජ්‍ය අංශයට බඳවා ගැනීම් ශක්තිමත් කරන්න අපි කටයුතු කරනවා. ඒ වාගේම ආර්ථිකය ප්‍රසාරණය කිරීමත් එක්ක ඒ ප්‍රසාරණයේ ප්‍රතිලාභ හරහා පෞද්ගලික අංශයටත් වැඩි අවස්ථාවක් ලබා දීලා තිබෙනවා. ඒ අනුව ඒ අයටත් රැකියා සඳහා පුද්ගලයන් බඳවා ගැනීමෙන් ඒ හරහා අපේ රටේ රැකියා වියුක්තිය අඩු කරන්න පුළුවන්. ඒ නිසා මම අර කලින් සඳහන් කළා වාගේ එක පැත්තකින් ඒවාට අවශ්‍ය අණ පනත් අපි සම්මත කර ගන්නවා. ඒ වාගේම අහෝසි කරන්න ඕනෑ නම්, අපි ඒවා අහෝසි කරනවා. අලුතින් ගේන්න ඕනෑ නම් ගේනවා. ජාතික ජන බලවේගය හැටියට මේ රටේ ජනතාවට පොරොන්දු වෙච්ච ඒ පොහොසත් රට, ලස්සන ජීවිතය අත්පත් කර ගැනීම සඳහා එක පැත්තකින් සංවර්ධන ක්‍රියාමාර්ගත්, අනෙක් පැත්තෙන් අවශ්‍ය වන ආයෝජන කැඳවීම් සහ ජාත්‍යන්තර ප්‍රජාවගේ දායකත්වය අරගෙන කටයුතු කිරීමටත් අපි ක්‍රියා කරනවා. ඒ සඳහා අවශ්‍ය වන නීතිමය අණ පනත් වෙනස් කරන්න ඕනෑ නම්, ඒවා වෙනස් කරන්නත් අපි පැකිළෙන්නේ නැහැ. ඒ නිසා ජාතික ජන බලවේගය ආණ්ඩුව පිළිබඳව තිබෙන විශ්වාසය තවදුරටත් රැක ගනිමින්, ඒ විශ්වාසය තුළ ජීවත් වෙන්න. අපි ඔක්කෝම එකතු වෙලා ලස්සන රටක්, ලස්සන ජීවිතයක්, පොහොසත් රටක් හදා ගනිමු කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා.

බෙහෙවින්ම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.34]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 10ක කාලයක් තිබුණා. නමුත්, අපේ ගරු ඇමතිතුමාට ඔබතුමා විනාඩි 3ක් වැඩියෙන් දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේ අධ්‍යක්ෂ (පරිපාලන) උදය මුණසිංහ මැතිතුමා අද දිනයේ විශ්‍රාම යනවා. එතුමා අවුරුදු 30ක කාලයක් පාර්ලිමේන්තුවේ සේවය කළා. එතුමාගේ විශ්‍රාම දිවිය නීරෝගීව ගත කරන්න හැකියාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව ආරම්භ කරනවා.

මේ වෙලාවේ මම කථා කරන්න ඕනෑ, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පනත ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ඇමතියි, නියෝජ්‍ය ඇමතියි දෙදෙනා පැටලුණා, දෙදෙනාම නියෝජ්‍ය ඇමති වෙලා තිබුණා. කමක් නැහැ. නියෝජ්‍ය ඇමතිතුමාගේ කථාව මම අහගෙන සිටියා. ඉතාම වැදගත්, උචිත, කාලෝචිත විධියට එතුමා ඒ කරුණු ඉදිරිපත් කළා. 1984 වසරේ ප්‍රේමදාස මහත්මයාගේ කාලයේ තමයි මේ ආයතනය හැදුවේ. 2006 වසරේදී තමයි ලංකාවේ වැඩිම ආපදා සංඛ්‍යාවක් සිදු වුණේ. 2007දී තමයි මේ NBRO එක ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට අයත් වුණේ. ෆේරියල් අෂ්රොෆ් මැතිනිය තමයි ඒ කාලයේ විෂයය භාර ඇමතිවරිය හැටියට කටයුතු කළේ. මට ඒක තවම මතකයි. මොකද, එතකොට මම ඇල්ල ප්‍රාදේශීය සභාවේ

සභාපතිවරයා හැටියට කටයුතු කළා. ඒ කෙසේ වෙතත්, මේ ආයතනය පනතක් නැතිව පසුගිය කාලයේ වැඩ කළා. බදුල්ල දිස්ත්‍රික්කයේ වැඩියෙන්ම වැඩ කරන්නේ NBRO එක. එහේ පාරක් හදන්නත් බැහැ, වෙන මොනවත් කරන්නත් බැහැ, NBRO වාර්තාවක් නැතිව. නමුත් පනතක් නැතිව හරි NBRO එක, නැත්නම් ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය කියන්නේ බදුල්ල දිස්ත්‍රික්කය, නුවරඑළිය දිස්ත්‍රික්කය වාගේ වැඩි වශයෙන් නාය යන දිස්ත්‍රික්කවල විශාල වැඩ කොටසක් කරපු ආයතනයක්. ඒ නිසා පනතක් ගෙනැවිත් ඒ ආයතනය නීත්‍යනුකූල තත්ත්වයට පත් කරන්නට කටයුතු කිරීම ගැන මේ ආණ්ඩුවට අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ කියා මම හිතනවා. හොඳ දේට අපි හොඳයි කියනවා, නරක දේට නරකයි කියනවා. හොඳ දේට කවදාවත් අපි විරුද්ධ වන්නේ නැහැ.

දැන් මේ පනත ගෙනාපු වෙලාවේ අපේ ඇමතිවරු දෙදෙනෙකුත්, පාර්ලිමේන්තු මන්ත්‍රීතුමෙකුත් කථා කළා, විදුලිබල මණ්ඩලයේ ප්‍රශ්න ගැන. ලුණු දියවෙලා යනවා වාගේ ප්‍රශ්නත් දියවෙලා යයි කියලා එක් මන්ත්‍රීවරයෙක් කිව්වා. නමුත්, ප්‍රශ්න දියවෙන්නේ නැහැ. ඒ කථා කරපු ඇමතිවරයෙක් කිව්වා, සමාගම් 12ක් ගැන. සමාගම් 12ක් හරි, 15ක් හරි අපි නේ හැදුවේ. අපේ කාලයේ කරපු දේ වැරදියි කියලා ඒ වැරද්ද නේ නිවැරදි කළේ. නැත්නම් කංචන විජේසේකර මාතරින් දිනන්න එපා යැ. කංචන හරියට වැඩේ කරලා තිබුණා නම් කංචන දිනන්න එපා යැ. පෝල්රාජ් මහත්මිය දිනන්නත්, කංචන පැරදෙන්නත් හේතුව මොකක්ද? පෝල්රාජ් මහත්මිය දිනනවා, කංචන පරදිනවා. ඒක හරි හෝ වැරදි හෝ මාතර දිස්ත්‍රික්කයේ ජනතාව ජාතික ජන බලවේගය විශ්වාස කරලා තමයි එතුමියට ඡන්දය දුන්නේ. ඒ නිසා සමාගම් 12ක් හදන්න හදපු එකට ඔයගොල්ලන් දැන් සමාගම් 6ක් හදපු එකක් කියලා වැඩක් නැහැ. ඔයගොල්ලන් කරන්න ඕනෑ මේක තිබුණු තත්ත්වයේම තියන්න කටයුතු කරන එක.

නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමනි, ඔබතුමා ගිහිල්ලා අර විදුලිබල මණ්ඩලය ඉස්සරහ උද්ඝෝෂණවලට සම්බන්ධ වුණේ නැහැ නේ.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
නැහැ.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
සජිත් ප්‍රේමදාස මහත්මයා ගියේත් නැහැ, අපි කවුරුවත් ගියේත් නැහැ. අපි මේවා ඇදගෙන නාගන්නේ නැහැ. ඔයගොල්ලන් තමයි ඇදගෙන නාගන්නේ. අපි කියන්නේ මේකයි. විදුලිබල මණ්ඩලයට ඔයගොල්ලන් ගෙනැල්ලා දාපු ප්‍රශ්නයක් තමයි මේ ටිකේ ඇදගෙන යන්නේ. එහෙම නම්, ජනාධිපතිතුමාට කථා කරන්න. දැන් මෙතැනදි මන්ත්‍රීවරයෙක් මේ ගැන කිව්වා. ඕවා අපට විග්‍රහ කරලා වැඩක් නැහැ. අපට විග්‍රහ කරලා මොකටද? අපි හෙට විදුලිබල මණ්ඩලයේ වැඩට යනවාද? නැහැ. ඔයගොල්ලන් ඕවා විග්‍රහ කරන්න ඕනෑ විදුලිබල මණ්ඩලයේ සේවකයන්ට. ඔයගොල්ලන් විදුලිබල මණ්ඩලයේ වෘත්තීය සමිති එක්ක කථා කරන්න. ඔය ඉන්නේ, ඔය කතික මහත්තුරුම ජනාධිපතිතුමා එක්ක මේ ගැන සාකච්ඡා කරන්න, සම්බන්ධීකරණය කරන්න, එතුමා රට ගිහින් ආවාම. මෙතැන වැරැද්ද, නිවැරැද්ද කථා කළාට වැඩක් නැහැ. දෙගොල්ලන් - unions සහ ඔයගොල්ලන් - එකතු වෙලා ජනාධිපතිතුමා එක්ක සාකච්ඡා කරලා මේ ප්‍රශ්නය විසඳාගන්නකෝ. මේ විපක්ෂයේ ඉන්න මිනිස්සුන්ට ඕවා කියලා මොකටද? අපට ඕවා කියලා වැඩක් නැහැ. ඔයගොල්ලන්ම කථා කරලා ඔය ප්‍රශ්නය විසඳාගන්න. ඒවායේ හිටපු වෘත්තීය සමිති නායකයෝ නේ මේ මහත්තුරු.

මම මේ පාර්ලිමේන්තුවට ආවේ 2020දි. මේ ආවේ දෙවැනි වතාවට. හැබැයි, 2015දී පාර්ලිමේන්තුවේ සිටියේ නැහැ. ඔයගොල්ලන් දන්නවාද, මැන්පවර් සේවකයන් විධියට විදුලිබල මණ්ඩලයේ 6,000ක් සිටියා. යහ පාලන ආණ්ඩුව කාලයේ - මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ කාලයේ, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ කාලයේ - රංජිත් සියඹලාපිටිය විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති ඇමති වශයෙන් සිටියදී ඒ 6,000ම ස්ථිර කළා. මේ, අපි කියන කථා නොවෙයි. මම වගකීමෙන් පාර්ලිමේන්තුවේදී කියනවා, ඒ වෘත්තීය සමිති නායකයා වූ රන්ජන් ජයලාල් හැම කෙනාගෙන්ම රුපියල් 5,000, 10,000 එකතු කළා. එකතු කරලා ඒවා රන්ජන් ජයලාල්ලා ගත්තා. දැන් ඒ අය කියනවා, අපේ සල්ලි අපට දෙන්න කියලා. රන්ජන් ජයලාල්ලා අන්තිමට මොකද කළේ? සටනින් ඉවත් වුණා. රුපියල් 5,000, 10,000, 15,000 සේවකයන්ගෙන් ගත්තා. ගත්තේ කවුද? අපේ ආණ්ඩුව දුන්න ඒ රස්සා ස්ථිර කළා. මේ අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා එතකොට පාර්ලිමේන්තුවේ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය ඇමති. මම හොඳටම දන්නවා. ඔය ප්‍රශ්න අපට වැඩක් නැහැ. ඔය ප්‍රශ්නය විසඳාගන්න පුළුවන්. ප්‍රශ්නය විසඳාගන්නේ නැතිව, නිකම් ලොකු ටෝක් දාලා, "ගෙදරට එන්නම්, ළමයි ලැහැස්ති කරන්න" කියනවා. මේවා අපි කියපුවා නොවෙයි. මේ දේවල් ඔහුගේ voice-cut එකේම තිබෙන්නේ. කාටවත් චණ්ඩිකම් පෙන්වන්න අපට වුවමනාවක් නැහැ. එතුමා කවුද? එතුමා පාර්ලිමේන්තුවේ ඉන්න කෙනෙක්ද? ඒ නිසා මම මේ වෙලාවේදී ඒකත් කියන්න ඕනෑ. ආණ්ඩුවේ කථා කරන මහත්වරුන්ට අපි මේ කාරණයත් කියන්න ඕනෑ. අපි මේවාට ගිහිල්ලාත් නැහැ; සම්බන්ධ වෙලාත් නැහැ. අපි පිකටිංවලට ගිහිල්ලාත් නැහැ; අවුස්සලාත් නැහැ. ඒවා අපි කළේ නැහැ. ඔයගොල්ලන් තමයි ඒ සමාගම් හැදුවේ. ඔයගොල්ලන් පනත ගෙනාවා; පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා; ඔයගොල්ලන්ම සම්මත කළා. අපට ඒ වෙලාවේ විරුද්ධ වෙන්න පුළුවන්ද? අපේ රටේ මිනිස්සු මේ පාර්ලිමේන්තුවට ආණ්ඩුවේ මන්ත්‍රීවරු හැටියට 159ක load එකක් එවලා තිබෙනවා. දැන් අපි මොනවා කරන්නද? අප බිත්තියටම හේත්තු කරලා තිබෙන්නේ. විපක්ෂයේ අපි කී දෙනා ද පත් කර එවලා තිබෙන්නේ? අපට පුළුවන්ද මේ දේවල්වලට මුහුණ දෙන්න? ආණ්ඩුවේ මන්ත්‍රීවරු 159දෙනෙකුට මුහුණ දෙන්න අපට පුළුවන්ද? ජනතාව අප බිත්තියටම හේත්තු කරලා නේ, මේ මන්ත්‍රීවරු 159ක් පාර්ලිමේන්තුවට එවලා අණපනත් සම්මත කර ගත්තේ. ඒ නිසා ඔයගොල්ලන්ම ඒවා විසඳන්න. ජනතාවගේ ප්‍රශ්න ඔයගොල්ලන් විසඳන්න.

දැන් බලන්න, කොටුව දුම්රිය පොළ ඉස්සරහ කවුද ඉන්නේ කියලා. සංවර්ධන නිලධාරින් 25,000කට රස්සා දුන්නේ ගෝඨාභය රාජපක්ෂ මහත්මයා. අපි කොච්චර කාලයක් සංවර්ධන නිලධාරින්ට රස්සා දුන්නාද? ඔයගොල්ලන්ට තිබෙන්නේ දැන් පොඩි දෙයක් කරන්න නේ. ඒ සංවර්ධන නිලධාරින්ගෙන් ටිකක් ගුරු සේවයට දාලා, අනෙක් අයත් මොකක් හෝ වැඩකට යොදවන්න. ඔබතුමන්ලා ඒගොල්ලන්ගේ ඉල්ලීම්වලට ඇහුම්කන් දෙන්නකෝ. ඔබතුමන්ලා විපක්ෂයේ හිටපු කාලයේ ඒ අයගේ ඉල්ලීම්වලට හොඳට ඇහුම්කන් දුන්නා නේ. ඔබතුමන්ලා දැන් ඒ ඉල්ලීම්වලට ඇහුම්කන් දෙන්නේ නැති හින්දා නේ, කොටුව දුම්රිය පොළ ඉස්සරහා උපාධිධාරි සංවර්ධන නිලධාරින් වාඩිවෙලා ඉන්නේ. ඔය මිනිස්සු ඔක්කෝම ඔබතුමන්ලාට ගොඩ පිටින් ඡන්දය දීපු මිනිස්සු නේ. ලංකා විදුලිබල මණ්ඩලයේත් ඉන්නේ ඔයගොල්ලන්ට ගොඩ යන්න ඡන්දය දීපු අය නේ. ඇයි ඒ මිනිස්සු මේ විධියට අමාරුවේ දාන්නේ? එහෙම කරන්න එපා. මේවා අපේ කරේ නම් තියන්න එන්න එපා මහත්වරුනේ කියන එකයි අපි මේ වෙලාවේ කියන්නේ.

අපේ රටේ පොලීසිය දිහා බලන්න. දැන් පොලීසිය කුඩු අල්ලනවා. ඔබතුමන්ලාත් සතුටින් ඉන්නවා. ඒ තැන්වලට පොලීසිය භාර ඇමතිතුමා යනවා; පොලිස්පති යනවා. ඒක

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

හොඳයි. හොඳ දේවල්වලට අපි හොඳයි කියනවා. ඒවා කෙරෙන්න ඕනෑ. ඒවා රටේ කෙරෙන්න ඕනෑ දේවල්. ඒක හොඳයි. 2009 අවුරුද්දේ පොලිසියේ සාජන්ලා වූ අය 492ක් තවමත් ඉන්නවා, උසස්වීමක් නැතුව. මේ, 2025 අවුරුද්ද. ඒ සාජන්ලා 492ක් උසස්වීමක් ලැබෙයි කියලා බලාගෙන ඉන්නවා. මේ 492 අතර CID එකේ කට්ටියත් ඉන්නවා. අපිත් අත්අඩංගුවට අරගෙන arrest කරපු අය මේ අතර ඉන්නවා. මේ 492 අතරේ අපිවත් පොදු දේපළ පනත යටතේ අත්අඩංගුවට අරගෙන arrest කරපු සාජන්ලා ඉන්නවා. හැබැයි, අපෙනුත් කටඋත්තර ගන්නවා සාජන්ලා. ඒගොල්ලන් බලාගෙන ඉන්නවා, දැන් අපට SI තනතුර -උප පොලිස් පරීක්ෂක තනතුර- දෙයි කියලා. ඒ අය අවුරුදු 16ක් තිස්සේ සාජන් තනතුරේ. අන්න ඒ වාගේ ප්‍රශ්න සොයා බලා ඒවා ටික ටික විසඳන්න. ඒ අයගේ ප්‍රශ්නවලට ඇහුම්කන් දෙන්න.

මම ඌව පළාත් සභාවේ මහ ඇමතිවරයා විධියට හිටපු කාලයේ අපේ සමන්ත විද්‍යාරත්න වත්මන් ඇමතිතුමා පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක්. එතුමා ඒ කාලයේ අපට ඇවිල්ලා කියනවා, මෙන්න මේ දේ විසඳන්න කියලා. පුළුවන් දේවල් අපි ඒ කාලයේ විසඳුවා. එතුමා මන්ත්‍රී. මම මහ ඇමති. අපි එතුමන්ලාට ඇහුම්කන් දුන්නා. එතුමා කියන දේට අපි ඇහුම්කන් දීලා, පහුව දා අපි ඒවාට දෙන්න පුළුවන් පිළිතුරු ලබා දුන්නා. ඒක නිසා ආණ්ඩුවත් අපිත් එක්ක එල්ලී එල්ලී, අපිව මරාගෙන කන්නේ නැතුව, අපිත් එක්ක රණ්ඩු වෙන්නේ නැතුව අවශ්‍ය විධියට වැඩ ටික කරන්න. ඔයගොල්ලන් මොකක්ද කරන්න ඕනෑ? "ඔන්න චාමරයා ඇවිල්ලා එකක් කියලා ගියා. එතුමා කියපු දේට අපි උත්තරයක් දෙන්න ඕනෑ. නාමල් ඇවිල්ලා තවත් එකක් කියලා ගියා. අපි ඒවාට උත්තරයක් දෙන්න ඕනෑ. සජිත් ඇවිල්ලා උදේ පාන්දර තවත් එකක් කිව්වා. ඒවාට අපි උත්තරයක් දෙන්න ඕනෑ" කියලා ආණ්ඩුව වැඩ කරන්න ඕනෑ.

දැන් ඔන්න කියනකොටම වැඩබලන ආරක්ෂක ඇමතිතුමා මේ සභාවට ආවා. එතුමාත් මම නියෝජනය කරන දිස්ත්‍රික්කයේම කෙනෙක්. එතුමා අද වැඩබලන ආරක්ෂක ඇමති. වැඩබලන ආරක්ෂක ඇමතිතුමා හෙට අනිද්දා බදුල්ලට එනකම් මම ඉන්නේ. මොකද, එතුමා ළඟට මම පුහුණුවකට - trainingවලට - යන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය දැන් අවසානයි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මට තව විනාඩි දෙකක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ එක්කම මෙන්න මේ දේත් බලන්න. මම රාජ්‍ය ඇමතිවරයා විධියට හිටපු කාලයේ පැද්දේ KU-5861 අංක දරන V8 එක. ඔයගොල්ලන් දන්නවාද, දැන් මේ V8 එක පදින්නේ කවුද කියලා? මේ මන්ත්‍රීතුමන්ලා නොවෙයි ඒක පදින්නේ. BCC එකේ සභාපති දැන් ඒ V8 එක පදිනවා. කොළඹ කර්මාන්ත අමාත්‍යාංශය යටතේ තිබෙන BCC එක, සබන් කොම්පැනියේ සභාපති මේ V8 එක පදිනවා. එතකොට මේ ආණ්ඩුවට හරියනවාද? එතකොට ආණ්ඩුව හැදෙනවාද?

මම තවත් කාරණයක් කියන්නම්. මා ළඟ තිබෙන මෙන්න මේ ලේඛනයේ මූල්‍ය වංචාවක් පිළිබඳව තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ ලේඛනය **සභාගත*** කරනවා.

***** **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ලේඛනයේ මාතෘකාව හැටියට, "මූල්‍ය අංශය තුළ සිදුව ඇති රුපියල් ලක්ෂ 280ක මුදල් වංචාව සම්බන්ධව" කියා සඳහන්ව තිබෙනවා. ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ විශාලතම මූල්‍ය වංචාව සම්බන්ධයෙන් තමයි මම මේ සභාව දැනුවත් කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා තමයි මම මේ ලේඛනය සභාගත කළේ. මේක මූල්‍ය වංචාවක්. මේවා ගැන හොයන්න; මේවා ගැන බලන්න. මේවා තමයි ආණ්ඩුවක් හැටියට කරන්න ඕනෑ දේවල්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට ලබා දුන් නියමිත කාලයෙන් තව ටිකක් ඉතුරු වෙලා ඇති. ඒ නිසා මට පොඩි කාලයක් දෙන්න.

මේ මූල්‍ය වංචාව පිළිබඳව හොයා බලන්න. මේකත් එක වංචාවක්. මේ ආණ්ඩුව තුළ, ආණ්ඩුව අපහසුතාවට පත් වෙන මේ වාගේ ගොඩක් දේවල් තිබෙනවා. අපහසුතාවට පත් වෙන තැන කොහේද, කොහේද හිල තිබෙන්නේ කියලා ඒ හිල හොයලා ඒකට බදාම දාලා හරි repair එකක් කරලා හරි ඒ හිල වහන්න. සමන්ත විද්‍යාරත්න මහත්මයා උමා ඔයේ හිලක් තිබෙනවා කියලා ඒ කාලයේ කිව්වා. ඊට පස්සේ ඒ මිනිස්සු ඒ හිල වැහුවා. සමන්ත විද්‍යාරත්න මහත්තයා උමා ඔයේ හිල් ටික පෙන්නුවා. ඉරානකාරයෝ බලලා හිල වැහුවා. සමන්ත විද්‍යාරත්න මහත්තයා හැමදාම උමා ඔයේ හිල හොයනවා, හිල පෙන්වනවා. එම නිසා ඉරානකාරයෝ "ටක්" ගාලා හිල වහලා දැම්මා. ඒ වාගේ, ආණ්ඩුවත් දැනගන්න ඕනෑ, කොහේද හිල තිබෙන්නේ, ඒ හිල වහගන්න. *[බාධා කිරීමක්]* ඒ හිල වහගත්තාම තමයි ඔයගොල්ලන්ට කිසි ප්‍රශ්නයක් නැතුව මේ ආණ්ඩුව ඉදිරියට ගෙන යන්න පුළුවන් වෙන්නේ. විදුලිබල මණ්ඩලයේ ප්‍රශ්නයටයි, උපාධිධාරීන්ගේ ප්‍රශ්නයටයි අපට දොස් කියලා වැඩක් නැහැ.

මම මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මට කථා කරන්න වෙලාව ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජී.ඩී. සූරියබණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.45]

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය ස්ථාපනය කිරීමට අදාළ විධිවිධාන සැලැස්වීම සඳහා අද දින මේ උත්තරීතර සභාවේ විවාදයට ගනු ලබන මේ පනත් කෙටුම්පත පිළිබඳව මගේ අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඇත්තටම මේ පනත සම්බන්ධයෙන් අද විවාදය ආරම්භ කරපු ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා ප්‍රකාශ කළ පරිදි ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය පිහිටුවා තිබෙන්නේ 1984 වර්ෂයේ නිවාස

සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ. ඊට පසුව නොයෙකුත් අමාත්‍යාංශ යටතේ ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය ක්‍රියාත්මක වෙලා තිබෙනවා. පසුව 2007 වර්ෂයේදී තමයි ආපදා කළමනාකරණ කියන විෂය පථයට අදාළව මෙම සංවිධානය ආපදා කළමනාකරණ හා මානව හිමිකම් පිළිබඳ අමාත්‍යාංශය යටතට පත් කළේ. ඊට පසුව 2022 වර්ෂයේදී ආපදා කළමනාකරණ විෂය ආරක්ෂක අමාත්‍යාංශය යටතට පත් කිරීමත් සමඟ ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ඇති විෂය පථයක් බවට පත් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1984දී ස්ථාපනය කළ ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය මේ දක්වා ඉටු කරපු කාර්යභාරය ඇත්තටම කිසිසේත්ම අවතක්සේරු කරන්න බැහැ. එම සංවිධානය මේ රටට විශාල කාර්යභාරයක්, හොඳ සේවාවක් කළා. විශේෂයෙන්ම නාය යෑම් සම්බන්ධයෙන් අවශ්‍ය දත්ත එක් රැස් කිරීම සඳහා 2006 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල විසින් ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයට ව්‍යාපෘතියක් පැවරුවා. ඒ තමයි, නුවරඑළිය සහ බදුල්ල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කළ Landslide Hazard Zonation Mapping කියන ව්‍යාපෘතිය. ඒ ව්‍යාපෘතියේ සාර්ථකභාවයත් එක්ක ඒ දිස්ත්‍රික්ක දෙකට එහා ගිහිල්ලා තවත් දිස්ත්‍රික්ක 10ක් ඒ ව්‍යාපෘතිය සඳහා එකතු කළා. ඒ වාගේම ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය road sector එකේත් නාය යෑම් - landslides - සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කළා. ඇත්තටම මේක විශාල කාර්යභාරයක් කරපු ආයතනයක්, සංවිධානයක්. අපි අද මේ පාර්ලිමේන්තුවේ පනතක් මඟින් "ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය" නමින් මේ ආයතනය පිහිටුවලා අවශ්‍ය නෛතික පදනම ඒ ආයතනයට ලබා දීමට තමයි කටයුතු කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ලෝකයම මුහුණ දෙන ප්‍රශ්නයක් තිබෙන බව අපි දන්නවා. ඒ අනුව ගෝලීය උෂ්ණත්වය වැඩි වීම හරහා දේශගුණික විපර්යාසවලට ලක් වෙලා ස්වාභාවික විපත් දැන් බහුලව සිද්ධ වෙන බවට අපට වාර්තා වෙනවා; අපි ඒවා දකිනවා; අපට ඇහෙනවා. අපි දන්නවා, පසුගිය කාල සීමාව තුළ - අවුරුදු කීපයක් පිටුපසට ගියත් - දේශගුණික විපර්යාසවල බලපෑම් මත අපේ රටත්, අපේ රටේ ජනතාවත් විශාල වශයෙන් ස්වාභාවික විපත්වලට මුහුණ දුන් බව. විශේෂයෙන්ම කඳුකර ප්‍රදේශයේ නාය යෑම්වලින්, ජල ගැලීම්වලින් පිරිසක් අවතැන් වුණා; ජීවිතක්ෂයට පත් වුණා. ඒ වාගේම, නාය යෑම් මඟින් ඒ ප්‍රදේශවල ජනතාව විශාල වශයෙන් පීඩාවට පත් වුණා, උන්හිටි තැන් අහිමි වුණා වාගේම ජීවිත විශාල ප්‍රමාණයක් අහිමි වුණා. අවතැන් වෙලා තවම අවතැන් කඳවුරුවල ජීවත් වෙන පිරිසකුත් ඉන්නවා. අපි අද නීතිමය බලතල දීලා ආරම්භ කරන්න බලාපොරොත්තු වෙන ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයට විශාල කාර්යභාරයක් තිබෙනවා. ඉදිරියේදී මේ නාය යෑමට ගොදුරු වන ප්‍රදේශ හඳුනාගෙන, රටේ සංවර්ධන කටයුතුවලදී එහෙම නැත්නම් ගොඩනැඟිලි ඉදිකිරීම් කටයුතුවලදී ඒ බිම අස්ථායීද නැද්ද, ඒ බිම සුදුසුද, නැද්ද කියන තාක්ෂණික උපදෙස් ලබා දීමේ වගකීම මේ ආයතනයට තිබෙනවා. අද අනුමත කරන පනත හරහා ඉදිරියේදී ලැබෙන නීතිමය ප්‍රතිපාදනත් එක්ක ඒ ආයතනයේ කාර්යභාරය ඉතා හොඳින් කරයි කියලා මා බලාපොරොත්තු වෙනවා.

අපි දන්නවා, සාමාන්‍යයෙන් පනතක් සම්මත කරපු පමණින් එහි බැඳීමක්, වගවීමක් තිබෙන බව. ඒක මේ ආයතනයටත් තිබෙනවා. ඒ නිසා ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ ව්‍යවස්ථාපිත රාජකාරිය තුළත් බැඳීමක්, වගවීමක් තිබෙනවා වාගේම, මේ රටේ ඉන්න ජනතාවටත් යම්කිසි වගවීමක් තිබෙනවා, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය කරන මේ කාර්යයට සහාය දක්වන්න. විශේෂයෙන්ම අපි මීට අවුරුදු 5කට එහා අතීතය ගැන කථා කළොත්, 2020 සැප්තැම්බර් මාසයේ 20වැනි දා රාත්‍රී කාලයේ තිබුණු අයහපත් කාලගුණ තත්ත්වය නිසා මහනුවර ප්‍රදේශයේ පස් මහල් ගොඩනැඟිල්ලක් නාය යෑමකට ලක් වුණා. ඒ ගොඩනැඟිල්ලේ ඒ වන විට හිටපු තිදෙනෙකුට ජීවිත අහිමි වුණා; එකම පවුලේ තුන්දෙනෙක් ජීවිතක්ෂයට පත් වුණා. පසුව අනාවරණය වූ කාරණය තමයි, ඒ ගොඩනැඟිල්ල ඉදි කරලා තිබෙන ප්‍රමිතිය සම්බන්ධයෙන් ගැටලුසහගත තත්ත්වයක් තිබුණාය කියන එක. ඒ වාගේම, ඒ ගොඩනැඟිල්ල ඉදි කරලා තිබුණු බිමත් අස්ථායී බිමක්, එහෙම නැත්නම් ඒකට සුදුසු නැති, නාය යෑමේ අදානමක් තිබෙන බිමක්.

මේ අවස්ථාවේදී අපි මේ පනත සම්මත කරනකොට මේ කරුණු සැලකිල්ලට ගන්න ඕනෑ. මම ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාටත් මේ සම්බන්ධ කරුණු අවධාරණය කළා. විශේෂයෙන්ම මෙහි 12. (1) සහ (2) අනුවගන්තිවල සඳහන් වෙනවා, අනතුරු සහිත බිමක් පරීක්ෂා කිරීමට යෑමේදී ඒ ඉඩම් හිමියාගේ නැත්නම් ඒ ගොඩනැඟිලි හිමිකරුගේ අවසරය ලබාගත යුතුයි, ඒක තමයි නීත්‍යනුකූලභාවය කියන එක. නමුත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාත් ප්‍රකාශ කළා, එය ඉදිරියේදී සංශෝධනයට ලක්වීමට නියමිතයි කියලා. මේක ඇත්තටම ජාතික වශයෙන් වැදගත් කාර්යභාරයක්. අනතුරක් සිද්ධ වෙලා ඒ අනතුරෙන් පස්සේ පසුතැවිලි වෙනවාට වඩා, අපි ඒකෙන් වන්දි අරන් ජීවත් වෙනවාට වඩා මම හිතන හැටියට ඒ අනතුර වළක්වා ගැනීම ඉතාම වැදගත් වෙනවා. අපි දන්නවා, මේ ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය ඔවුන්ගේ කටයුත්ත නිසියාකාරව කරනවා කියලා. ඒ කියන්නේ identification, awareness, mitigation, law enforcement කියන ඒ කාර්යන් හතර ඔවුන් නිසි පරිදි ඉටු කටයුතු කරයි කියන එක. ඒ ඒ නාය යන ප්‍රදේශ හඳුනා ගැනීම, ජනතාව දැනුවත් කිරීම, අවදානම් අඩු කිරීම සඳහා අවශ්‍ය පිළියම් යෙදීම සහ එවැනි කටයුතුවලට එරෙහි වන කවුරුහරි ඉන්නවා නම් එය වැළැක්වීම සඳහා නීතිමය වශයෙන් කටයුතු කිරීම.

මේ පනත අනුමත කිරීම තුළින් අපි ඒ නෛතික රාමුව සකසලා දෙනවා වාගේම, ඒ ආයතනය සඳහා පත් වෙන නිලධාරීන් සියලුදෙනාටත් වගකීමක් පැවරෙනවා, ඔවුන්ගේ කාර්යභාරය නිසි අයුරින් හඳුනාගෙන ඒ අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා අපේ රටේ විපත්වලට, නාය යෑමට ලක් වෙන ප්‍රදේශ හඳුනාගෙන ජනතාවට ඒ පිළිබඳ පෙර දැනුම්දීම් කරලා ඒ විපත්වලින් ජනතාව බේරා ගන්න අවශ්‍ය කටයුතු කිරීමට. එම ආයතනවලට අවශ්‍ය සහයෝගය දැක්වීමට ජනතාවටත් වගකීමක් තිබෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.55]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම ගැන අපි සතුටු වනවා. මොකද, මේ ආයතනය 1984දී පටන් අරගෙන, 1997 වනකොට ආපදා කළමනාකරණ අමාත්‍යාංශයත් එක්ක ගොඩනැඟුණා. 2019දී ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා අමාත්‍යවරයා විධියට කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරලා, 2025දී

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

පනත් කෙටුම්පත හැටියට පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙනවා. එතකොට හිතා ගන්න පුළුවන් පරිසර වෙනස්කම්, භූගෝලීය වෙනස්කම් හා සිදු වන ආපදා පිළිබඳව ලෝකයේම කතිකාවක් නැඟෙනකොට අපේ රටේ පනතක් තුළින් ඒ ආයතනය පිහිටුවන්න කොච්චර කාලයක් ගත වනවාද කියලා. කල් ගිහිල්ලා හරි මෙම ආයතනය පිහිටුවලා ඒ අදාළ කාරණා ඉෂ්ට කරන්න කටයුතු කිරීම ගැන අපි සතුටු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ හැම කාරණයක් සඳහාම දිගු කාලීන සැලැස්මක් තිබෙන්න ඕනෑ. අද ලෝකයේ හැම රටකම පරිසරයේ තිබෙන වෙනස්කම් පිළිබඳව, කාලගුණ, දේශගුණ විපර්යාස පිළිබඳව අවධානය යොමු වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි, ආර්ථික ප්‍රතිපත්ති ගොඩනඟනකොටත් මේ හැම කාරණයක් පිළිබඳව අවධානයට අරගෙන තිබෙනවා. ඒ වාගේම තමයි භූගෝලීය දේශපාලනයත්. අද ලංකාව එක පැත්තකින් භූගෝලීය පිහිටීමත් එක්ක නාවික, ගුවන් කේන්ද්‍රස්ථානයක් බවට පත් වනවා. දකුණු ආසියාවේ ආරක්ෂාව සම්බන්ධයෙන් වාගේම, පරිසරය සම්බන්ධයෙන් වන වෙනස්කම්, මුහුදේ වන කැලඹීම් හේතුකොටගෙන කලාපයේ වන භූගෝලීය පාරිසරික වෙනස්කම් පිළිබඳවත් අද ලෝකයේ විශේෂ අවධානයක් යොමු වෙලා තිබෙනවා. ඉතින්, මෙම ආයතනය පිහිටුවීම සම්බන්ධ කාරණයට වඩා, පිහිටෙව්වාට පසුව අපි කටයුතු කරන ආකාරය පිළිබඳවත්, කලාපීය සහ ගෝලීය රටවල් එක්ක කටයුතු කරන ආකාරය පිළිබඳවත් ඔබතුමන්ලා දැන්ම අවධානය යොමු කළොත් හොඳයි කියලා මා විශ්වාස කරනවා.

දැන් අමාත්‍යවරු කිහිපදෙනෙක් පසුගිය කාල සීමාවේ සිදුවීම් ගැන කථා කළා. දැන් ඔබතුමන්ලාගේ ආණ්ඩුවට අවුරුද්දයි. අවුරුද්දක් ගතවෙලාත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉස්සර ආණ්ඩු කරපු අය ගැන කිය කියා ඉන්න එක සාර්ථක නැහැ. මොකද, දැන් අවුරුද්දක් පුටුවේ වාඩි වෙලා හිටියා නේ. ඔබතුමන්ලා පොරොන්දු ගණනාවක් දීලා බලයට ආවේ. හැබැයි, ඔබතුමන්ලා අවධානය යොමු කරලා බැලුවාද මේ අවුරුද්දක කාල සීමාව ඇතුළත ආණ්ඩුව විධියට ඒ පොරොන්දු වුණු කාරණාවලින් කීයක් ඉෂ්ට කරලා තිබෙනවාද කියලා? එහෙම නේද, ගරු අර්චුනා මන්ත්‍රීතුමනි? ඒ වාගේම ජනතාවට ප්‍රතිලාභ කොච්චර ලැබිලා තිබෙනවාද කියලා අවධානය යොමු කළාද? ජනතාවට! ජනතාවගේ ආර්ථිකය නඟා සිටෙව්වාද? ඔබතුමන්ලා බලයට ආවේ පොහොසත් රටක් හදන්න. රටේ ජනතාව පොහොසත් වීම කෙසේ වෙතත්, 159දෙනා පොහොසත් වෙච්ච කථාව ගැන නම් පසුගිය දවස්වල රටේ, සමාජයේ කැලඹිල්ලක් ඇති වුණා. මේ 159දෙනා පොහොසත් වෙච්ච ආකාරය ගැන. මොකද, අපි හැත්තෑ අවුරුදු ශාපයක් ඇතුළත කෝටිපතියෝ වුණේ කොහොමද කියන ප්‍රශ්නය තිබෙනවා. එහෙම නැත්නම් ඒ හැත්තෑ අවුරුදු ශාපයේදී කෝටිපතියෝ වෙන්න බැරි වුණා නම්, මේ පසුගිය අවුරුද්ද ඇතුළත කෝටිපතියෝ වුණේ කොහොමද කියන ප්‍රශ්නය තිබෙනවා. මම දැක්කා ඒ ප්‍රශ්නයටත් ඔබතුමන්ලාගේ එක් එක් අය, එක් එක් ආකාරයෙන් පිළිතුරු ලබා දීලා තිබෙනවා. ඒ පිළිතුරු කොච්චර ප්‍රායෝගිකද, නැද්ද කියන කාරණය අපට අදාළ නැහැ. මොකද, ඔබතුමන්ලා සමාජය, රට සහ ලෝකය දකින විධිය තමයි ඒකෙන් ඉස්මතු වෙන්නේ.

රටේ අතිගරු ජනාධිපති - ඔබතුමන්ලාගේ ජනාධිපතිවරයා - යටතේ තිබෙන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්තවලට අනුව මේ අවුරුද්දේ දෙවැනි කාර්තුවේ කෘෂි කර්මාන්තය සියයට 3.6කින් පහත වැටිලා. එළවලු වගාව සියයට 3.6කින් පහත වැටිලා. දැන් ඇහුවාම ඔබතුමන්ලා කියනවා, පොහොරත් දෙනවා කියලා. ගොවියා ආරක්ෂා කරනවා කියලාත් කියනවා. හැබැයි, ඔබේම ආයතනවලින් දෙන සංඛ්‍යාලේඛනවලට අනුව එළවලු නිෂ්පාදනය සියයට 3.6කින් අඩු වෙලා. එක පැත්තකින් එළවලු නිෂ්පාදනය සියයට 3.6කින් අඩු වනවා. අනෙක් පැත්තෙන් මොකක්ද කරන්නේ? අල උගුලන කාලයට ලංකාවට අල ගෙනෙනවා. ලූනු උගුලන කාලයට ලූනු ගෙනෙනවා. අවසානයේ ලූනු ගොවියා අසරණ වනවා. ලූනු ගොවියාගේ ආදායම, අල ගොවියාගේ ආදායම පහත වැටෙනවා. එළවලු ගොවියාගේ ආදායම පහත වැටෙනවා. මොකද, ඔබතුමන්ලාගේ කෘෂිකර්ම අමාත්‍යවරයා විශ්වාස කරන්නේ, මේ රටේ වවනවාට වඩා පිට රටක වවපුවා ගෙනැල්ලා මිනිසුන්ට කන්න දෙන එක ලාභයි කියලා. ඒක ලාභ නම්, සාධාරණ මිලකට මිනිසුන්ට ඒවා ලැබෙනවා නම් කමකුත් නැහැ. හැබැයි, ජනතාවගේ ආර්ථිකයට ඒක බලපා තිබෙනවා.

තවත් පැත්තකින් ධීවර කර්මාන්තය පහත වැටිලා. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තාවට අනුව සියයට 34කින් ධීවර කර්මාන්තය පහත වැටිලා.

සියයට 34කින්! රට වටේම තිබෙන මුහුද ගැන කියලායි බලයට ආවේ. රට වටේම මුහුද තිබෙනවා කිව්වා. හැබැයි, මම චෝදනා කරන්නේ නැහැ. මොකද, ලුනු ටික මුදවා ගන්නත් බැහැ නේ, ඔබතුමන්ලාට. රට වටේම මුහුද තිබෙනවා කියලා බලයට ආපු තමුන්නාන්සේලාගේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව, ධීවර කර්මාන්තය මේ අවුරුද්දේ දෙවැනි කාර්තුවේ සියයට 34කින් වැටිලා. ධීවර අමාත්‍යවරයා යාපනයේ නේද? යාපනයේ ඉන්නේ, අමාත්‍යවරයා. තෙල් මිල ඇතුළු කාරණා බොහොමයක් මේ ගැටලුවට බලපානවා. ආණ්ඩුව මේ ගැන අවධානය යොමු කළේ නැත්නම් ධීවර ක්ෂේත්‍රය තවදුරටත් වැටෙනවා. මාළු පිටතින් ගෙනැල්ලා කන්න දෙන්න වෙනවා. මුහුද දිහා බලාගෙන මාළු පිටතින් ගෙනැත් කන්න වෙනවා. ඒ තැනට මේ රටේ ආර්ථිකය තමුන්නාන්සේලා පත් කරලා තිබෙනවා. මේවායි, අවුරුද්දක් ඇතුළත ඔබතුමන්ලා ලබපු ජයග්‍රහණ.

ඒ වාගේමයි රබර් කර්මාන්තය. එය සියයට 10.7කින් වැටිලා තිබෙනවා. මෙය, තමුන්නාන්සේලාගේම ගරු ජනාධිපතිතුමාගේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ලබා දෙන වාර්තාවලට අනුව මේ රටේ මේ අවුරුද්දේ දෙවැනි කාර්තුවේ ප්‍රතිඵල; ඔබේ ආණ්ඩුවේ ප්‍රතිඵල.

විදුලිබල පනත ගැන, විදුලිබල අමාත්‍යාංශය ගැන කියනවා මම දැක්කා. දැන් ඒකට අපට චෝදනා කරලා වැඩක් වෙන්නේ නැහැ. ඔය පනත ඉරලා විසි කරලා, ජීවිතය පූජා කරලා, මරාගෙන මැරෙනවා කිව්වේ ඔබතුමන්ලා. ඒ මිනිසුන්ට තිබෙන වේදනාව ඒක. විදුලිබල මණ්ඩලයේ සේවකයන්ට තිබෙන ලොකුම වේදනාව, රැවටිච්ච එක. "20,000ක් පෙන්නලා අපි ආණ්ඩුව ගත්තා, 100,000ක් මරලා හරි ආණ්ඩුව තියාගන්නවා" කියනවා, ඔබතුමන්ලාගේ වෘත්තීය සමිති නායකයා. 1988-89 දාපු සෙල්ලම් දැන් දමන්න බැහැ. වෙනස් වෙන්න, වෙනස් වෙන්න. ඔබතුමන්ලා අපට වෙනස් වෙන්න කියනවා නේ. ඔබතුමන්ලා වෙනස් වෙන්න. බය කරලා, තර්ජනය කරලා, මරනවා කියලා, උසාවිය පෙන්වලා, බන්ධනාගාරය පෙන්වලා, පොලීසිය පෙන්වලා වැඩ කරගත්තු කාලය ඉවරයි. ඒ යුගය ඉවරයි. එහෙම බය කරලා දේශපාලනය කරන්න බැහැ. එහෙම බය කරලා දේශපාලනය කළා කියලා තමුන්නාන්සේලාට ආණ්ඩුව ගෙනියන්නත් බැහැ. ඒ මිනිසුන්ට තිබෙන වේදනාව තමයි ඒ අය රවට්ටපු එක. රවට්ටපු එක පමණක් නොවෙයි. ඒ රවට්ටපු කාරණය ඔබතුමන්ලා මහා උජාරුවෙන් කියන එකත් වේදනාවක්. ඒක හරි කැතයි; හරි නරකයි.

උපාධිධාරීන් රැකියා සොයාගෙන ආවා. ඔබතුමන්ලා කිව්වා "ගෙයින් ගෙට යන්න, ආණ්ඩුව ගැන කියන්න" කියලා. උපාධිධාරීන් ගෙයින් ගෙට ගියා. ගිහිල්ලා තමුන්නාන්සේලාට

ඡන්දය අරගෙන දුන්නා. ඒ අයට මොකක්ද කළේ? එන්න කිව්වා, පක්ෂ කාර්යාලයට. ඒ අය රැකියාවක් ඉල්ලාගෙන උද්ඝෝෂණය කරන්න ආවා. එතකොට ගහලා එළෙව්වේ. ගහලා එළෙව්වා, උපාධිධාරීන් රැකියා ඉල්ලාගෙන ආවාම. උපාධිධාරීන් 20,000කට රැකියා දෙනවා කියලායි බලයට ආවේ. සංවර්ධන නිලධාරීන් පිරිසක් අවුරුදු හයක් ගුරුවරුන් විධියට වැඩ කළා. කොවිඩ් වසංගතය වෙලාවේ ගුරුවරුන් නැති වෙනකොට, ගුරු හිඟයක් තිබෙනවා කියලා දැනගත්තාම, එදා ආණ්ඩුව ප්‍රතිපත්තිමය වශයෙන් තීන්දුවක් ගත්තා, ඒ අය යවන්න ඕනෑ කියලා. ඒ අය ගිහින් රැකියාව කළා. ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ජනතා විමුක්ති පෙරමුණේ ගුරු සංවිධානය දරුවන් බිල්ලට තියලා පාරට බැහැලා උද්ඝෝෂණය කරනකොටත් ඒ සංවර්ධන නිලධාරීන් 16,000 වැඩට ගියා. ඒක අමතක කරන්න එපා. ඒ 16,000 ඉස්කෝලවල ඉගැන්නුවා. එදා ඔබතුමන්ලා දරුවෝ බිල්ලට තියලා අයිතීන් දිනාගන්න කටයුතු කළා. දැන් මේ වෘත්තීය සමිතිවලට advice දෙන්න එනවා, කරන්න ඕනෑ විධිය ගැන. ලෙඩ්ඩු බිල්ලට තියලා දේශපාලනය කරපු, ඉස්කෝලේ දරුවෝ බිල්ලට තියලා දේශපාලනය කරපු අය තමුන්නාන්සේලා. ගමේ මිනිස්සු බිල්ලට තියලා දේශපාලනය කරපු, කර්මාන්තශාලා වැහුණත් කමක් නැහැ, අපේ දේශපාලන අරමුණු ඉටු වෙන්න ඕනෑ කියන තැන හිටපු තමුන්නාන්සේලා, කරන්න ඕනෑ විධිය ගැන දැන් තිබෙන වෘත්තීය සමිතිවලට උපදෙස් දෙනවා. ඔය මානසිකත්වය ඔබතුමන්ලාට කලින් තිබුණා නම්, අද මේ රට දියුණුයි. ඔය මානසිකත්වය ඔබතුමන්ලාට කලින් තිබුණා නම් අද මේ රට දියුණු රටක් බවට පත් වෙලා. එහෙම නම් ආයෝජකයන් බොහෝදෙනෙක් ලංකාවට ඇවිල්ලා, මේ ආයතනවල ප්‍රශ්න බොහොමයක් විසඳිලා. ඔබතුමන්ලා එදා විපක්ෂයේ ඉන්න කොට වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක් ගත්තා. මේ කියන පිරිස ඒකට සහයෝගය දුන්නේ නැහැ. ඒකේ return එක කොහොමද දෙන්නේ? සමථයකට පත් වෙන්න පුළුවන් ක්‍රමයක් හදලා තිබියදීත් ඔබතුමන්ලා ඒ අය ගුරු සේවයෙන් එළියට දාලා ඔබතුමන්ලාගේ අවශ්‍යතාව ඉෂ්ට කර ගන්න උත්සාහ කරනවා. ඒක බොහොම වැරදියි. ඒ අයගේ දක්ෂතාව ඇගැයීමට ලක් කරලා රැකියාව දෙන්න. ඒ අය ඔබතුමන්ලා එක්ක වෘත්තීය සමිති ව්‍යාපාරයේ ඉන්න නැතිව ඇති. ඒ අයට වෙලාවක් තිබුණේ නැහැ නේ. මොකද, ඒ අය ගුරුවරුන් හැටියට එදා ඉගැන්නුවා. හැබැයි, අද ඔබතුමන්ලා මොකද කරන්නේ? අද ඔබතුමන්ලා ආණ්ඩුවක් විධියට බලයට ඇවිල්ලා ඒ අයගෙනුත් පළිගන්නවා. ඒ නිසා අපි ආණ්ඩුවට කියන්නේ මේකයි. ඔබතුමන්ලා බලයට ඇවිල්ලා අවුරුද්දක් වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විනාඩියයි මම ගන්නේ.

ඔබතුමන්ලා බලයට ඇවිල්ලා අවුරුද්දක් වෙනවා. දෛනික ආදායම් උත්පාදනය කරන මිනිස්සු ජීවත් වෙන්නේ කොහොමද කියලා බලන්න. ඒ මිනිස්සු ගැන බලන්න. එදා ඔබතුමන්ලා ඒ වෙනුවෙන් කථා කළා. අද ඔබතුමන්ලා ඒ දිහා ඇහැක් ඇරලා බලන්නේ නැහැ. කර්මාන්තශාලා වැහිලා රැකියා නැති වෙනවා. ඔබතුමන්ලා ඒවා ගැන හොයන්නේ නැහැ. ආයෝජකයන් එනවා කියනවා. ඊයේ පෙරේදා මාධ්‍යයට ගිහිල්ලාත් එහෙම කියනවා මම දැක්කා. මාධ්‍යවේදියා ප්‍රශ්න ඇහුවාම, "උත්තර දෙන්න බැහැ" කියනවා; "ඒවා අහන්න තහනම්" කියනවා. ඒවා වැරදියි නේ.

මෙවැනි පනත් කෙටුම්පත් ගේන්න. මේවා හොඳ දේවල්. හැබැයි ඉතින් ආයතනය 1984දී පටන් අරගෙන, 2007දී අමාත්‍යාංශයක් යටතට ගිහිල්ලා 2019 වර්ෂයේ රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා කැබිනට් පත්‍රිකාව දාලා, 2025දීයි මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට එන්නේ. අන්න ඒවා වෙනස් කිරීම තමයි system change වෙනවා කියන්නේ. System change වෙනවා කියන්නේ, ගමේ කෙහෙල් කැන කැබ් එකේ දමාගෙන ඇවිල්ලා පක්ෂයට දීලා දැන් Montero එකේ නැඟලා යන එක නොවෙයි. මේ ආණ්ඩුවට අපි කියන්නේ, මේ සංවර්ධන නිලධාරීන්, විදුලිබල මණ්ඩලයේ සේවකයන් ඇතුළු මේ රටේ වැඩ කරන ජනතාවගේ ප්‍රශ්න විසඳන්න කරුණාකර මැදිහත් වෙන්න කියලායි.

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.05]

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය ස්ථාපිත කිරීම පිළිබඳ පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදය පැවැත්වෙන මේ වෙලාවේ මගේ කථාව පටන් ගන්න හොඳ තැනක් මතු වුණා. මේ ආයතනය කලින් පටන් අරගෙන, 2007දී අමාත්‍යාංශයක් යටතේ තිබිලා, 2019දී කැබිනට් පත්‍රිකාව දමලා 2025දී තමයි ඊට අදාළ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට එන්නේ, ඒ system එක තමයි වෙනස් කරන ඕනෑ කියලා මට කලින් කථා කළ මන්ත්‍රීතුමා කිව්වා. ඒක තමයි මේ වෙනස් කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 2025 වනකල් ආණ්ඩු කළේ අපි නොවෙයි නේ. අපි ආණ්ඩු කරන පළමුවෙනි අවුරුද්දේම ජාතික වශයෙන් වැදගත්කමකින් යුතු, මේ දක්වා නැවතිලා තිබුණු බොහෝ පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවට ගෙනෙන්න, ඒවා සම්මත කරන්න කටයුතු කර තිබෙනවා. ඒ සම්මත කරපු පනත් අතර තිබෙනවා, අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත, ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත ආදි පනත් බොහොමයක්. ඒ වාගේමයි, අද කථා කරන මේ පනත් කෙටුම්පත. පසුගිය අවුරුද්ද තිස්සේ එවැනි පනත් කෙටුම්පත් ගෙනැල්ලා සම්මත කරලා මේ රට යම් ක්‍රමයක්, system එකක් අනුව හදන්න තමයි අපි වැඩ කටයුතු කරන්නේ. ඒක තමයි අපි දැන් කරගෙන යන්නේ. අවුරුදු ගණනක් ආණ්ඩු කරපු අය ඒ අවශ්‍යතාව දැන් අපට මතු කරලා වැඩක් නැහැ. මොකද, අපි දැන් ඒ කටයුත්ත කරමින් ඉන්නේ. ඒ කටයුත්ත කරමින් සිටියදී ඒවා කරන්න ඕනෑ කියලා වැඩක් නැහැ. අපි කොහොමටත් ඒවා කරනවා. මේ කියන ආයතනයට අදාළ මේ වැදගත් පියවර ගන්නවා වාගේම, මේ හැම එකකම නිසි ක්‍රමයක්, system එකක් හැදීම තමයි ජනතාව අපෙන් බලාපොරොත්තු වුණේ. ඒක තමයි අප මේ කරමින් ඉන්නේ.

ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය ස්ථාපිත කිරීම ගැන සහ මේ පනත් කෙටුම්පත ගැන අදහස් දැක්වීම් ගොඩක් මතු වුණා. නමුත්, අවසාන ටිකේ විදුලිබල මණ්ඩලය ගැන කථාවක් ආවා නේ. එක මන්ත්‍රීතුමෙක් කිව්වා, අපට ඡන්දය දුන්නේ කංචන

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

-රනිල් ගෙනාපු එක වෙනස් නොකර තිබුණු විධියටම තිබෙන්න දෙන්නයි කියලා. මට කලින් කථා කරපු මන්ත්‍රීතුමා කිව්වා, ඒක ඉරලා විසි කරලා තමයි අපි බලයට ආවේ කියලා. මේ ගැන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත කරපු දවසේත් කථා කළා; ඊට පස්සේත් කථා කළා; අදත් කථා කරනවා. මට තේරෙන්නේ නැහැ, මේක තේරුම් ගන්න මෙච්චර අමාරුද කියලා. පැවැති පනත වෙනස් කරලා තමයි අලුත් පනත ගෙනාවේ. විදුලිබල මණ්ඩලය සම්බන්ධයෙන් තිබුණේ, විදුලිබල මණ්ඩලය විකුණා දමන්න පුළුවන්, සමාගම් 12කට කඩන පනතක්. ඒක වෙනස් කරන්න නම් අපි කළා වාගේ අලුතින් පනතක් ගේන්න ඕනෑ. ඒ පනත අහෝසි කරලා තමයි අලුත් පනතක් ගෙනැල්ලා තිබෙන්නේ. කාර්යක්ෂමතාව වෙනුවෙන් රාජ්‍ය සමාගම්වලට කැඩුවාට මේ පනතේ පැහැදිලිව තිබෙනවා, අයිතිය සියයට සියයක් රජය සතු විය යුතුයි කියලා. ඒක දැන දැනමයි මේ බොරුව වපුරන්නේ. ඒක එක කාරණයක්.

අනෙක් පැත්තෙන්, ඒ සේවකයන් රැකියාවලින් දොට්ට දමනවා කියලා කථාවක් හදලා තිබෙනවා. පාර්ලිමේන්තුවේ මේ ගැන කථා කරන්නේ ඇයි කියන සාකච්ඡාවක් මෙතැනදී මතු වුණා නේ. ඒ ගැන පාර්ලිමේන්තුවේ කථා කරන්නේ ඇයි, එතුමන්ලාට නොවෙයි නේ මේක කියන්න ඕනෑ කියලා කිව්වා නේ. පාර්ලිමේන්තුව තිබෙන්නේ, එතුමන්ලාට දේවල් කියන්න විතරක් නොවෙයි. මේ පාර්ලිමේන්තුව දිහා මිනිස්සු බලාගෙන ඉන්නවා; මේ පාර්ලිමේන්තුවේ මොනවාද කථා වෙන්නේ කියලා මිනිස්සු බලාගෙන ඉන්නවා. පාර්ලිමේන්තුව කියන්නේ, තීන්දු තීරණ ගන්නා, පනත් සම්මත කර ගන්නා තැන. එහෙම නැතුව අපට හිතෙන කථා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට කියන තැනක් නොවෙයි, මේක. මේ කථා කියන්නේ ඔබතුමන්ලාට නොවෙයි. එහෙම හිතුවොත්, අපි ගොඩක් දේවල් මෙහිදී කියන්න ඕනෑ නේ. මොකද, අපි ඒවා මෙතැන කියලා වෙනස් කරන්නද? අපි මේ දේවල් කියන්නේ මේ රටේ ජනතාවට පේන්න; අපි මොකක්ද මේ කරමින් ඉන්නේ කියලා ඒත්තු ගන්වන්න; ඒ ගැන පැහැදිලිකිරීම් කරන්න. මේ වැරදි මත, දුර්මත වෙනස් කරන්න අවශ්‍ය නිසා තමයි සමහර දේවල් අපි නැවත නැවතත් කියන්නේ.

විදුලිබල මණ්ඩලය සම්බන්ධයෙන් කිව්වොත්, ඒක විකුණන්නේ නැහැ. සියයට සියයක් රාජ්‍ය අයිතිය තිබෙන සමාගම් බවටයි පත් කරන්නේ. ඒක වෙනස් කරන්න අලුතින් පනත් කෙටුම්පතක් ගේන්න ඕනෑ. එහෙම නම්, ඒ ගැන බිය විය යුතු කිසිම කාරණයක් නැහැ. ඒක අපේ ප්‍රතිපත්තිය. අපි එය කලින් කිව්වා. ඒක තමයි දැන් කරන්නේ.

දෙවැනි එක සේවකයන් පිළිබඳ කාරණය. 23,000ක් වන සේවකයන් රැකියාවලින් ඉවත් කරන්න හදන බව කිව්වා. අපට එහෙම සැලසුමක් නැහැ. ඒක පැහැදිලිව කියා තිබෙනවා. කාට හරි අවශ්‍ය නම් රැකියාවලින් voluntarily යන්න පුළුවන්. එහිදී ලබා දෙන වන්දිය වැඩි කර තිබෙනවා. සමාගම් තෝරා ගැනීමේදී ඒක ඕනෑම තැනක කරන ක්‍රමයක්. ඒ හැරෙන්න මේ කාරණය දිගින් දිගටම ඇදගෙන යමින්, එහෙම නැත්නම් දෙවැනි දා ඇමතිතුමා එක්ක සාකච්ඡාවක් කරලා ඉදිරිපත් කරන ඉල්ලීම්වලට විසඳුම් හම්බ වුණාම තුන්වැනි දා ඒවා වෙනස් කරමින්, ඒ ක්‍රමයට වැඩ කරන එක සාධාරණ නැහැ. රටේ විදුලිබල මණ්ඩලය හෝ මේ ආයතන තිබෙන්නේ මොකටද? විදුලිබල මණ්ඩලය තිබෙන්නේ මොකටද? විදුලිබල මණ්ඩලය තිබෙන්නේ, මේ රටේ ජනතාවට සහ මේ රටේ කර්මාන්තවලට අවශ්‍ය විදුලිය ලබා දෙන්න. ඉස්පිරිතාල තිබෙන්නේ, මේ රටේ රෝගීන්ට අවශ්‍ය ප්‍රතිකාර ලබා දෙන්න. ඒවායේ යම් සේවක පිරිසක් සේවය කරනවා. ඒ සේවකයන්ට විවිධ වරප්‍රසාද හම්බ වෙනවා. අපිත් ඒවායේ රැකියා කළා. ඒක තවත් කථාවක්. හැබැයි අපි හැම තිස්සේම ඒවායේ ප්‍රමුඛතාව පිළිබඳව සිහි තබා ගනිමින් වැඩ කළ යුතුයි. එතකොට ඉල්ලීම්, අරගළ අසාධාරණ විධියට කරන්න හොඳ නැහැ, බොරු කියමින් ඒවා කරන්න හොඳ නැහැ. ආයතන විකුණනවා කියලා අදටත් කියමින් ඉන්නවා. සේවකයන් රැකියාවලින් එළියට වැටෙනවා කියලා අදටත් කියමින් ඉන්නවා. එහෙම නොවෙයි. අපට ඉලක්කයක් තිබෙනවා. රාජ්‍ය සමාගම් හදලා කාර්යක්ෂමතාව වැඩි කරන එක, 2028 වෙද්දී අවශ්‍ය විදුලි සැපයුම ලබා දෙන එක, අපි කිව්ව විධියට 2028 වෙනකොට සියයට 30කින් විදුලි බිල අඩු කරන එක කරන්න ඕනෑ. ඒකට කරන්න ඕනෑ ප්‍රතිසංස්කරණ තිබෙනවා. ඒකට කරන්න ඕනෑ ගොඩ නැංවීම් තිබෙනවා. ඒක දැන් තිබෙන ක්‍රම තුළින් කරන්න බැරි නිසා තමයි මේ විධියට කරගෙන යන්නේ. නැවත නැවතත් මේ ගැන කථා කරන්න වෙන්නේ ඔබතුමන්ලාට ඇහෙන්න කියන්න ඕනෑ නිසා නොවෙයි, මේක තවදුරටත් පැහැදිලි කරන්න අවශ්‍ය නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දවස්වල මත්ද්‍රව්‍ය ගැනත් ටිකක් ලොකු සාකච්ඡාවක් මතුවෙලා තිබෙනවා. කලින් කථා කරපු මන්ත්‍රීතුමා සභාවේ හිටියා නම් හොඳයි. මත්ද්‍රව්‍ය ගැන ලොකු සාකච්ඡාවක් මතුවෙලා තිබෙනවා. ඇයි එහෙම සාකච්ඡාවක් එන්නේ? ඒක පැහැදිලි කරන්නත් ඕනෑ. ඇයි එහෙම සාකච්ඡා වෙන්නේ? එහෙම සාකච්ඡා වෙන්නේ මත්ද්‍රව්‍ය ජාවාරම්කාරයෙක් පොලිසියෙන් වටලනකොට රටේ ජනාධිපති මේ වෙලාවේ ඒක මැද්දට පැනලා ඔහු බදාගත්ත නිසාද? එහෙම නැත්නම් මේ ගැන සාකච්ඡා වෙන්නේ, ආණ්ඩුවේ ප්‍රබල ඇමතිවරයෙක් මත්ද්‍රව්‍ය ජාවාරමේ නිරත වෙනවා කියලා මේ රටේ කවුරුහරි චෝදනා කරලාද? එහෙම නැත්නම් මේ ගැන සාකච්ඡා වෙන්නේ, මේ රටේ මත්ද්‍රව්‍ය ජාවාරම්වලට, සංවිධානාත්මක අපරාධවලට උඩගෙඩි දීපු, සම්බන්ධ වුණු පොලිස් නිලධාරින් ඉහළ තනතුරුවලට පත් කරලාද? නැහැ, ඒ එකක්වත් නිසා නොවෙයි මේ ගැන සාකච්ඡා වෙන්නේ. මේ මත්ද්‍රව්‍ය ගැන සමාජය තුළ සාකච්ඡාවක් ඇති වෙලා තිබෙන්නේ මත්ද්‍රව්‍ය අල්ලන නිසා. කවදාවත් නැති විධියට මත්ද්‍රව්‍ය තොග පිටින් අහුවෙන නිසා. ගෙවල්වලින්, ලොරිවලින්, පොළොව යට වළලලා තිබියදී තොග ගණන් මත්ද්‍රව්‍ය අහුවෙන නිසා. කවදාවත් මේ රටේ අහු නොවෙච්ච තරම් මත්ද්‍රව්‍ය අහුවෙන හින්දා. ඇයි මෙහෙම වෙන්නේ? එතකොට මේක හය හිතෙන කාරණයක් නේ. මේ රටේ මත්ද්‍රව්‍ය කිලෝ ගණනින්, තොග ගණනින් අහු වෙන්නේ. එහෙම වුණේ කොහොමද, මේවා පිටිපස්සේ කවුද ඉන්නේ කියන ඒ සියලු දේවල් ඉදිරියේදී එළියට එයි කියලා අපි හිතනවා.

දැන් මත්ද්‍රව්‍ය අල්ලනවා, සංවිධානාත්මක අපරාධකරුවන් අල්ලනවා. දේශපාලන පක්ෂ අතර වෙනස්කම් තිබෙනවා. ඒ නිසා සමහරු ඒකට ප්‍රතිචාර දක්වනවා, සමහරු නිහඬව ඉන්නවා. ඒක ගැන අවුලක් නැහැ. හැබැයි, එක පක්ෂයක් විතරක් මේවා අල්ලන අල්ලන සැරේට මාධ්‍ය සාකච්ඡා පවත්වනවා. ඒ වාගේ මොකක් හරි අල්ලනකොට voice-cut එකක් දෙනවා. බිම වළලලා තිබෙන මොකක් හරි දෙයක් ගොඩ ගන්නකොට මාධ්‍ය සාකච්ඡාවක් තියනවා. කොහේ හරි තිබිලා මත්ද්‍රව්‍ය කිලෝ දාහක් විතර අහුවුණොත් ගිහිල්ලා voice-cut එකක් දෙනවා. මේක ඇත්තටම අපි හිතන්න ඕනෑ කාරණයක්. හොරාට කලින් කෙහෙල් කැන වැට පනිනවා කියනවා නේ. ඒ වාගේ දෙයක් තමයි මාධ්‍ය දිහා බැලුවාම හැම තිස්සේම දැන් අපට පෙනෙන්න තිබෙන්නේ. අනෙක් වැඩේ තමයි, ඔක්කෝම දේවල් අහු වෙන්නේ එකම පැත්තකින්. අපි දන්නවා, ලංකාවේ මත්ද්‍රව්‍යවලට සම්බන්ධ red areas තිබුණු බව. මත්ද්‍රව්‍ය වැඩිපුර පාවිච්චි කරන, වැඩිපුර මත්ද්‍රව්‍ය ජාවාරම් සිදුවෙන, ඒවා operate වෙන, පොලීසියේ වැඩි අවධානයක් යොමු වුණු තැන් සාමාන්‍ය ජන සමාජයත් දන්නවා. කොළඹ ආශ්‍රිතව තිබෙන සමහර ප්‍රදේශ වාගේ. හැබැයි, කවදාවත්

නැති විධියට තංගල්ල, මිද්දෙනිය, නෙටොල්පිටිය, හම්බන්තොට වාගේ තැන්වලිනුත් ඒවා අහු වෙනවා. කොහොමද එහෙම වෙන්නේ? මෙච්චර කල් ඒ තැන්වල මෙහෙම දෙයක් සිදුවුණේ නැහැ. ඒ නිසා අපි හිතනවා, ඉස්සරහට මේවා සම්බන්ධ සියලු දේවල් එළියට එයි කියලා. ඒ වාගේම අපි බලනවා, මේ තිබෙන කලබලය සහ ඒවා අතර සම්බන්ධයක් තිබෙනවාද කියලා. එහෙම නැත්නම් අල්ලන අල්ලන සැරේට මාධ්‍ය සාකච්ඡා තියන්නයි, voice-cuts දෙන්නයි ඕනෑ නැහැ නේ. කවුරුවත් කිව්වේ නැහැ නේ, ඒගොල්ලන් සම්බන්ධයි කියලා.

මේ මත්ද්‍රව්‍ය ඇත්තටම ඉතා දරුණු ඛේදවාචකයක් වෙලා තිබෙන්නේ. තවම මේ ආණ්ඩුවට අවුරුද්දයි. මේ අවුරුද්ද ඇතුළත මේ වැඩේ, මේ මත්ද්‍රව්‍ය සම්බන්ධ වැඩේ, මත්ද්‍රව්‍ය නිවාරණය, මත්ද්‍රව්‍ය ඇල්ලීම කියන වැඩේ ඉතාම තීරණාත්මකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේක ඉවර කළ යුතුයි. මොකද මේ හරහා පසුගිය කාලයේ මේ රටේ ළමා පරපුර මොන මට්ටමට විනාශ කරලා තිබෙනවාද කියන එක උදාහරණයකින් කියන්නම්. උතුරු කොළඹ ආසනයේ තොටළඟ ප්‍රදේශයේ පිළිසකර කරන දිළිඳු ප්‍රදේශවලට අපි යනවා. ඊයේත් අපි ඒ පැත්තේ ගියා. එතැන පැල්පත් 270ක් තිබෙනවා. අපිත් එක්ක සම්බන්ධ වෙච්ච පොලිස් නිලධාරින්ගෙන් අපි ඇහුවා, මෙහේ මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් තිබෙන තත්ත්වය කොහොමද කියලා. එතකොට කිව්වා, ඒ 270ම මත්ද්‍රව්‍ය තිබුණා කියලා. ඒ හැම ගෙදරකම තිබුණා, හැබැයි, දැන් අඩු වෙලා තිබෙනවා කිව්වා. තවත් එහාට ගියොත්, ඒ කියන්නේ උතුරු කොළඹ, මෝදර, කොටහේන සහ වෙරළබඩ පොලීසිය පැත්තට ගියාම අවුරුදු 12, 13 ළමයි තමයි අයිස් මත්ද්‍රව්‍යය පාවිච්චි කරන්නේ. මේක බරපතළ ඛේදවාචකයක් වෙලා තිබෙන්නේ. පවුල් පිටින් බිඳ වැටිලා තිබෙන්නේ. මේ රටේ ළමයින්ගේ අනාගතය මුළුමනින්ම විනාශ කරන පාරක තමයි යමින් තිබුණේ. මේ ආණ්ඩුව මොනවාද කළේ කියලා අහනවා නේ. මතක තබා ගන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විධියට මත්ද්‍රව්‍ය අහු නොවුණා නම්, ආණ්ඩුව වෙනස් නොවුණා නම්, ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් පත් නොවුණා නම්, තංගල්ලේ පොළේත් අයිස් විකුණනවා. එතැනට මේක යමින් තිබුණේ. මේ මත්ද්‍රව්‍ය තොග අහුවෙන වේගයෙන් පෙනෙන්නේ ඒක. ඒ නිසා ඒක හරි පැහැදිලියි.

මේ රටේ සංවර්ධන කටයුතු, සංවර්ධනයට අදාළ අණ පනත් ගෙනෙන එක, ඒ ඔක්කොමත් අපි කරමු. ජනතාවට සහන සැලසීම සඳහා සියයක් දේවල් අපි කරලාත් තිබෙනවා. පිළිසකර කටයුතු, ඉදිකිරීම් කටයුතු පටන් ගෙන තිබෙනවා. හැබැයි, ඒ ඔක්කොටම උඩින් මේ රටේ තරුණ පරපුර විනාශ කරන, මීළඟට පරාද කළ යුතු ප්‍රධානම අභියෝගය වෙච්ච මත් ද්‍රව්‍ය උවදුර පරාද කරන්න මේ ආණ්ඩුව පැහැදිලිව අත තියලා තිබෙනවා. ඒක සාර්ථක වෙමින් තිබෙනවා. හැබැයි, ඒකට කට්ටිය කලබල වෙලා. නමුත්, ඒකට අපට කරන්න දෙයක් නැහැ. මේ රටේ පරම්පරාවක හීන මරලා, මේ රටේ පරම්පරාවක් විනාශ කරලා, තමන්ගේ දේශපාලනය ගොඩ දමා ගන්න, එහෙම නැත්නම් එක පුද්ගලයෙක් ගොඩ යන්න, තමන්ගේ දෙපයින් නැඟී සිටින්න බැරිව තාත්තාගේ වාරුවෙන් නැඟිටින මිනිස්සුන්ට දේශපාලනයෙන් ගොඩ යන්න මේවා පාවිච්චි කරන යුගය අපි අවසන් කරනවා.

මේ ආණ්ඩුව අවුරුද්දක් ඇතුළත මොකක්ද කළේ කියලා ඇහුවොත්, අපි පෙන්වමින් තිබෙනවා මේ රටේ දශක ගණනක් තිස්සේ වෙනස් කරන්න බැහැ කියපු, ආණ්ඩු වෙනස් කරද්දී වෙනස් වෙච්ච නැති, -කලිනුත් ආණ්ඩු වෙනස් වුණා නේ- අල්ලපු නැති, ඉවර කරපු නැති මත් ද්‍රව්‍ය උවදුර නැති කරන්න මේ ආණ්ඩුව සංවර්ධන වැඩ පිළිවෙළට සමගාමීව සාර්ථකව අඩිය තබා තිබෙන බව. ඒකේ සාර්ථකත්වය පෙන්වමින් තිබෙනවා. අපි බලමු, ඉස්සරහට එතැනදී තව කවුද එළියට එන්නේ කියලා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.15]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පනත් කෙටුම්පත අද ඉදිරිපත් කර තිබෙනවා. මීට අවුරුදු 6කට ඉස්සෙල්ලා -2019දී- ආපදා කළමනාකරණ අමාත්‍යවරයා විධියට මීට අදාළ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කිරීමට ලැබීම ගැන මම සන්තෝෂ වනවා. අපි දන්නවා, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය - NBRO එක - 1984දී රණසිංහ ප්‍රේමදාස මැතිතුමා ආරම්භ කළ බව. පහුගිය අවුරුදු 76ක කාලය තුළ තමයි ඒක වුණේ. මේ රටේ විශාල සංවර්ධනයක් ඇති වුණා, ගොඩනැඟිලි හැදුණා. මේවා හරි විධියට නියාමනය කිරීම සඳහා NBRO එක එදා පිහිටෙව්වා. අද මේ රටේ භූමි ප්‍රමාණයෙන් සියයට 30ක් තිබෙන්නේ කඳුකර ප්‍රදේශයේ. මේවා නාය යනවා, මේවාට වෙන වෙන ප්‍රශ්න එනවා. ඒක නිසා තමයි NBRO එක පිහිටෙව්වේ. ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය නිසා අද රටේ පිළිවෙළකට මේ ගොඩනැඟිලි ඉදි වෙනවා.

මේ රටේ හැම අවුරුද්දකම වාගේ නාය යෑම් සිදු වනවා. මේ රටට ගංවතුර, සුළි සුළං, පොඩි පොඩි භූමිකම්පා ඇති වනවා. මට මතකයි, අපි ආණ්ඩුවේ ඉද්දී අරණායක ප්‍රදේශයේ සාමසර කන්ද නාය ගියා. 113දෙනෙක් එක තැන මැරුණා. ඒ අයගේ ජීවිත මහ පොළොවේ වැළලුණා. අවුරුදු 2ක් ඇතුළත අපේ ආණ්ඩුවට පුළුවන්කම ලැබුණා, ජීවත් වුණු සියලුදෙනාටම ගෙවල් ටික හදලා දෙන්න, පාරවල් ටික හදලා දෙන්න, ජලය ලබා දෙන්න.

මම ස්තුතිවන්ත වෙනවා අපේ කබීර් හෂීම් මැතිතුමාට. අපට ඒ වැඩ කරන්න ඉඩක් තිබ්බෙ නැහැ. එතුමාගේ මවට අයිති පෞද්ගලික ඉඩම්වලින් අක්කර 35ක් අපට ඒ සඳහා ලබා දුන්නා. එහෙමයි අපේ පක්ෂයේ කණ්ඩායම එදා වැඩ කළේ.

ඒ විතරක් නොවෙයි, මේ රටේ හෝටල්, පාසල්, රෝහල්, නිවාස සංකීර්ණ හදද්දී ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය අත්‍යවශ්‍යම ආයතනයක් වෙලා තිබෙනවා. ඒ අය අද ඒ කටයුතු හරියට කරනවා. ඒගොල්ලන්ට නීත්‍යනුකූල අයිතිය ලබා දෙන්න තමයි, එදා අපි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න අවශ්‍ය කැබිනට් යෝජනාව ගෙනාවේ.

2018දී මේ රටේ විශාල ගංවතුර තත්ත්වයක් ඇති වුණා. මම හිතන විධියට, ඉතිහාසයේ ලොකුම ගංවතුර තමයි 2017, 2018 කාලයේ ඇති වුණේ. නිරිතදිග මෝසම එනකොට වැස්ස වැඩි වෙනවා. නුවරඑළිය, හැටන් අවට ප්‍රදේශයට, කැලණි ගඟ ආශ්‍රිතව වැස්ස වැඩි වෙනවා. දැන් මේවාට විකල්ප ක්‍රියාමාර්ග ගන්න ඕනෑ. ඒ සඳහා ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පනත් කෙටුම්පත සම්මත කරලා විතරක් මදි. මේ ආපදා වළක්වා ගන්න තිබෙන විකල්ප මොනවාද කියලා බලන්න ඕනෑ.

මට මතකයි, අපේ ආණ්ඩුව කාලයේ යෝජනාවක් තිබුණා, නිරිතදිග මෝසමෙන් එන වතුර උමගක් හදලා මහවැලි ප්‍රදේශවලට, උතුරට, උතුරු නැඟෙනහිරට ගෙනියන්නේ කොහොමද කියලා. ඒ වාගේ වැඩ පිළිබඳව තමයි මේ ආණ්ඩුව කල්පනා කරන්න ඕනෑ. මේවා ගැන කල්පනා කරන්න ඕනෑ. එහෙම නැතිව බස් ස්ටෑන්ඩ්වල තීන්ත ගාලා හරියන්නේ නැහැ.

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

ඒ විතරක් නොවෙයි. අපි දන්නවා, වැලි ගොඩ දැමීම නිසා ප්‍රධාන ගංගාවල ඉවුරුවලට හානි සිද්ධ වෙන බව. ඒවා ආරක්ෂා කරන්න ඕනෑ. ඒ සඳහාත් අවශ්‍ය උපදෙස් මේ ආයතනයෙන් ගන්න. මේ ආණ්ඩුව ආවා කියලා වැලි ගොඩ දැමීම නැවතිලා නැහැ. නීතිය අනුව ඒවා නවත්වන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. භූමි කම්පාවලටත් අපට ලෑස්ති වෙන්න වෙයි. පසුගිය අවුරුද්දේ නුවර, දිගන ප්‍රදේශයේ භූමි කම්පා කිහිපයක් ඇති වුණා. මොනරාගල දිස්ත්‍රික්කයේ බුත්තල, වැල්ලවාය ප්‍රදේශයේ භූමි කම්පා කිහිපයක් ඇති වුණා. ත්‍රිකුණාමලයේත් භූමි කම්පාවක් සිද්ධ වෙලා තිබුණා. මේවා ගැන රජය කල්පනා කරන්න. මේවා සඳහා ගන්නා ප්‍රතිකර්ම මොනවාද? සමහරවිට මේවා නිසා ලොකු හානියක් සිද්ධ වෙන්න ඉඩ තිබෙනවා. එක්ස්ප්‍රස් පර්ල් නෞකාවෙන් සිදු වුණු පරිසර හානිය නිසා පරිසරයට කොච්චර රසායනික ද්‍රව්‍ය එකතු වෙලා තිබෙනවාද, පරිසරය කොච්චර අපවිත්‍ර වෙලා තිබෙනවාද කියලා NBRO ආයතනය වාර්තා දුන්නා. මම හිතන විධියට එය විශාල කාර්යභාරයක් කළ ආයතනයක්. මට මතකයි, ඒ දවස්වල අපේ යහ පාලන ආණ්ඩුව තිබියදී ජාතික රක්ෂණ භාර අරමුදල යටතේ මේ රටේ ස්වාභාවික ආපදා සියල්ලම රක්ෂණය කරලා තිබුණා. නාය යෑම නිසා ගෙයක් නැති වුණොත් ඉඩමක් ගන්න ලක්ෂ 4ක් දුන්නා, ගේ හදා ගන්න ලක්ෂ 16ක් දුන්නා. ව්‍යාපාරයක් නැති වුණොත් ලක්ෂ 25ක් දුන්නා. දැන් ඒ අරමුදල සම්පූර්ණයෙන් අහෝසි කරලා තිබෙනවා. තමුන්නාන්සේලා ඒ රක්ෂණ වාරික ගෙවන්නේ නැහැ. අපි අවුරුද්දකට වාරිකය ලෙස මිලියන 1,500ක් ගෙව්වා. අද තමුන්නානාන්සේලාගේ ආණ්ඩුව ඒක ක්‍රියාත්මක කරනවාද කියලා මම අහනවා. කරුණාකරලා ඒක ක්‍රියාත්මක කරන්න. අපේ පැත්තේ කිහිපදෙනෙක් මට ඇවිල්ලා කිව්වා, වැස්සෙන් නිවාස හානි වුණා ලු. නිවාස හානි වුණාට ආණ්ඩුවෙන් සත පහක්වත් දෙන්නේ නැහැ කියලා. මෙවැනි පනත් කෙටුම්පත් ගෙනාවාට මදි, ඒ අයට උදවු කරන්නත් ඕනෑ.

අපි ඒ දවස්වල හඳුනාගෙන තිබුණා, බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දෙහිගලවත්තේ තිබෙන ලයින් කාමර ටික නාය යෑමේ අවදානමක් තිබෙනවා කියලා. ඒ ගැන NBRO එකෙන් report එකක් දීලා තිබුණා. අපි ඒ සඳහා විකල්ප ඉඩම් සොයලා දුන්නා. ආණ්ඩුවට අපි කියනවා ඒ වැඩ පටන් ගන්න කියලා. ඒ මිනිස්සු නාය යෑම්වලට යට වෙනකම් ඉන්න එපා. මොනරාගල ආසනයේ බඩල්කුඹුර ගමේ වෙලවත්තේ මේ වාගේම ලයින් කාමර දෙකක ඉන්න කට්ටිය ඉවත් කරන්න කියලා තිබෙනවා. නමුත් ආණ්ඩුව ඒ සඳහා කිසිම ක්‍රියාමාර්ගයක් ගත්තේ නැහැ. තමුන්නාන්සේලා වැරදි හදන්නයි ආවේ. දැන් මිනිහෙකුගේ ගෙයක් ආපදාවට ලක් වුණොත් දෙන්න සල්ලි නැහැ; සල්ලි දෙන්නෙත් නැහැ. මේ පනත් කෙටුම්පත ගෙනාවේ යන්තම් එදා අපි ඉදිරිපත් කළ නිසා. මම ඉල්ලන්නේ, රක්ෂණ භාර අරමුදල යටතේ ඒ තිබෙන රක්ෂණය නැවත ඇති කරන්න. මොකද, මිනිස්සු නිතර නිතර ආපදාවලට ලක් වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ විතරක් නොවෙයි. NBRO එකෙන් නුවර පාරේ ආපදාවට ලක් වෙන, නාය යෑමට ලක් වෙන තැන් දැන් හදලා තිබෙනවා. නුවරඑළිය මල් වත්ත ළඟ, දහඅට වංගුවේ වැඩ කරලා තිබෙනවා. මේ ආයතනය වැඩ කරනවා. ඒකට මුදල් දෙන්න. මම දන්න විධියට දැනට විශාල මුදල් ප්‍රමාණයක් මේකට වෙන් කරලා නැහැ. අපේ ආණ්ඩුව කාලයේ අපි ඒ සියල්ල සඳහා මුදල් වෙන් කළා.

කොහොම නමුත්, අපි ඉදිරිපත් කළ යෝජනාවක් අනුව මේ පනත් කෙටුම්පත ගෙන ඒම ගැන ස්තුතිවන්ත වෙනවා. 1984දී නිවාස ඇමති විධියට රණසිංහ ප්‍රේමදාස මැතිතුමා තමයි මේ අදහස ගෙනාවේ. ඊට පස්සේ මම ඊට අදාළ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරලා තිබෙනවා. තමුන්නාන්සේලා එතැනින් අවුරුදු 6කට පස්සේ අද මේ පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙනවා. කොහොමත් අපි මේකට පක්ෂව ඡන්දය දෙනවා. මොකද, මේක අපි ගෙනාව යෝජනාවක්. ආපදා ගැන මීට වඩා සැලකිලිමත් වෙන්න, ජනතාවට උදවු කරන්න කියලා අපි කියනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වී.එස්. රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
මට විනාඩි 9ක් තිබුණා, දැන් ඒක 7ක් වෙලා, තව වේලාව යනකොට 6ක් වෙයි.

[பி.ப. 2.24]

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றையதினம் இச்சபையில் தேசியக் கட்டிட ஆராய்ச்சி நிறுவகத்தைத் தாபிப்பதற்கான சட்டமூலம் கொண்டுவரப்பட்டு இருக்கின்றது. இது சந்தோஷமான ஒரு விடயம்! கடந்த காலங்களில் மலையகப் பகுதிகளில் அதிகமான 'லயன்' அறைகள் மண்சரிவால் இடிந்துவிழுந்ததை நாங்கள் அவதானிக்கக்கூடியதாக இருந்தது. கடந்த வாரம் கெனில்வொர்த் தோட்டத்தில் ஒரு பாடசாலை இடிந்து விழுந்து இருக்கிறது. அதன் பின்னர், அந்தப் பாடசாலையை நடத்துவதற்கு, மாற்றுப் பாடசாலையாக வேறொரு பாடசாலை பெற்றுக்கொடுக்கப்பட்டு இருக்கிறது. இவ்வாறான சூழ்நிலையில், தேசியக் கட்டிட ஆராய்ச்சி நிறுவகத்தை உருவாக்குவது நல்லதென நான் நினைக்கின்றேன்.

கடந்த காலத்தில் மலையகப் பெருந்தோட்டப் பகுதிகளுக்கென NEVIDA எனப்படுகின்ற பெருந்தோட்டப் பிராந்தியத்துக்கான புதிய கிராமங்கள் அபிவிருத்தி அதிகாரசபை உருவாக்கப்பட்டது. இது 2018ஆம் ஆண்டின் 32ஆம் இலக்கச் சட்டத்தின்படி தாபிக்கப்பட்டது. இந்த அதிகாரசபையானது, பெருந்தோட்ட சமூகத்தைச் சார்ந்த மக்களுடைய பொருளாதார நிலையை முன்னேற்றுவதற்கும் தேசிய அபிவிருத்தியில் அவர்களின் பங்களிப்பை அதிகரிப்பதற்குமென உருவாக்கப்பட்டது. பெருந்தோட்ட மக்களின் வாழ்வாதாரத்தை உயர்த்தி, அவர்களுக்குச் சிறந்த வசதிகளை வழங்குவதன் மூலம் அவர்களைத் தேசிய நீரோட்டத்துடன் இணைப்பதே இதன் நோக்கமாகும். வீடமைப்பு, குடிநீர் வசதி, பிற அபிவிருத்திகள், சேவைகள் போன்ற திட்டங்களை மேற்பார்வை செய்தல் மற்றும்

செயற்படுத்தல், பொருளாதார மற்றும் கலாசார முன்னேற்றத்தை ஊக்குவித்தல் என்பன இதன் பொறுப்புக்களில் அடங்கும். இவ்வாறானதோர் அதிகாரசபையை அமைத்தும் அது 7 வருடங்களாகச் செயற்படாமல் இருந்தது வருத்தத்துக்குரிய விடயமாகும். இப்பொழுது இந்த அதிகாரசபையைக் கலைப்பதற்கு நடவடிக்கை எடுக்கப்படுவதாக நாங்கள் அறிகின்றோம். பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர் மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன அவர்கள் இங்கு இருக்கிறார். நான் உரையாற்றி முடிந்த பிறகு அவர் இது தொடர்பில் பதில் அளிப்பாரென நினைக்கின்றேன்.

ඔබතුමා මේකට උත්තර දෙන්න. මේක අහෝසි කරනවා කියලා දැනට අපට ආරංචි වෙලා තිබෙනවා. ඇයි මේක අහෝසි කරන්නේ? ජනතාව සඳහා ඇති කරපු මේ Authority එක අයින් කරන්න එපා කියලා තමයි මම කියන්නේ. *[බාධා කිරීමක්]* ඔබතුමා මගේ කථාවෙන් පසුව කිව්වා නම් හොඳයි. නැත්නම් මගේ වෙලාව යනවා. මට වෙලාව දෙන්න ඔබතුමාට සිද්ධ වෙනවා.

මම තව කරුණු දෙකක්, තුනක් කියන්නම්. ඔබතුමා එකපාරටම මට උත්තර දෙන්න. මේක අහෝසි කරන්න එපා කියන එකයි මම කියන්නේ. අනෙක් එක, මේක ප්‍රතිසංස්කරණය කරනවා නම් ඒකේ බලතල අඩු කරන්න එපා. ඒ බලතල අඩු කරන්නේ නැතිව මේක ඉදිරියට ගෙන යන්න ඔබතුමන්ලාට උත්සාහයක් තිබෙනවා නම්, 2026 අය වැයෙන් මේ සඳහා මුදල් වෙන් කරන්න. මුදල් වෙන් කරලා මේක ශක්තිමත් කරන්න. එතකොට මේ NEVIDA එක ඉදිරියට ගෙන යන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා. ඒත් එක්කම මේක ශක්තිමත් කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ජනතාවට වැඩ කරන්න මේ ආයතනය උපයෝගි කර ගන්න. මේක දිස්ත්‍රික්ක අටකට වැඩ කරන්න පුළුවන් ආයතනයක්. එක දිස්ත්‍රික්කයකට විතරක් නොවෙයි, දිස්ත්‍රික්ක 8කට. ඔබතුමාගේ දිස්ත්‍රික්කයටත් මේක ඇතුළත් වෙනවා. ඒ නිසා කරුණාකරලා මෙය ශක්තිමත් කරන්න. මෙය ශක්තිමත් කරන්න කටයුතු කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඔබතුමා පාර්ලිමේන්තුවට උත්තර දෙනවා නම් වඩාත් හොඳයි. එහෙන් මෙහෙන් උත්තර දෙන එක තේරුමක් නැහැ. පාර්ලිමේන්තුවේ කථා කරලා, පාර්ලිමේන්තුවේ දීම උත්තර දෙනවා නම් වඩාත් හොඳයි. එතකොට ජනතාවටත් දැන ගන්න පුළුවන්. එය මෙතැන ස්ථිර කරන්නත් පුළුවන්.

ඊළඟට අපි කථා කරන්න බලාපොරොත්තු වෙනවා, වතු කම්කරුවන්ගේ වැටුප් ප්‍රශ්නය. දැනට වතු කම්කරු වැටුප විධියට රුපියල් 1,300ක් ලැබෙනවා. රුපියල් 1,700ක් දෙනවා කියලා කිහිප වතාවක් පොරොන්දු වුණා. ජනාධිපතිතුමා කිව්වා, රුපියල් 2,000ක් දෙන්නම් කියලා. නමුත් තවමත් එය කිසිම පිළිවෙළකට ආවේ නැහැ. මම හිතන විධියට ගිය සුමානයේ උසාවියෙන් තීන්දුවක් දීලා තිබෙනවා, ඔක්තෝබර්වලට ඉස්සෙල්ලා මේකට විසඳුමක් දෙන්න කියලා. ඒ නිසා ඔබතුමා කරුණාකරලා මේ ගැන කථා කරන්න. ඔබතුමා මේකට උත්තර දෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

மலையக மக்களின் இந்தப் பிரச்சினைக்கு கௌரவ அமைச்சர் அவர்கள் தீர்வைப் பெற்றுத்தருவாரென நான் நினைக்கின்றேன். NEVIDA என்ற பெருந்தோட்டப் பிராந்தியத்துக்கான புதிய கிராமங்கள் அபிவிருத்தி அதிகாரசபையைக் கலைக்கக் கூடாது. அதைக் கலைப்பதன் மூலம் அரசாங்கம் எங்களுடைய மக்களுக்குத் துரோகம் செய்யக் கூடாதென நான் கேட்டுக் கொள்கின்றேன். நட்டமடைந்து வருவதாகக் கூறப்படும் 33 அரச நிறுவனங்களை மூடுவதற்கு முயற்சிகள் எடுக்கப்படுவதாக நான் அறிகின்றேன். அதில் இந்த அதிகாரசபையைச் சேர்க்கக் கூடாதென நான் இந்த நேரத்தில் கேட்டுக் கொள்கின்றேன். இடைநிறுத்தப்பட்டு இருக்கின்ற பாடசாலைகளின் கட்டிட வேலைகள் பூர்த்தியாக்கப்பட்டு, அவை அபிவிருத்தி செய்யப்பட வேண்டும். அதேபோல், ஆஸ்பத்திரிகளையும் அபிவிருத்தி செய்வதற்கான நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டும். இவற்றைச் செய்வதற்கான சந்தர்ப்பங்கள் வரும்பொழுது, இன்றைய தினம் கொண்டுவரப்பட்டு இருக்கின்ற தேசிய கட்டிட ஆராய்ச்சி நிறுவகம் சட்டமூலம் மிகவும் பிரயோசனமாக இருக்குமென நான் நினைக்கின்றேன்.

எங்களுடைய மக்களின் வாழ்க்கை முறையை மாற்றுவதற்காகக் கொண்டுவரப்பட்ட ஓர் அமைப்புதான் பெருந்தோட்டப் பிராந்தியத்துக்கான புதிய கிராமங்கள் அபிவிருத்தி அதிகாரசபை! பெருந்தோட்ட மக்கள் இங்கு வந்து 200 வருடங்களுக்கும் மேலாகியும் இன்னும் அவர்களுடைய வாழ்க்கை முறை மாற்றப்படவில்லை. 'லயன்' அறைகள் அகற்றப்பட்டு, அவர்களுக்குத் தனி வீடுகளைப் பெற்றுக் கொடுக்கின்ற திட்டத்தைக் கொண்டுவர வேண்டுமெனவும் அவர்களுக்குத் தேயிலைத் தோட்டங்களைப் பிரித்துக் கொடுத்து, அதன்மூலம் அவர்களுடைய வாழ்க்கை முறையை மாற்றுவதற்கான நடவடிக்கைகளை எடுக்க வேண்டுமெனவும் கேட்டுக் கொள்கின்றேன். கௌரவ அமைச்சர் சமந்த வித்யாரத்ன அவர்களின் பதிலை எதிர்பார்த்து, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චන්දන සූරියආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.30]

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අද අපි පාර්ලිමේන්තුවේදී වැදගත් පනතක් පිළිබඳ සංවාදයක, විවාදයක ඉන්නේ. ජාතික ජන බලවේගය ආණ්ඩුව බලයට පත්වෙලා වසරක් සම්පූර්ණ වෙද්දී මොනවාද කළේ කියලා මට කලින් අදහස් දක්වපු විපක්ෂයේ මන්ත්‍රීවරු විවිධ ප්‍රශ්න මතු කළා. මේ ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය වසර ගණනාවක් තිස්සේ මේ රට වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටු කළත්, අඩුම ගණනේ ඒ ආයතනයේ රාජකාරි ටික ආවරණය වන පරිදි, වගකීම නීත්‍යානුකූල වන පරිදි කටයුතු කිරීමට අවශ්‍ය අණ පනත් ටිකවත් හදන්නේ නැතිව තමයි ඒ කථා කරපු මහත්වරු පසුගිය කාලයේ ආණ්ඩු කරලා තිබෙන්නේ. මොනයම් හෝ අවබෝධයක් තිබෙනවා නම් මේ අයට ඒකවත් හිතෙන්න ඕනෑ. ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය මේ වනතෙක්ම පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත කර නොමැති ආයතනයක් විධියටයි අපේ රටේ ක්‍රියාත්මක වුණේ. ඒ නිසා ජාතික ජන බලවේගයේ ආණ්ඩුව අද වගකීමෙන් යුතුව ඒ ආයතනයේ සේවාව නිසි පරිදි ඉටු කර ගැනීම සඳහා ඉතා පැහැදිලි නීතියක් සම්මත කරනවා. එක පැත්තකින් ඒක ඉතාම වැදගත් කාරණාවක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තවත් වැදගත් කාරණා කිහිපයක් තිබෙනවා. හම්බන්තොට පුංචි මහත්තයා කලින් අදහස් දක්වලා මේ ගරු සභාවෙන් ගියා. එතුමා අහනවා, අපි මොනවාද කළේ කියලා. ජාතික ජන බලවේගය ආණ්ඩුව

[ගරු චන්දන සූරියආරච්චි මහතා]

ආවේ නැත්නම්, ශ්‍රී ලංකාවේ ගෙන ගිය පාලනය තවදුරටත් ගෙන ගියා නම් අපේ රටේ නාමය "අයිස්ලන්තය" කියලා වෙනස් වෙන්න ඉඩ තිබුණා. ඒ අයිස්ලන්තයේ අගනගරය තංගල්ල බවට පත් වෙන්නත් ඉඩ තිබුණා. අන්න එවැනි විනාශකාරී ගමනක්, අපේ රටේ අනාගත පරම්පරාව -උපදින්න ඉන්න දූ දරුවෝ-, අපේ රටේ තරුණ තරුණියන් විනාශයට ලක් වෙන්න තිබුණු අවස්ථාව තමයි මේ ජාතික ජන බලවේගය ආණ්ඩුව බලයට පත්වීමත් එක්ක සුද්ධ කරමින් සිටින්නේ; නිවැරදි කරමින් සිටින්නේ.

අපි දැක්කා, පසුගිය ඉරිදා සහ සඳුදා දවස් දෙකේ පොලීසියේ ඒ අදාළ අංශ තංගල්ල ඇතුළු ඒ ප්‍රදේශවල කළ පැය 48ක මෙහෙයුමකින් පස්සේ හෙරොයින් සහ අයිස් මත් ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 705.91ක් අත්අඩංගුවට අරගෙන තිබෙන බව. අන්න එතැන තමයි රට තිබුණේ. ඉතින් අද නීතිය එහෙම ක්‍රියාත්මක වෙනවා. අපි දැක්කා, පසුගිය සෙනසුරාදා අපේ රටේ නඩු භාණ්ඩ ගොඩක් එකතු වෙලා කිඹුලා ඇළ පැත්තේ තැනක ලොකු අඳෝනාවක් ඉදිරිපත් කරනවා, මේ බේදවාචකයෙන් තමන් ගැලවෙන්නේ කොහොමද කියලා. කළ පව් තමන් පසුපස එනවා කියනවා වාගේ, එල දෙනවා කියනවා වාගේ ආණ්ඩුවේ ඉන්නකොට කරපු අපරාධ, සංවිධානාත්මක අපරාධ, ඒවාට දීපු අනුග්‍රහය සහ සහාය එක්ක දැන් තමන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක වෙද්දී ප්‍රජාතන්ත්‍රවාදය ඉස්සරහට දාලා අද ඒගොල්ලන් උත්සාහ කරමින් ඉන්නවා, ඒ දේවල්වලින් ගැලවෙන්න. මම දැක්කා, බදුල්ලේ මන්ත්‍රීතුමෙක් මේ පාර්ලිමේන්තුවේ කථා කළ ආකාරය. එතුමාම තමයි කිඹුලා ඇළ පැත්තේ පසුගිය සෙනසුරාදා තිබිච්ච නඩු භාණ්ඩ රැස්වීමේදී රනිල් වික්‍රමසිංහ මහත්තයා ඉස්සරහ තියාගෙන කිව්වේ, 1988-89දී රනිල් වික්‍රමසිංහට අහු වුණා නම්, අද ඔය ආණ්ඩුවේ ඉන්න, සද්දෙ දමන ගොඩක් අය ඉතුරු වෙන්නේ නැහැ කියලා. ඒ මොකක්ද කිව්වේ? නඩුවකට අවශ්‍ය සාක්ෂියක් තමයි ඒ බදුල්ලේ මන්ත්‍රීතුමා අර නඩු භාණ්ඩ සමුළුවේදී ඉදිරිපත් කළේ. ඉතින් ඒ විධියට තමයි පසුගිය වකවානුව තිබුණේ.

විශේෂයෙන්ම අද මේ පාර්ලිමේන්තුවේදී මීට කලින් කළ කථාවලදී විදුලිබල මණ්ඩලය පිළිබඳව සාකච්ඡා වුණා. විදුලිබල මණ්ඩලය පිළිබඳ සාකච්ඡාවට අදාළව ඉතා පැහැදිලිව කිව යුතුව තිබෙනවා, විදුලිබල මණ්ඩලය පෞද්ගලීකරණය කරන්න ගියේ එජාප-පොහොට්ටු ආණ්ඩුව බව. එහෙම නැත්නම් රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුව. රනිල් වික්‍රමසිංහ නොවෙයි, රනිල් වික්‍රමසිංහ තනියෙන් හිටියේ, ජනාධිපති විධියට. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සහාය දෙමින් හිටපු ඒ ආණ්ඩුව එදා 2024 ජුනි මාසයේදී විදුලිබල මණ්ඩලය පෞද්ගලීකරණය කිරීමට අවශ්‍ය අණ පනත් සම්මත කළා. එහිදී එම ආයතනය සමාගම් 12ක් බවට පත් කළා. ඒ වාගේම ඒ සමාගම් 12න් 9ක් මුළුමනින්ම පෞද්ගලීකරණයට ලක් කළා. ඒ වාගේම ජල විදුලි බලාගාර විතරක් රජයේ සමාගමක් විධියට තියාගෙන ඩීසල්, ගල් අඟුරු, නැප්තා ආදියෙන් විදුලිය ජනනය කරන ව්‍යූහ පෞද්ගලික සමාගම් බවට පත් කරන්න ගියා. එහෙම තමයි එජාප-පොහොට්ටු ආණ්ඩුව එදා විදුලිබල මණ්ඩලය විකුණන්න අවශ්‍ය, පෞද්ගලීකරණයට අවශ්‍ය පියවර ගත්තේ. අන්න ඒ පනත ගෙනෙනකොට එදා රන්ජන් ජයලාල් සහෝදරයා ඇතුළු වෘත්තීය සමිති ව්‍යාපාරය විදුලිබල මණ්ඩලය රැක ගැනීම වෙනුවෙන් සටන් කළා. රනිල්-කංචන, එහෙම නැත්නම් එජාප-පොහොට්ටු ආණ්ඩුව විදුලිබල මණ්ඩලය පෞද්ගලීකරණය කරන්න ගෙනාපු පනතට එරෙහිව එදා සටන් කළා; අරගළ කළා. මට මතකයි, අද මේ වෘත්තීය සමිති කටයුතු කරනවා වාගේම එදා 2024 ජනවාරි මාසයේ 2, 3, 4 දිනවලදී ඔවුන් අසනීප නිවාඩු වාර්තා කරමින්, එජාප-පොහොට්ටු ආණ්ඩුවේ විදුලිබල මණ්ඩලය පෞද්ගලීකරණය කිරීමේ පනතට එරෙහිව වෘත්තීය ක්‍රියාමාර්ග ගත්තා. එදා එජාප-පොහොට්ටු ආණ්ඩුව කොහොමද ඒ සටනට පිළිතුරු දුන්නේ?

මට මතකයි, එදා අසනීප නිවාඩු වාර්තා කළ සේවකයන් 62කගේ වැඩ තහනම් කළා. කවුද? එජාප රනිල් වික්‍රමසිංහ සහ කංචන විජේසේකර ආණ්ඩුව. පසුගිය දිනවලත් විදුලිබල මණ්ඩල සේවකයෝ අසනීප නිවාඩු වාර්තා කළා. ජාතික ජන බලවේගයේ ආණ්ඩුව අධිකරණයට ගියාද? නැහැ. ඒ අය ගෙදර යැව්වාද? නැහැ. ඒ අයගේ වැඩ තහනම් කළාද? නැහැ. හැබැයි එදා 2024දී රනිල් වික්‍රමසිංහ-පොහොට්ටු ආණ්ඩුව අසනීප නිවාඩු දමපු සේවකයන් 62කගේ වැඩ තහනම් කළා. නීතියෙන් එය කරන්න බැහැ. නමුත් මණ්ඩලයේ තිබිච්ච දේශපාලන බලය පාවිච්චි කරලා, ඉහළ නිලධාරින් එක්ක එකතු වෙලා, විදුලිබල මණ්ඩලයේ සේවකයන් 62ක් ගෙදර යැව්වා. ඒ සේවකයන්ට නැවත රැකියාව දුන්නේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව ආවාට පස්සේ. ඒ විතරක් නොවෙයි.

අපි ඉතා පැහැදිලිව කියනවා, එදා 2024දී කංචන-රනිල් ආණ්ඩුව වෘත්තීය සමිති නායකයන්ගේ අත් බැඳලා, කට වහලා තමයි ඒ පනත ගෙනෙන්න ගියේ කියලා. ඒ නිසා තමයි එදා ගරු අධිකරණයට ගිහිල්ලා වෘත්තීය සමිති නායකයන් ඇතුළු ක්‍රියාකාරීන් 92කට වාරණ නියෝග ගත්තේ, විදුලිබල මණ්ඩලයට ඇතුළු වෙන්න බැරි වෙන්න. එදා එහෙම තමයි විදුලිබල මණ්ඩලය පෞද්ගලීකරණය කරන්න, විකුණන්න ගියේ. ජනාධිපතිවරණය තිබුණේ සැප්තැම්බර් 21වැනි දා. 2024 සැප්තැම්බර් 18වැනි දා අමාත්‍ය මණ්ඩලය තීරණයක් ගත්තා. මොකක්ද? අද මෙතැන මේ කථා කරන විපක්ෂයේ මන්ත්‍රීවරු තමයි එදා ඒ කැබිනට් මණ්ඩලයේදී ඒ තීරණය අනුමත කළේ. මොකක්ද කළේ? විදුලිබල මණ්ඩලයේ සිටි 22,000ක් පමණ වූ සේවකයන්ගෙන් 12,000ක් ඉවත් කළ යුතුයි කියලා 2024 සැප්තැම්බර් 18වැනි දා අමාත්‍ය මණ්ඩල තීරණයක් අරගෙන සේවකයන් 12,000ක් ගෙදර යවන්න තමයි එදා එජාප-පොහොට්ටු ආණ්ඩුව ක්‍රියා කළේ. එවැනි විනාශකාරී වැඩ පිළිවෙළක් තමයි එදා පැවතුණේ. නමුත් අද වනවිට අනුර දිසානායක සහෝදරයා ඇතුළු මේ ආණ්ඩුව විදුලිබල මණ්ඩලය පෞද්ගලීකරණය කරන එක නවත්වා, සේවක අයිතීන් ආරක්ෂා කරලා, ඒ ගොඩනැඟෙන සමාගම් 6ම සියයට සියයකින් රජය සතු කර ගැනීමට අවශ්‍ය කරන පියවර ගනිමින් තිබෙනවා. ඒ නිසා අපි විදුලිබල මණ්ඩලයේ සේවක මහත්ම මහත්මීන්ට කියනවා, විදුලිබල මණ්ඩලය විකුණන්නේ නැහැ, සේවක අයිතිවාසිකම් අහිමි වෙන්නේ නැහැ, ඒ තිබුණු සියලු අයිතිවාසිකම් ඇතුළේ සියයට සියයක රජයේ මැදිහත්වීම මත විදුලිබල මණ්ඩලය ඉස්සරහට යන බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව එක කාරණයක් මම කිව යුතුයි. අද මේ ගරු සභාවේදී අවස්ථා කිහිපයකදීම සංවර්ධන නිලධාරීන් පිළිබඳව කථා කළා. සංවර්ධන නිලධාරින් ගුරු සේවයට අන්තර්ග්‍රහණය කරන්න බැහැ, ගුරු සේවයට යන්න තිබෙන එකම ක්‍රමය තරග විභාගය කියලා එදා අමාත්‍ය මණ්ඩල තීරණ ගත්තා. රනිල් වික්‍රමසිංහ-පොහොට්ටු ආණ්ඩුව 2022දී ගත් ඒ තීරණය අනුව තමයි 2023 මාර්තු මාසයේ ඒ තරග විභාගය පවත්වන්න නියමිත වුණේ. ඊට පසුව සංවර්ධන නිලධාරින් 34දෙනෙකු ගරු ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා මූලික අයිතිවාසිකම් නඩුවක් ගොනු කළා, "තරග විභාග එපා, සෘජුව ගුරු සේවයට අන්තර්ග්‍රහණය කරන්න" කියලා. වසර කිහිපයකට පසුව එම පෙත්සම් විභාගයෙන් අනතුරුව ගරු ශ්‍රේෂ්ඨාධිකරණය එම පෙත්සම් 4ම නිෂ්ප්‍රභ කළා. ඒ අනුව දැන් නීත්‍යානුකූලව තිබෙන්නේ තරග විභාගය පවත්වන්නයි. නමුත් මම දැක්කා විපක්ෂ නායකතුමා කියනවා, "නැහැ, නැහැ. තරග විභාගය එපා, ඒ අයව අන්තර්ග්‍රහණය කරන්න" කියලා. හැබැයි, 2013දී පාසල්වලට ගත් 16,000ක් වන සංවර්ධන නිලධාරින් ගුරු සේවයට අන්තර්ග්‍රහණය කරන්න කියලා අපි එදා පාරේ සටන් කරද්දී, එවකට පැවැති යහ පාලන ආණ්ඩුවේ ඔය සජිත් ප්‍රේමදාස මහතා හිටපු කැබිනට් මණ්ඩලයේ අධ්‍යාපන ඇමති විධියට හිටපු

අකිල විරාජ් කාරියවසම් 2013දී පාසල්වලට ගිය සංවර්ධන නිලධාරිවරුන් ගුරු සේවයට නිකම් අන්තර්ග්‍රහණය කළේ නැහැ. තරග විභාගයෙන් තමයි ගත්තේ. එදා ඒ තරග විභාගයෙන් සමත් වෙන්න බැරි වුණු සංවර්ධන නිලධාරින් පවා 2013 සිට අදටත් පාසල්වල සංවර්ධන නිලධාරින් විධියටම කටයුතු කරනවා. මේ තීන්දු තීරණ ගත්තේ ඒ අය. නමුත් අපි ආණ්ඩුවක් විධියට පාසල්වල ඉන්න සංවර්ධන නිලධාරින්ටත් අගතියක් නොවන පරිදි කටයුතු කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව සුළු වෙලාවක් ලබා දෙන්න.

අපි ගුරු සේවය තුළ තිබෙන 30,000කට ආසන්න පුරප්පාඩු පිරවීමේදී පාසල් සංවර්ධන නිලධාරින්ටත් යම් විශේෂ ප්‍රමුඛතාවක් ලැබෙන පරිදි සාධාරණ විධියට කටයුතු කර එම ප්‍රශ්නය විසඳන්න සැලසුම් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වසම්වල ඉන්නා ආර්ථික සංවර්ධන නිලධාරින්ට එදා රාජපක්ෂ පාලනය තුළ ඇට වර්ග බෙදන්න, පැළ බෙදන්න, බාල්දි බෙදන්න, ලිප් බෙදන්න, කෝප්ප බෙදන්න තමයි රාජකාරි වශයෙන් පවරා තිබුණේ. නමුත් නව ආණ්ඩුවේ ප්‍රජාශක්ති වැඩසටහන යටතේ ඒ සෑම නිලධාරියෙකුටම ශක්තිමත් වැඩ පිළිවෙළක්, පැහැදිලි රාජකාරියක්, වසමේ නිවැරදි වගකීමක් නිර්මාණය වන විධියට සැලසුම් කරලා, ඒ සෑම නිලධාරියෙකුටම වෘත්තීය වගකීමක්, වටිනාකමක් නිර්මාණය වෙන විධියේ වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රාජ්‍ය සේවය ශක්තිමත් කරන දිශාවටත්, විදුලිබල මණ්ඩලය රැක ගැනීමේ දිශාවටත් තමයි මේ සියලු කාරණා ඇතුළේ ජාතික ජන බලවේගය ආණ්ඩුව ගමන් කරමින් තිබෙන්නේ කියන කාරණය සඳහන් කරමින්, අද දින මේ වැදගත් පනත පිළිබඳව පවත්වන සංවාදයට සම්බන්ධ වීමට මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.41]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, NBRI එකට නව ශක්තියක් නෛතිකව එකතු වෙන මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මේ අලුත් අණපනත් සඳහා මුල පුරපු ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මම කියන්න කැමැතියි, ව්‍යසනකාරී තත්ත්වයක් තුළ සාමසර කන්ද නාය යෑම නිසා ඇති වූ මහා ඛේදවාචකය තුළින් විනාශයට පත් වුණු නිවෙස්වල ජනතාව වෙනුවෙන් අක්කර 35කට වැඩි ඉඩම් පරිත්‍යාගයක් කරමින් කබීර් හෂීම් පවුල ලොකු සේවාවක් ඉෂ්ට සිද්ධ කළ බව. ඒ කාරණා දෙකම මතක් කරමින්, NBRI එකට නෛතික ශක්තියක් ලැබෙන අවස්ථාවේදී ඉදිරියටත් විශිෂ්ට සේවාවක් ඉෂ්ට කරන්නට එම ආයතනයට හැකියාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, මේ අවස්ථාවේදී ජාතික වශයෙන් වැදගත් වන කරුණු කිහිපයක් පිළිබඳව කරුණු දක්වන්නට අදහස් කරනවා.

එක්ස්ප්‍රස් පර්ල් ඛේදවාචකය ගැන අපි හැමෝම දන්නවා. ශ්‍රී ලංකාවේ අධිකරණය X-Press Feeders ආයතනයට තීන්දුවක් ලබා දුන්නා, මූලික වන්දියක් හැටියට ඇමෙරිකානු ඩොලර් බිලියනයක් -ඇමෙරිකානු ඩොලර් මිලියන 1,000ක්- ශ්‍රී ලංකාවට ලබා දෙන ලෙස. අද දවසේ මේ මොහොත වනවිට සිංගප්පූරුවේදී එම ආයතනය ඒ ගෙවීම් ක්‍රියාවලිය ප්‍රතික්ෂේප කරලා තිබෙනවා. අපි හැමෝම දන්නවා, 2021 ජූනි මාසයේ සිදු වූ මෙම ඛේදවාචකය නිසා, මුහුදු ජලයට නයිට්‍රික් ඇසිඩ් leak වීම සිදු වුණු බව. ජීවිතවලට හානි කරන ඉතාම භයානක plastic pellets, hazardous goods, lead ingots, acids යනාදී වශයෙන් කන්ටේනර් 81ක අඩංගු ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් මුහුදට එක්වීම නිසා පරිසර විනාශයක් සිද්ධ වුණා. කටාර් රාජ්‍යයත්, ඉන්දියාවත් එම නැව ප්‍රතික්ෂේප කරනකොට අපේ රට ඒකට විවෘත කිරීම තුළින් බරපතළ ඛේදවාචකයක් සිද්ධ වුණා. එම අනතුරින් විපතට පත් වුණු ධීවර ප්‍රජාවට වන්දි ටික ලබා දෙන්න අදටත් බැරිවෙලා තිබෙනවා. එම නිසා මෙම X-Press Pearl ප්‍රශ්නයේදී අපි රටක් හැටියට එකට ඉඳගෙන එම හානිය සිද්ධ කරපු එම ආයතනයට විරුද්ධව ගත යුතු ඉහළම පියවර ගන්න කටයුතු කරන්නට ඕනෑ බව මම මේ අවස්ථාවේදී විශේෂයෙන් ප්‍රකාශ කරන්නට ඕනෑ.

ඊළඟට මම තවත් කාරණයක් කියන්න කැමැතියි. එන්.ජී. කමලාවතී මහත්මිය මේ රටේ ලක්ෂ 18ක් පමණ වූ ආබාධිත ප්‍රජාව වෙනුවෙන් 2025 සැප්තැම්බර් මාසයේ 19වැනි දා අධිකරණ කටයුත්තක් තුළින් ලොකු ජයග්‍රහණයක් ලැබුවා. ඒ තමයි, ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමයේ සභාපතිවරිය හැටියට එතුමිය මහව සිට වවුනියාව දක්වා ඇති දුම්රිය ස්ථාන අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘති නිරීක්ෂණය කරනකොට ආබාධ සහිත පුද්ගලයින්ට දුම්රියවල ගමන් කිරීමට ප්‍රවේශ පහසුකම් නිසි පරිදි සකස් වී නොතිබීම කියන කාරණය සම්බන්ධයෙන්. හැබැයි ඉතින්, ඒ පහසුකම් තිබෙන බවට බෝඩ් ලෑලි ගහලා ප්‍රදර්ශනය කරලා තිබුණා. නමුත් ඒ පහසුකම් තිබුණේ නැහැ. උදාහරණයක් හැටියට කිව්වොත්, විශේෂයෙන්ම ශ්‍රාවස්තිපුර දුම්රිය ස්ථානය තුළ එම අයිතිවාසිකම් කඩවන පරිදි තමයි ඉදිකිරීම් සිද්ධවෙලා තිබුණේ. නමුත්, එතුමියට අධිකරණ ක්‍රියාදාමයට යන්න වුණේ ඇයි? ජනාධිපතිවරයාට ලියුම් ලිව්වා; මානව හිමිකම් කොමිසමට ගියා; අදාළ බලධාරින්ව දැනුවත් කළා. නමුත්, ඒ කිසිවකින් ප්‍රයෝජනයක් නැති වුණු මොහොතක එතුමිය අධිකරණයට ගියා. එතකොට අධිකරණය තීන්දු කළා, ඒ මහත්මියගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිද්ධ වෙලා තිබෙනවා, ඒ නිසා රුපියල් ලක්ෂයක වන්දි මුදලක් ලබා දෙන්න කියලා. මම මේ කාරණාව මේ අවස්ථාවේදී කිව්වේ විශේෂයෙන්ම අපි සංවේදී වෙන්නට ඕනෑ, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කටයුතුවලදී ආබාධිත ප්‍රජාවට නිසි පහසුකම් සැලසෙන පරිදි එම ඉදිකිරීම් කරන්නට. දුම්රිය ස්ථානවල පමණක් නොවෙයි, සෑම ඉදිකිරීමකදීම මේ ප්‍රතිපත්තිය අනුගමනය කිරීම අතිශයින්ම වැදගත් බව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා.

ඒ වාගේම මම මේ අවස්ථාවේදී පාරිසරික ප්‍රශ්නයකුත් යොමු කරන්නට කැමැතියි. විශේෂයෙන්ම අපි හැමෝම දන්නවා, අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අඹන්පොල සහ ගල්ගමුව දුම්රිය ස්ථාන අතර ගැටදිවුල, කාසිකොටේ ප්‍රදේශයේ අලින් එහාට මෙහාට මාරු වන ස්ථානයක් තිබෙන බව. 2024 මාර්තු 01වැනි දා තමයි අලින් මාරු වන එම ස්ථානයේ පළමු වනජීවී උමං මාර්ගය ආරම්භ කරන්නට වැඩකටයුතු ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. එහි ඡායාරූප දෙකක් මා විසින්ම ගත්තා.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

මෙන්න මේක තමයි අද තත්ත්වය. දැන් එහි වැඩකටයුතු ඇනහිටලා තිබෙනවා. මම හිතන විධියට, ලංකාවේ පමණක් නොවෙයි, ලෝක ප්‍රකට කාවන්තිස්ස ඇතා වාගේම මානාහරණ ඇතා ඇතුළු ඇතුන් ගණනාවකගෙන් සමන්විත වූ විශාල අලි රංචුවක් එතැනින් එහාට මෙහාට යනවා. රේල් පාර උඩින් තමයි ඒ අලි රංචුව යන්නේ. ඒ නිසා විශේෂයෙන්ම ඒ අදාළ අමාත්‍යවරයාගෙන් මම ඉල්ලීමක් කරනවා, මේ ඇනහිටලා තිබෙන ලංකාවේ පළමු වනජීවී උමං මාර්ගය නැවතත් ස්ථාපනය කරන්න කියලා.

මම තව කාරණයක් කියන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සංවර්ධන නිලධාරින් පිළිබඳව අදහස් කිහිපයක් පළ වුණා. මමත් ඒ පිළිබඳව කථා කරපු ප්‍රමුඛයෙක් හැටියට කරුණු කිහිපයක් කියන්න ඕනෑ. ඇත්තවශයෙන්ම අධිකරණයේ සමථකරණ තීන්දුවක් ආවා, ඒ 16,600ක් වන ගුරු සංවර්ධන නිලධාරින් වෙනුවෙන්. ඒ අය විශාල කැප කිරීමක් කරලා තිබෙනවා, අවුරුදු ගණනාවක්. කොරෝනා -කොවිඩ්- සමයේ, රට බංකොලොත් වුණු අවස්ථාවලදී දුවා දරුවන්ට නිදහස් අධ්‍යාපනය ලබා දීම සඳහා 16,600ක් ඒ කැපකිරීම් කළා. එතකොට; ඒ දරුවන්ට උගන්වන කොට මේ අය සංවර්ධන නිලධාරින්ද, නැද්ද කියලා හොයලා බැලුවේ නැහැ; ඒ අය ගුරු සේවයේ හිටියාද, නැද්ද කියලා බැලුවේ නැහැ. ඒ කාලවලදී ළමයින්ට උගන්වන්න මේ අය හොඳයි. හැබැයි, රජය අපොහොසත් වෙලා තිබෙනවා, එදා අධිකරණය ලබා දුන්නු සමථකරණ තීන්දුව ක්‍රියාත්මක කරන්න. මොකක්ද මේ සමථකරණ තීන්දුව? අභ්‍යාසලාභී ගුරුවරයෙක් හැටියට -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු විපක්ෂ නායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට තව විනාඩියක් දෙන්න.

2 II ශ්‍රේණියට බඳවා ගෙන, අවුරුදු තුනක් ඇතුළත postgraduate diploma එකක් කරලා අභ්‍යාසලාභී ගුරුවරයෙක් හැටියට ගුරු සේවයට අන්තර්ග්‍රහණය වෙන්න පුළුවන්. පූර්වාදර්ශ තිබෙනවා. 2004ට පෙර කර තිබූ උපාධිධාරි පත්වීම් සියල්ලක්ම 2005න් පස්සේ ගුරු සේවයට අන්තර්ග්‍රහණය කළා. ඒ නිසා අපි හැමෝම අවබෝධ කර ගන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. එදා විපක්ෂයේ ඉන්න කොට ගුරු ක්ෂේත්‍රයේ සංවර්ධන නිලධාරින් වෙනුවෙන් ඒ නැඟු හඬ අද ක්‍රියාවට නංවන්න ඕනෑ. අපි පැහැදිලිව කියනවා, සමථකරණ තීන්දුව අනුව, වසර තුනක postgraduate diploma එකක් ක්‍රියාත්මක වෙන අතරතුර මේ ගුරු සංවර්ධන නිලධාරීන්ව 2 II ශ්‍රේණියට ඇතුළත් කරන්න පුළුවන් කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු විපක්ෂ නායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එදා විදුලිබල ක්ෂේත්‍රයේ සේවකයන් 23,000ක් මහ පාරට බැස්සපු අය අද කියනවා, ඒ මාතෘකාව අදාළ නැහැ කියලා. ඒ අය කියනවා, මරන්නත් ලැහැස්තියි ලු, මැරෙන්නත් ලැහැස්තියි ලු, ආණ්ඩුව රැක ගන්න. ලක්ෂයක් වුණත් මරන්නත් කැමැතියි ලු. ඔන්න කථා! මෙතැන අපි හැමෝගේම වගකීම ඝාතනය නොවෙයි, මිනිසා ජීවත් කරවීම. අපි හැමෝම කියනවා, විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රතිව්‍යුහගත කිරීමක් සිදු විය යුතුයි කියලා. හැබැයි, එය සිදුවිය යුත්තේ අර 23,000කගේ රැකියා ආරක්ෂා කරගෙනයි.

පසුගිය දවසක IMF එකේ finance team එක ලංකාවට ආවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු විපක්ෂ නායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කබීර් හෂීම් මැතිතුමා මේකට සාක්ෂි දරනවා. අපි කෙළින්ම IMF එකට කිව්වා, "ඔව්, ප්‍රතිව්‍යුහගත කිරීම් - restructuring - කෙරෙන්නට ඕනෑ. නමුත් 23,000කගේ රැකියා ආරක්ෂා කරමින් තමයි ඒ කටයුතු ඉෂ්ට සිද්ධ වෙන්න ඕනෑ" කියලා. ඒ දේ ඉෂ්ට සිද්ධ කරන්න අද ආණ්ඩුව අපොහොසත් වෙලා තිබෙන මොහොතක මම කියන්න කැමැතියි, විදුලිබල ක්ෂේත්‍රයේ ඒ 23,000 අමතක කරන්නට එපා; ගුරු ක්ෂේත්‍රයේ සංවර්ධන නිලධාරින් 16,600 අමතක කරන්නට එපා කියලා. ඔබතුමන්ලා විපක්ෂයේ ඉන්න කාලයේ ඒ අය වෙනුවෙන් කියපු කථා ඒ පොරොන්දු වුණු ආකාරයට දැන් ආණ්ඩු බලය තිබෙන මොහොතක කරුණාකරලා ක්‍රියාවට නංවන්නට කටයුතු කරන්න කියලා රජයෙන් ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මංජුල සුරවීර ආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.52]

**ගරු මංජුල සුරවීර ආරච්චි මහතා**
(மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විශේෂ දවසක්. ජාත්‍යන්තර සංඥා භාෂා දිනය අදට යෙදිලා තිබෙනවා. ප්‍රථමයෙන්ම, සංඥා භාෂාව හරහා නිහඬ සන්නිවේදනයක් තුළින් ලෝකය ගළපා ගෙන ජීවිතය ගත කරන්න අරගළ කරන පුරවැසි සමූහයට අපේ ගෞරවනීය ප්‍රණාමය පුද කරන්න කැමැතියි.

ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය වසර 40ක කාල සීමාවක් කැබිනට් තීන්දුවක් හරහා එහේට දෝලනය වෙමින්, මෙහේට දෝලනය වෙමින් ගිය ආයතනයක්. ඒ ආයතනය සඳහා යම්කිසි නීතිමය ස්ථාවර තත්ත්වයක් ඇති කිරීමට පනතක් සම්මත කරන අද දිනයේ මටත් කථා කිරීමට අවස්ථාව ලැබීම ඉතාම ඓතිහාසික අවස්ථාවක්.

විශේෂයෙන්ම ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය අරමුණු කිහිපයක් මුල් කරගෙන තමයි, මේ වෙනකොට රට පුරා ක්‍රියාත්මක වෙන්නේ. ගොඩනැඟිලි ද්‍රව්‍ය පර්යේෂණ හා පරීක්ෂණ අංශය, පරිසර අධ්‍යයනය සහ සේවා අංශය, භූ තාක්ෂණික ඉංජිනේරු සේවා හා පරීක්ෂණ අංශය, මානව ජනාවාස සැලසුම් සහ පුහුණු අංශය, නාය යාම් සහ පර්යේෂණ සහ අවදානම් කළමනාකරණ අංශය, ව්‍යුහාත්මක ඉංජිනේරු

අංශය ආදී වශයෙන් අංශ කිහිපයක් ඔස්සේ ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය රට පුරා ක්‍රියාත්මක වෙනවා. අපි දන්නවා, මේක ඉතාම දුෂ්කර කොන්දේසි යටතේ වැඩ කරන ආයතනයක් බව. පළමුවෙන්ම එහි කාර්ය මණ්ඩලයට අපගේ ගෞරවනීය ස්තුතිය පුද කරන්න ඕනෑ. ඒකට හේතුව තමයි, ඉංජිනේරු විද්‍යාව, භූ තාක්ෂණ විද්‍යාව, ගෘහ නිර්මාණ ශිල්පය, නගර සැලසුම්කරණය ආදී විෂය ප්‍රාමාණික දැනුමක් සහිත උපාධිධාරීන් 138ක් එකතු වෙලා, 350ක් වෙච්ච කාර්ය මණ්ඩලයක් සමඟ මෙම ආයතනය ඉතා අසීරුතා මැද තමයි, නාය යාම් සහ මේ රටේ සිදුවන ආපදා තත්ත්ව කළමනාකරණය කර ගනිමින්, මිනිස්සුන්ට ජීවිතය දෙන්න උත්සාහ කරමින් ඉන්නේ. මේ පනත් කෙටුම්පත සම්මත කරන මේ මොහොත වන විට, අපි එහි අඩුපාඩු කිහිපයක් දකිනවා. විශේෂයෙන්ම ස්වයං අරමුදල් උත්පාදනය කර ගනිමින් තමයි මෙම ආයතනය පවත්වාගෙන යන්නේ. ඒ නිසාම පර්යේෂණ හා තාක්ෂණික උපදෙස් සැපයීම හරහා, විශේෂයෙන් රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය වෙනුවෙන් උපදෙස් සැපයීම හරහා ඔවුන් අරමුදල් උපයා ගනිමින් පුනරාවර්තන වියදම් සපුරා ගන්නා ආයතනයක් බවට මෙය පත් කරලා තිබෙනවා. විශේෂයෙන් නාය යාම් අවදානම් දිස්ත්‍රික්ක 14ක් ඇතුළේ පැතිරිලා තිබෙන බෙදවාචකය නිසා, ඒ වාගේම මිනිස් ක්‍රියාකාරකම් හා සොබාදහමේ සිදු වන ක්‍රියාකාරකම් නිසා ශ්‍රී ලංකා භූමියෙන් සියයට 30ක් අවදානම් කලාපයක් බවට පත් වෙලා තිබෙනවා.

2024 වර්ෂයට අදාළව ගත්තොත්, මුළු රටේම නාය යාම් 1,252ක් සිද්ධ වෙලා තිබුණා. එයින් මා නියෝජනය කරන නුවරඑළිය දිස්ත්‍රික්කයේ නාය යාම් 41ක් වාර්තා වුණා. අපි දන්නවා, මේ වෙනකොට 2024 වසරට අදාළව නිවාස හා ගොඩනැඟිලි 1,602ක් අහිමි වෙලා තිබෙන බව. එහෙම නැත්නම් විනාශ වෙලා තිබෙනවා, දේපළ හානි වෙලා තිබෙනවා. ඒ වාගේම මේ ආයතනයට පැවරිලා තිබෙන වැඩ රාජකාරි කර ගන්න ගියාම බාධා ගොඩක් තිබෙනවා. එකක් තමයි, සේවක හිඟය. ඒකට අදාළ ප්‍රවීණ සේවකයන්ගේ පුරප්පාඩු තිබෙනවා. අනෙක් පැත්තෙන් උපකරණවල හිඟයක් තිබෙනවා. මෙන්න මේ වාගේ කාරණා ගොඩක් තිබෙනවා. විශේෂයෙන්ම මතු කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ඒ තමයි, නුවරඑළිය දිස්ත්‍රික්කයේ ආපදා කළමනාකරණ ආයතනයට 2025 අවුරුද්දේ අයදුම්පත්‍ර 131ක් යොමු කරලා තිබෙනවා. නමුත්, මේ වෙනකොට ඊට අදාළ නිසි පරීක්ෂණ කරලා, අදාළ වාර්තා දෙන්න සමත් වෙලා තිබෙන්නේ 38කට විතරයි. එතකොට 93ක් තවම දෙන්න බැහැ, pending තිබෙන්නේ.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ මේ නාය යාම්වලට ලක් වෙලා තිබෙන්නේ තනි තනි පවුල් නොවෙයි, ගම්මාන විධියටයි. එක්කෝ ලයින් කාමර විධියටයි. එක ලයින් කාමර පේළියක පවුල් 50ක්, 60ක් ජීවත් වෙනවා. එතකොට එය සංඛ්‍යාව අතින් කුඩා වුණාට ප්‍රමාණය අතින් අතිවිශාලයි. විශාල පරාසයක් තුළ මේ විනාශය පැතිරෙමින් තිබෙනවා. ඒ නිසා අපි එක පැත්තකින් අද සතුටු වෙනවා, මේ ආයතනය පනතක් හරහා ස්ථාපිත කරලා, ස්ථාවර කරලා, රටේ ජනතාවට බියෙන් සැකයෙන් තොර ජීවිතයක් ලබා දෙන්න අදාළ මැදිහත්වීම කරන්න, මේ ආයතනයට ශක්තිය ලබා දීම සම්බන්ධයෙන්.

අපි දැක්කා, මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අදාළ විෂය මූලිකව අපේ අමාත්‍යවරුන් කිහිපදෙනෙක් ඉතා මැනවින් පැහැදිලි කරලා දුන්නා. මේ වාගේ වටපිටාවක් ඇතුළේ අපි ආණ්ඩුව විධියට රටේ ජනතාවට වග කියන්න තමයි බලය අරගෙන තිබෙන්නේ. අපෙන් අහනවා, මොනවාද කළේ කියලා. මම කියන්නම්. මේ අපිළිවෙළට, අසංවිධානාත්මකව, ජනතාවට විවිධාකාරයෙන් පීඩා ගෙන ආපු අණපනත් සියල්ල වෙනස් කරන්න, 2025 වසර තුළ අපි මේ පාර්ලිමේන්තුව තුළදී සමත් වෙලා තිබෙනවා.

ඔබට මතක නම්, විපක්ෂයේ කෙඳිරිගාන මේ සමහර මන්ත්‍රීවරුන් පසුගිය දවස්වල කෙඳිරි ගගා අඬන්න එක් හේතුවක් තමයි, ජනාධිපතිවරයන්ගේ හිමිකම් (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවේ සම්මත කිරීම. අපි මොනවාද කළේ කියලා අහනවා නේ. ඔන්න කරපු ඒවා. ඒ වාගේම, සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පත ගෙනාවා; සම්මත කළා. ඒ වාගේම යන එන මං නැතුව ඉන්න විපක්ෂය මේ මොහොතේත් එල්ලෙන්න හදන, බිල්ලෝ මවන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත ගෙනාවා. විදුලිබල මණ්ඩලය කැබැලි කරලා විකුණන්න හදපු, 23,000ක් සේවකයන්ගෙන් 11,000ක් එළියට දාන්න හදපු පනත අහෝසි කරලා සංශෝධන 21ක් සහිතව පනත සම්මත කරලා සේවකයන්ටත්, ජනතාවටත් හිතකර විධියට, ඒ වාගේම රටේ බලශක්තිය, විදුලි බලය සියයට 100ක් රජය සතුව, භාණ්ඩාගාරය සතුව තියාගෙන සමාගම් බවට පත් කරලා ඒ ආයතනය රැක ගන්න අපි කටයුතු කර තිබෙනවා. කංචනලාගේ ඒ කුට උපක්‍රමවලින් අපි ඒ ආයතනය බේරාගෙන තිබෙනවා. ඒ වාගේම අපි සම්මත කළා, 2025 අංක 15 දරන සමෘද්ධි (සංශෝධන) පනත, 2025 අංක 13 දරන විනිමය පත්‍ර (සංශෝධන) පනත, 2025 අංක 12 දරන සමාගම් (සංශෝධන) පනත, 2025 අංක 11 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත, 2025 අංක 7 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත, 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත ආදිය. ඒ පනත, මේ වෙලාවේ ගොඩක් දේවල් මතු කර ගන්න පුළුවන් පනතක්. මේ වාගේ පනත් විශාල ප්‍රමාණයක් අපි සම්මත කරගෙන තිබෙනවා. ඒ ඔක්කෝම ජනතාව වෙනුවෙන් තමයි කළේ.

රට වෙනුවෙන් අපි ඒ වාගේ දැවැන්ත වැඩ කොටසක් කරමින් ඉන්න වෙලාවක, විශේෂයෙන්ම කඩා වැටුණු, විනාශ කරපු මේ සමාජයට නැවත පන්නරයක් දෙන්න, සමාජය නිවැරදි තැනට ගන්න, අයිස්, කුඩු, මත්ද්‍රව්‍ය රටින් තුරන් කරලා දරුවන්ට රටක්, හෙටක් හදන්න උත්සාහ කරමින් ඉන්න වෙලාවක, පාතාලය හා නීති විරෝධී ආයුධ සහ ගනුදෙනු, ගිනිකෙළි, ගිනි අවි ජාවාරම් නැවැත්වීමට කටයුතු කරමින් ඉන්න වෙලාවක, වංචා දූෂණ, හොරකම්, නාස්තිය නවත්වමින් රට හදන්න කටයුතු කරමින් ඉන්න වෙලාවක, විශේෂයෙන්ම ඩොලරය ස්ථාවර කරමින් ආයෝජකයන් කැඳවා ගනිමින්, සංචාරක ක්ෂේත්‍රය දියුණු කර ගනිමින්, යටිතල පහසුකම් දියුණු කරමින්, නීතියේ විධානයේ ආධිපත්‍යය තහවුරු කර ගනිමින්, රටේ ආර්ථික, දේශපාලන ස්ථාවරත්වය ගොඩනගමින්, ජනතාවට ජීවිතය දෙන්න උත්සාහ කරන වෙලාවක විපක්ෂය ආණ්ඩුවට විරුද්ධව කටයුතු කරමින් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ වෙලාවේ මතක් වෙනවා, අලි බාබා සහ හොරු හතළිහේ කථාව. විපක්ෂයේ ඉන්න පක්ෂ සහ සංවිධාන 40ක් එකතු කරගෙන කුඩා ගෙවල් ඇතුළට, ශාලා ඇතුළට එකතු වෙලා, අපි මේ කරන සෑම ක්‍රියාවකටම එරෙහිව එයාලා නඟන එකම අදෝනාව, ආණ්ඩුව පැන්නිය යුතු බවයි. ඒක තමයි එකම අරමුණ. කුඩු, අයිස් නවත්වන්න කටයුතු කරන කොට, "ආණ්ඩුව පන්නමු!" කියනවා. පාතාලය නවත්වන්න හදන කොට, "ආණ්ඩුව පන්නමු!" කියනවා. වංචා දූෂණ, හොරකම් නවත්වමු කියන කොට, "ආණ්ඩුව පන්නමු!" කියනවා. මෙන්න මේ වාගේ විපක්ෂයක් තමයි අද අපට ඉන්නේ. නමුත් අපි කියන්න කැමැතියි, ජනතාව ලබා දුන් ජන වරමට අබමල් රේණුකින්වත් පිට යන්නේ නැතුව ඒ ජන වරමට අදාළව, ඒ ප්‍රතිපත්ති මාලාවට වග කියමින් අපි අනිවාර්යයෙන් කටයුතු කරන බව. මේ රට අයාලේ ගිය රටක්; විනාශ කරපු රටක්; හොරුන්ගේ පාරාදීසයක් බවට පත් කරලා තිබුණු රටක්. එහෙව් රට නිවැරදි මාවතට ගෙන යන්න ඉදිරි වසර 5 තුළ ජාතික ජන බලවේගය ආණ්ඩුව කටයුතු කරනවා. ගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලය ඇතුළු මන්ත්‍රී මණ්ඩලය වාගේම මින් පිටත වැඩ කරන ජාතික ජන බලවේගයේ සියලුදෙනා එකතු වෙලා ප්‍රගතිශීලී, දේශප්‍රේමී ජනතා බලවේග එකතු කරගෙන මේ රට හදන ගමන නොනවත්වා ඉදිරියට ගෙන යන බව ප්‍රකාශ කරමින් මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් මූලාසනයට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ප්‍රගීත් මධුරංග මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.02]

**ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පිහිටුවීමට අදාළ විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදයේදී කථා කිරීමට අවස්ථාවක් ලබා දීම ගැන ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

මා කථාව පටන්ගන්න ඉස්සර වෙලා මුලින්ම සුබ පැතීමක් කරන්න කැමැතියි. මේ ගරු ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වසර 30කට අධික කාලයක් සේවය කර අද දින විශ්‍රාම යන අධ්‍යක්ෂ (පරිපාලන), උදය මුණසිංහ මහත්මයාට මාගේ ශුභාශිංසන පිරිනමනවා. එතුමා කොළඹ නාලන්දාවේ ආදි ශිෂ්‍යයෙක්. ඒ වාගේම, විශේෂයෙන්ම දසවන පාර්ලිමේන්තුවේ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා පවත්වාගෙන යෑම සඳහා මනා සම්බන්ධීකරණයක් සපයමින්, සියලු ගරු අමාත්‍යවරුන්ට සහ ගරු මන්ත්‍රීවරුන්ට කාරක සභාවල කටයුතු ඉතා සුමටව කරගෙන යෑම සඳහා මහඟු පිටිවහලක් ලබා දුන් නිලධාරියෙක්. එතුමා හෙට දිනයේ සිට ආරම්භ කරන විශ්‍රාම දිවියට සහ හෙට දින යෙදෙන එතුමාගේ උපන්දිනයට මම විශේෂ ශුභාශිංසන එකතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ NBRO එක NBRI කරද්දී ඒ ගැන කථා කරන්නට ලැබීම ගැන මම බෙහෙවින්ම ආඩම්බර වෙනවා. මොකද, ශ්‍රී ලංකාවේ safety කියන විෂයය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන, විශේෂ ළැදියාවක් ඇති පුද්ගලයෙකු විධියට මේ සම්බන්ධව කථා කරන්නට ලැබීම මා ලද මහඟු අවස්ථාවක් බව මම හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය පිහිටුවා වසර 40කට වැඩි කාලයක් වෙනවා. නමුත්, පාර්ලිමේන්තුවෙන් ඒකට අවශ්‍ය කරන නීතිමය සුජාතභාවය මේ වනකල් ලබා දීලා තිබුණේ නැහැ. අන්න ඒ නීතිමය සුජාතභාවය එම සංවිධානයට ලබා දීලා ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පිහිටුවීම සඳහා අවශ්‍ය පනත් කෙටුම්පත සම්මත කිරීම තමයි අද මේ සිදු කරන්නේ.

අද උදේ සිට අපට ඇහුණා විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු කෙඳිරි ගානවා. ආණ්ඩුවට දැන් අවුරුද්දකුත් වෙලා, අරක කරන්න, මේක කරන්න කියලා ඒගොල්ලන් අපට උපදෙස් දෙනවා. අවුරුදු 40ක් තිස්සේ ආණ්ඩු කරපු කට්ටිය තමයි ඒ කෑ ගහන්නේ. නමුත්, ලංකාවේ safety ක්ෂේත්‍රය ගත්තාම, ඒ ක්ෂේත්‍රයේ වැඩ කටයුතු කරගෙන යන්නට, ලංකාවේ සුරක්ෂිතතාව ඇති කරන්නට මහඟු සම්පතක් වෙච්ච මේ වාගේ ආයතනයක් regulate කරන්න අවශ්‍ය පනත් කෙටුම්පත සම්මත කර දෙන්න අවශ්‍ය විධිවිධාන සලස්වන්නේ නැතිව ඒගොල්ලන් මේ අවුරුදු 40ක කාලය ගත කර තිබෙනවා. මේ අය ඒකටත් අසමත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත සම්මත කළාට පස්සේ, එම ආයතනයට නීතිමය සුජාතභාවයක් ලැබුණාට පස්සේ, safety සම්බන්ධ වැඩ රාජකාරි රාශියක් කරන්න ඒ ආයතනයට පුළුවන්. මේ ආයතනය ගත්තාම, building material testing, air, water, noise, vibration and environmental monitoring and geotechnical engineering testing වාගේ විශාල වැඩ රාජකාරි රාශියක් කරන්න පුළුවන් ආයතනයක්. නීතිමය වශයෙන් පනතක් සම්මත කර තිබුණේ නැති නිසා, එම ආයතනයෙන් ඒ වැඩ කටයුතු කරගෙන යද්දී එම ආයතනය ලබා දෙන උපදෙස් ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය ආයතන සහ පළාත් පාලන ආයතනවලට අදාළව නිසි පරිදි නියාමනයක් කරන්න එම ආයතනයට හැකියාවක් ලැබුණේ නැහැ. ඒ කටයුතු නිසි පරිදි නොවීම නිසා පසු ගිය කාලයේ විශාල වශයෙන් එහි වින්දිතයන් බවට පත් වුණේ අප ආදරය කරන අපේ මහ ජනතාවයි. මොකද, safety නැති තැන් හරියට mapping කරලා, භූ තලයේ අස්ථාවරත්වයක් තිබෙන තැන් mapping කරලා, ඉදිරියේදී ඒවායේ structures හදන්න ඕනෑ කොහොමද, ඒවායේ stability එක ඇති කරන්න ඕනෑ කොහොමද කියන නියාමනය කරන්නට තිබෙන ආයතනයට අවශ්‍ය බලතල නොතිබීම, පසුගිය කාලයේ නවත්වා ගන්නට සහ අවම කර ගන්නට තිබුණු අනතුරු විශාල වශයෙන් වැඩි වෙන්න බලපෑවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතාවාදී ආණ්ඩුවක් හැටියට අපට ඕනෑ යම්කිසි සිද්ධියක් වුණාට පස්සේ ඒකට reactive වැඩ කරන්න නොවෙයි. යම් දෙයක් වෙන්න කලින් proactive ලෙස ඒකට අවශ්‍ය විධිවිධාන සලස්වා ගැනීම තමයි අපට අවශ්‍ය වෙන්නේ. අන්න ඒ නිසා තමයි ඒ ආයතනයට අවශ්‍ය නීතිමය වටපිටාව සකසා දීම සඳහා මේ පනත් කෙටුම්පත සම්මත කරන්නේ.

මේ ආයතනයට අපි විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මොකද, මේ ආයතනය ආරක්ෂාව පැත්තෙන් විශාල දේවල් කරපු, කරගෙන යන සහ ඒ සඳහා දැඩි ශක්‍යතාවක් තිබෙන ආයතනයක් නිසා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ දැන් තිබෙන trend එක බැලුවාම විශාල වශයෙන් කාලගුණික, දේශගුණික විපර්යාසවලට ලෝකය මුහුණ දෙමින් පවතිනවා. මේ රට කාලගුණික, දේශගුණික විපර්යාසවලට මුහුණ දෙද්දී, මේක තමයි landslides regulate කරන්න තිබෙන ප්‍රධානම ආයතනය. ඊට අමතරව මේ ආයතනයට තිබෙන ශක්තිය එක්ක අපට විශාල දෙයක් සමාජයට දෙන්නට පුළුවන්. ඉදිරියේදී ඇති වෙන්නා වූ ස්වාභාවික අනතුරු අවම කර ගන්න සහ ඒ ස්වාභාවික අනතුරුවලින් සිදු වෙන්නා වූ දේපළ හානි, ජීවිත හානි අඩු කර ගැනීම සඳහා විශාල ශක්තියක් මෙම ආයතනය තුළින් අපට ලබා ගන්න පුළුවන්. ඒත් එක්කම නාය යෑම්වලට නැඹුරුතාවක් ඇති ප්‍රදේශවල, භූ තාක්ෂණික තත්ත්වයේ අස්ථාවරත්වයක් ඇති ප්‍රදේශවල, ඒවායින් වන බලපෑම අවම කර ගැනීම සඳහා අවශ්‍ය වැඩ කටයුතු කර ගන්නටත් මේ ආයතනය මඟින් ඉදිරියේදී මෙච්චර කාලයක් කළාට වඩා වැඩි වැඩ කොටසක් කර ගැනීමටත් අපට හැකියාව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආයතනයේ තිබෙනවා, Research and Development - R&D - Unit එකක්. මේ Unit එක හරහා, ඉදිරියේදී දේශගුණික, කාලගුණික විපර්යාසවලදී සිදු වන භූ අස්ථාවරත්වය සම්බන්ධවත්, නාය යෑම් සම්බන්ධවත් proactive decisions අරගෙන, ඒ research and development හරහා සමාජයට විය හැකි අනතුරු අවම කර ගැනීමට, mitigate කර ගන්නට පුළුවන්; ඒ සඳහා අපට මේ ආයතනය ඉතාම හොඳින් යොදා ගන්න පුළුවන්. ඒ සඳහා මේ ආයතනයට නීතිමය සුජාතභාවය අවශ්‍යයි. අන්න ඒක ලබා දීම සඳහා තමයි අපි අද මේ පනත් කෙටුම්පත සම්මත කරන්නේ. මේ ජනතාවාදී රජය අපි කියපු විධියටම, අපට ජනතාවගේ mandate එක තිබෙන විධියටම ජනතාවට අවශ්‍ය කරන, ජනතාවට යහපතක් වන ආකාරයේ

පනත් කෙටුම්පත් ඉදිරියේදීත් සම්මත කරනවා. දැන් විපක්ෂයේ ඉන්න අය පසුගිය කාලය පුරාම ආණ්ඩු පක්ෂයේ තමයි හිටියේ. අවුරුදු 40ක් තිස්සේ මේ ආයතනයට නීතිමය තත්ත්වයක් අරගෙන දුන්නේ නැතිව, තවත් එක එක ඒවා දැන් අපට උගන්වන්න එන්න අවශ්‍ය නැහැ. අපි කරන්නේ මොකක්ද කියලා දන්නවා. යන්නේ කොහේද කියලා අපි දන්නවා. ජනතාව වෙනුවෙන් කරන්න ඕනෑ මොකක්ද කියලාත් මේ රජය දන්නවා. ඒ වැඩ කටයුතු කරමින් පොහොසත් රටක් හදලා, ඒ රට තුළ අපේ මිනිස්සුන්ට ලස්සන ජීවිතයක් ගත කරන්න පුළුවන් ආකාරයට මේ රට හදලා දෙනවා කියන පොරොන්දුව දෙමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.10]

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පිහිටුවීමේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම පිළිබඳව ඉතාම සතුටින් මම අද වචන කිහිපයක් කථා කරන්න කැමැතියි. මට මතක විධියට, මේ පනත් කෙටුම්පත 2019දී කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළේ ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා. එවකට හිටපු අමාත්‍යවරයා හැටියටයි එතුමා මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ. මම හිතන විධියට 1980 ගණන්වල රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා පළමුවෙන්ම NBRO සංකල්පය ලංකාවේ ආරම්භ කළා. ඒ නිසා අද මේ ආයතනය නීතිගත කරන එක ඇත්තටම වැදගත් දෙයක්. ඒකට අපි රජයට ස්තුති කරනවා.

මේ ආයතනයේ පරමාර්ථ 3ක් තිබෙනවා. ඒවා ඉතා වැදගත් පරමාර්ථ. මේ වාගේ ආයතනයක් පිහිටුවන්න ඕනෑ ඉදිකිරීම් කරන අයට තහංචි දාන්න නොවෙයි, ඒවා පහසු කරලා දෙන්නයි. ඒ නිසා ඒ වෙනුවෙන් කාලසීමාවක් ඇති කරන්න කියලා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ කියන්නේ, සති දෙකකින් හෝ ඒ අවසරය ලබා දීමේ වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. නැත්නම් මේක බාධාවක් වෙනවා සාමාන්‍ය පොදු ජනයාට.

මම මේ ගැන අද විශේෂයෙන්ම කථා කරන්නේ හේතු කිහිපයක් පදනම් කරගෙනයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන අපේ ගරු සුජිත් සංජය පෙරේරා මැතිතුමාත් සභාවේ ඉන්නවා. අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන ආණ්ඩුවේ පරිසර අමාත්‍ය ගරු දම්මික පටබැඳි මැතිතුමාත් මේ මොහොතේ සභාවේ ඉන්නවා. අපේ දිස්ත්‍රික්කය නාය යෑම්, ගංවතුර ගැලීම් ඇතුළු ආපදා විටින් විට සිද්ධ වෙන දිස්ත්‍රික්කයක්. මේ ආපදා අපේ දිස්ත්‍රික්කයේ සිටින ජනතාවගේ ජීවිතවලට ලොකු හානියක්. දෙවැනි කාරණය හැටියට ඔබතුමන්ලාටත් මතක ඇති, 2017 වසරේ අරණායක ප්‍රදේශයේ සිදු වූ සාමසර කන්ද නාය යෑම. එදා මම රජයේ ඇමතිවරයකු හැටියට හිටියේ. ඒ නාය යෑමෙන් විශාල පිරිසක් මිය ගියා. ඒ ආපදාව නිසා අවතැන් වූ පවුල් සිය ගණනක් පීඩනයට පත් වුණා. කෑගල්ල දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් මම අද කථා කරන තුන්වැනි කාරණය මෙයයි. පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නන්ද බණ්ඩාර මන්ත්‍රීතුමා අද දිනයේ මේ සභාවේ නැහැ. එතුමා පසුගිය රැස්වීම් සතියේදී - සැප්තැම්බර් 09වැනි දින - මේ සභාවේදී වාචික පිළිතුරු අපේක්ෂාවෙන් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් ඇසුවා. එහිදී ගරු නන්ද බණ්ඩාර මන්ත්‍රීතුමා දෙවැනි අතුරු ප්‍රශ්නයේදී අසා සිටියා, අරණායක ආසනයේ කුණු කසළ දැමීමට, කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් අක්කර 5ක ඉඩමක් ලබා දෙන්න පුළුවන් ද කියලා. එහිදී දෙබත්ගම වත්ත ගැන කථා කළා. ඇත්තටම දෙබත්ගම වත්ත කියන්නේ මගේ සීයාට අයිති ඉඩමක්. 1952 වර්ෂයේ ඒක පුණ්‍ය ආයතනයකට පරිවර්තනය කරලා ඊ.එල්.එම්. ඊබ්‍රහීම් ට්‍රස්ට් සහ එම්.එස්.එම්. සලීම් ට්‍රස්ට් කියන පුණ්‍ය ආයතන දෙකක් යටතේ නඩත්තු වෙනවා. මගේ මවත් ඒකට සම්බන්ධයි. ඒ ට්‍රස්ට් දෙක යටතේ තමයි ඒ කටයුතු කරන්නේ.

ගරු නන්ද බණ්ඩාර මැතිතුමා කසළ ප්‍රතිචක්‍රීකරණය සඳහා අක්කර 5ක් ගැන කථා කරලා තිබුණා. ගරු දම්මික පටබැඳි ඇමතිතුමාත් මේ සභාවේ ඉන්න නිසා මම මේ කාරණය කියන්නේ. මේ අක්කර පහ සම්බන්ධව තවම ප්‍රශ්නයක් තිබෙනවා. ඒකේ ඔප්පු ලබා ගැනීම පිළිබඳව ගැටලුවක් තිබෙනවා. නිහාල් සෙනෙවිරත්න අරණායක ප්‍රාදේශීය සභාවේ සභාපති හැටියට ඉන්න කාලයේ එතුමා 2020 වසරේ දෙබත්ගම වත්තේ අපේ පුණ්‍ය ආයතනයට ලියුමක් එවනවා, මේ සඳහා අක්කර 5ක් ඉල්ලලා. එතකොට අපේ වත්තෙන් සතියක් ඇතුළත ලියුමක් යවනවා, කිසිම අය කිරීමකින් තොරව අක්කර 5ක් ලබා දෙන්න අපි එකඟයි කියලා. වතු අධිකාරිතුමාත් මේකට අත්සන් කරලා තිබෙනවා. ඒක අපි පරිත්‍යාග කරනවා කියලාත් කියලා තිබෙනවා. මා ළඟ ඒ ලියුම් දෙකම තිබෙනවා. මම ඒවා **සභාගත*** කරනවා.

මේ ඉඩමේ ඔප්පුව ලියා ගන්න කටයුත්ත රජය විසින් කරන්න ඕනෑ දෙයක්. ඒක ප්‍රමාද වෙලා තිබෙනවා. ඒකට අවශ්‍ය කටයුතු අපෙන් කෙරෙන්න ඕනෑ නම් අපි ඒකත් කරන්න සූදානම්. හැබැයි, දිස්ත්‍රික් කමිටු රැස්වීමේදී මේ කාරණය සාකච්ඡා කරන්නත් පුළුවන් කියලා මම විශේෂයෙන්ම කියන්න කැමැතියි. රජයේ පවරා ගැනීමේ කටයුතු ප්‍රමාද වීම සාමාන්‍ය දෙයක්. අරණායක සාමසර කන්ද නාය යෑමෙන් සිය ගණනක් වූ ජනතාව අවතැන් වුණාට පසු, ඒ වෙලාවේ රජයේ ඇමතිවරයකු හැටියට කටයුතු කළ මම, නිල වශයෙන්, හැකි ප්‍රමාණයෙන් ඒකට සම්බන්ධ වෙලා උදව් කළා. මට මතකයි, රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා, ගයන්ත කරුණාතිලක මැතිතුමා ඇතුළු අපේ හිටපු ඇමතිවරු කණ්ඩායමක්ම ඒකට විශාල වශයෙන් උදවු කළා. ඒ අවතැන් වූ අයට - පවුල් දෙසිය ගණනකට - නැවත පදිංචි වෙන්න තැනක් නැති නිසා ඒ වෙලාවේ අපි ඉදිරිපත් වුණා, අපේ පවුලේ පුණ්‍ය ආයතනය යටතේ තිබෙන දෙබත්ගම වත්තෙන් අක්කර 30ක් ලබා දෙනවා කියලා. හිටපු ඉඩම් ඇමති ගයන්ත කරුණාතිලක මැතිතුමා යටතේ තමයි මේ ගැසට් නිවේදනය නිකුත් කරලා අපේ අක්කර 30 පවරා ගන්නේ. ගරු ඇමතිතුමනි, එම ගැසට් පත්‍රිකාවේ පිටපතක් මා ළඟ තිබෙනවා. මම ඒකත් **සභාගත*** කරනවා.

අවතැන් වූ අයට අපි ඒ අක්කර 30ත් ලබා දෙනවා, නැවත පදිංචි වෙන්න. ඒගොල්ලෝ දැන් පදිංචි වෙලාත් තිබෙනවා. හැබැයි, මේ ඔප්පු ටික අපෙන් තවම ඉල්ලලා නැහැ. අපි මේ ඉඩම නොමිලේ දීලා තිබෙන්නේ. මේක හදා ගන්න කටයුතු කරන්න. ඉදිරියේදීවත් ඒක හදා ගන්න කියලා මම ඉල්ලා සිටින්න කැමැතියි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු කබීර් හෂීම් මහතා]

ඒ වාගේම තමයි ගලිගමුවේ අපේ පෞද්ගලික ඉඩම්වලින් පන්සල්වලට, පාසල්වලට, සුසාන භූමිවලට අපි ඉඩම් දුන්නා. ගලිගමුවේ දොඩම්දෙනිය පන්සල තිබෙනවා. ඒකට අපි අක්කරයක් ලබා දුන්නා. ඒ ඉඩමේ ඔප්පුව ලියා ගන්න බැරුව ඒ ස්වාමීන් වහන්සේ මට කථා කළා. මම ඒකට අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා. හැබැයි, රජයේ උදවු ඕනෑ, ඒ ඔප්පු ටික හදාගන්න. ඒ සඳහා ඔබතුමන්ලාගේ මැදිහත් වීම මම විශේෂයෙන්ම බලාපොරොත්තු වෙනවා.

මම හිතනවා, මේ අවස්ථාවේදී මම මේකත් කියන්න ඕනෑ කියලා. මොකද, මේක වැදගත් කාරණයක්. ඉදිරියේදීත් අපේ දිස්ත්‍රික්කයේ ඇති වන නාය යෑම්, ගංවතුර ගැලීම් ඇතුළු ඒ ආපදා තත්ත්ව පිළිබඳව අපි මීට වඩා අවධානය යොමු කළ යුතුයි කියන එකත් විශේෂයෙන් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.16]

**ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයට අදාළ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් විවාද කරන මේ අවස්ථාවේදී අපි ඇත්තවශයෙන්ම තේරුම් ගන්න ඕනෑ කාරණය තමයි මේ ආයතනය නීතිගත නොවී ඉතා දීර්ඝ කාලයක් තිබුණු බව. ඒ නිසා මේක අත්‍යවශ්‍ය පනත් කෙටුම්පතක්. සාමාන්‍යයෙන් මෙහිදී අවධානය යොමු කරනවා, කඳුකර ප්‍රදේශයේ ජලයෙන් යට වන පහත් බිම් සහ ආපදාවට ලක් වන ප්‍රදේශ වශයෙන් නම් කර ඇති ප්‍රදේශවල කෙරෙන ඉදිකිරීම් ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරන, කඳුකර ප්‍රදේශයක් නියෝජනය කරන මන්ත්‍රීවරු හැටියට අපි මේ කාරණය ගැන සැලකිලිමත් විය යුතුයි. මේ පනත් කෙටුම්පත යටතේ මෙවැනි ප්‍රදේශ සිතියම්ගත කිරීම - mapping - ආරම්භ කිරීමේ හැකියාව තිබෙනවා. ඒක තමයි ඉතාම වැදගත් කාර්යය. සාමාන්‍යයෙන් අපට ඉඩම් ඔප්පු පරීක්ෂා කරලා බලන්න පුළුවන්, අයිතිය ආපු ආකාරය පිළිබඳව, පෙළපත පිළිබඳව. නමුත් යම් කිසි ඉඩමක් ඇත්තවශයෙන්ම කඳුකර ප්‍රදේශයක ඉඩමක් වෙනකොට, නාය යෑමේ අධි අවදානම් කලාපයක තිබෙනවාද, අවදානම්ද, එහෙම නැත්නම් කුමන මට්ටමක තිබෙන ඉඩමක්ද කියන එක හඳුනා ගැනීම පොදු ජනතාවට ඉතාම වැදගත් වෙනවා. ජනතාව නොදැනුවත්කම නිසා මෙවැනි ස්ථානවල දිගින් දිගටම ඉදිකිරීම් කරගෙන යනවා. එවැනි විශාල විපතක් පසුගිය කාලයේ මහනුවර ප්‍රදේශයේ අය අත්වින්දා. මහනුවර, බුවැලිකඩ ප්‍රදේශයේ සිදු වූ ඒ සිද්ධිය ගැන මේ සභාවේත් කියැවුණා. එතැනදී නීතිඥ අචලා ඒකනායක මහත්මියත්, ඇයගේ ස්වාමිපුරුෂයා සහ ළදරු දරුවාත් යන තිදෙනාගේ ජීවිත අහිමි වුණා. එය මුළු රටම කම්පාවට පත් වුණු ඉතාම අවාසනාවන්ත, කනගාටුදායක සිදුවීමක්. නමුත් ඒ සිදුවීමෙන් පස්සේ නැවත මේ ගැන ජනතාවගේ අවධානය යොමු කිරීම අඩු වෙලා ගියා. මේක මෙතරම් වැදගත් දෙයක්, වැදගත් කාර්යයක් කියලා හිතුවේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපේ ප්‍රදේශවල මේ අවදානම ගැන බැලුවොත්, 2023 වර්ෂයේ නාය යෑම් 9ක් සිදු වෙලා තිබෙනවා. නාය යෑමේ අවදානම් 10ක් හඳුනාගෙන තිබෙනවා. පසුගිය කාලය ගත්තොත්, දළ වශයෙන් 2024 වර්ෂය සලකා බැලුවාම නාය යෑම් 4කුත්, නාය යෑමේ අවදානම් 12කුත් හඳුනාගෙන තිබෙනවා. මෙවැනි හඳුනාගැනීම් දීර්ඝකාලීනව සිදු කරගෙන ඇවිල්ලා තිබෙනවා. හැබැයි ඒ හඳුනා ගැනීම්වලින් ගත් ඵල ප්‍රයෝජන මොනවාද කියන්න අපි දන්නේ නැහැ. ඒ සම්බන්ධව පැහැදිලි නීතියක් නොතිබුණු නිසා එම හඳුනා ගැනීම් මත එවැනි අවදානම් කලාපවල ඉදිකිරීම් සම්බන්ධ සීමා වාරණ පැනවීමේ හැකියාවකුත් නැහැ. හැබැයි අපට මේ පනත් කෙටුම්පතෙන් පස්සේ මින් ඉදිරියට එවැනි නිසියාකාර නියාමනයක් කරන්න හැකියාව ලැබෙනවා. විශේෂයෙන් දැඩි ආනතියක් සහිත ඉඩම් පිහිටි කඳුරට ප්‍රදේශයේ වැස්සකට පස්සේ හෙල් මළු කෙත් වගාවේ උඩහ ලියැද්ද පහළට ගිහිල්ලා කියන එක අත්දැකීමෙන් අපි දන්නවා. ස්වාභාවිකවම එවැනි සුළු වශයෙන් නාය යෑම් සහ පස් කඳු රූටා යෑම් නිතරම සිද්ධ වෙනවා. එවැනි ප්‍රදේශවල ජීවත් වෙනකොට මේ ගැන විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ.

ශ්‍රී ලංකාවේ බස් නැවතුම්පළවල් 50ක් ඉදිකරන්න අපි කටයුතු කරනවා. ඒ අතරින් එකක් නාවලපිටිය ප්‍රදේශයේ ඉදිකරනවා. හැබැයි කියන්න කනගාටුයි, අපට මේ අවස්ථාවේදී ඒ ඉදිකිරීම්වල මූලික කටයුතු ආරම්භ කරන්න බාධාවක් ඇති වෙලා තිබෙනවා. එය අනවසර ඉදිකිරීම් නිසා ඇති වුණු තත්ත්වයක්. මොකද, වසර සිය ගණනක් තිස්සේ සැලසුම්ගත නගරයක්ව තිබුණු නාවලපිටියේ භූගත ජල අපවහන පද්ධතියට අනවසර ඉදිකිරීම් හේතුවෙන් බාධා ඇති වෙලා තිබෙනවා. ඒ නිසා ඒක අවහිර වෙලා තිබෙනවා. මේ අවහිර වීම වෙලා තිබෙන්නේ හිටපු දේශපාලන අධිකාරිය විසින් කරන ලද අනවසර ඉදි කිරීම් නිසායි. දුම්රිය රක්ෂිත ඉඩම තුළ වෙළෙඳ සංකීර්ණයක් ඉදිකිරීමකුත් කරලා තිබෙනවා. 2021.02.12 වන දින දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් නාවලපිටිය නාගරික ලේකම් වෙත මේ අනවසර ඉදිකිරීම ගැන ලිපියක් මඟින් දැනුම් දෙනවා. මේ අනවසර ඉදිකිරීම් හේතුවෙන් වැස්ස අවස්ථාවලදී මුළු නගරයම ජලයෙන් යට වෙනවා. බස් නැවතුම්පළ සංවර්ධන කටයුතු කිරීමේ දී අලුතින් ඉදිකිරීමක් කිරීමට පෙර, වැසි දිනවලදී මේ නගරයේ පිරෙන ජලය ඉවත් කිරීම සඳහා මූලික උපදෙස් ලබාගන්න දැන් අපට අවශ්‍ය වෙලා තිබෙනවා. අපි ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවෙන් උපදෙස් පතලා තිබෙනවා. මේ උපදෙස් ලබා ගැනීමේ කාර්යය සඳහා පමණක් රුපියල් 2,985,400ක මුදලක් අවශ්‍ය වෙනවා කියලා එම ආයතනය අපට දැනුම් දීලා තිබෙනවා. ඒ කියන්නේ පසුගිය කාලයේදී දේශපාලකයන් කිසිම සැලැස්මක් නැතුව හිතුවක්කාරව, අත්තනෝමතිකව කරපු ඒ අනවසර ඉදිකිරීම් හේතුවෙන් රුපියල් මිලියන 3කට ආසන්න මුදලක් නිකරුණේ අපට වියදම් වෙනවා. වසර සිය ගණනාවක් ඉතා අපූරුවට බැහැර වෙච්ච වැසි ජලය දැන් බැහැර වීමේ අවහිරතාවක් තිබෙනවා. එම ජලය බැහැර කරන්නේ කොහොමද කියලා හොයලා බලන්න ජනතාවගේ මෙවැනි මුදලක් වියදම් කරන්න අපට සිද්ධ වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත යටතේ වන කාර්යන් ඉටු කිරීමේදී, "නිවාස ඇතුළු දේපළවලට ඇතුළු වීමේදී පොලිස් නිලධාරියකු යොදාගන්න අවශ්‍ය වෙන්නේ නැහැ, මේක අනවශ්‍ය ප්‍රතිපාදනයක්" කියලා අද විපක්ෂයෙන් විවේචනයක් ආවා. එහෙම නැහැ. පුද්ගලයෙක් ප්‍රාදේශීය ලේකම්තුමියකට තර්ජනය කරමින් හැසිරෙන ආකාරය පසුගිය දවසක අපි දැක්කා. නොයෙක් මානසික තත්ත්ව තිබෙන, නොයෙක් ආකාරයේ මිනිසුන් ඉන්නවා. නීති තිබුණාට වැඩක් නැහැ, ඒ නීති ක්‍රියාත්මක කිරීම සඳහා නිසි පරිදි ඒ අවශ්‍ය වැඩ

පිළිවෙළ හදලා නැත්නම්. රාජ්‍ය නිලධාරින්ට සහ අදාළ නිලධාරින්ට නිසි ආරක්ෂාව ලැබෙන්නේ නැත්නම් ඒ කටයුතු කරන්න බාධා එනවා. ඒ සඳහා පොලීසියේ නිලධාරින් යොදවන්න අපට ඕනෑ තරම් හැකියාව තිබෙනවා. පසුගිය කාලයේ පොලිස් නිලධාරින් ප්‍රභූ ආරක්ෂාව කියලා සංදර්ශන කටයුතු සඳහා පාවිච්චි කර තිබෙනවා අපි දැක්කා. අද ඒ සංදර්ශන නැහැ. එම නිසා පොලිස් ස්ථානවල නිදහසේ රාජකාරි කර ගන්න හැකියාව පොලිස් නිලධාරින්ට තිබෙනවා. ඕනෑ තරම් පොලිස් නිලධාරින් මේ වාගේ අවශ්‍ය රාජකාරි කටයුතුවලට යොදා ගන්න පුළුවන්. ඒ ගැන භය වෙන්න දෙයක් නැහැ. විපක්ෂය භය වනවා නම් භය වෙන්න ඕනෑ, ඒගොල්ලන් පසුගිය කාලයේ කරගෙන ආ දේවල්වලට බාධා ඇති වෙලා තිබෙන නිසායි. දැන් කිසිම පදනමක් නැතුව ඒ ගැන තමයි මේ විවේචන හා චෝදනා එල්ල කරන්නේ. ඇත්තවශයෙන්ම අපි කියන්නේ, ජාත්‍යන්තර මිනුම් ක්‍රම අනුව තිරසර සංවර්ධනයක් කරා අපි යන ගමනේදී පුනරුද යුගයක් උදා කිරීම සඳහා ඒ හා සම්බන්ධිත මිනුම් දඬු අනුව කටයුතු කර ගන්න අවශ්‍ය වනවා කියලායි. ඒ සඳහා මෙම පනත් කෙටුම්පත ඉතා වැදගත් බව සඳහන් කරමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු සුගත් වසන්ත ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු සංජීව රණසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SANJEEWA RANASINGHA left the Chair and THE HON. CHANAKA MADUGODA took the Chair.*

[අ.භා. 3.23]

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සැප්තැම්බර් 23වැනි දා; අද ජාත්‍යන්තර සංඥා භාෂා දිනය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංඥා භාෂා ජාත්‍යන්තර දිනයක් නම් කිරීමේ තිබෙන සංවේදීතාව, වැදගත්කම සහ මානවීය ගුණය සම්බන්ධයෙන් ගරු සභාවේ අවධානය යොමු කරන්න මේ කාලය පාවිච්චි කළාට කමක් නැහැ කියලා මම හිතනවා.

ආබාධ සහිත ප්‍රජාව අතර ලක්ෂ 4කට අධික ප්‍රමාණයක් ශ්‍රව්‍ය ආබාධිත, එහෙම නැත්නම් බිහිරි ප්‍රජාව ඉන්නවා. ඒ බිහිරි ප්‍රජාවගේ ස්වභාවය තමයි, නැත්නම් ඔවුන්ට තිබෙන ආබාධිත බව තමයි සන්නිවේදන බාධාව. ඔවුන්ට හඬක් නැහැ. ඔවුන්ට මේ ලෝකයේ හඬ ඇහෙන්නේ නැහැ. ඔබ හිතන්න, ඔබගේ තත්ත්වය. ඔබට සියලු ශබ්ද ඇහෙනවා. ඒ වාගේම ඔබගේ භාෂා කෞශල්‍යයෙන් ඔබගේ හදවතේ නැඟෙන හැඟීම්, අදහස් හා උදහස් සම්ප්‍රේෂණය කරන්න පුළුවන්. මෙන්න මේ හැකියාව නැති ලක්ෂ සංඛ්‍යාත පිරිසක් ලංකාවේ ඉන්නවා. මම හැමදාමත් කියනවා වාගේ ලංකාවේ නොවෙයි, මේ මුළු ලෝකයේම මානවයා සතු සුවිශේෂ, විශිෂ්ට දක්ෂකමක් තමයි තමන්ට අහිමි වන දෙයක් තිබෙනවා නම් ඒ අහිමි වන දෙයට විකල්පයක් නිර්මාණය කරන එක. බිහිරි ප්‍රජාවට වාක් චාතුර්ය නැති නිසා, සවන්පත් නෑහෙන නිසා, ඔවුන් තමන්ගේ වුවමනාව, තමන්ගේ අදහස, තමන්ගේ හැඟීම, තමන්ගේ මුහුණේ ඉරියව් හස්ත සංඥා මඟින් අනික් පාර්ශ්වයට සන්නිවේදනය කිරීම තමයි සංඥා භාෂාවෙන් සිදු වෙන්නේ. ඒවා හුදු අවිධිමත් සංඥා නොවෙයි. සංඥා ක්‍රමයෙන් එකතු වෙලා; වචන රාශියක් එකතු වෙලා ඒක දැනට භාෂාවක් බවට පත් වෙලා තිබෙනවා. ඔබ සහ මම කථා කරනවා වාගේම අපේ මව් භාෂාව වේවා, දෙවැනි භාෂාව විධියට පාවිච්චි කරන භාෂාවක් වේවා, ඒ සියලු භාෂාවල තිබෙන ගුණාංග සංඥා භාෂාව තුළ ගැබ් වෙමින් පවතිනවා; ගැබ් කරලා තිබෙනවා. ඒ සංඥා භාෂාව භාවිත කරන කණ්ඩායම කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා තමයි සංඥා භාෂා දිනයක් ජාත්‍යන්තරව ප්‍රකාශයට පත් කරලා තිබෙන්නේ. ජාත්‍යන්තර වශයෙන් ප්‍රකාශයට පත් කරලා තිබෙන මේ සංඥා භාෂා දිනය අපි ජාතික වශයෙන් සමරනවා. මේ සැරේ තේමාව තමයි, "සංඥා භාෂා හිමිකම නැත්නම් මානව අයිතියක් නැහැ" කියන එක. ඇත්ත තමයි. සන්නිවේදනය කියන්නේ මානවයන් විධියට අපට අත්‍යවශ්‍ය දෙයක්. ඒ හරහා තමයි ලෝකය තමන් තුළට ගන්නත්, තමන් තුළ තිබෙන දේවල් ලෝකයට ප්‍රකාශ කරන්නත් පුළුවන්කම ලැබෙන්නේ. සංඥා භාෂාව පිළිගත් භාෂාවක් විධියට රජයක් වශයෙන් අපි පිළිගන්නවා. මේ සඳහා ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව විසින් නිර්මාණය කරන ලද සංඥා භාෂා පනත් කෙටුම්පත අපි දැන් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට යොමු කර තිබෙනවා. එම දෙපාර්තමේන්තුවට යොමු කර තිබෙන මෙම පනත් කෙටුම්පත තුළ සංඥා භාෂාව පාවිච්චි කරන මේ ප්‍රජා කණ්ඩායමේ සන්නිවේදන වුවමනා අපි සනිටුහන් කරලා තිබෙනවා.

සංඥා භාෂාව පරිහරණය කරන්න නම් අනිවාර්යයෙන්ම සංඥා භාෂා පරිවර්තක කණ්ඩායමක් ඉන්න ඕනෑ. ඔවුන් තමයි ඒ අතරමැදි කාර්යය කරන්නේ. බිහිරි අය සංඥාවලින් නිකුත් කරන අදහස් උදහස් සාමාන්‍ය වචනයට පෙරළන්නේ ඔවුන්. ඔවුන්ට වෘත්තීයභාවයක් තිබෙන්න ඕනෑ. ඒ වාගේම ඔවුන්ගේ වෘත්තිය ගරුත්වයෙන් සිද්ධ කරන්න පුළුවන් පරිසරයක් නිර්මාණය කරන්න ඕනෑ. ඒ වාගේම සංඥා භාෂාව ප්‍රවර්ධනය කරන්න ඕනෑ, ඒ භාෂාවට පිළිගැනීමක් ලබා දෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නොවුණොත් මේ ප්‍රජාව නිහැඬියාවේ ගැඹුර තුළ ගිලිලා ආන්තික කණ්ඩායමක් බවට, අවාසිදායක කණ්ඩායමක් බවට පත් වනවා. දැනටත් ඔවුන් මෙම සංඥා භාෂා ප්‍රශ්නය නිසා අධ්‍යාපනික අවස්ථා අහිමිව, සෞඛ්‍ය පහසුකම් අහිමිව, විවිධ අපහසුතා, විවිධ ගැටලු දුෂ්කරතා අත්විඳිමින් දුක්ඛිතව ජීවත් වෙනවා. මොවුන්ට හඬක් වෙන්න ජාතික ජන බලවේගයේ අපි සූදානම්. මොවුන්ට හඬක් වෙන්න, මොවුන්ගේ අයිතිවාසිකම් අත්පත් කර දෙන්න රජයක් විධියට අපි සූදානම්. ඒ සඳහා අපේ කැපවීම සහ මැදිහත් වීම සහතික කරලා කියන්න පුළුවන්. මෙවැනි ජාත්‍යන්තර දිනයක් ළඟා වෙනකොට බිහිරි ප්‍රජාව අනිවාර්යයෙන්ම, තමන් කෙරෙහි රජයේ, මහජනතාවගේ, රාජ්‍ය නොවන සංවිධානවල අවධානය යොමු වෙලා තමන්ගේ ප්‍රශ්න අවම වෙයි, තමන්ගේ ප්‍රශ්නවලට විසඳුම් ලැබෙයි කියන බලාපොරොත්තුවෙන් ජීවත් වෙනවා.

[ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා]

මෙන්න මේ වාගේ තත්ත්වයක් තුළ අතිශය කනගාටුදායක ඛේදවාචකයක් අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් අපට වාර්තා වෙනවා. "වැටත් නියරත් ගොයම් කා නම් කාට පවසම් ඒ අමාරුව" කියලා සුප්‍රකට ප්‍රස්තාව පිරුළක් තිබෙනවා. කියන්න කනගාටුයි, ආබාධ සහිත - දෘශ්‍යාබාධිත, ශ්‍රව්‍යාබාධිත - දරුවන්ට රැකවරණය දෙන අනුරාධපුරයේ විද්‍යාලයක පාලක මණ්ඩලයේ සභාපතිවරයා බිහිරි දරුවන් හතරදෙනෙක් අපයෝජනයට සහ අපචාරයට ලක් කරලා තිබෙනවා. මේක තමයි ඊයේ පෙරේදා ප්‍රවෘත්තිය බවට පත් වුණේ. මේ ප්‍රවෘත්තියෙන් අපි සලිත වුණා; කනගාටුවට පත් වුණා; වේදනාවට පත් වුණා. ඒ ඇයි? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දරුවන් මේ වාගේ කාමුකයන්ගේ ගොදුරු බවට පත් වුණාම ඔවුන්ට හඬක් නැහැ; ඔවුන්ට කැගහන්න විධියක් නැහැ; ඔවුන්ට අප්‍රසාදය පළ කරන්න විධියක් නැහැ. මෙවැනි දුවා දරුවන්ට රැකවරණය දෙන මධ්‍යස්ථාන තුළම ඒ පාලක මණ්ඩලවල ප්‍රධාන ධුර දරන අය මෙවැනි තත්ත්වයක් නිර්මාණය කරනවා නම්, මේ දරුවන් ගොදුරු බවට පත් කරගන්නවා නම් අපේ රට ගැන, අපේ සමාජය ගැන අපි හිතන්නේ කොහොමද? අපි හිතනවා, අපේ සමාජය විසින් ආබාධ සහිත මේ දුවා දරුවන්ට රැකවරණය දෙයි කියලා. නමුත් අද තිබෙන තත්ත්වය ගැන කියන්න කනගාටුයි.

ඊ.ඩබ්ලිව්. අදිකාරම් මහත්මයා යම් අවස්ථාවක ළමා කණ්ඩායමකට මෙහෙම කියනවා. ඒ ළමයි අහනවා, "අපි කාගෙන්ද පරිස්සම් වෙන්න ඕනෑ?" කියලා. අදිකාරම් මහත්මයා නිවැරදිව කියනවා, "ඔබ පරිස්සම් වෙන්න ඕනෑ වැඩිහිටියන්ගෙන්" කියලා. වැඩිහිටියන්ගෙන් විතරක් නොවෙයි. මේ ආයතනවල පාලනය උරුම කරගත් උරුමක්කාරයන්ගේ ගොදුරු බවට පත් වෙන්නද මේ ආබාධිත දරුවන් ඉන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

ඔවුන්ට තමන්ගේ දුක, වේදනාව, තමන් අපයෝජනය වෙච්ච කාරණය, අපචාරයට ලක් වෙච්ච කාරණය කියාගන්න බැහැ. එවැනි දරුවන් අපයෝජනය කරන, ගොදුරු බවට පත් කරන අයට අනිවාර්යයෙන්ම ඉතා ඉහළ දඬුවම් ලබා දිය යුතුයි. කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය කිව්වා, මේ සම්බන්ධයෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය අපක්ෂපාතී පරීක්ෂණයකට යොමු වෙලා තිබෙනවා කියලා. පොලීසියත් එහෙමයි. කියන්න සතුටුයි, මේ කාරණයට ගරු වසන්ත සමරසිංහ අමාත්‍යවරයා මැදිහත් වෙලා තිබෙනවා. මේ මැදිහත්වීම් තුළින් අපි බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? මේ වාගේ හඬක් නැති අහිංසක දූ දරුවන් බිල්ලට ගන්න, කාමාතුර වුවමනාවලට යොදාගන්න අය පිටුදැකීමේ වුවමනාව අපට තිබෙනවා. එහෙම නැත්නම් මේ ආබාධිත දරුවන් සුරක්ෂිත වෙන්නේ කොහොමද? ඒ කාරණය මේ උත්තරීතර ගරු සභාවෙන් මම අහනවා. අපි නියෝජනය කරන්නේ ඔවුන්. අපි නියෝජනය කරන්නේ ජන මතය. ඒ ජන මතයට එරෙහිව යන මේ පාපිෂ්ඨ කාමාතුරයන් අපි පිටුදැකිය යුතු නැද්ද? එහෙම නැතුව ඔවුන්ගේ තුරුල්ලට, ඔවුන්ගේ සෙවණට මේ දූ දරුවන් යවන්නේ කොහොමද?

මම ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටිනවා, මේ විධියේ කුරිරු පාලකයන්ට, පාලක මණ්ඩල වුවමනාවලට යටත් වෙලා මේ ආබාධිත දුවා දරුවන් වෙන්දේසි කරන, පාවිච්චි කරන, අපයෝජනය කරන ආයතන වෙනස් කරන්න කියලා, ඔවුන්ගේ පාලන ව්‍යුහ වෙනස් කරන්න කියලා. ගරු වසන්ත සමරසිංහ අමාත්‍යවරයා මට පොරොන්දු වුණා වාගේම මේ පාසල අනිවාර්යයෙන්ම උතුරු මැද පළාත් සභාවට පවරා ගත යුතුයි. එහෙම නොවුණොත් අද මම කියන මේ කාරණය තව මාසයකින් මට නැවත කියන්න සිද්ධ වේවි. එතකොට ඒක කොච්චර වේදනාවකින් කියන්න වේවිද? අපි කොහොමද ඒක ඉවසන්නේ? අපේ රජයක් යටතේ මෙහෙම දේවල්වලට ඉඩ දෙන්න බැහැ. අපි ඒ දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න ඕනෑ. ආබාධිත නොවන දරුවන් වාගේම මේ අයත් දරුවන්. ඔවුන් මානව සමාජයේ අනාගතය භාරගන්න ඉන්න පුරවැසියන් බවට පත් වන අය. මේ වාගේ අපචාරයකට, මේ වාගේ අපයෝජනයකට ලක් වුණොත් ඔවුන්ගේ අභිමානය, පෞරුෂත්වය කඩා වැටෙනවා. ඒ දරුවන් පෞරුෂත්වයෙන් බෙලහීන කරන්න අපට ඉඩ දෙන්න බැහැ.

මෙවර ජාත්‍යන්තර සංඥා භාෂා දිනයේ තේමාව වන "සංඥා භාෂා හිමිකම්වලින් තොර මානව හිමිකම් නොමැත" කියන කාරණය ඔබත් තේරුම් ගනිමින් කටයුතු කළ යුතුයි. සංඥා භාෂාව ලංකාවේ පිළිගත් භාෂාවක් බවට පත් කිරීමේ පනත් කෙටුම්පත මම හිතන විධියට තව මාස කිහිපයකින් ඔබ හමුවට - පාර්ලිමේන්තුවට- ඉදිරිපත් වෙනවා. අපි විශ්වාස කරනවා, ආණ්ඩු පක්ෂයත්, විපක්ෂයත් පූර්ණ එකඟතාවකින් ඒක සම්මත කරලා ලක්ෂ සංඛ්‍යාත බිහිරි ප්‍රජාව වෙනුවෙන් අපගේ වගකීම ඉෂ්ට කරයි කියලා. ඒ බලාපොරොත්තුවෙන් මම නිහඬ වෙනවා. මට මේ කාලය ලබා දීම වෙනුවෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට බෙහෙවින්ම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.35]

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)

මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පිහිටුවීම සම්බන්ධ පනත් කෙටුම්පත විවාදයට ගන්නා අද දවසේ මට කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව සතුටට පත් වෙනවා. විශේෂයෙන්ම ලංකාවේ සංවර්ධන ක්‍රියාවලියේදී අනාගත සංවර්ධනයට ප්‍රමුඛ කාර්යභාරයක් ඉෂ්ට කරන ආයතනයක් යාවත්කාලීන කරන පනතක් විධියට තමයි අද මේ පනත පිළිබඳව සාකච්ඡා වෙන්නේ. NBRO එක වෙනුවට NBRI එක නිර්මාණය කරමින් මේ පනත හරහා රජය බලාපොරොත්තු වන ක්‍රියාවලි සියල්ලම සාර්ථක වෙන්න කියලා පළමුව මම ප්‍රාර්ථනා කරනවා. හේතුව, ලංකාව වාගේ සංවර්ධනය වෙමින් පවතින රටකට අනාගතයේදී පැමිණීමට නියමිත අනතුරුවලින් සිදුවිය හැකි ජීවිත සහ දේපළ හානි වළක්වා ගන්නට විශාල වශයෙන් මූලා සහයෝග ලබා දෙමින්, තාක්ෂණික සහයෝගයක් ලබා දෙමින් මේ වාගේ ආයතන පුළුවන් තරම් සක්‍රිය කිරීම අනාගතයට අතිශය වැදගත් වීමයි.

මේ ආයතනය නිර්මාණය කිරීමේ, මේ ආයතනයේ ක්‍රියාකාරිත්වය අතර ප්‍රමුඛම කාර්යය විය යුත්තේ -වෙමින් පවතින්නේත් ඒක- දේශගුණික විපර්යාසවලට සහ බලශක්ති අර්බුදයට ඔරොත්තු දෙන ආකාරයේ ගොඩනැඟිලි නිර්මාණය කිරීම සහ ලංකාව කියන මේ සමස්ත රටේ සෑම තැනකම තිබෙන පස් ඇතුළු අනෙකුත් සියලු ඛනිජ සම්පත් පිළිබඳව පර්යේෂණ කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීමයි. මේක, ඒ සඳහා ඉදිරිපත් වෙච්ච පනතක්.

ඒ නිසා මේක ලංකාවේ සංවර්ධන ක්‍රියාවලියට අතිශය වැදගත්. දේශගුණික විපර්යාස හා බලශක්ති අර්බුදය රටේ ගොඩනැඟිලිවලට තිබෙන සම්බන්ධතාව කොයි වාගේද? මේ, සැප්තැම්බර් මාසය. මෙය ලංකාවේ මෝසම් වර්ෂාව පරක්කු

වෙමින් පවතින කාල සීමාවක්. සාමාන්‍යයෙන් මේ කාල සීමාව වෙද්දී වර්ෂාව පතනය වෙන්න ඕනෑ. වර්ෂාව පතනය නොවීමත් එක්ක අධික උෂ්ණත්වය හා සමානව බැඳිලා තිබෙන බලශක්ති අවශ්‍යතාව ඉහළ යනවා. මාසිකව අවශ්‍ය කරන බලශක්ති අවශ්‍යතාව වෙනදාට වඩා ඉහළ යන විට ඒ සමස්ත පද්ධතියම මේක ඇතුළේ අර්බුදයකට පත් වෙනවා. ඒ නිසා බලශක්තිය ඉතිරි කර ගැනීම වැදගත් වනවා. මෝසම් වර්ෂාව ප්‍රමාද වීමත් සමඟ ඉදිරියේදී කෙටි කාල සීමාවක් තුළ ලොකු වර්ෂාවක් පතනය වනවිට නාය යෑම් හා ගංවතුර වැනි අනතුරු විශාල ප්‍රමාණයක් සිදු වීමට නියමිතයි. එතකොට මේ ආයතනය යාවත්කාලීන කිරීම හරහා බලාපොරොත්තු විය යුතු අරමුණ වන්නේ, ඒ වාගේ අනතුරු සිදු වීමට පෙර ඒ අනතුරු වළක්වා ගැනීම සඳහා ගත හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගැනීමයි. ඒක තමයි මෙහි තිබෙන වැදගත්කම. NBRO එක NBRI කිරීමට වඩා එහාට ගිය කාර්යක්ෂම සේවාවක් ලබා ගැනීම උදෙසා අලුත් සැලසුම් ඔස්සේ ආණ්ඩුව ක්‍රියාත්මක වෙනවා නම් හොඳයි. හැබැයි, මේ පනත කියවන හැම අවස්ථාවකදීමත්, ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළත් මට හොයා ගන්න බැරි වෙච්ච දෙය තමයි, මේ පනත හා සම්බන්ධිත ක්‍රියාවලියේදී ආණ්ඩුවේ මඟ පෙන්වීම මොකක්ද කියන එක. ඒ කියන්නේ, ආණ්ඩුවේ රාජ්‍ය ප්‍රතිපත්තිය කුමක්ද කියන එක මට හොයා ගන්න බැරි වුණා. මගෙන් පස්සේ කථා කරන කාට හරි මේ පනත හා සම්බන්ධ රාජ්‍ය ප්‍රතිපත්තිය කුමක්ද කියලා කියන්න පුළුවන් නම් තව ටිකක් ඒ ගැන කල්පනා කිරීමේ හැකියාව ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආයතනවල තමයි ලංකාවේ බුද්ධිය තිබෙන විශාල පිරිසක් සේවය කරන්නේ. හැබැයි, ඒ ආයතනවල තිබෙන ඊළඟ ගැටලුව තමයි අකාර්යක්ෂමතාව. ඒක පුද්ගලයින්ගේ ප්‍රශ්නයක් නොවෙයි. ඒ කියන්නේ, එම ආයතනවල සේවය කරන අයගේ ප්‍රශ්නයක් නොවෙයි. මේ ආයතනවලට අවශ්‍ය කරන හොඳ මැෂින්වල අඩුවක් තිබෙනවා. ඊට අමතරව ප්‍රධාන වශයෙන් සේවක අඩුපාඩු තිබෙනවා. පුළුවන් තරම් මේ ආයතනය හා සම්බන්ධ ශාඛා දිස්ත්‍රික් වශයෙන් හෝ දමන්න පුළුවන් නම්, ගොඩනැඟිල්ලක් ඉදිකරන්න කලින් පස් සාම්පලය පරීක්ෂා කරන එක අනිවාර්ය කරන්න පුළුවන් නම්, ඒක කෙටි කාල සීමාවක් තුළ අදාළ වියදම පමණක් අය කරගෙන ලබා දෙන්න පුළුවන් නම්, නිර්මාණය කරන ගොඩනැඟිලි කඩා වැටීමේ ඉඳලා සිදුවන බොහෝ අනතුරු වළක්වා ගන්න පුළුවන් වෙනවා. මම එහෙම කියන්නේ, නාය යෑමේ අනතුරු මේ වනකොට මධ්‍ය කඳුකරයට විතරක් සීමා වෙලා නැති නිසායි. මීරිගම ආසනයේ පවා නාය යෑමේ අනතුරු සහිත ප්‍රදේශ තිබෙනවා. දංඕවිට, මඩබාවිට, බෝතලේ සහ තවලම්පිටිය ආශ්‍රිත ප්‍රදේශ දක්වාම නාය යෑමේ අනතුරුවලට ලක් වෙනවා. නාය ගියාට පසුව සිදු වන ජීවිත හානි සහ දේපළ හානි වෙනුවෙන් මුදල් වෙන් කිරීම වෙනුවට ඊට කලින් නාය යන ප්‍රදේශ තෝරාගෙන පස් පිළිබඳ සිතියමක් නිර්මාණය කරලා, ඒ පිළිබඳව අවධානය යොමු කිරීමෙන් පසුව සමස්ත රටේම ගොඩනැඟිලි ඉදිකරන්න පුළුවන් නම් මම හිතනවා, ඒකෙන් අපට වැඩි ප්‍රයෝජනයක් ලබා ගන්න පුළුවන් කියලා.

ඒ වාගේම ලංකාව පුරා පැතිරිලා තිබෙන ඛනිජ සම්පත් පිළිබඳව නිසි පර්යේෂණයක් සිදු කරමින් ඒක සිතියම්ගත කිරීම තුළිනුත් අපට ඉදිරි සංවර්ධන වැඩවලදී නිවැරදි මඟ පෙන්වීමක් ලබා දීමේ හැකියාව ලබා ගන්න පුළුවන් වනවා. ඒ වාගේම ඒ තුළින් ආයෝජකයන් කැඳවා ගැනීමේ අවස්ථාව ලැබෙනවා. ඒ නිසා මේ ආයතනය පුළුවන් තරම් ශක්තිමත් කිරීමේ වගකීම අපට පාර්ලිමේන්තුව ලෙසත්, ආණ්ඩුව ලෙස ඔබටත් තිබෙනවා කියන අදහසත් මම ඉදිරිපත් කරන්න කැමැතියි. ඒ විධියට ඛනිජ සම්පත් ආශ්‍රිත දේවල් පිළිබඳව සිතියම්ගත කරලා තිබුණොත් ඒක ආණ්ඩුවට වුණත් ලෙහෙසියි. මොකද, ආණ්ඩුව පටන් ගත්ත මුල් කාලයේ මීරිගම ආසනයේ නිදන් හාරන්න ආපු බව ඔබතුමන්ලාට මතක ඇති. නමුත්, ආපසු නිධන් හාරන්න එන්න ඕනෑ නැහැ. කළු ගල් හාරලා අපරාදේ නිකම් සල්ලි නාස්ති කරන්න ඕනෑ නැහැ. සිතියම්ගත කළාම නිධානයක් තිබෙනවාද, නැද්ද කියලා බලලා ඒ ස්ථානය හාරලා නිධානය අරගෙන ඕනෑ නම් ආණ්ඩුවේ ණය හෝ මොනවා හෝ පියවා ගන්නත් පුළුවන්. ඒ නිසා මේ වාගේ සිතියම්ගත කිරීම හැම පැත්තකින්ම වැදගත් කියන කාරණාව මම කියන්න ඕනෑ. මේක research office එකක්. මේ research office එක හා බැඳුණු තවත් ආයතන කිහිපයක් තිබෙනවා. විශේෂයෙන්ම Green Building Council එක තිබෙනවා. ඊට අමතරව IESL එක තිබෙනවා. මේ හැම තැනක්ම - සම්පූර්ණ පද්ධතියම - ඒකාබද්ධ කරලා, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයත් ඒකාබද්ධ කරලා ඒ සම්බන්ධතා ටික හදා ගන්න පුළුවන් නම් මම හිතනවා, මේකෙන් වැඩි කාර්යක්ෂම සේවයක් ලබා ගන්න පුළුවන් වෙයි කියලා. ඇයි, මම එහෙම කියන්නේ? IESL එක වාගේ තැන්වල මේ පිළිබඳව සාකච්ඡා සිද්ධ වුණාට රාජ්‍ය ප්‍රතිපත්ති හදන්න මේ ආයතනවල දායකත්වය අපි තවම හරියට අරගන්නේ නැහැ. ඒ නිසා මේ පනත යාවත්කාලීන කරන විට මේ හැම තැනක් පිළිබඳවම අවධානය යොමු කරන්න ඕනෑ. ඒ වාගේම යළි යළිත් මේ හැම තැනක්ම යාවත්කාලීන කරමින් වැඩි සේවයක් ඒ තුළින් ලබා ගන්න පුළුවන් නම් හොඳයි කියාත් මම විශ්වාස කරනවා.

ප්‍රාදේශීය වශයෙන් ගත්තාම, මේ සංවර්ධන කටයුතුවලට වැඩිම දායකත්වයක් සපයන්නේ technical officersලා. ප්‍රාදේශීය සභාව ඇතුළු හැම ස්ථානයකම ඔවුන් ඉන්නවා. මේ අය NBRO එකත් එක්ක සම්බන්ධ කරලා, ඒ අයගේ දැනුම යාවත්කාලීන කිරීම වැදගත් වනවා. මොකද, මධ්‍යම රජය විසින් මේ ප්‍රතිපත්ති නිර්මාණය කළාට භූමිය ඇතුළේ මේවා ක්‍රියාත්මක කිරීමට යෑමේදී TOsලාගේ කාර්යභාරය අතිශය වැදගත් වනවා. ඒ නිසා ඒ අයගේ දැනුම යාවත්කාලීන කිරීම ඉතාම වැදගත් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වනවිට පවතින දේශගුණික විපර්යාස සහ අධික උෂ්ණත්වය ආදී සියලු දේවල් ගත්තාම අලුත් materials හරහා ගොඩනැඟිලි නිර්මාණය කිරීම වැදගත් වනවා. මේක, උෂ්ණත්වය පාලනය කරපු ගොඩනැඟිලි හදන්න පුළුවන් කොහොමද, ගොඩනැඟිල්ලක් නිර්මාණය කළාම ඒකේ වහලය සූර්ය කෝෂවලට සම්බන්ධ කර ගන්න පුළුවන් වෙන්නේ කොහොමද යනාදී ගොඩක් දේවල් පිළිබඳව පර්යේෂණ කළ යුතු ආයතනයක් නිසා හැකිතාක් ඒ වෙනුවෙන් ඉදිරි අය වැයේදී මුදල් වෙන් කරන්න කියන යෝජනාවත් මම මේ ආණ්ඩුවට ඉදිරිපත් කරන්න කැමැතියි.

ඒ වාගේම අපට වැඩිපුර නොපෙනෙන පැත්තක් තිබෙනවා. ලංකාවේ මධ්‍යම කඳුකරයේ ජල විදුලි බලාගාර තිබෙනවා. මේ ජල විදුලි බලාගාරවලට අදාළ ජලාශ නිසා මධ්‍යම කඳුකරයේ ජලය පිරිලා පස් බොහොම තෙත බරිත වෙලා තිබෙන්නේ. එලෙස පස් තෙත බරිත වීමේ බලපෑම නිසා එක්තරා මොහොතක යම් කන්දක් නාය යෑමේ ප්‍රතිඵලයක් ලෙස එකදු බලාගාරයකට හෝ විශාල පස් කන්දක් කඩාගෙන වැටුණොත්, ඒ හරහා බලාගාරයේ dam එක කඩාගෙන ගිහිල්ලා විශාල අනතුරක් සිද්ධ වෙන්න පුළුවන්. ඒ නිසා මධ්‍යම කඳුකරය පිළිබඳව නිරන්තර පර්යේෂණ කිරීම සඳහා ඒ ප්‍රදේශවල මේ ආයතනයේ ශාඛා පිහිටුවන්න කියන යෝජනාවත් මම ආණ්ඩුවට ඉදිරිපත් කරන්න කැමැතියි.

ඊළඟ කාරණාව තමයි, ගල්, වැලි, පස් ප්‍රවාහනය. මේ සියලු දේවල් එකට බැඳිලා තිබෙන්නේ. පසුගිය දවස්වල අපි දැක්කා, වැලි ගෙන යන ටිපර් රථයක් පාසල් වෑන් එකක හැප්පිලා විනාශ අනතුරක් සිද්ධ වෙනවා. නමුත්, ආණ්ඩුව ඒ වෙනුවෙන් ගත්ත ක්‍රියාමාර්ගය මොකක්ද කියලා මම අහන්න කැමැතියි. මේ ටිපර්

[ගරු අමිල ප්‍රසාද් මහතා]

රථ මෙච්චර වේගයෙන් යන්නේ ඇයි කියන එකට පිළිතුරක් ලබා දෙනවා කිසිම අවස්ථාවක මට ආණ්ඩුව පැත්තෙන් ඇහුණේ නැහැ. ඒකට හේතුව තමයි, මේ අයට දවසකට ගෙනෙන්න දෙන ලෝඩ් ප්‍රමාණය වැඩි වීම. ලෝඩ් එකක් ගෙනැල්ලා දැම්මා, ආපසු ගියා. ඒ නිසා ලෝඩ් සීමා කිරීම අතිශය වැදගත්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ ආසනය මැද්දේ තිබෙන මුද්දරගම ප්‍රදේශයෙන් මම අද එනකොට දැක්කා බස් රථවල පාසල් ළමුන් පිරිලා ඉන්නවා. ඊට අමතරව පාසල් ළමයි විශාල ප්‍රමාණයක් තනි බස් රථයක එනවා. එවැනි වෙලාවක අනතුරක් සිද්ධ වුණොත් ජීවිත හානි විශාල ප්‍රමාණයක් සිද්ධ වෙන්න පුළුවන්. මේ අවස්ථාවේ ප්‍රවාහන ඇමතිතුමාත් ගරු සභාවේ ඉන්නවා. ඒ නිසා පාසල් කාල සීමාව තුළ ළමයින්ගේ ප්‍රවාහනය පිළිබඳව අවධානය යොමු කරලා, බස් රථ ප්‍රමාණය වැඩි කරන්න කියන ඉල්ලීමත් මම කරනවා. මොකද, අර සිදුවීම් දෙක එකට ගත්තාම ඒ වාගේ අනතුරක් සිද්ධ වුණොත් කොහොමද තත්ත්වය කියන කාරණාව පිළිබඳව ප්‍රශ්නයක් මතු වුණා.

විශේෂයෙන්ම මධ්‍යම රජය තිබෙන්නේ මේ වාගේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න. මේක ඉතාම හොඳ පනතක්. මම පනත කියෙව්වා. හැබැයි, මේ පනත ක්‍රියාත්මක කරන අවස්ථාවේදී සිදු වූ ප්‍රධාන වෙනස්කම් මොනවාද කියලා මට වැඩිය සොයා ගන්න බැරි වුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි. දැන් කථාව අවසන් කරන්න.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)

තව පොඩි වෙලාවකින් මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම පනත ක්‍රියාත්මක කරන්න කලින් මේ දෙකේ තිබුණු වෙනස්කම් මොනවාද කියන එකත් මට හොයා ගන්න බැරි වුණා. හැබැයි, යාවත්කාලීන කරන පනතක් විධියට මම මේ ගැන සතුටු වෙනවා.

මම කියමින් සිටි කාරණාවට නැවතත් යොමු වුණොත්, මධ්‍යම රජය මේ වාගේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන විට මධ්‍යම රජයෙන් පහළ තිබෙන ස්තරය වන පළාත් සභාව හරහා මේ ගොඩනැඟිලි ඉදිකිරීම ආදී වැඩ ටික කරන්න පුළුවන් නම් කාර්යක්ෂම සේවයක් අපේ රටට ලබා ගන්න පුළුවන්. පළාත් සභා මැතිවරණය වසරක කාල සීමාවක් තුළ පවත්වනවා කියලා ඔබේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ තිබෙනවා. මේ අවස්ථාවේදී සභානායකතුමාත් ගරු සභාවේ ඉන්නවා. එම නිසා අපි අහන්න කැමැතියි, පළාත් සභා මැතිවරණය පවත්වන්නේ කවදාද කියලා. මැතිවරණ ජයග්‍රහණය, පරාජය පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. මැතිවරණ ජයග්‍රහණය පිළිබඳ ඔබට විශ්වාසයක් ඇති කියලාත් අපි හිතනවා. පළාත් සභා මැතිවරණය ඉක්මනින් පවත්වලා, පළාත් සභාව හරහා ඔබ විසින් ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නට අවස්ථාව තිබෙනවා. ඒ නිසා ආණ්ඩුවෙන් අපි ඉල්ලීමක් කරනවා, හැකි ඉක්මනින් පළාත් සභා මැතිවරණය පවත්වන්න කියලා. පසුගිය කාල සීමාවේදී ඔබ විපක්ෂයේ සිටියදී පළාත් සභාවට විරුද්ධව නඟපු හඬවල් එකක්වත් දැන් වැඩක් නැහැ. මොකද, ඔබ තමයි දැන් ආණ්ඩුව කරන්නේ. ඒ නිසා පළාත් සභා මැතිවරණය පවත්වලා, මේ අණපනත් මධ්‍යම රජය විසින් නිර්මාණය කර දුන්නාට පස්සේ ප්‍රායෝගිකව පළාත් සභාව සහ ප්‍රාදේශීය සභාව හරහා ගොඩනැඟිලි නිර්මාණය කරමින්, කාර්යක්ෂම සේවයක් රටට ලබා දෙන්නට අවශ්‍ය ශක්තිය ලැබෙන්න කියා ප්‍රාර්ථනා කරමින්, වසරක් පිරුණු ඔබේ ආණ්ඩුවටත් සුබ පතමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.46]

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ ජනතාවගේ පැත්තෙන් වාගේම අනාගතය පැත්තෙන් ගත්තොත්, වැදගත් පනතක් පිළිබඳව තමයි අද අපි සාකච්ඡා කරමින් ඉන්නේ. මේ පනත නොතිබුණාට, අදාළ කාර්යභාරයන් 1984.03.05වන දින ස්ථාපනය කළ ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයෙන් ඉෂ්ට වුණා. නමුත්, ඒකට නෛතික බලයක් තිබුණේ නැහැ. මොකද, පනතක් නැතුව නීතියක් ගොඩනැඟෙන්නේ නැහැ. ඒ නිසා වසර 41කට පසුව ඒ අඩුව තමයි අද සම්පූර්ණ කරන්නේ. ඒ ගැන අපි සතුටු වනවා. මම හිතනවා, අපේ රජයට වසරක් පිරෙන මොහොතේ රටේ ජනතාව මේ පිළිබඳව සතුටු වෙයි කියලා. දැන් මේ පාර්ලිමේන්තුවේ ජනතාවාදී අණපනත් සම්මත වෙනවා. අපි කියන්නේ නැහැ, ඉතිහාසයේ එහෙම පනත් සම්මත නොවුණාය කියලා.

නමුත් ඉතිහාසය පරීක්ෂා කර බැලුවාම අපට හුඟක් පේන්නේ වරප්‍රසාද ඇති කර ගන්න හදාපු පනත්, බලය දීර්ඝ කර ගන්න, බලය තර කර ගන්න හදාපු පනත්. ඒ වාගේ පනත් අපි දැකලා තිබෙනවා. ඒ අතරේ ජාතික ජන බලවේගයේ රජයක් ඇවිල්ලා අපි අද මේ ගේන පනතත් ජනතාවගේ අවශ්‍යතාවක් සම්පූර්ණ කරන එකක්.

පසුගිය දවසක අපි ගෙනාවා 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත. ඒ වාගේම පසුගිය ජූලි 31වැනිදා ගැසට් පත්‍රයේ පළ කරමින් ජනාධිපතිවරයන්ගේ හිමිකම් (ඉවත් කිරීමේ) පනත ගෙනාවා. අපි හිතනවා වසරක් යනකොට මේ සභාවෙන් සම්පාදනය වෙන නීති දිහා බැලුවත් ජනතාවාදී ගමනක, මහජන අපේක්ෂා ඉටු කරන ගමනක රජය යමින් තිබෙනවා කියන කාරණය ජනතාවට පැහැදිලියි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොහොම නමුත් ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පනතින් අපි බලාපොරොත්තු වෙනවා ප්‍රධාන අරමුණු කිහිපයක් සම්පූර්ණ කර ගන්න. අපි දන්නවා මේ රට පාරිසරික වශයෙන් යම් අර්බුදවලට මුහුණ දීලා තිබෙනවා, ආපදා උත්සන්න වෙලා තිබෙනවා කියලා. මේ වාගේ වෙලාවක මේ වාගේ ආයතනයක අත්‍යවශ්‍යභාවයක් තිබෙනවා. අපි මේකේ ප්‍රධාන අරමුණු කරගෙන තිබෙනවා පර්යේෂණ සහ පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධයෙන් බලතල හොඳින් ලබා දෙන්න. ඒ වාගේම ඒ කාර්යයන් වෙනුවෙන්, රට වෙනුවෙන් තාක්ෂණික සහාය ලබා දෙන්න අදාළ බලය ලබා දෙන්න. අනාගතයේදී ආපදාවලට ඔරොත්තු දෙන නිර්මිත පරිසරයක් සහතික කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන්න අපි මේ පනතින් ඒ ආයතනය වෙත තවත් බලය ලබා දෙනවා. ඒ අරමුණු සම්පූර්ණ කර ගන්න බලාපොරොත්තු වෙනවා. අනෙක් පැත්තෙන්, මේ පනතේ අවශ්‍යතාව තේරුම් ගනීවි කියලා මම හිතනවා. මේ සමාජයේ බොහෝදෙනෙකුට ඒක තේරෙනවා.

නාය යාම් සම්බන්ධයෙන් අපේ රටේ ඉතිහාසය ගත්තොත්, 1947දී, නිදහස ලැබෙන්නට පෙර වසරේ කඩුගන්නාවේ නාය යාමක් නිසා ජීවිත 40ක් නැති වුණා. ඒ වාගේම මේ සභාවේදී කථා වුණා 2016දී අරණායකදී 150දෙනෙකුගේ ජීවිත නැති වුණා කියලා. නුවරඑළිය වලපනේදී 1970දී ජීවිත 19ක් නැති වුණා. අපේ බදුල්ල දිස්ත්‍රික්කයේ මීරියබැද්දේ 2014දී ජීවිත 36ක් නැති වුණා. මේ විධියට බලනකොට ජීවිත විශාල ප්‍රමාණයක් අහිමි වෙලා තිබෙනවා. මේ ජීවිත ආරක්ෂා කරන්න පුළුවන් බලතල සහිත නීතියක් තිබෙන ආයතනයක් බවට මේක පත් කර ගැනීමේ වාසියක් තිබෙනවා කියන එකත් අපි පෙන්වා දෙන්න කැමැතියි.

පසුගිය වසර 20ක වාගේ කාලය බැලුවාම, 2003දී ලංකාවේ නාය යාම් නිසා නැති වුණු ජීවිත ප්‍රමාණය 218ක්. ඒ වාගේම 2014දී ජීවිත 100ක්, 2016දී ජීවිත 151ක්, පසුගිය 2017දී ජීවිත 262ක් අහිමි වෙලා තිබෙනවා. පසුගිය කාලයේ ඒ නීති ශක්තිමත් කිරීම දුර්වල වෙලා තිබුණු බව අපි දැක්කා. ඒ දුර්වලවීම්වල ප්‍රතිඵලයක් විධියට මේ රටේ ජනතාවගේ ජීවිත අහිමි වෙලා තිබෙනවා.

අපි දන්නවා, නාය යාම් සිදු වෙන්නේ කඳුකරයේ විතරක් නොවෙයි කියලා අපේ රටේ පසුගිය ඉතිහාසය බැලුවොත් මහ බැංකුව නාය ගියා. අපේ රටේ ජාතික සමගිය නාය ගිහින් තිබුණා, ආගමික සංහිඳියාව නාය ගිහින් තිබුණා. ඒ නිසා මේ නීති රීති ගොඩ නඟන අතරේ සමස්තය ගොඩ නැඟීමේ කාර්යය වෙනුවෙන් එක් පියවරක් තමයි මේ අරගෙන තිබෙන්නේ, ජනතාවගේ ජීවිතවලට වග කියන්න. මේකේ බරපතළකම තේරෙන්න, මේ නීති රීතිවල තිබෙන දෝෂ තේරුම් ගන්න මම මේ කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2014 අවධියේ මම හිටියේ ඌව පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට. හපුතලේ පූනාගල ප්‍රදේශයේ මීරියබැද්ද නාය ගියා 2014 ඔක්තෝබර් මාසයේ 29වෙනි දා. ඒකෙන් තමයි ජීවිත 36ක් අහිමි වුණේ. ඒ වෙලාවේ මම ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයෙන් ඇහුවා, "මෙතැන නාය යනවා කියලා ඔබතුමන්ලා හඳුනාගෙන තිබුණේ නැද්ද? මොකද, ඔබතුමන්ලාට තමයි ඒ වගකීම තිබෙන්නේ" කියලා. එතුමන්ලා ලිපි ලේඛන අවුස්සලා මට පෙන්වූවා, 2014දී නාය ගිය තැන අනිවාර්යයෙන් අධික ලෙස නාය යන ස්ථානයක්, එහි ලයිම්වල ඉන්න ජනතාව වහාම ඉවත් කරන්න කියලා ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය විසින් 2007දී වාර්තාවක් නිකුත් කර තිබෙන බව. ඒ ලියුම යොමු කරලා තිබුණේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට, රජයේ ඉහළ ආයතනවලට. දිස්ත්‍රික් ලේකම්තුමාගෙන් අහනකොට ලිපි ලේඛන අවුස්සලා කිව්වා, අපි ඒක හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම්තුමාට දැන්වූවා කියලා. හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගිහිල්ලා ඇහුවාම, files ටික අවුස්සලා බලනකොට ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඒක ග්‍රාම නිලධාරි මහත්මයාට දැනුම් දීලා තිබෙනවා. ග්‍රාම නිලධාරී මහත්මයා files ටික අවුස්සලා අවුස්සලා මට පෙන්වලා දුන්නා, "මෙතැන නාය යන ස්ථානයක්, මෙතැනින් ඉවත් වෙන්න" කියලා තුන් පාරක් ගිහින් ජනතාව දැනුවත් කරලා තිබෙනවා කියලා. ඉතින් ලයිමේ ඉන්න කට්ටියට ඉවත් වෙන්න තැනක් තිබුණේ නැහැ. බිම් අඟලක් නැහැ, එයාලාට ඒ අයිතිවාසිකම් දීලා තිබුණේ නැහැ. ඒ නිසා ජීවිත 36ක් අහිමි වුණා. ඊට පස්සේ මම පළාත් සභාවේදී යෝජනාවක් දාලා කිව්වා, "ඒ, ස්වාභාවික ආපදාවකින් සිදු වුණු මරණ 36ක් නොවෙයි, රජය දුර්වල විධියට ක්‍රියාත්මක වීම නිසා සිදු වුණු මිනී මැරුම් විධියට ඒවා සලකන්න ඕනෑ" කියලා. එවැනි තත්ත්වයක් තුළ මේ නීතිය ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරන්න අපි කැමැතියි. ඒ අනුව මේ රටේ නීතිමය පැත්තෙන් තව ශක්තිමත් විය යුතු ස්ථාන ගොඩක් තිබෙන බව අපි දකිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නාය යාම් සම්බන්ධයෙන් කථා කරනකොට නාය යාම් ප්‍රධාන වශයෙන් වර්ග දෙකකට බෙදෙනවා. එකක්, ස්වාභාවික හේතූන් නිසා සිදු වන නාය යාම්. අනෙක, මානව ක්‍රියාකාරිත්වය නිසා සිදු වන නාය යාම්. දැන් අපේ රටේ වැඩිපුර නාය යාම් සිදු වෙන්නේ මානව ක්‍රියාකාරිත්වය නිසායි. දැන් මේ ගරු සභාවේදී උමා ඔය සම්බන්ධයෙන් එක මන්ත්‍රීවරයෙක් කථා කළා. උමා ඔයෙන් සිදු වෙච්ච නාය යාම්, විනාශයන් සුළුපටු නැහැ. ඒ නාය යාම් ස්වාභාවික නාය යාම් නොවෙයි; වැරදි ව්‍යාපෘතියක්; පරිසර අධ්‍යයන වාර්තා නිරවද්‍ය ලෙස සකස් කරන්නේ නැතිව, විද්‍යානුකූල ලෙස කරන්නේ නැතිව කළ ව්‍යාපෘතියක් නිසා ඇති වූ ඒවා. මධ්‍යම කඳුකරයේ නාය යාම් සිදු වනවා නම් ඒ ප්‍රදේශයේ ජනතාවට විතරක් නොවෙයි බලපාන්නේ. අපේ රටේ හදවත කියන්නේ මධ්‍යම කඳුකරය. එතැනින් තමයි අපේ සියලුම දිය සීරාවන් උල්පත් ටික උපදිනු ලබන්නේ. ඉතින් ඒවා අහිමි වෙනවා කියන්නේ රටකට මහා ප්‍රශ්නයක්. අන්න එවන් මධ්‍යම කඳුකරයේ නැඟෙනහිර බෑවුම තමයි උමා ඔය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරපු බෑවුම. ඒ නිසා ඒවා මානව ක්‍රියාකාරීත්වය නිසා සිදු වෙච්ච නාය යාමක් කියනවාට වැඩිය හොඳයි, ආණ්ඩුවේ ක්‍රියාකාරීත්වය නිසා සිදු වෙච්ච නාය යාමක් කියලා වර්ග කරන එක. මොකද, ආණ්ඩුවක් ගත්ත වැරදි තීන්දුවක් නිසා තමයි එය සිද්ධ වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ දවසේ අපේ කැබිනට් මණ්ඩලය රැස් වුණා. උමා ඔය ප්‍රශ්නය තවම අහවර නැහැ. සමහරු හිල හොයන්න කථා කරනවා නේ. ඇබෙටවත් ගහන්න පුළුවන් එකක් නම් ප්‍රශ්නයක් නැහැ, කථා කරපු කට්ටිය. ඒ නිසා මම මේ කියන්නේ. මේ උමා ඔය ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අපි ඊයේ කැබිනට් මණ්ඩලයේදී කථා කළා. වෙච්ච විනාශයට තවමත් වන්දි ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ වෙනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තවම නඩුව තිබෙනවා. මම ස්තුතිවන්ත වෙනවා පරිසර යුක්ති කේන්ද්‍රයට. හේමන්ත විතානගේ මහත්තයලා මූලික වෙලා, අපි ජනතාවත් එක්ක එකතු වෙලා නඩු දැම්මා. ආණ්ඩුව යමක් දුන්නා නොවෙයි. නඩු කියලා උද්ඝෝෂණ කරලා අපි ගත්තේ. සම්පූර්ණ හානි වුණා කියලා ආණ්ඩුව වාර්තා කරන නිවාස ප්‍රමාණය; උමා ඔය ව්‍යාපෘතිය නිසා කඩා වැටිලා, ඉරි තලා, පුපුරලා බිමට වැටුණු නිවාස ප්‍රමාණය 8,374යි. එතකොට උමා ඔය ව්‍යාපෘතියෙන් හානියක් වුණේ නැද්ද? මෙතුමන්ලාගේම රජයන් කාලයේ පිළිගත්ත වාර්තා මම මේ කියන්නේ. ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය දීපු වාර්තා මම මේ කියන්නේ. නඩු කියලා අපි මේවායින් ගෙවල් අටදහස් ගණනකට වන්දි ගත්තා රුපියල් කෝටි ගණනක්. ඊයේ අපි කැබිනට් මණ්ඩලයෙන් සම්මත කර තීන්දු කළා තවත් නිවාස 1,153කට වන්දි ගෙවන්න. ඒ, වාර්තා සම්පූර්ණ කරපුවා. ඒ වාගේම වාර්තා සම්පූර්ණ කරපු නැති, පුපුරා විනාශ වෙච්ච නිවාස තවත් තිබෙනවා. ඒවා සම්බන්ධයෙන් අපි ඊයේ දිස්ත්‍රික් ලේකම්තුමාගේ මූලිකත්වයෙන් කමිටුවක් පත් කරන්න තීන්දු කළා. ඒ මිනිස්සු මරණයට පත් වෙන්න දෙන්න බැහැ, පුපුරපු ගෙයක් ඇතුළේ තියලා. ඒ අයටත් වෙච්ච හානිය සම්බන්ධයෙන් තක්සේරු කර ඔවුන්ටත් යමක් කරන්න ඕනෑ කියලා තීන්දු කළා. උමා ඔය ව්‍යාපෘතිය නිසා ඇල්ල සහ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකේ විතරක් බිමටම සමතලා වෙච්ච නිවාස ප්‍රමාණය -ඔය කියන ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ වාර්තාවලට අනුව- 256යි. තවම අපිට ඉඩම් ටික දීලා ඉවර කර ගන්න බැරි වුණා. මේවා මේ අද ඊයේ වෙච්ච දේවල් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුල් අවස්ථාවේදී දිය උල්පත් හත්දහස් ගණනක් සිඳී ගියා. ඒ නිසා සමහරුන්ට තවමත් බොන්න වතුර නැහැ. ඒ නිසා අපි ඊයේ ඒ සම්බන්ධයෙනුත් තීන්දුවක් ගත්තා. සිහිලැල් පුරවරය කියන බණ්ඩාරවෙල, වතුර උපන් තැන බොන්න වතුර නැති නිසා තවම බවුසර්වලින් වතුර බෙදනවා.

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

උමා ඔයේ හිල පාදන කට්ටියට අපි මේ කියන්නේ. ඒ නිසා ඊයේ අපි තීන්දුවක් ගත්තා තවදුරටත් බවුසර්වලින් වතුර බෙදීමට ප්‍රතිපාදන ආණ්ඩුව යොදන්න. මොකද, එය මිනිස්සුන්ගේ මූලික අවශ්‍යතාවක්. ඒ වාගේම අපි ඊයේ තීන්දු කළා පාංශු සංරක්ෂණ වැඩ පිළිවෙළක් කරන්න. උමා ඔය පහළ නිම්නයේ මිනිස්සුන්ට ජල භිහයකට මුහුණ නොදෙන්න මහා ජලාශයක් -තල්පිටිගල ජලාශය- ඉදි කරන්න අපි ඊයේ කැබිනට් මණ්ඩලයේ දී තීන්දු කළා. මේ විධියට තීන්දු ගන්න වුණේ මෙවැනි රාජ්‍ය ආයතනවලට හරි නීතියකින් බලයක් දීලා තිබුණේ නැති නිසා. හරියට නීතිය ක්‍රියාත්මක වුණේ නැති නිසා. පරිසර නීති තිබුණත් ඒවා නොතකා වැඩ කළා. ඒ නිසා අපි හිතනවා මේ රජයට; අපිට වගකීමක් තිබෙනවා නීත්‍යානුකූල ලෙස මේ රටේ වැඩ කටයුතු කරන්න.

අපේ දිස්ත්‍රික්ක ගත්තොත්, රට ගත්තොත් මේ නාය යාම් ප්‍රශ්නය ඉතා දරුණුයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මීරියබැද්ද නාය ගියාට පස්සේ අපි පළාත් සභාවල යෝජනා දාලා එවකට අපේ පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරු මැදිහත් වෙලා දිගින් දිගටම රජයෙන් ඉල්ලීමක් කළා, මේවායේ පස් කඳු යට මිනිස්සු වැළලෙන්න දෙන්න බැහැ කියලා. දැන් මම වැවිලි කර්මාන්ත ඇමතිවරයා. අපේ වැවිලි ක්ෂේත්‍රය තමයි වැඩිහරියක් මේ අනතුරට පත් වෙන්නේ. මොකද, මේ මධ්‍යම කඳුකරයේ විශාල වශයෙන් ඉන්නේ වැවිලි ක්ෂේත්‍රයේ ජනතාව. බදුල්ල දිස්ත්‍රික්කයේ අපි බලපෑම් කරලා, 2015, 2016 වසරවල, - NBRO එකේ නිලධාරින්ට අපි ස්තුතිවන්ත වෙනවා,- බොහොම දුෂ්කර තත්ත්වයන් මත ඒ අය අධ්‍යයනයක් කරලා සිතියම්ගත කිරීම මඟින් වාර්තාවක් නිකුත් කළා, බදුල්ල දිස්ත්‍රික්කයේ සමස්ත භූමි ප්‍රමාණයෙන් සියයට 66.9ක භූමි ප්‍රමාණයක් නාය යාම් අවදානමේ තිබෙන්නේ කියලා. දැඩි නාය යාම් සිදු වෙනවා කියලා නමින් නමට නිවාස නම් කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බදුල්ල දිස්ත්‍රික්කයේ නාය යාම්වලට ගොදුරු වෙනවා කියලා නම් කරපු නිවාස ප්‍රමාණය 5,064ක්. ඒක නුවරඑළියේ 897ක්. දැන් මේ මිනිස්සු මෙහෙම මැරෙනකන් අපට බලාගෙන ඉන්න පුළුවන්කමක් නැහැ.

පෙර අපි මේවා ගැන විවේචන එල්ල කළා, පැවැති ආණ්ඩුවලට. නමුත් දැන් අපේ ආණ්ඩුවට වගකීමක් තිබෙනවා, ඒ ගෙවල් කඩාගෙන වැටිලා මිනිස්සු වැළලෙන්න නොදී, මේ නීති රීති ශක්තිමත් කරලා, බයක් සැකක් නැතුව ජීවත් වෙන්න පුළුවන් ස්ථිර නිවාසයක ඒ ජනතාව පදිංචි කරවන්න. අන්න ඒකට අනුව මේ ලබන ඔක්තෝබර් 12වැනි දා වැවිලි ක්ෂේත්‍රයේ, නාය යාම්වලට ගොදුරු වෙන්න නියමිත, අධි නාය යාම් අවදානමේ ඉන්න පවුල් 2,125කට බණ්ඩාරවෙලදී ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් රුපියල් ලක්ෂ 32ක් වටිනා නිවසක් සහ පර්චස් 10ක ඉඩම් කැබැල්ලක් ලබා දීලා, ඒ ජනතාවට යම් සහනයක් ලබා දෙන්න අපි තීන්දු කරලා තිබෙනවා. ඒ නිසා යම් කටයුත්තක් සිදු වෙනවා. ඔබට අපි මතක් කරන්න කැමැතියි, මේ NBRO එක පසුගිය ආණ්ඩු කාලවල -අවුරුදු ගණනක් තිස්සේ- නිකුත් කළ වාර්තා අතර තිබෙනවා, -අපේ දිස්ත්‍රික්කයේ මම මේ කියන්නේ- මේමලේ දෙමළ විදුහල. ඒක ඇල වෙලා, පුපුරලා තිබෙන්නේ. ඒ පාසල නාය යන පාසලක්. ඒ වෙනුවට අපට පාසලක් දෙන්න වෙනවා. ඒ වාගේම මක්කල්දෙනිය පාසල නාය යන පාසලක්. ඒ වාගේම තමයි මීරියබැද්ද පාසල; මහකන්ද ආර්නෝල්ඩ් පාසල; ග්ලෙන් ඇල්පින් පාසල. ඒ විධියට ගත්තාම වැවිලි ක්ෂේත්‍රයේ විශාල ප්‍රශ්න ප්‍රමාණයක් තිබෙනවා. මම මේ උදාහරණ කිව්වේ. බදුල්ල දිස්ත්‍රික්කයේ නාය ගිය ස්ථාන 15ක් මේ අවුරුද්දේ ප්‍රතිසංස්කරණය කරනවා. ආරක්ෂිත වැටි දමනවා; ආරක්ෂිත ක්‍රම අනුගමනය කරනවා. ඒ සඳහා වෙන් කළ මුදල, රුපියල් මිලියන 1,500ක්. ඉතින් ඒ තරම් විශාල මුදලක් ඒවාට වැය වෙන්නේ, ස්වභාව ධර්මය නිසි ලෙස කළමනාකරණය කරමින්, පාරිසරික මිතුරු සංවර්ධනයක නො නියැලීමේ ප්‍රශ්නය නිසායි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා මේ රට බරපතළ තත්ත්වයකට පත් වෙලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
අවසන් කරනවා.

ලෝකයත් දැන් කථා කරන විශාල මාතෘකාවක්, පාරිසරික ප්‍රශ්නය. අපේ රටේත් පරිසරයට ආදරය කරන නායකත්වයක් තිබෙන්නේ. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ මේ දේශපාලන ගමනේදී, අපේ ව්‍යාපාරය මේ පාරිසරික තත්ත්වයන්ට, පාරිසරික කාරණාවලට මුල් තැන දෙමින්, අදාළ නීති සම්පාදනය කරමින්, මේ රටේ ජනතාව ආරක්ෂා කරමින් යන ගමනේදී සම්මත කරන පනතක් හැටියට මේ සඳහා කාගේත් සහයෝගය ලබා දෙන්න කියන ඉල්ලීම කරමින්, මා නිහඬ වෙනවා.

බෙහෙවින් ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[පි.ව. 3.59]

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் இச்சபையில் தேசியக் கட்டிட ஆராய்ச்சி நிறுவகம் சட்டமூலம் விவாதத்துக்கு எடுத்துக்கொள்ளப்பட்டு இருக்கின்றது. உண்மையிலேயே இந்த நிறுவகம் உருவாக்கப்பட வேண்டிய கட்டாயத் தேவை இருக்கின்றது. காரணம், இந்த நாட்டின் மலைச்சாரல்களில் இருந்து உருவெடுக்கின்ற நீரானது கடலைச் சென்றடைவதற்கு இடையில் இந்த நாட்டு மக்களுக்குப் பல இன்னல்களை ஏற்படுத்துகின்ற அதேநேரம், பல நன்மைகளையும் ஏற்படுத்துகின்றது. குறிப்பாக, இந்த நாட்டில் அடிக்கடி disaster ஏற்படுவதனால், கூடுதலான அரச நிதியை மக்களுடைய பாதுகாப்புக்கும் அவர்களின் இடரைப் போக்குவதற்கும் பயன்படுத்தவேண்டி உள்ளது. எனவே, தேசியக் கட்டிட ஆராய்ச்சி நிறுவகத்தை உருவாக்குவது காலத்தின் தேவையெனக் கருதுகின்றேன்.

கிழக்கு மாகாணத்தின் அம்பாறை மாவட்டத்தில் பாரிய அனர்த்தம் ஏற்படுவதற்குப் பிரதான காரணியாக இருப்பது, ஒலுவில் பிரதேசத்தில் அமையப் பெற்றிருக்கின்ற துறைமுகமாகும். ஒலுவில் துறைமுகத்துக்கான திட்டம் வரையப்படும்போது, இவ்வாறான விடயங்கள் கவனத்தில் கொள்ளப்படவில்லை. இதனால் இன்று அந்தப் பிரதேசத்தில் இருக்கின்ற மீன்பிடித் தொழிலாளர்கள் பாதிக்கப்பட்டு இருக்கின்றார்கள். குறிப்பாக, சுமார் 10,000 குடும்பங்கள்

நேரடியாகப் பாதிக்கப்பட்டு இருக்கின்றன. மேலும், அந்தப் பிரதேசத்தில் இருக்கின்ற தோட்டங்கள், வயல்கள், காணிகள், பொருளாதார ரீதியாக நன்மை பயக்கின்ற ஏனைய விடயங்கள் என அனைத்தும் சேதமாக்கப்பட்டு இருக்கின்றன. இவை அனைத்தையும் இழந்துவிட்டபோதிலும், ஒரு தேவையையேனும் பூர்த்திசெய்யக்கூடிய நிலையில் இந்தத் துறைமுகம் இருக்கிறதா? என்றால், அதுவும் இல்லை! எனவே, இந்த விடயத்தைக் கவனத்திற்கொண்டு எதிர்காலத்தில் இந்தத் துறைமுகத்தை ஒழுங்கமைக்க வேண்டும். அத்துடன், அந்தப் பிரதேசத்தில் கடலரிப்பால் பாதிக்கப்பட்டுக்கொண்டு இருக்கின்ற இடங்களையும் அங்குள்ள மக்களையும் பாதுகாப்பதற்கு உரிய நடவடிக்கைகளையும் எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

செப்ரெம்பர் மாதம் 23ஆம் திகதியான இன்று சர்வதேச சைகை மொழி தினமாகும். இந்த விடயத்துடன் அதனையும் தொடர்புபடுத்தி நான் இங்கு சில விடயங்களைக் குறிப்பிட வேண்டியிருக்கின்றது. கிழக்கு மாகாணத்தில் HNDE கற்கைநெறியை நிறைவுசெய்த 255 பேருக்கு ஆங்கில ஆசிரியர் நியமனம் 2024ஆம் ஆண்டு கௌரவ செந்தில் தொண்டமான் அவர்கள் ஆளுநராக இருக்கும்போது வழங்கப்பட்டது. இந்த 255 பேரில் 50க்கும் மேற்பட்டவர்கள் அந்த ஆசிரியர் நியமனத்தைப் பெற மறுத்திருந்தார்கள். இவர்களில் அம்பாறை கல்வி வலயத்தில் 22 பேரும், மகா ஓயா கல்வி வலயத்தில் 7 பேரும், தெஹியத்தகண்டிய கல்வி வலயத்தில் 5 பேரும் அடங்குவர். காரணம், அவர்களுக்குத் தூர இடங்களுக்கே நியமனம் வழங்கப்பட்டிருந்தது.

இவர்கள் அத்தனை பேரும் பெண் ஆசிரியர்கள்! இந்த முஸ்லிம் ஆசிரியைகள் தமிழ் மொழி மூலம் பாடங்களைக் கற்பிக்கக் கூடியவர்கள். இவர்களுக்குச் சிங்களப் பிரதேசங்களுக்கே நியமனம் வழங்கப்பட்டு இருக்கிறது. சிங்களப் பிரதேசத்தில் இருக்கின்ற மாணவர்கள் தமிழ் மொழிமூலம் எவ்வாறு ஆங்கிலத்தைக் கற்றுக்கொள்ள முடியும் என்பது பிரச்சினைக்குரிய விடயமாகக் காணப்படுகின்றது. அதனால்தான் நான் சொன்னேன், இந்த விடயத்துக்கும் இன்றைய சர்வதேச சைகை மொழி தினத்துக்கும் இடையில் தொடர்பு இருக்கிறது என்று. இது இந்த அரசாங்கம் மிகக் கவனமாகப் பார்க்கவேண்டிய ஒரு விடயமாகும். இதனை ஒரு 'மாபியா' போன்று அந்த நேரத்தில் இருந்த அரசாங்கமோ அல்லது ஆளுநரோ அல்லது அவர்களுக்குக்கீழ் இருந்த நிருவாகமோ செய்திருக்கிறது என்பதை நான் இந்தச் சபையில் தெரிவிக்க விரும்புகின்றேன். இவ்வாறு மொழி ரீதியான பிரச்சினை இருக்கின்ற ஆசிரியர்களைத் தூர இடங்களுக்கு நியமித்துவிட்டு, 2-3 மாதங்களுக்குப் பிறகு தங்களுடைய பிரதேசங்களுக்கு இடமாற்றங்களை அவர்கள் கோருகின்றபோது அந்த நியமனங்களை மாற்றீடு செய்வதற்கு அவர்களிடமிருந்து இலஞ்சமாக இரண்டு அல்லது மூன்று இலட்சம் ரூபாயைப் பெற்றுக்கொண்டு கட்டங்கட்டமாக அவர்களுடைய சொந்த இடங்களுக்கு நியமனங்களை வழங்கியிருக்கின்றார்கள்.

நாங்கள் இந்தச் சபையிலும் தற்போதைய கிழக்கு மாகாண ஆளுநரிடமும் அவருடைய செயலாளரிடமும் கேட்பது என்னவெனில், தற்காலிகமாகவேனும் ஆறு மாதங்களுக்கு அல்லது ஒரு வருடத்துக்கு இந்த ஆசிரியர்களை அவர்களுடைய சொந்தப் பிரதேசங்களுக்கு இடமாற்றம் செய்யுங்கள் என்றுதான். காரணம், அவர்கள் எடுக்கின்ற சம்பளம் போதாமல் இருக்கின்றது. அதைவிட, மொழி ரீதியான பிரச்சினை மிகப் பெரிய பிரச்சினையாக இருக்கின்றது. அவர்கள் பெண்களாக இருப்பதனால் தெஹியத்தகண்டிய, பதியத்தலாவ, அம்பாறை போன்ற தூரப் பிரதேசங்களில் தங்கியிருந்து, மாணவர்களுக்குக் கல்வி கற்றுக்கொடுக்க முடியாத அளவுக்கு உள ரீதியாகப் பாதிக்கப்படுகின்ற சூழல் காணப்படுகின்றது. இது பற்றி நாங்கள் நீண்ட காலமாக, தொடர்ச்சியாக கௌரவ அமைச்சர் அவர்களிடம் பேசி வருகின்றோம். அதேபோன்று, கிழக்கு மாகாண ஆளுநரிடமும் பேசி வருகின்றோம். அவர்கள் ஓரிரு விடயங்களைச் செய்துதந்து இருக்கிறார்கள். குறிப்பாக, நாற்பதுக்கும் மேற்பட்ட ஆசிரியைகள் இவ்வாறு கஷ்டத்தின் மத்தியிலேயே தங்களுடைய தொழிலைச் செய்துகொண்டு இருக்கிறார்கள். எனவே, இதனைக் கவனத்திலெடுத்து, இதற்கான அனுமதியை வழங்குமாறு கேட்டு, எனது உரையை முடிக்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු දම්මික පැටබැඳි අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.05]

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පිහිටුවීම සඳහා වන පනත් කෙටුම්පත දෙවනවර කියවීම පිළිබඳ විවාදයට සම්බන්ධ වෙන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. 1984 සිට වසර 41ක් චක්‍රලේඛයක් මඟින් පමණක් ක්‍රියාත්මක වෙච්ච ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය, 2025 ජූලි 17වැනි දා ගැසට් කළ මේ පනත් කෙටුම්පත මඟින් ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය බවට පත් කරන්න ලැබීම ගැන රජයක් හැටියට අපි සතුටු වෙනවා. මේ පනත් කෙටුම්පත සම්මත වීමත් සමඟ ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය විධිමත් ආයතනයක්, වගකිව යුතු ආයතනයක් සහ වඩා කාර්යක්ෂම ආයතනයක් බවට පත් කරන්න අපට හැකියාව ලැබෙනවා. මේ රජය කරන වැඩ පිළිබඳවම විවාද කරමින් තමයි විපක්ෂය අද අපෙන් ප්‍රශ්න කරන්නේ, "මේ රජය පත් වෙලා අවුරුද්දක කාලය තුළ මොනවාද කළ වැඩ" කියලා. 1984දී පිහිටුවපු, තමන්ගේ රජයන් විසින්ම පිහිටුවපු ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය අවුරුදු 41ක් තිස්සේ චක්‍රලේඛයක් මඟින් පමණක් ක්‍රියාත්මක කළ අයම, අපේ රජය යටතේ, අපේ රජයේ පළමුවැනි අවුරුද්ද තුළදීම පනත් කෙටුම්පතක් ගෙනැල්ලා ඒ ආයතනය විධිමත් ආයතනයක් බවට පත් කරද්දීත් අපෙන් ප්‍රශ්න කරනවා, මේ රජය අවුරුද්දක් ඇතුළත මොනවාද කළේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2016 වසරේ මැයි 17වැනි දා අපේ රටට, විශේෂයෙන්ම කෑගල්ල දිස්ත්‍රික්කයට විශේෂ දවසක් බවට පත් වුණා - කනගාටුදායක දිනයක් බවට පත් වුණා. කෑගල්ල දිස්ත්‍රික්කයේ විශාල නාය යෑම් 25ක් සිදු වුණා, ඒ දවසේ. ඒවා අතරින් විශාලතම නාය යෑම තමයි අරණායක ප්‍රදේශයේ, අරණායක ආසනයේ සිදු වුණු සාමසර කන්ද නාය යෑම. ඒ සාමසර කන්ද නාය යෑම නිසා ජීවිත 127ක් අහිමි වුණා, නිවාස 75ක් පමණ මුළුමණින්ම විනාශයට පත් වුණා. ඒ විතරක් නොවෙයි, එදිනම බුලත්කොහුපිටිය ප්‍රදේශයේත් නාය යෑමක් සිද්ධ වුණා. ඒ නාය යෑම නිසා ජීවිත 17ක් අහිමි වුණා. 2017 වර්ෂයේ විතරක් අපේ රටේ ඇති වූ නාය යෑම් නිසා 262දෙනෙක් මිය ගිහිල්ලා තිබෙනවා. ඒ නාය යෑම්වලින් කෑගල්ල දිස්ත්‍රික්කයේ 1,985දෙනෙක් අවතැන් වුණා. නැවත පදිංචි කරන්න පුළුවන්කම

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

ලැබුණේ ඔවුන්ගෙන් 1,656දෙනෙක් පමණයි. 329දෙනෙකුට නැවත පදිංචිය සඳහා අවශ්‍ය පහසුකම් ලබා දෙන්න බැරිවෙලා තිබෙනවා. බුලත්කොහුපිටිය ලැවන් වත්තේත් එවැනි පිරිසක් ඉතිරිවෙලා ඉන්නවා. 2017 වසරේ නාය යෑමෙන් ඇති වූ විපත නිසා අවතැන් වුණු අයට ප්‍රමාණවත් පරිදි පහසුකම් ලබා දෙන්න තවමත් නොහැකි වෙලා තිබෙනවා. ඉතින්, අපේ රජය යටතේ ඒ සඳහා කඩිනම් පියවර ගනිමින් ඉන්නවා. විශේෂයෙන්ම ඒ මොහොතේ තිබුණු රජය යටතේ ගරු කබීර් හෂීම් මැතිතුමා ඒ සඳහා මැදිහත් වුණා. අඩු පාඩු සහිතව වුණත් ඒ කරන ලද මැදිහත් වීම වෙනුවෙන් අපි එතුමන්ලාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2023 වසරේදී පමණක් නාය යෑම්, ගල් පෙරළීම් ආදී සිදුවීම් 1,738ක් වාර්තා වෙනවා. අපේ රටේ කාලයක් තිස්සේ සිදු වුණු වනාන්තර හෙළි පෙහෙළි කිරීම්, අවිධිමත් ඉඩම් පරිහරණය වාගේ පරිසර දූෂණ කටයුතු නිසා නාය යෑමේ අවදානම දිනෙන් දින වැඩි වෙමින් තිබෙනවා. එවැනි වටපිටාවක් තුළ චක්‍රලේඛනයක් මඟින් පමණක් ක්‍රියාත්මක වෙමින් තිබුණු ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය බවට පත් කරලා, විධිමත් කරලා, බලාත්මක කිරීමට ලැබීම ඉතාම වැදගත් සිද්ධියක් කියලා අපි විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රට පොහොසත් රටක් කිරීම, ඒ වාගේම අපේ රටේ ජනතාවට ලස්සන ජීවිතයක් උරුම කිරීම වෙනුවෙන් තමයි අපට මේ ජන වරම ලැබිලා තිබෙන්නේ. ඒ අනුව අපේ රට සංවර්ධනය කිරීමේදී අපි මුහුණ දී තිබෙන ප්‍රධාන අභියෝග කිහිපයක් තිබෙනවා. ඉන් එකක් තමයි, සංවර්ධන කාර්යයේදී අපේ රටේ ඉඩම් සීමා සහිත වීම. ඒ වාගේම තමයි අපේ රට සාපේක්ෂව අධික ජන ඝනත්වයක් සහිත රටක් ලෙස තිබීම. ඉඩම් පිළිබඳ ප්‍රශ්නය අපට අභියෝගයක් හැටියට තිබෙනවා. විශේෂයෙන්ම අපේ කෘෂි කර්මාන්තය තවමත් යැපීම් කෘෂි කර්මාන්තයක මට්ටමේ තමයි පවතින්නේ. මෙන්න මේ කෘෂි කර්මාන්තය වෙළෙඳ පොළ ඉලක්ක කරගත් නවීන කෘෂි කර්මාන්තයක් බවට පත් කිරීමේදී ඉඩම් පිළිබඳ ගැටලුවට අපි මුහුණ පාලා ඉන්නවා. ඒ වාගේම සංචාරක කර්මාන්තය සහ නිෂ්පාදන කර්මාන්තය - manufacturing industry - වැනි අංශවලට ගමන් කරද්දී අපට භූමිය පිළිබඳ ප්‍රශ්නයට මුහුණපාන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ ප්‍රශ්නය අභියෝගයක් හැටියට තිබෙනවා. ඒ නිසා අපට විධිමත් භූමි කළමනාකරණ සැලැස්මක් අවශ්‍ය වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අන්න එවැනි තත්ත්වයක් තුළදී ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පිහිටුවීම, එය බලාත්මක කිරීම සහ එය විධිමත් ආයතනයක් බවට පත් කිරීම විශාල ඉදිරි පියවරක් හැටියට තමයි අපි සලකන්නේ.

ඉදිරියේදී අපි මේ රටේ නිසි ඉඩම් කළමනාකරණ සැලැස්මක් හදද්දී මෙම ආයතනයේ කාර්යභාරය විශේෂ වැදගත්කමක් දරනවා. විශේෂයෙන්ම කර්මාන්ත සඳහා සහ ප්‍රධාන ව්‍යාපෘති සඳහා අවශ්‍ය පරිසර වාර්තා සැකසීමේදී මෙම ආයතනයට විශාල වැදගත්කමක් ලැබෙනවා. අපේ රජය විසින් පනත් කෙටුම්පතක් ගෙනැල්ලා මෙම ආයතනය පිහිටුවා විධිමත් කිරීම ඉතාම වැදගත් සිද්ධියක් හැටියට මා දකිනවා.

මෙම විවාදයේදී අදහස් දැක්වූ මන්ත්‍රීවරු අපෙන් ප්‍රශ්න කළා, අවුරුද්දක් ඇතුළත මේ රජය මොනවාද කරලා තිබෙන වැඩ කියලා. ඒ ප්‍රශ්න කරපු මන්ත්‍රීවරුම ආණ්ඩුවක් ලෙස අපි මේ කරන වැඩ නිසා අර්බුදයට පත් වෙලා තිබෙනවා. අපි මේ රජය බලයට පත් වූ මුල් කාලය තුළම අපේ රටේ පැවැති පාතාලය මර්දනය කරන්න, පාතාලය හෙළිදරව් කරන්න වැඩ කටයුතු ආරම්භ කළා. මේ වෙනකොට ඒ පාතාලය හෙළිදරව් කිරීමේ වැඩ කටයුතු වේගයෙන් ඉදිරියට යමින් තිබෙනවා. අපේ රටේ ක්‍රියාත්මක වෙමින් තිබුණු ඒ වෛර වළල්ල මේ වෙනකොට හෙළිදරව් වෙමින් තිබෙනවා. පාතාලය, මත්ද්‍රව්‍ය ජාවාරම සහ ඊට සම්බන්ධ දේශපාලන අධිකාරිය මේ වෙනකොට හෙළිදරව් වෙමින් තිබෙනවා. ඒ හෙළිදරව් වීම නිසා මෙතෙක් කල් ඒ පාතාලය නඩත්තු කරපු, ඒ මත්ද්‍රව්‍ය ජාවාරම්වලට පහසුකම් සැලසූ ඒ දේශපාලන අධිකාරිය දැන් අර්බුදයට පත් වෙලා ඉන්නවා.

අපේ රටේ දූ දරුවන්ට, තරුණ තරුණියන්ට, මේ රටේ අනාගත පරම්පරාවට "අයිස්ලන්තයක්" විධියට උරුම වෙන්න තිබුණු මේ රට අපි වසරක් ඇතුළත කළ ඒ වැඩ කොටස තුළින් බේරා ගනු ලැබුවා. අපේ රටේ පැවැති අනෙකුත් කර්මාන්ත කඩා වැටෙන්න ඉඩ හරිමින් මේ රටේ මත්ද්‍රව්‍ය නිෂ්පාදනාගාර ඇති කිරීම සඳහා තමයි පසුගිය කාලවල පැවැති ආණ්ඩු, ඒ ආණ්ඩුවල සිටි නායකයන්, පාලකයන් කටයුතු කරලා තිබුණේ. එවැනි බේදවාචකයක් කරා ගමන් කරමින් තිබුණු රට දැන් ආපසු හැරෙමින් තිබෙනවා. අද වනවිට මේ රට මත් උවදුරින් ගලවා ගැනීම සඳහා, මේ රටින් පාතාලය තුරන් කිරීම සඳහා අපි කටයුතු කරමින් තිබෙනවා. මේ රටේ පාසල් දූ දරුවන්, තරුණ තරුණියන්, දෙමව්පියන් ඇතුළු සියලුදෙනා ඒ මත්ද්‍රව්‍ය ජාවාරමට උදවු කරපු, ඒ පාතාලය නඩත්තු කරපු ඒ දේශපාලන අධිකාරිය ප්‍රතික්ෂේප කිරීමට දැන් පෙළ ගැසෙමින් තිබෙනවා. ඒ නිසා තමයි ඒ හිටපු දේශපාලන අධිකාරිය දැන් කලබල වෙලා තිබෙන්නේ. ඒ අය කලබල වෙලා දැන් නන් දොඩවමින් ඉන්නවා. ඒ නිසා ඒගොල්ලන් උත්සාහ කරනවා, මේ රජය ක්‍රියාත්මක කරමින් ඉන්න සංවර්ධන වැඩ කටයුතු, ඒ වාගේම ආයතන කාර්යක්ෂම කිරීමේ වැඩ කටයුතු අඩපණ කරන්න. ඔවුන් ඒ සඳහා මැදිහත් වෙමින් ඉන්නවා.

විදුලිබල මණ්ඩලය කියන්නේ අපේ රටේ ලාභ ඉපයිය යුතු ආයතනයක්. නමුත් පසුගිය කාලයේ විදුලිබල මණ්ඩලය ඒ ආකාරයෙන් ලාභ ඉපයුවේ නැහැ. ඒ තුළ වංචා, දූෂණ, අක්‍රමිකතා බොහොමයක් සිද්ධ වුණා. විදුලිබල මණ්ඩලය කෑලි කිහිපයකට කඩා පෞද්ගලීකරණය කිරීමේ සැලැස්මක් පසුගිය කාලයේ පැවැති ආණ්ඩු දියත් කළා. නමුත් අපේ රජය ඒක වෙනස් කරලා, විදුලිබල මණ්ඩලය පෞද්ගලීකරණයෙන් ගලවලා පූර්ණ රාජ්‍ය ආයතනයක් හැටියට පවත්වා ගෙන යමින්, ඒක කාර්යක්ෂම, ලාභ ලබන ආයතනයක් බවට පත්කරන්නට අවශ්‍ය වෙනස්කම් කරද්දී, මේ අය ඊට ඉඩ නොදී, අකුල් හෙළමින් කටයුතු කරනවා.

මේ රජය මේ රට ගොඩනැඟීමේ පොරොන්දුව මේ රටේ ජනතාවට දීලා තිබෙනවා, ඒ වෙනුවෙන් වග වෙමින් ඉන්නවා, ඒ සඳහා කටයුතු කරමින් ඉන්නවා. විශේෂයෙන්ම පාතාලය, මත්ද්‍රව්‍ය ජාවාරම ක්‍රියාත්මක කරමින්, ඒවා නඩත්තු කරන දේශපාලන අධිකාරිය විසින් කරන බාධා කිරීම් පරාජය කරමින් අපි අපේ ජනතාවට වග වෙන, ජනතාවට දුන් පොරොන්දු ඉෂ්ට කරන ක්‍රියාමාර්ග ඉදිරියට ගෙන යන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

*අනතුරුව ගරු චානක මාදුගොඩ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. CHANAKA MADUGODA left the Chair and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[4.17 p.m.]

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

*Bismillahir Rahmanir Raheem.*

Hon. Deputy Chairperson of Committees, this morning, the Supreme Court issued a judgment convicting the former Controller General of Immigration and Emigration to three years' imprisonment over an issue of contempt of court. That judgment was delivered following a complaint we made to the court regarding the delay by the respondents to implement an Interim Order that was given in the cases filed by three of us, former Members of Parliament President's Counsel M.A. Sumanthiran and Patali Champika Ranawaka and myself, challenging the new e-visa scheme, which was to be implemented without following proper procurement procedures. We pointed out to court that as a result of a contract entered into for over a period of 16 years with a dubious company, the country would have lost almost US Dollars 3.4 billion worth of revenue that would have been accrued to it. The main matter was fixed for argument on the 20th of November this year though this judgment was delivered only regarding the issue of contempt of court. This is an abject lesson for public officials who carry out the orders of their superiors without looking at the implications for them when it comes to issues of fraud. It was pointed out to court that the deliberate delay to implement the Interim Order would have cost a further US Dollars 800 million loss to the Government and the court took into consideration various matters; the accused respondent's unwillingness to express remorse for his conduct and his delayed plea of guilt were all taken into consideration. The court had also referred to the legislation relating to contempt of court, which does not provide for an upper limit for any punishment. However, today, the court ruled that that upper limit should be fixed at seven years' rigorous imprisonment for any contempt of the Supreme Court. Also, taking into consideration a variety of other matters, this respondent was found guilty and sentenced to three years and the two years he has spent in remand prison has also been taken into account.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

විපක්ෂය පැත්තෙන් කථා කරන අබ්දුල් වාහිද් මන්ත්‍රීවරයාගේ කාලයත් මම ගන්නවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

Madam, I would like to point out that I had referred this issue to the Committee on Public Finance chaired by the Hon. (Dr.) Harsha de Silva. That whole episode was inquired into by the Committee led by him and he submitted a report. That 600-page report mentioned very clearly that the Auditor-General must submit a forensic audit on the loss that was to be incurred to the Government as a result of this dubious contract to be given to a very dubious company registered in Dubai and which was also using a company like the VFS as a front to do it. I do not know why the VFS got into such a very dubious contract. However, being a reputed company, they themselves had got their names also tarnished in the process. Anyway, the main matter is up for argument on the 20th of November, and we are yet to receive the forensic audit report by the Auditor-General. Therefore, I want to put it on record here so that he would expeditiously make it available and it would be available for us, the petitioners, to be brought to the notice of the court when the matter is taken up for argument.

Having said that, Madam, I would like to say that we are discussing the National Building Research Institute Bill today. I believe with regard to disaster management and a variety of other issues, this particular organization which currently exists as the National Building Research Organization is performing a very important function. It is good to bring in a Bill like this and make the structure much more firm, providing various different stipulations relating to the Institute itself. But, I feel that in the structure of the Institute, they should have included some other organizations as well such as the Urban Development Authority and the Sri Lanka Land Reclamation and Development Corporation. Those are also two important institutions that should have been part of this Institution; at least in the Board, they should have been given some representation. The other members of the Board would be engineers who are well versed in fields like structural engineering and those engaged in areas of geological survey and architecture. It would have been better, rather than leaving it to the Minister to decide on whom to appoint, to have nominees of the Sri Lanka Institute of Architects and the Institution of Engineers, Sri Lanka in the Board; those professional organizations could pick and choose the correct persons to be nominated to the Board of the Institute rather than leaving it to be done on the whims and fancies of the successive Ministers.

Beyond that, I would like to talk about some of the disasters that we faced recently, particularly the frequent floods that we experienced in Akurana area. We had requested the District Development Committee to involve the Sri Lanka Land Reclamation and Development Corporation to address that particular issue. But, so far, no concrete decision has been made except to take action against unauthorized structures which are causing flooding of the Akurana Town. We are now facing the

[ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා]

monsoon season. Towards the end of the year, once again, there is a danger of the Akurana Town flooding. If action is not taken expeditiously, particularly to involve an important specialist organization like the Sri Lanka Land Reclamation and Development Corporation who had already submitted a feasibility report, there would be a serious issue. I would like to mention that here because it is of urgent necessity to have a scientific approach to contain the frequent flooding that takes place in Akurana area.

The other issue concerns several schools that had been damaged due to landslides in the Central Province. Of course, the Hon. Minister Samantha Viddyarathna pointed out about school buildings in Badulla District being damaged. Also, there are more than 50 to 60 buildings in Kandy District alone which had been rendered unusable because of threats of landslides. So, those buildings have to be replaced. Therefore, I would like to request this Institute to submit a report so that the Ministry of Education could provide sufficient funds to do that.

Similarly, I would also like to point out about the increasing number of skyscrapers we see coming up in Colombo and the suburbs today. Several very tall apartment buildings and other buildings are coming up, but the Colombo Municipal Council lacks the required capacity for firefighting.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Okay, Madam.

With buildings rising up to almost 40 to 50 floors, if there would be a sudden fire in higher floors, whether the Colombo Municipal Council has the required firefighting capacity is a very serious issue. Therefore, that has to be addressed and I would like the Government to pay attention to that. Since the Government is now controlling the Colombo Municipal Council, immediate action must be taken to have sufficient cranes which could reach up to 40, 50 floors to contain a sudden fire that erupts in one of those high-rise buildings in Colombo and suburban areas. That is another matter relating to disaster management, which also comes - perhaps, to a certain extent - under the purview of this particular Institute and which should be looked into.

Having said that, I congratulate the Government for having brought in this Bill and conclude my remarks.

Thank you.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අර්කම් ඉල්යාස් මහතා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.28]

**ගරු අර්කම් ඉල්යාස් මහතා**
(மாண்புமிகு அர்கம் இல்யாஸ்)
(The Hon. Arkam Ilyas)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ආපදා තත්ත්වයන්ට සාර්ථකව මුහුණ දීම, ඒවා වැළැක්වීමට අදාළ කටයුතු කිරීම, ගොඩනැඟිලි ඉදිකිරීම සහ ඒවායේ ගුණාත්මකභාවය සඳහා වූ භූ පාරිසරික නිර්දේශ ලබා දීමේදී සිදුවන ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා වන ආයතනය පනතක් මඟින් ස්ථාපනය කරන්න අද අපට පුළුවන් වනවා. 1984දී, ඒ කියන්නේ මීට අවුරුදු 41කට පෙර පිහිටුවූ ආයතනයක් අද වනතෙක් පනතක් මඟින් ස්ථාපනය නොකිරීම විශාල අඩුපාඩුවක් කියලා අපි හිතනවා. වෘත්තිකයන් වශයෙන් වාගේම ක්ෂේත්‍රයේ නිපුණයන් විශාල පිරිසක් - ඉංජිනේරුවන්, භූ විද්‍යා විශේෂඥයන්, architectsලා, town and country plannersලා වාගේ 150ක් පමණ - සේවය කරන මෙම ආයතනයේ සම්පූර්ණ සේවක සංඛ්‍යාව 350ක් විතර ඉන්නවා. විශේෂයෙන් අපේ රටේ පුරවැසියන්ගේ ජීවිත, දේපළ සහ ආර්ථිකය පිළිබඳව නිර්දේශ කරන මෙම ආයතනයට නිසි නීත්‍යනුකූල පරිසරයක් යටතේ කටයුතු කිරීමේ අවස්ථාව මෙතුවක් කල් නොලැබීම ගැන අපි කනගාටුවට පත් වනවා.

මෙම ආයතනය අද වන විට මෙම ක්ෂේත්‍රයේ විශාල පරාසයකට විවිධ සේවා ලබා දෙනවා. මම ඒකෙන් විශේෂයෙන් කරුණු තුනක් ගැන කථා කරන්න කැමැතියි. නාය යෑමේ අවදානමට ලක්ව ඇති ප්‍රදේශ පිළිබඳව පර්යේෂණ හා සමීක්ෂණ කිරීම සහ එම කටයුතු ප්‍රවර්ධනය කිරීම, නාය යෑම් හෝ විශේෂිත භූ තාක්ෂණික අස්ථාවරතාවක්, එහෙම නැත්නම් geotechnical stability එක අවම ප්‍රදේශවල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී, ගොඩනැඟිලි ඉදිකිරීමේදී අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම, දැනට පවතින ගොඩනැඟිලිවල තත්ත්ව වාර්තා ලබා දීම සහ යම් ව්‍යාපෘතියක් හෝ ඉදිකිරීමක් නිසා අසල ඇති වෙනත් ඉදිකිරීම්වලට සිදු වූ හෝ සිදු වීමට ඇති බලපෑම පිළිබඳ වාර්තා ඉදිරිපත් කිරීමත් මෙම NBRO එක කරගෙන ගියා. අද ඉඳන් ඒවා NBRI එකේ වගකීම් වනවා.

ඉංජිනේරු තාක්ෂණය පැත්තෙන් එවැනි ඉතා වැදගත් උපදෙස් දෙන ආයතනයක් විධියට මෙම ආයතනය ක්‍රියාත්මක වනවා. අපි දන්නවා, ලංකාව කියන්නේ විශේෂයෙන් අවදානම් සහිත කඳු ආශ්‍රිත ප්‍රදේශ බහුල වශයෙන් පවතින රටක් කියලා. සංඛ්‍යාත්මකව ගත්තොත් ඒක සියයට 30ක වාගේ ප්‍රමාණයක් වන බව තමයි අපට වාර්තා වන්නේ. දිස්ත්‍රික්කවලින් ගත්තොත්, දිස්ත්‍රික්ක 14කම නාය යෑමේ අවදානම තිබෙනවා. පසුගිය වසර විතරක් ගත්තොත්, දිස්ත්‍රික්ක 13ක නාය යෑම් 1,252ක් වාර්තා වෙලා තිබෙනවා. ඒ තුළින් පූර්ණ, අර්ධ හෝ සුළු වශයෙන් නිවාස ඇතුළු ගොඩනැඟිලි හානි 1,602ක් වාර්තා වෙලා තිබෙනවා. 2024 වසරේ පමණක් නාය යෑම් නිසා ජීවිත 6ක් අපට අහිමි වෙලා තිබෙනවා. මාතර දිස්ත්‍රික්කයේ ජීවිත 2කුත් මෙන්ම, බදුල්ල, මහනුවර, කෑගල්ල, රත්නපුර කියන දිස්ත්‍රික්කවලිනුත් ජීවිත හානි වාර්තා වෙලා තිබෙනවා.

පසුගිය වසර 10ක, 15ක කාල සීමාව තුළ සිදු වූ නාය යෑම්වලින් ජීවිත ගණනාවක් අහිමි වුණා. මීට කලින් කථා කළ මන්ත්‍රීවරු, ඇමතිවරු ප්‍රකාශ කළා වාගේ 2016 වසරේදී අරණායක ප්‍රදේශයේ සිදු වූ නාය යෑමෙන් ජීවිත 127ක් නැති වුණා වාගේම, ගෙවල් 75කට ආසන්න ප්‍රමාණයක් සම්පූර්ණයෙන්ම විනාශ වුණා. බදුල්ල, කොස්ලන්ද වතු යායේ 2014දී වෙච්ච නාය යෑමෙන් ජීවිත 200ක් පමණ නැති වුණා වාගේම, 150කට ආසන්න නිවාස ප්‍රමාණයක් විනාශ වෙලාම ගියා. මේ පනත බලාත්මක කිරීම මඟින් නීතියෙන්ම ජාතික ගොඩනැඟිලි

පර්යේෂණ ආයතනයට බලයක් හිමි වෙනවා, මෙවැනි අධිඅවදානම් කලාපවල සිදු කරන ව්‍යාපෘතිවලට, ඉදිකිරීම්වලට අනුමැතිය ලබා දීමට වැදගත් විධියට මැදිහත් වන්න.

මේ පනතින් ඇත්තටම අපි බලාපොරොත්තු වෙන්නේ මොකක්ද කියන එක කලින් කථා කරපු මන්ත්‍රීවරයෙක් කිව්වා. එතුමා තවම මේ ගැන දැනුවත් නැතුව ඇති. දැනටත් NBRO එකෙන් අදාළ areas සිතියම්ගත කරලා තිබෙන්නේ. නමුත් ඒ සිතියම් පළාත් පාලන ආයතනවලට වෙන වෙනම යවන්න ඕනෑ. ඒ අධිඅවදානම් ප්‍රදේශවල මොකක් හෝ ඉදිකිරීමකට එහෙම නැත්නම් ව්‍යාපෘතියකට අනුමැතියක් ලබා ගැනීමක් පළාත් පාලන ආයතනවලට ඉදිරිපත් වුණොත්, ඒ සඳහා NBRO එකේ අනුමැතිය, අනුකූලතාව ලබා ගැනීම මෙමඟින් අපට නීත්‍යානුකූලවම කරගන්න පුළුවන්. ඒ වාගේම එවැනි ස්ථානවල සිදු කරන්න යන ඉදිකිරීම් සීමා කරන්නත් මේ තුළින් අපට පුළුවන්. ඒ වාගේම තවත් ඉතාම වැදගත් දෙයක් තමයි, අනාගතයේ විශාල ආපදා තත්ත්ව ඇතිවීම අඩු කරගන්නත් මේ තුළින් අපට පුළුවන්කම ලැබෙන එක.

ඒ වාගේම අද වෙනකොට තිබෙන තවත් විශාලම ප්‍රශ්නයක් තමයි, කොළඹ ඇතුළු තදාසන්න ප්‍රදේශවල පසුගිය දශක කිහිපය තිස්සේ high-rise buildings විශාල ප්‍රමාණයක් ඉදිවෙලා තිබීම. විවිධ අවශ්‍යතා සඳහා භූ විද්‍යාත්මක අස්ථාවර පාංශු තත්ත්ව ඇති ස්ථානවලත් විවිධ ඉදිකිරීම් ව්‍යාපෘති සිදු වනවා. ඒ වාගේම අපි දන්නවා, එවැනි සමහර උස් ගොඩනැඟිලි සහ භූ ස්ථාවරත්වය නොමැති ස්ථානවල ඉදිකර ඇති සමහර ගොඩනැඟිලි නිවැරදි ප්‍රමිතියට අනුකූල නොවීම නිසා විවිධ ප්‍රශ්න ඇති වන බව. විශේෂයෙන්ම ගිලා බැසීම්, ඉරි තැළීම්, සමහර වෙලාවට ගොඩනැඟිලි කඩා වැටීම් පවා සිදු වුණා.

අපි දන්නවා, මීට ටික කාලයකට පෙර වැල්ලවත්ත ප්‍රදේශයේ ඉදිකරමින් තිබුණු ගොඩනැඟිල්ලක් කඩා වැටීමෙන් ජීවිත කිහිපයක් නැති වුණු බව. මහනුවර ප්‍රදේශයේ තිබුණු නිවසක් කඩා වැටීමෙනුත් පවුලකටම ජීවිත අහිමි වුණා. නමුත්, NBRO එකට මෙවැනි අවස්ථා වැළැක්වීම සඳහා වූ රෙගුලාසි නීත්‍යානුකූල තත්ත්වයක් යටතේ ලබා දීමේ අවස්ථාව මෙම පනත මඟින් ලබා දෙනවා.

අද අපේ රටේ විවිධ පෞද්ගලික ආයතන තිබෙනවා, භූමියේ ස්ථාවරභාවය, එහෙම නැත්නම් geotechnical reports ලබා දෙන. තරගකාරී වෙළෙඳ පොළ රටාව යටතේ ඒවායේ ගුණාත්මකභාවය පිළිබඳ විශාල ප්‍රශ්න අපට මේ දවස්වල ආරංචි වනවා. මෙම පනත මඟින් එම ආයතන නියාමනය කිරීමේ බලතල වාගේම, ඊට අදාළ රෙගුලාසි පැනවීමටත් හැකියාව තිබෙනවා. ඒවාට අදාළ standards ඉදිරිපත් කිරීමේ බලතලත් මේ තුළින් ලබා ගත හැකි වනවා. ඒ වාගේම ප්‍රමිතියට අනුකූල ගොඩනැඟිලි ඉදිකිරීම සම්බන්ධයෙනුත් වැදගත් තීන්දුවක් මේ මඟින් ගන්න පුළුවන්.

ඒ වාගේම මෙම ආයතනයේ තවත් විශේෂිත කාර්යභාරයක් තමයි, ඉදිකිරීම්වලට තත්ත්ව වාර්තා ලබා දීම සහ අවට සිදුවන ව්‍යාපෘති සඳහා ඉදිකිරීම්වලින් සිදුවන හානිය හෝ බලපෑම පිළිබඳව තත්ත්ව වාර්තා ලබා දීම. විශේෂයෙන්ම තදාසන්න ප්‍රදේශවල සිදු කරන ඉදිකිරීම්වලදී ඇති වන ප්‍රශ්නයක් තමයි, යම් ඉදිකිරීමක් නිසා අගතියට පත් වන පාර්ශ්ව ඒ සිදු වූ හානිය ප්‍රතිපූර්ණය කිරීම සඳහා නීතියේ පිහිට පැතීම. එවැනි අවස්ථාවල NBRO එක තාක්ෂණික වාර්තා ලබා දීම මඟින් විශාල කර්තව්‍යයක් අදටත් කරනවා. මේ පනත මඟින් එම කාර්යය සඳහාත් නිසි නීත්‍යානුකූලභාවයක් ලැබෙනවා. විශේෂයෙන්ම එවැනි විවිධ ප්‍රශ්න ඇති වන අවස්ථාවලදී ඒවා විසඳීමත් මේ තුළින් පහසු වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දුන් කාලය අවසන්.

**ගරු අර්කම් ඉල්යාස් මහතා**
(மாண்புமிகு அர்கம் இல்யாஸ்)
(The Hon. Arkam Ilyas)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම අවසාන වශයෙන් තව විනාඩියක් ගන්නවා. අපට මේ දවස්වල වැදගත්ම දෙයක් කරන්න පුළුවන් වෙලා තිබෙනවා. අද වෙනකොටත් ලංකාවේ ඉදිකිරීම් ක්ෂේත්‍රයට standard එකක් නැහැ. අදටත් අපි පාවිච්චි කරන්නේ, BS, Euro, Indian, American standards හෝ Australia, New Zealand යන රටවල standards. ඒ රටවල standards තමයි අදත් විශ්වවිද්‍යාලවල ඉදිකිරීම් ක්ෂේත්‍රයට පාවිච්චි කරන්නේ. මට කලින් කථා කරපු ගරු මන්ත්‍රීවරයෙකුත් මේ ගැන ප්‍රශ්න කළා. අපට UDA, NBRO වාගේම CIDA කියන ආයතන සම්බන්ධ කරගෙන ලංකාවටම ආවේණික වූ code of practice එකක්, එහෙම නැත්නම් standard එකක් හඳුනා ගැනීමට දැන් National Physical Planning Department එකේ අනුමැතිය ලැබිලා තිබෙනවා. අපි හිතනවා, මේ තුළින් ලංකාව තුළ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විශාල පිම්මක් පනින්න පුළුවන් වෙයි කියලා. අපටම ආවේණික වූ විධියට, ලංකාවට අදාළ පාරිසරික තත්ත්වය යටතේ, ඒ වාගේම wind conditionවලට අනුව ඉදිරියේදී අපට හොඳ ව්‍යාපෘති ඉදිරිපත් කරන්න පුළුවන් වෙයි. අපි හිතනවා, මේ වාගේ හොඳ projects ගෙන ඒම තුළින්, ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ හොඳ තත්ත්වයක් ඇති කර ගන්න අපට පුළුවන් වෙයි කියලා. ඒ වාගේම මේ පනත මඟින් ඒකට මූලාරම්භය ලැබෙනවා කියලා අපි හිතනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.35]

**ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**
(மாண்புமிகு கிட்ணன் செல்வராஜ்)
(The Hon. Kitnan Selvaraj)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று இந்த அதியுயர் சபைக்குக் கொண்டுவரப்பட்டிருக்கின்ற தேசியக் கட்டிட ஆராய்ச்சி நிறுவகம் என்ற சட்டமூலமானது நான் பிரதிநிதித்துவம் செய்கின்ற மலையகப் பிரதேசத்தைப் பொறுத்தவரை மிகவும் முக்கியமான ஒன்றாகும். தேசியக் கட்டிட ஆராய்ச்சி நிறுவனமானது - NBRO - 1984ஆம் ஆண்டு நிறுவப்பட்டது. அதனை மறுசீரமைப்பதற்கான நடவடிக்கை 2019ஆம் ஆண்டில் மேற்கொள்ளப்பட்டது. அதனை மேலும் வலுப்படுத்தி, வளப்படுத்தி அதனுடைய சேவையைச் சமூகத்திற்கும் நாட்டுக்கும் பிரயோசனமாகச் சரிவரப் பெற்றுக்கொள்வதற்கு ஏதுவான வழிமுறைகளை முன்மொழிகின்ற ஒரு சட்டமூலமாகவே இதனை இன்று நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. முதலாவதாக, இச்சட்டமூலத்தினூடாக இந்த நிறுவனம் மேலும் வலுப்படுத்தப்பட இருக்கின்றது. இரண்டாவதாக, இது தேசிய அபிவிருத்தித் திட்டங்களுக்குப் பங்களிக்கின்ற அதேவேளை, நாடாளுமன்றத்தால் அங்கீகரிக்கப்பட்ட நிறுவனமாக இயங்க இருக்கின்றது. மூன்றாவதாக, பாதுகாப்புத் தொடர்பான தகவல்களின்படி மண்சரிவு அபாயத்தைக் குறைப்பதில் இது

[ගරු කිට්නන් සෙල්වරාජ් මහතා]

முக்கிய பங்கை ஆற்றவிருக்கிறது. இவை விசேடமாக இந்தச் சட்டமூலத்தினூடாகக் கொண்டுவரப்பட்டிருக்கின்ற பிரதான மான விடயங்களாகும்.

இந்த நிறுவனம் பல வருடங்களுக்கு முன்னர் இந்த நாட்டிலே அறிமுகப்படுத்தப்பட்டு இருந்தாலும், கடந்த காலங்களில் இவற்றைச் சரிவரப் பயன்படுத்துவதற்கு ஏதுவான வழிவகைகள் இல்லாமையின் காரணமாகவே நாட்டில், விசேடமாக மத்திய மலை நாட்டில் பாரிய மண்சரிவு அபாயங்களை நாங்கள் கண்டிருக்கின்றோம் என்பது நம் அனைவருக்கும் தெரியும்! விசேடமாக, மீரியபெத்த மண் சரிவினால் பல குடும்பங்கள் பாதிக்கப்பட்டன; கிட்டத்தட்ட 40 பேருக்கும் மேல் உயிரிழந்தார்கள். அதனைத் தொடர்ந்து அதே மாவட்டத்தின் ஹல்தும்முல்ல பிரதேச சபைக்கு உட்பட்ட கபரகல தோட்டத்திலே இடம்பெற்ற மண்சரிவினால் கிட்டத்தட்ட 80 குடும்பங்களைச் சார்ந்தவர்களுடைய உடைமைகள் முழுமையாக அழிக்கப்பட்டு, அவர்கள் நடுத் தெருவுக்குத் தள்ளப்பட்டிருப்பதை நாங்கள் காணக்கூடியதாக இருக்கிறது.

அதைவிட, ஹல்தும்முல்ல பிரதேச சபைக்குட்பட்ட கெலிப்பானாவல என்ற கிராமத்திலுள்ளவர்களுக்கு இன்று வரைக்கும் சொந்த வீடுகளைப் பெற்றுக்கொடுக்க முடியாதிருக்கின்றது. அதேபோல், பசறை, கனவரெல்ல தோட்டத்திலே மண்சரிவால் பாதிக்கப்பட்டவர்கள் இருப்பதோடு, இன்னும் அந்தப் பிரதேசம் மண்சரிவு அபாயத்திற்கு உட்படக்கூடிய பிரதேசமாகவே உள்ளது. அதேபோல், பசறை, மீதும்பிட்டிய தோட்டம் உட்பட மலைப் பிரதேசங்களை உள்ளடக்கிய மாவட்டங்களில் கூடுதலான மண்சரிவு அபாயத்தை எதிர்கொள்ளும் சூழ்நிலையில் ஒட்டுமொத்தச் சமூகமும் இருக்கின்றது. இதைத் தடுக்கும் நோக்கில் இந்தச் சட்டமூலம் கொண்டுவரப்பட்டபோது எதிர்க்கட்சியினரும் சில ஆலோசனைகளை வழங்கியதன்மூலம் இந்தச் சட்டமூலத்தை நிறைவேற்றுவதற்கு ஆதரவாகவும் அவர்கள் கை உயர்த்துவார்கள் என்பதில் சந்தேகம் இருக்காதென்று நான் நினைக்கின்றேன்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, விசேடமாக இந்த அதிஉயர் சபையில் இதற்கு முன்னரும் பல சட்டமூலங்கள் கொண்டுவரப்பட்டன. அதில் விசேடமான ஒரு சட்டமூலம்தான் முன்னாள் ஜனாதிபதிகளுடைய சலுகை களைக் குறைக்கும் நோக்கில் கொண்டுவரப்பட்ட சனாதிபதிகளின் உரித்துரிமைகள் (நீக்குதல்) சட்டமூலம். அந்தச் சட்டமூலத்தைக் கொண்டுவந்தபோது எதிர்க்கட்சியினர் தங்களுடைய பாத்திரத்தை ஏற்று நடித்து, தங்களுக்கு ஏற்றவாறு கருத்துகளை இந்தச் சபையிலே முன்வைத்தார்கள். அதிலும் விசேடமாக, வடக்கு, கிழக்கைப் பிரதிநிதித்துவம் செய்கின்ற இலங்கைத் தமிழரசுக் கட்சியைச் சார்ந்தவர்கள் அழகாகத் தங்களுடைய வாதப் பிரதிவாதத்தை முன்வைத்தார்கள். ஆனால், அந்தச் சட்டமூலத்துக்கு வாக்கெடுப்பு நடத்தும் தருவாயில் அவர்கள் இந்தச் சபையில் இருந்து காணாமற்போனதை நாங்கள் காணக்கூடியதாக இருந்தது. அவ்வாறு எதிர்க்கட்சியினர் ஒதுங்கியிருந்த நிலையில், ஒரேயொரு எதிர்க்கட்சி உறுப்பினர் மாத்திரமே அதற்கெதிராக வாக்களித்தார். ஆனால், இன்று கொண்டுவந்திருக்கின்ற இந்தச் சட்டமூலமானது நாட்டின் ஒட்டுமொத்த வளங்களையும் மக்களின் வாழ்வையும் பாதுகாக்கின்ற ஒரு சட்டமூலமாக இருக்கின்றமையால், இந்தச் சட்டமூலத்தைப் பலப்படுத்த வேண்டிய, இதனை மேலும் பலமிக்க சட்டமாக மாற்றவேண்டிய கடப்பாடு எதிர்க்கட்சியினருக்கு இருக்கின்றது. அந்த வகையில், இந்தச் சபையிலே இந்தச் சட்டமூலத்துக்கு ஆதரவு தருவார்களென நாங்கள் எதிர்பார்க்கின்றோம். அதுபோல், எதிர்வரும் காலங்களில் இவ்வாறான மேலும் பல சட்டமூலங்கள் கௌரவத்துக்குரிய இந்தச் சபைக்குக் கொண்டுவரப்படுமென நான் நினைக்கின்றேன்.

அடுத்து, இன்று நாட்டில் பிரதான பேசுபொருளாக மாறியிருப்பது தங்காலைப் பிரதேசம். கடந்த காலங்களில் இலங்கையின் தலைநகரமான கொழும்பைப் பற்றி பேசிக்கொண்டிருந்தோம். ஆனால், இன்று தங்காலைப் பிரதேசம் போதைவஸ்துக்களின் தலைநகரமாக மாறியிருப்பது பேசுபொருளாக மாறியிருக்கின்றது. அந்தப் பிரதேசம் போதைவஸ்துக்களின் மர்மஸ்தானமாக மாறியிருக்கின்றது. எனவே, எதிர்வரும் காலங்களில் கௌரவத்துக்குரிய இச்சபையில் போதைவஸ்தையும் அதனோடு ஒன்றிணைந்த பாதாள உலகக் குழுவையும் முற்றுமுழுதாக ஒழிப்பதற்கு ஏதுவான சட்டமூலங்கள் கொண்டுவரப்படும்போது, தங்காலைப் பிரதேசத்தைப் பிரதிநிதித்துவம் செய்கின்ற எதிர்க்கட்சிப் பிரதிநிதிகள் அந்த மக்களின் நலனுக்காக வாக்களிப்பார்கள் என எதிர்பார்க்கின்றேன். எனவே, இந்த அரசாங்கம் கொண்டுவருகின்ற இவ்வாறான சட்டமூலங்கள் நாட்டுக்கும் சமூகத்துக்கும் பிரயோசனம் என்ற வகையில், இன்று கொண்டுவரப்பட்டிருக்கின்ற இந்தச் சட்டமூலத்தை மிகவும் மகிழ்ச்சியுடன் வரவேற்று, எனது சிற்றுரையை முடித்துக் கொள்கின்றேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**

(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)

(The Hon. Deputy Chairperson of Committees)

ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.42]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**

(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)

(The Hon. (Dr.) Ramanathan Archchuna)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට විනාඩි 8ක කාලයක් වෙන් වෙලා තිබුණා. ඒක විනාඩි 4ක් කළා. හැමදාම ඕක කරනවා. කරුණාකරලා තව විනාඩියක්වත් වැඩි කරලා දෙන්න. මම මගේ කථාව පටන් ගන්නවා.

இந்த மாதம் உங்கள் எல்லோருக்குமே தெரியும், இது எங்களுடைய தேசத்தினது சொத்து 'தியாக தீபம்' திலிபன் அண்ணாவுடைய நினைவேந்தல் அனுஷ்டிக்கப்படும் மாதமென்பது. இச்சந்தர்ப்பத்தில் அவரது ஒரு சில வரிகளை இந்தப் பாராளுமன்றத்திலே பதிவிட விரும்புகின்றேன். "நான் மரணத்தை மகிழ்ச்சியுடனும் பூரண திருப்தியுடனும்தான் தழுவிக்கொள்கின்றேன். என் தலைவனின் தலைமையில் அனைத்து மக்களும் கிளர்ந்தெழுவார்கள் என்பதை நான் உறுதியாக நம்புகின்றேன். இந்த மாபெரும் மக்கள் புரட்சி என்றோ ஒரு நாள் எம் இலட்சியத்தை நிறைவேற்றியே தீரும். மக்கள்மீது கொண்ட அசையாத நம்பிக்கையின் பேரில், அவர்கள்மீது கொண்ட தாளாத பாசத்தின் பேரில் அவர்களின் விடிவுக்காக நான் 651வது விடுதலைப்புலியாக எனது தோழர்களை நோக்கி மெதுவாகப் போய்க் கொண்டிருக்கின்றேன்." இவ்வாறு கூறி, எங்களுடைய திலீபன் அண்ணா பன்னிரண்டு நாட்கள் இந்த மண்ணிலே உணவு, நீராகாரமின்றி உண்ணாவிரதம் இருந்து இறந்து இப்பொழுது 38 வருடங்கள் கடந்து விட்டன. இன்றும் எங்களுடைய இனம் அநாதையாகவே இருக்கின்றது.

இன்றைய தினம் இச்சபையில் கொண்டுவரப்பட்டிருக்கின்ற தேசியக் கட்டிட ஆராய்ச்சி நிறுவகச் சட்டமூலம் disaster management தொடர்பான ஒரு முக்கியமான சட்டமூலமாகும். அந்த ஆராய்ச்சி நிறுவகத்தைக் கட்டமைக்கின்ற இந்தப் பிரேரணையை நான் ஆமோதிக்கின்றேன். இவ்வாறான ஒரு நிறுவகம் அமைக்கப்படுவது இந்த நாட்டுக்கு மிகவும் இன்றியமையாதது. ஆனால், கவலை என்னவென்றால், எங்களுடைய நாட்டிலே பல பகுதிகள் இருந்தாலும் வடக்கு, கிழக்கு என்ற பகுதிகளும் இருப்பதென்பது இலங்கையின் அரசாங்கங்களுக்குக் காலங்காலமாகத் தெரியவில்லை என்பதுதான். அண்மைய தினங்களில் யாழ்ப்பாணத்தில் 'அபிவிருத்தி' என்ற அடிப்படையிலே அடிக்கல் ஒன்றை நாட்டிவிட்டுச் சென்றிருக்கின்றார் எங்களுடைய மாண்புமிகு சனாதிபதி அவர்கள். அதுமட்டுமல்ல, வடக்கு மாகாணத்தில் இன்னும் பல இடங்களுக்குச் சென்று எங்களுடைய மாகாணத்தை அபிவிருத்தி செய்வதாகக் கூறியுள்ளார்.

இங்கு நான் முக்கியமான ஒரு விடயத்தைச் சொல்ல வேண்டும். Clean Sri Lanka என்ற திட்டத்தைக் கொண்டுவந்துள்ள நீங்கள், இந்த நாட்டின் வடக்கு மாகாணத்திலே அரசாங்க அதிபராகப் பதவி வகிக்கின்ற ம. பிரதீபன் என்பவர் மாபெரும் கள்ளன் என்று, உங்களால் நியமிக்கப்பட்ட ஆளுநர் எழுதிய கடிதத்தில் உள்ள விடயத்தை - எந்த அடிப்படையிலே உங்களுடைய ஆளுநர் அவர்கள் உங்களுடைய அரசாங்க அதிபரைக் 'கள்ளன்' என்று கடிதமூலம் குறிப்பிட்டு அவரை வெளியேற்றச் சொல்லியுள்ளாரோ அதனை - இன்றுவரைக்கும் நடைமுறைப்படுத்தவில்லை. அந்தக் கடிதத்தின் பிரதியை ஏற்கனவே இந்தப் பாராளுமன்றத்துக்கு நான் சமர்ப்பித்திருக்கின்றேன்.

இந்த நிலையில், கடந்த Budgetஇல் எங்களுக்கு மாபெரும் பிச்சை தந்திருக்கின்றீர்கள். எங்களுடைய இனம் தொடர்பாக நான் ஒருபோதும் தேசியம் கதைத்து இந்தப் பாராளுமன்றத்துக்கு வந்தவனல்லன். தேசத்தினுடைய விடுதலைக்காகப் போராடியவர்கள் எங்களுடைய உயிர்மூச்சு; அவர்கள் தொடர்பில் கதைக்க வேண்டிய தேவையில்லை. எமது மக்களுடைய அடிப்படைத் தேவையான சுகாதாரம், கல்வி, அன்றாட வாழ்க்கைப் பிரச்சினைகள், பாதைகள், போக்குவரத்து வசதிகள் என்பன அபிவிருத்தி செய்யப்பட வேண்டும். ஒரு சமூகத்துக்கு அடிப்படையான தேவைகள் நிறைவேற்றப்படாமல் இருக்கின்றபோதுதான் இந்த நாட்டிலே தாம் சுயநிர்ணயமாக வாழ வேண்டும் என்ற ஒரு எண்ணத்துக்கு மக்கள் தள்ளப்படுகின்றார்கள். தங்களுடைய அரசாங்கம் இப்பொழுது என்ன செய்கின்றது என்றால், இந்த அடிப்படையான விடயங்களைச் செய்வதைப் பிச்சை போடுவது போன்று பெரிய விடயமாகக் காட்டிக் கொள்கின்றது. 5,000 மில்லியன் ரூபாய் வடக்கில் உள்ள பாதைகளை நிர்மாணம் செய்வதற்காகவும், 1,500 மில்லியன் ரூபாய் வட்டுவாகல் பாலத்தின் நிர்மாணத்திற்காகவும் ஒதுக்கப்பட்டு, அண்மைய தினங்களில் அடிக்கல் நாட்டப்பட்டுள்ளது. கடந்த மார்ச் மாதம் 21ஆம் திகதிய Budget Speechஇல் குறிப்பிட்ட இந்த விடயங்களுக்கு, ஐந்தாறு மாதங்கள் கடந்த நிலையில் இப்பொழுது செப்ரெம்பரில்தான் அடிக்கற்களை நாட்டியுள்ளீர்கள். இன்னும் இரண்டு மாதங்களில் உங்களுடைய இந்த வருடத்துக்கான Budget முடிந்துவிடும். ஆகவே, என்ன அடிப்படையிலே எங்களுக்கு ஒதுக்கிய பணத்தை நீங்கள் பாவித்தீர்கள் என்பது ஒரு மாபெரும் பிக்காலித்தனம். இதைப் பிக்காலித்தனம் என்றுதான் சொல்வார்கள். பொய் சொல்வது என்பது வேறு; ஓர் இனத்தை ஏமாற்றுவது என்பது வேறு. ஆனால், தமிழீழ விடுதலை இயக்கம் இருந்தபோது ஒரு காலத்தில் பொருளாதாரத்திலும் கல்வியிலும் எமது சமூகம் சிறந்து விளங்கியது.

நீங்கள் எங்கள் கழுத்தை நெரிக்கின்றபோதுகூட, பொருண்மிய மேம்பாட்டுக் கழகத்தை உருவாக்கி, சுயாட்சியாக வாழ்ந்த எங்களுடைய இனத்தை 2009க்குப் பிறகு திட்டமிட்ட ரீதியில் நீங்கள் - எங்களுடைய தமிழ்த் தேசிய அரசியல்வாதிகள் உட்பட - அனைவரும் ஏமாற்றியுள்ளீர்கள். நான் நினைக்கின்றேன், இது எங்களுடைய சக அரசியல் கட்சிகளை வசைபாடுகின்ற என்னுடைய வாயிலிருந்து வரும் கடைசி வசனமென்று. ஏனென்றால், 12 நாட்கள் உணவும், நீருமின்றி உண்ணாவிரதம் இருந்து இறந்த எங்களுடைய திலீபன் அண்ணாவை நினைவுகூரும் இந்த நாட்களிலே நான் இன்று ஒரு முடிவு எடுத்துக் கொள்கின்றேன். இன்றைய நாளிலிருந்து என்னுடைய சக தமிழ் அரசியல் கட்சிகள் பற்றிய எந்த வசனங்களையும் எந்தக் கருத்துகளையும் சொல்லப் போவதில்லை; அவர்களோடு ஒற்றுமையாக இருப்பதற்கு ஆசைப்படுகின்றேன். காரணம், காலங்காலமாக 35 - 38 வருட போரிலே அழிந்த இனம் நாம். இப்போது உங்களைப் போன்ற ஓர் அரசாங்கம் அபிவிருத்தி என்ற அடிப்படையில் போடுகின்ற பிச்சைகளில் எமது இனம் ஏமாறுகின்றது. அதற்கு முக்கியமான காரணம், எங்களுடைய தமிழ் அரசியல்வாதிகளுக்கு இடையில் நிலவுகின்ற ஒற்றுமையில்லாத தன்மை! ஆகவே, நான் இன்றைய தினம் நினைத்துள்ளேன், எங்களுடைய தமிழ் அரசியல்வாதிகள் யாரையுமே வசைபாடுவதில்லையென்று. அவர்களுடன் சேர்ந்து இந்த அரசாங்கத்துக்கு pressure கொடுக்க நினைக்கின்றேன். ஏனென்றால், எதிர்க்கட்சியில் இருந்தபோது என்ன செய்தீர்கள்? என்று எல்லோரும் கேட்பார்கள்.

இலங்கையில் உள்ள சகல பல்கலைக்கழகங்களும் அபிவிருத்தி செய்யப்படப்போவதாக Cabinet முடிவு இன்றைய தினம் அறிவிக்கப்பட்டிருந்ததை நான் பார்த்தேன். விக்ரமாராச்சி பல்கலைக்கழகம் சம்பந்தமாக நான் சிங்களத்தில் போட்ட பதிவுகளுக்கு ஒரு மாதத்தில் விடை கிடைத்திருக்கின்றது. ஆகவே, எதிர்க்கட்சியில் இருக்கின்ற என்னைப் பொறுத்தவரைக்கும் என்னுடைய வடக்கு மாகாணத்தின் அபிவிருத்தி முக்கியம். சில 'அல்லக்கைகள்' போன்று, நாங்கள் தேசியம் கதைத்து இனத்தை அழிப்பதற்குத் தயாராக இல்லை. தேசியம் எங்களுடைய உயிர்மூச்சு! திலீபன் எங்களுக்காக மரணித்துக்கொண்ட எங்களுடைய உறவு! ஆகவே, இன்றைய தினம் நான் அவருக்காக ஒரு முடிவெடுத்திருக்கிறேன். அதாவது, இனிவரும் காலங்களில் தமிழ் மக்கள், தமிழ்க் கட்சிகளுடன் ஒற்றுமையாக இருப்பது என்று.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසන්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම අවසන් කරනවා.

நாங்கள் தமிழர் என்ற வகையில் சிந்தித்து, கட்டாயம் ஒற்றுமையான ஒரு பயணத்தை முன்னெடுக்க வேண்டும். அடுத்து, நீங்கள் சொல்லுகின்ற விடயங்களைத் தயவுசெய்து செய்யுங்கள்! ஒரு கல்லை மாத்திரம் வைத்துவிட்டு ஏமாற்றாதீர்கள்!

மண்டைதீவில் playground அமைக்கப்படவிருக்கின்ற இடத்திலிருந்து இன்றைய தினம் மிக ஆபத்தான ஆயுதங்கள் கண்டெடுக்கப்பட்டிருக்கின்றது. எமது பிரதேசங்களில்

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා]

இன்னும் பல இடங்களைத் தோண்டிப் பாருங்கள், செம்மணி போன்று ஆயிரமாயிரம் எலும்புக்கூடுகள் வரும்! மிகக் கவலையுடன் திலீபன் அண்ணாவின் மறைவு நாளை நினைவுகூர்ந்து, எனது உரையை முடிக்கிறேன். நன்றி, வணக்கம்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මේජර් ජෙනරාල් අරුණ ජයසේකර මැතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.48]

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (වැඩබලන ආරක්ෂක අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பதில் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Acting Minister of Defence)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දින ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පනත් කෙටුම්පත දෙවන වර කියවීම පිළිබඳ විවාදයේදී විශේෂ කරුණු රාශියක් උදෑසන සිට මේ වනතුරු කතිකාවට භාජන වුණා. විශේෂයෙන් ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය ආපදා කළමනාකරණ විෂය පථයට විශේෂ දායකත්වයක් පසුගිය වසර 40ක් වැනි කාලයක් තුළ විවිධාකාරයෙන් ලබා දීලා තිබෙනවා. මේ ආයතනය එතරම් වැදගත්, වටිනා ආයතනයක්. ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය නාය යෑම් සම්බන්ධයෙන් දෙනු ලබන නිර්දේශ පසුගිය කාල වකවානු තුළ පළාත් පාලන ආයතන නිසි පරිදි, නිසි ලෙස පිළිනොපැද්ද අවස්ථා රාශියක් නිරීක්ෂණය වුණා. ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට මේ පනත මඟින් විශේෂ බලතල මේ ආයතනයට ලබා දීමක් සිද්ධ කෙරෙනවා.

අපි දන්නා ආකාරයට, ශ්‍රී ලංකාව ආපදාවන්ට ලක්වන රටවල් අතරින් එකක්. ඒ සම්බන්ධ අත්දැකීම් රාශියක් අපේ ඉතිහාසයේ අපි ලබා ගෙන තිබෙනවා; ලැබිලා තිබෙනවා. විශේෂයෙන් අද අවස්ථා ගණනාවකදී ඒ සම්බන්ධව සාකච්ඡාවටත් බඳුන් වුණා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ වගකීම, අපේ ආණ්ඩුවේ වගකීම, රජයේ වගකීම තමයි ජනතාවගේ සුරක්ෂාව. ඒ වාගේම ජීවනෝපාය, දේපළවල ආරක්ෂාව, යටිතල පහසුකම්වල ආරක්ෂාව සැපයීම අපේ ජාතික වගකීමක් හැටියට අපි විශේෂයෙන් ධාරණය කරගෙන තිබෙනවා; අවබෝධ කරගෙන තිබෙනවා. ඉතින් ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය වැදගත්.

විශේෂයෙන්ම මේ ආපදා කළමනාකරණයට අපේ ත්‍රිවිධ හමුදාවම සම්බන්ධ වෙනවා; පොලීසිය සම්බන්ධ වෙනවා; සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සම්බන්ධ වෙනවා, හදිසි අවස්ථාවකදී ආපදා කළමනාකරණයේ පෙරමුණේ ඉන්න ආයතන හැටියට. තාක්ෂණික වශයෙන් මේ ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය විශේෂ මෙහෙවරක් ඒ අවස්ථාවේ සිද්ධ කරනවා. ඒ වාගේම තමයි ජාතික සංවර්ධනය අඩාළ කිරීමේ ප්‍රධාන අංගයක් සහ ජාතික ආරක්ෂාවට ප්‍රධාන තර්ජනයක් සේ සලකනවා, මේ ආපදා අවස්ථා. ඒ නිසා ආපදා කළමනාකරණය වැදගත්. ආපදාවලින් ජන ජීවිතවලට සිදුවන හානිවලින්, දේපළවලට සිදුවන හානිවලින් ජාතික ආරක්ෂාවට විශේෂ තර්ජනයක් ඇති වන නිසා ජාතික ආරක්ෂාවේ ප්‍රධාන මූලධර්මයක් තමයි යම්කිසි සිද්ධියක් වෙන්න කලින් ඒ සම්බන්ධව පෙර අවබෝධයක් ලබාගෙන, පෙර අවධානයක් යොමුකර ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ නිසා තමයි මේ ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය මඟින් කඳුකර ප්‍රදේශවල තිබෙන, බෑවුම් සහිත ප්‍රදේශවල තිබෙන අවදානම් තත්ත්වය සම්බන්ධයෙන් තාක්ෂණික නිර්දේශ ලබා දීම, යෝග්‍යතා සහතික ලබා දීම සිදු කරන්නේ. ඒ වාගේම සංවර්ධන කටයුතුවලදී ඒ ගොඩනඟන ගොඩනැඟිලි සම්බන්ධයෙන් පෙර කරන තාක්ෂණික ඇගයීම් වාර්තා ලබා දීලා ඒ තුළින් ජාතික ආපදාවන් නිසා ඇතිවිය හැකි තර්ජන අඩු කර ගැනීමට කටයුතු කරන්නේ. මොකද, ඒ කටයුතු නිසා ජන ජීවිතවලට වෙන්න තිබෙන හානිය වළක්වා ගැනීමට තමයි මේ ආයතනය ප්‍රධාන වශයෙන් කටයුතු කරන්නේ. අපේ ජාතික ජන බලවේගය විශේෂයෙන් අපේ ප්‍රතිපත්තිවල ඒ ගැන සඳහන් කරලා තිබෙනවා. දැනට ඒක ජාතික ප්‍රතිපත්තිය හැටියටත් අරගෙන තිබෙනවා. ගංවතුර, නාය යෑම් සඳහා පූර්ව සහ සක්‍රිය අනතුරු ඇඟවීම් සඳහා ක්‍රියාකාරී ආපදාකරණ පද්ධතියක් සංවර්ධනය කිරීම මෙහිදී අත්‍යවශ්‍යයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සියලු පාර්ශ්වකරුවන් සඳහා පුළුල් ආචාර ධර්ම පද්ධතියක් ඇති කිරීම අපේ ප්‍රතිපත්තියක්. ඒක මූලික වශයෙන් අපි පිළිගෙන තිබෙනවා. ඒ වාගේම ඒක ජාතික ප්‍රතිපත්තියක් හැටියටත් අපි ඉදිරිපත් කරලා තිබෙනවා. ජාතික ආපදා තත්ත්ව කළමනාකරණය සහ ශ්‍රම බළකාය පුහුණු කිරීමේදී රාජ්‍ය අංශයේ ඉදිකිරීම් ආයතනවල සහභාගිත්වය සහතික කිරීම. ඒ කියන්නේ, මේ ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයට සම්බන්ධ තාක්ෂණික ආයතන කිහිපයක්ම තිබෙනවා. ඒ තමයි, නාගරික සංවර්ධන අධිකාරිය ඇතුළු අනෙකුත් ආයතන. ඒ සියලු ආයතන ඒක රාශි කරගෙන ඉදිරියට කටයුතු කරන්න තමයි, අපේ උපාය මාර්ග අපි කළමනාකරණය කරලා තිබෙන්නේ. ඒ වාගේම, නව්‍ය තාක්ෂණය සහ ප්‍රශස්ත අමුද්‍රව්‍ය හඳුන්වාදීම සඳහා ඉදිකිරීම් කර්මාන්තයට විශේෂිත පර්යේෂණ සංවර්ධන අංශයක් අපේ ප්‍රතිපත්තියේ හඳුන්වා දීලා තිබෙනවා. ඒ වාගේම පාරිසරික බලපෑම් පිළිබඳ ගැඹුරු තක්සේරුවක් සහ සියලු ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා පාරිසරික වගවීම් අනිවාර්ය කිරීමත් අපේ ප්‍රතිපත්තියේ සඳහන් වෙනවා. ඒ වාගේම තමයි, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට මේ ආයතනයට අවශ්‍ය නීතිමය බලතල මේ පනත මඟින් ලැබෙනවා.

ඒ වාගේම තමයි, අවදානම් කලාප අධි අවදානම් හා මධ්‍ය අවදානම් වශයෙනුත්, ආරක්ෂිත කලාප හැටියටත්, ලංකාවේ අවදානමට ලක් වෙන්න තිබෙන ප්‍රදේශ වෙන් කරලා හඳුනා ගෙන සිතියම්ගත කරලා තිබෙනවා. ඒ කලාප වෙනම වර්ණ මඟින් හඳුන්වා දීලා තිබෙනවා. ඒ වාගේම තමයි, ගොඩනැඟිලි සඳහා building codes හඳුන්වා දීලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒවාත් ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයෙන් විශේෂ surveys කරලා, සිතියම්ගත කරලා තිබෙනවා. ඒ වාගේම මෙහි මූලාරම්භය දශක හතරකට කලින් සිද්ධ වුණත්, මේ තාක්කල් කිසිම ආණ්ඩුවක් ඒ සම්බන්ධව විශේෂ සැලකිල්ලක් දක්වා නැති බවයි, අද උදේ සිට කරපු කථාවලින් හැඟුණේ.

මේ ආපදා කියන්නේ විශේෂිත වූ විෂයයක්. ඒ නිසාම තමයි අවසාන වශයෙන් ආරක්ෂක අමාත්‍යාංශය යටතට ඒ විෂය පථය ලබා දී තිබෙන්නේ, අනෙකුත් රේඛීය අමාත්‍යාංශයත් සමඟම ඒ කටයුතු සලස්වන්න. විශේෂයෙන්ම, පසුගිය අගෝස්තු 7වැනි දා ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජාතික ආපදා කළමනාකරණ කවුන්සලය රැස්වුණා. ඒකත් රැස්වුණේ අවුරුදු 7කට පසුව. 2018න් පසුව එම කවුන්සලය රැස්වෙලා තිබුණේ නැහැ. අපේ ප්‍රතිපත්තියක් හැටියට අපි ගෙනාවා, ජාතික ආපදා කළමනාකරණ කවුන්සලය රැස්විය යුතුයි කියලා. ඒකට මේ ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයත් සම්බන්ධ වෙනවා, අපේ ආපදා

කළමනාකරණ මධ්‍යස්ථානය ඇතුළු තිබෙන අනෙකුත් ආයතන සමඟ. ඒ අනුව, මේ ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයට නීතිමය වශයෙන් බලතල ලබා දීමටත්, ඒ හා සම්බන්ධව කටයුතු කරන අනෙකුත් ආයතන සමඟ අන්තර්ග්‍රහණය කර විශේෂ වැඩ පිළිවෙළක් අනුව ඉදිරියේදී කටයුතු කරන්නත් ජනාධිපතිතුමා උපදෙස් ලබා දුන්නා. අවුරුදු 7ක් එම ජාතික ආපදා කළමනාකරණ කවුන්සලය රැස් වුණේ නැහැ. නමුත්, ජනතාවට වග කියන ආණ්ඩුවක් හැටියට අපි ජනතාවගේ ආරක්ෂාව සුරක්ෂිත කිරීමටත්, ඒ වාගේම දේපළවලට සිදුවිය හැකි හානි පිළිබඳව පෙර අවධානය යොමු කර ඒවායෙන් දැනුම් සම්භාරය අරගෙන ඒ ගැන කටයුතු කිරීමටත් කටයුතු කර තිබෙනවා.

ඒ වාගේම තමයි, විශේෂයෙන්ම නිවාස ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ආපදාවලට ඔරොත්තු දෙන නිවාස ඉදිකිරීමට අවශ්‍ය තාක්ෂණික මාර්ගෝපදේශ ලබා දීමත්, ඉදිකිරීම් භූමිය තෝරා ගැනීමේ සිට ඉදිකිරීම් කටයුතු නිම වන තෙක් සේවා සැපයීමත් මෙම ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයෙන් සිදු කරනවා. පැරණි ගොඩනැඟිලි පරීක්ෂා කර සුදුසු තාක්ෂණික නිර්දේශ ලබා දීම හා මඟ පෙන්වීමත්, යටිතල පහසුකම්, විවිධ සංවර්ධන ව්‍යාපෘති, භූ තාක්ෂණික සැපයුම් සහ ගොඩනැඟිලි ද්‍රව්‍ය පරීක්ෂා කිරීමත් මේ ආයතනය මඟින් සිද්ධ වෙනවා. විශේෂයෙන්ම වැඩිවන ජනගහනය, වැඩි අවදානම් සහිත ඉඩම්වලට වඩා අඩු අවදානම් සහිත ඉඩම් අත්පත් කර ගැනීමට විශේෂ ඉල්ලුමක් තිබෙනවා. හරියාකාර ඉඩම්වලට නොයා අවදානම් සහිත ස්ථානවල නිවාස ඉදිකිරීමට යාමෙන් මෙවැනි අනතුරුදායක තත්ත්වයන්, ජීවිත අවදානම් ඇති වෙන්න පුළුවන්. අවිධිමත් ලෙස, නීතිවිරෝධී ලෙස, ඒ අවදානම් කලාපවල ප්‍රමිතියෙන් තොර ගොඩනැඟිලි ඉදිකිරීමෙන් අපේ ජීවිතවලට හානි සිද්ධ වෙන්න පුළුවන්. ඒ නිසා අපි මේ සඳහා විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා. මේ පනත අනුව, ඒ ආයතනයෙන් දෙන්න තිබෙන තාක්ෂණික නිර්දේශ, සහතික අනිවාර්යයෙන් දිය යුතුයි. එහෙම නැති වුණොත් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට මේ ආයතනයට විශේෂ බලතල හිමි වෙනවා. අපේ රටේ සියලුම පුරවැසියන්ගේ ආරක්ෂාව, ජන ජීවිතය, දේපළ සුරක්ෂිත කිරීම කෙරෙහි අපි විශේෂයෙන් අවධානය යොමු කර තිබෙනවා.

අරමුණු 3ක් මූලික කරගෙන තමයි අපි මේ ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පනත ඉදිරිපත් කරන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
Order, please! අද දින විවාදයේ කටයුතු අවසන් වන තෙක් කාලය ලබා ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
ඒකෙන් නායයෑමට නැඹුරුතාවක් තිබෙන ප්‍රදේශවල භූ තාක්ෂණික අවශ්‍යතා හඳුනාගෙන, geotechnical instability, ඒවායේ බලපෑම් අවම කිරීම සහ තිරසර ආකාරයෙන් එම ප්‍රදේශ සංවර්ධනය කිරීම සඳහා පර්යේෂණ, සමීක්ෂණ පැවැත්වීමෙන්, නිසි තාක්ෂණික දැනුම ලබා දීමෙන්, ඒ ආයතනවලට -රජයේ ආයතන, පෞද්ගලික ආයතන, ඉංජිනේරු ආයතනවලට- නිසි උපදෙස් ලබා දීමෙන් ඒ වෙන්න පුළුවන් හානි, උවදුරු, අනතුරු වළක්වා ගැනීමට පුළුවන්.

මොකද, හැම දෙයකදීම අපට වටින්නේ ජීවිත. එක් ජීවිතයක් වුණත් අපට වටිනවා. ඒ නිසා තමයි අපි ආරක්ෂක ක්‍රියා පිළිවෙත් අනුගමනය කළ යුත්තේ. ආරක්ෂක ප්‍රතිපත්තිවලට අනුකූලව කරගත යුතු දේවල් කලින් කරගත යුත්තේ. ඉදිකිරීම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට - according to National Policy on Constructions, ව්‍යසන කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අනුකූලව, ඒ වාගේම ආපදා ප්‍රත්‍යාස්ථිතික වන ආකාරයට ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු කරගෙන යන බවට වගබලා ගැනීම සහ අදාළ තාක්ෂණික සහාය සැපයීම තවත් අරමුණක්. අනෙක් විශේෂිත සහ ප්‍රධාන අරමුණ තමයි, ආපදා ප්‍රත්‍යාස්ථිතික නිර්මිත පරිසරයක් තහවුරු කිරීම උදෙසා අදාළ පර්යේෂණ සිදු කිරීම. ඒක අපේ ජාතික ජන බලවේගයේ -NPP - ප්‍රතිපත්ති මාලාවේත් අපි ගෙනහැර දක්වා තිබෙනවා.

මෙහිදී අප අවධානය යොමු කර තිබෙන තවත් විශේෂ කාරණයක් තිබෙනවා. දේශගුණික වශයෙන් සිදු වන විපත් ශීඝ්‍රයෙන් සහ දරුණු ලෙස මේ ලෝකය තුළ ඇති වෙනවා. ශ්‍රී ලංකාවත් ආපදාවලින් තර්ජන එල්ල වන රටක්. පසුගිය කාලවකවානු තුළ මෙරට ඇති වූ ආපදා තර්ජන පිළිබඳව අපට මනා අත්දැකීම් තිබෙනවා. ඒ අනුව තමයි අපි කාලෝචිත ලෙස ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය නීතිමය වශයෙන් ශක්තිමත් කරලා ඉදිරි සංවර්ධන කටයුතුවලට අදාළව තිරසර සංවර්ධනයක් ඇති කිරීම වෙනුවෙන් එහි සේවය සලසා ගැනීමට කටයුතු කරන්නේ. එම සංවර්ධනය නිසි ආකාරයෙන්, විධිමත් ලෙස සැලසුම්සහගතව සිදු කරලා, ඒ අවදානම් කලාපවල ගොඩනැඟිලි ඉදිකිරීම් කටයුතුවලදී නිසි තාක්ෂණික උපදෙස් හා දැනුම ලබා දීම තමයි අපේ මේ සම්පූර්ණ උත්සාහය. ඒ වාගේම, ප්‍රජාවගේ සහසම්බන්ධතා හරහා තිරසර නිවාස විසඳුම් ලබා දෙමින් ජාතික ක්‍රම මඟින් දේශගුණික විපත්වලට මුහුණ දීමට හැකි වෙයි කියන විශ්වාසය ද අපට තිබෙනවා. අපි ඒ සඳහා අවශ්‍ය කටයුතු කරමින් සිටිනවා.

මේ ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම් අදාළ අනුකූලතාවලට අනුව පවත්වාගෙන යෑම සඳහා ජාතික ප්‍රතිපත්තියක් සහ පැහැදිලි රාමුවක් අප සකස් කරගත යුතුව තිබෙනවා. මේ ආයතනය බලගැන්වූවාට පසුව ජාතික ආපදා කළමනාකරණ කවුන්සලය මේ වසර අවසානයේ නැවතත් -දෙවැනි වතාවටත්- රැස් වෙනවා. පසුගිය කාලවකවානුවල ආපදාවට ලක් වූ, නාය යෑම් නිසා ආපදාවට ලක් වූ පවුල් අවතැන් වූවන් ලෙස තවමත් සිටිනවා. ඒ අයත් ඒ සිටින ස්ථානවලින් වෙනත් ආරක්ෂිත ස්ථානවලට ගෙන යෑම සඳහා විශේෂ වැඩ පිළිවෙළකුත් ගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි අපි යොදා තිබෙනවා. ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයට මේ බලය පැවරීමෙන් ආපදා කළමනාකරණය කියන විශාල විෂය පථයට මහත් දායකත්වයක් ලබා දෙනවා. ඒ නිසාම තමයි ආරක්ෂක අමාත්‍යාංශය යටතට මේ විෂය පවරා දීලා තිබෙන්නේත්. අපේ ප්‍රධාන ආයතන 3ක් තිබෙනවා, යුද්ධ හමුදාව, ගුවන් හමුදාව සහ නාවික හමුදාව කියලා. ඔවුන්ගේ හැකියා විවිධාකාරයි. ඔවුන්ගේ හැකියාව යොදාගන්නවාට අමතරව විශේෂයෙන්ම පොලීසිය සහ සිවිල් ආරක්ෂක බලඇණියත් දිස්ත්‍රික්ක මට්ටමින් ආපදා කළමනාකරණය සඳහා අපි වෙන වෙනම යොදවා තිබෙනවා. ඒ වෙනුවෙන් කටයුතු කිරීමේදී කරනු ලබන පෙර දැනුවත් කිරීම් විශේෂ වශයෙන් සැලකිල්ලට ගෙන ආපදාවලින් වන හානිය අවම කර ගැනීමට අපි අවශ්‍ය කටයුතු කරමින් සිටිනවා. ඒ වෙනුවෙන් ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය විශේෂ දායකත්වයක් මේ වන තෙක් ලබා දී තිබෙනවා.

විශේෂයෙන්ම කඳුකර ප්‍රදේශවල සිටින ජනතාව රටේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයට විශාල දායකත්වයක් ලබා දෙනවා. එම නිසා ඔවුන්ගේ සුරක්ෂිතතාව, ඔවුන්ගේ පවුල්වල ආරක්ෂාව සහ දේපළවල ආරක්ෂාව, ඔවුන්ගේ ඉදිරි කටයුතු

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

සංවර්ධනය සඳහා ලබා දිය හැකි උපරිම දායකත්වය ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයෙන් ලබා දෙනවා. ඒ වාගේම, පළාත් පාලන ආයතන සහ සංවිධාන, විශාල ඉදිකිරීම්කරුවන්, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන් ඉදිරියේදී ගම් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා නවීකරණය - modernize - කරනවා.

ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණයෙන් සියයට 30ක් විතර තිබෙන්නේ නාය යෑමේ තර්ජනයට ලක්වන භූමි. එම භූමි ආශ්‍රිතව ජීවත් වන ජනතාවට ආරක්ෂිතව ජීවත් විය හැකි කලාප සකසා දීම සඳහා අපි විශේෂයෙන් සැලකිලිමත් වී තිබෙනවා.

අපේ විශ්වාසය අනුව, ඉදිකිරීම් යනු හුදෙක් ගොඩනැඟිලි ඉදිකිරීම් පමණක් නොව, අනාගත ලෝකය ගොඩ නැඟීමයි. අපේ අවශ්‍යතාව එයයි. එම නිසා අපේ ඉදිරි පරම්පරාව මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමත්, ඔවුන්ට මේ පිළිබඳ දැනුම් සම්භාරයක් ලබා දීමත් අපි විශේෂයෙන් වැදගත් කොට සලකනවා. ඒ වාගේම අපේ Centre for Defence Research and Development - CDRD - එකේත් විශේෂ සැලකිල්ලක් යොමු කරලා පසුගිය මාස දෙකක තුනක කාලය තුළ මේ විෂය පථය ගැන විශේෂ සාකච්ඡා මාලාවක් පැවැත්වූවා.

ආපදා කළමනාකරණය කියන විෂය ගත් විට, පසුගිය කාල වකවානුවල ඇති වෙච්ච විවිධාකාර ආපදා තිබෙනවා. උතුරේ ආපදා ගත්තොත්, ඒවා සිදු වන්නේ වෙනත් විධියකට. වර්ෂාවෙන් හෝ වෙනත් ආකාරවලින් සිදු වන ආපදා තිබෙනවා. නැඟෙනහිරට ගියාම, ඒ ආපදාවම වුණත් සිදු වෙන්න පුළුවන් විධි සහ ඒවායින් වෙන්න පුළුවන් හානි වෙනස්. කඳුකරයට ගියාම ඊටත් වඩා වෙනස්. ඒ අනුව අපේ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ තිබෙන CDRD කියන ආයතනය CDM එකත් සමඟ බද්ධ වෙලා ආපදා කළමනාකරණයට විශේෂිත වූ උපායික ක්‍රමයක් නැවතත් සකසන්න, තිබෙන ක්‍රමය කාලෝචිත ලෙස සකසන්න අපි උනන්දු වෙනවා. ගරු ජනාධිපතිතුමාත් ඒ සඳහා විශේෂ සැලකිල්ලක් යොමු කර තිබෙනවා. මා කලිනුත් කිව්වා වාගේ අගෝස්තු මාසයේ 7වැනි දා ජාතික ආපදා කළමනාකරණ කවුන්සලය රැස් වුණා. එහිදීත් අපි ඒ කාරණයට විශේෂයෙන් අවධානය යොමු කළා.

විශ්වවිද්‍යාලවල මේ විෂය පථයට අදාළව විශේෂ research studies රාශියක් කරලා තිබෙනවා. විශ්වවිද්‍යාලවලින් මේ විෂයට අදාළව කරලා තිබෙන surveysවලින්, එහෙම නැත්නම් researchesවලින් ලබා ගත් තොරතුරු හරියාකාරව එකතු කරලා, එක ස්ථානයකට ගෙනැල්ලා ඒවා filter කරලා ඒ findings අනුව ශ්‍රී ලංකාවේ ජාතික ආපදා කළමනාකරණයට දායක වෙන්නේ කොහොමද කියන එක ගැන කරුණු දැක්වීමක් හරියට සිද්ධ වෙලා නැති බව අපට වැටහිලා තිබෙනවා.

ලංකාවේ භූමි ප්‍රදේශය තුළ විතරක් නොවෙයි ලංකාවේ භූමියෙන් පිටතදීත්, මහ මුහුදේත් ආපදා සිදු වුණා. පසුගිය කාලයේ නැව් දෙකක් හේතුවෙන් ද ආපදා සිදු වුණා. ඒවා සම්බන්ධයෙනුත් කටයුතු කරන්නේ කොහොමද, කලාපීය වශයෙන් තිබෙන ආපදා කළමනාකරණ කාර්යසාධක ආයතන සමඟ එකතු වෙලා කටයුතු කරන්නේ කොහොමද කියන එක ගැනත් අපි විශේෂයෙන් අවධානය යොමු කර තිබෙනවා. විශේෂයෙන් විශ්වවිද්‍යාලවල කරලා තිබෙන research studiesවල findings අරගෙන ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයෙන් කරන්න තිබෙන විශේෂිත වූ මෙහෙවර ආපදා කළමනාකරණයට අන්තර්ග්‍රහණය කරන්නත් අපි කටයුතු කර තිබෙනවා. ඒ වාගේම, අපේ රටේ අවදානම් කලාපවල පිහිටා තිබෙන ගොඩනැඟිලිවලට කේතයක් - building code එකක් - එහෙම නැත්නම් system එකක් ලබා දීමත්, නාය යෑම් සිදු විය හැකි කඳු බෑවුම් සහ ඒවායේ ව්‍යාප්තිය කලින් හඳුනා ගැනීම සඳහා මූලික ක්‍රමයක් ලෙස නාය යෑම් උපද්‍රව කලාප සිතියම්ගත කිරීමත් සිද්ධ වෙලා තිබෙනවා. සුමාන දෙකකට කලින් මේ සම්බන්ධයෙන් වෙන් වෙන් වශයෙන් කැබිනට් පත්‍රිකා දෙකකුත් අපි කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළා. ඒවාත් අනුමත වෙලා ආවාට පසුව ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයට විශේෂ දායකත්වයක් ලැබෙනවා. ඒකත් විශේෂිත වූ දෙයක්. නාය යෑම්වලට ලක් වන කලාප හඳුනා ගැනීමට, අධිඅවදානම්, මධ්‍ය අවදානම්, ආරක්ෂිත කලාප හැටියට තිබෙන ප්‍රදේශවල තිබෙන ගොඩනැඟිලි වෙන් කර හඳුනා ගැනීමට සහ ඒ ජනතාව දැනුවත් කිරීමට මේ තුළින් කටයුතු කරනවා.

අපි නාය යෑම් ආරම්භක කලාපය - initiation area - හැටියට සුන්බුන් ගලා යන මාර්ගය - flow path එක - සලකනවා. සුන්බුන් තැන්පත් වන කලාපය - depositional zone - වෙනම ප්‍රදේශයක්. ඒ කියන්නේ, ආපදාවක් වුණාට පස්සේ, එහෙම නැත්නම් නාය යෑම වුණාට පස්සේ සුන්බුන් තැන්පත් වන කලාපය. මේ පිළිබඳව අපට අත්දැකීමක් තිබෙනවා. අරණායක නාය යෑමෙන් එක් ස්ථානයකදී ජීවිත 127ක් අහිමි වුණා. අපි විශේෂ සැලකිල්ලක් යොමු කර තිබෙනවා, ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න.

ප්‍රතිපත්තිමය වශයෙන්, පරිපාලන වශයෙන්, ප්‍රායෝගික වශයෙන් අපට කරන්න පුළුවන් සියලු දේවල් මේ ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පනත් කෙටුම්පතට අපි සම්බන්ධ කරලා තිබෙනවා. ඒකේ අඩුවැඩිකම් තිබෙනවා. අපි ඒකේ අඩුපාඩු තවත් හඳුනාගෙන, අදාළ ආංශික අධීක්ෂණ කමිටුවේත් සාකච්ඡා කරලා ඒ නිරීක්ෂණත් ලබාගෙන තිබෙනවා. ඒ අනුව ඉස්සරහට අවශ්‍ය නම් ඒ සංශෝධන වුණත් ගේන්න අපි කටයුතු සූදානම් කරලා තිබෙනවා.

අපට සැලකිලිමත් වෙන්න පුළුවන් අනෙක් විශේෂිත කාරණය මෙයයි. ආපදාවක් කිව්වාම, ඒක අපට කිය කියා එන්නේ නැහැ. ආපදාවකදී කළ යුතු පළමුවැනි දේ තමයි ඒකෙන් ඇති වෙන්න පුළුවන් හානිය අඩු කර ගැනීම. එහෙම කරගන්න නම් අපේ පෙර සූදානමක් තිබෙන්න ඕනෑ, පෙර දැනුම්දීමක් තිබෙන්න ඕනෑ, අවධානයක් තිබෙන්න ඕනෑ, ඒ ගැන අබෝධයකුත් ඇති කරගන්න ඕනෑ. අපට ආපදාවක් නවත්වන්න බැහැ, කොහෙත්ම. ආපදා කළමනාකරණයේදී කරන්න තිබෙන්නේත් ආපදාව වෙන්න කලින් මහජනයා ඒ ඒ ස්ථානවලින් ආරක්ෂිත ස්ථානවලට ගෙන යෑමයි. එසේ ගෙනයෑමට නම් ඒ ස්ථාන මොනවාද කියලා අපි ඉස්සෙල්ලා හඳුනාගන්න ඕනෑ. පසුගිය කාලයේ කරලා තිබෙන ඒ සමීක්ෂණවලින් අපි ඒවා හඳුනාගෙන තිබෙනවා. මේ National Building Research Institute - NBRI - එක විශේෂිත වූ හැකියාවලින් සමන්විත, තාක්ෂණික මට්ටමේ හැකියාවලින් සමන්විත ආයතනයක්. විශේෂයෙන් තමුන්නාන්සේලාත් දැකලා ඇති, බදුල්ල පාරේ යනකොට තිබෙන කඳු බෑවුම් සහිත පාර අයිනේ, එහෙම නැත්නම් ඒ මාර්ග දෙපැත්ත සකසා තිබෙන ආකාරය. මේ ආයතනයේ අවධානය සහ අධීක්ෂණය යටතේ තාක්ෂණික දැනුම ලබා දීලා රජයේ සහ පෞද්ගලික ආයතන එකතු කරගෙන, ඒ අවදානම් කලාප වෙන් කරගෙන, ආපදාවක් වෙන්න කලින් කරලා තිබෙන දේවල් තමයි ඒ බදුල්ල පාරේ ඔබතුමන්ලාට දැකගන්න පුළුවන් වුණේ.

ආපදා කළමනාකරණය ගත්තාම, එය විශේෂ විෂයයක්. ඒ නිසා තමයි විශ්වවිද්‍යාලවලින් මේ ගැන කරලා තිබෙන පර්යේෂණ, එහෙම නැත්නම් research studies, සමීක්ෂණ වාර්තා අපි දැන් එකතු කරමින් තිබෙන්නේ. මේ පිළිබඳ ඉතාම හොඳ researches ගොඩක් කරලා තිබෙනවා. ඒ දැනුම ලබාගෙන අපි මේ කටයුතු කරනවා. අද විපක්ෂයේ සිටින කථික මන්ත්‍රීවරු මේ ආයතනය ගැන විශේෂයෙන් සාකච්ඡාවකට භාජන කළා. ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ තිබෙන වැදගත්කම, හැකියාව අනුව ඒ ආයතනය බලවත් කිරීමෙන්, නීතිමය වශයෙන්

එයට ලබා දෙන බලයෙන් අපේ ජාතික ආරක්ෂාවටත්, ජාතික සංවර්ධන වැඩ පිළිවෙළටත් විශිෂ්ට ලෙස දායක වෙන්න ඉදිරියේදී හැකියාවක් ලැබෙන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පනත් කෙටුම්පත දෙවන වර කියවීම, සභාව එකඟද?

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***

***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர]*

*Resolved:*

*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Major General (Rtd.)Aruna Jayasekera]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***

***[ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES in the Chair.]*

***1 සිට 34 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகத்திலிருந்து 34ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 34 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendment.*

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

# කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

## 2025 නීති විද්‍යාල ප්‍රවේශ විභාගයේ ප්‍රතිඵල නැවත සමීක්ෂණය
### 2025 சட்டக் கல்லூரி அனுமதிப் பரீட்சைப் பெறுபேறுகளை மீள்மதிப்பீடு செய்தல்
### RESCRUTINIZATION OF RESULTS OF LAW COLLEGE ENTRANCE EXAM, 2025

[අ.භා. 5.16]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "2020.12.20 දිනැති ගැසට් පත්‍රය අනුව 2025 මැයි 17 දින පවත්වනු ලැබූ ශ්‍රී ලංකා නීති විද්‍යාල විශේෂ ප්‍රවේශ විභාගයේ ප්‍රතිඵල 2025 අගෝස්තු 29 දින නිකුත් කරනු ලැබුවා.
>
> ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලැබූ මෙම විභාගය සඳහා ප්‍රශ්න පත්‍ර තුනක් ලබා දුන් අතර, ඉන් එකක් වූ ගිවිසුම් නීතිය පිළිබඳ වූ ප්‍රශ්න පත්‍රය ගැටලුකාරී බවින් යුක්ත වූ බැවින් ඒ පිළිබඳව නීති විද්‍යාලයට දැනුම් දීමට විභාග අපේක්ෂකයින් කටයුතු කළ අතර, ඒ අවස්ථාවේදී නීති විද්‍යාලයේ පිළිතුර වූයේ, ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසුව මේ පිළිබඳ අවධානය යොමු කරන බවයි.

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

ප්‍රතිඵල නිකුත් වූ පසු පෙනී ගියේ ඉහත සඳහන් කළ ප්‍රශ්න පත්‍ර තුනෙන් මුල් ප්‍රශ්න පත්‍ර දෙකට ඉතා ඉහළ ලකුණු ලබා ඇති සිසුන් 20දෙනෙකුට පමණ අනෙක් ප්‍රශ්න පත්‍රයට 40ට අඩු 35ට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා දී ඇති බවයි. එම නිසා ඔවුන් හට ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ගැනීමට නොහැකි වී ඇති අතර, ඔවුන් විශ්වාස කරන්නේ එම ප්‍රශ්න පත්‍රයට ද මුල් ප්‍රශ්න පත්‍ර දෙකට පිළිතුරු සැපයූ ආකාරයෙන්ම සාර්ථකව පිළිතුරු සැපයූ බවයි. ගැටලුකාරී ප්‍රශ්න පත්‍රය හේතුවෙන් මෙම තත්ත්වය උද්ගත වී ඇති බව එම විභාග අපේක්ෂකයින්ගේ විශ්වාසයයි.

පිළිතුරු පත්‍ර නැවත පරීක්ෂාව සම්බන්ධයෙන් විමසීම් කිරීමේදී නීති විද්‍යාලය පවසන්නේ, ඒ සඳහා පූර්ණ බලය විභාග දෙපාර්තමේන්තුව සතු බවයි. විභාග දෙපාර්තමේන්තුව පවසන්නේ ඒ සඳහා බලය ඇත්තේ නීති විද්‍යාලයට බවයි. කෙසේ වෙතත් ප්‍රතිඵල විශ්ලේෂණය කිරීමේදී පැහැදිලිව පෙනී යන්නේ යම් ගැටලුකාරී බවක් ඇති බවයි. එනමුදු, ප්‍රතිඵල නැවත සමීක්ෂණය සඳහා නිශ්චිත ආයතනයක් නොමැති වීම හේතුවෙන් එම අපේක්ෂක සිසුන් ඉතාමත් අසරණව ඇත.

මෙම විභාගය මත පදනම්ව නීති විද්‍යාලය සඳහා සිසුන් 201ක් බඳවා ගැනීමට තීරණය කර තිබූ නමුත්, උක්ත ප්‍රතිඵල අනුව සමත්ව ඇත්තේ සිසුන් 140ක් පමණි.

පවතින තත්ත්වය හමුවේ ඉතාමත් අසරණව සිටින මෙම සිසුන්ගේ ඉල්ලීම වනුයේ එම විභාග ප්‍රතිඵල නැවත සමීක්ෂණය සඳහා නීති විද්‍යාලය හෝ විභාග දෙපාර්තමේන්තුව වගකීම භාරගෙන එය ඉටු කර දීම හෝ විභාග ප්‍රතිඵල අනුව සමත්වීමේ ප්‍රතිශතය අඩු වීම හේතුවෙන් පුරප්පාඩුව ඇති සිසුන් 61ක් සඳහා විෂයයන් දෙකක් ඉහළ ලකුණු ලබා සමත්ව අනෙක් විෂය වූ ගැටලුකාරී ප්‍රශ්න පත්‍රයට ලකුණු 35-39 අතර ලබා අසමත් වූ සිසුන් 20 දෙනා බඳවා ගන්නා ලෙසයි.

එසේ නැතහොත් සියලුම විෂයයන් සඳහා කඩඉම් ලකුණු සීමාව සියයට 40 සිට සියයට 35 දක්වා අඩු කර අසාධාරණයට ලක් වූ සිසුන්ට සාධාරණය ඉටුකර දෙන ලෙස ඉල්ලා සිටියි.

උක්ත කරුණු සලකා බලා ඉහත කී කුමන හෝ ක්‍රමයක් ක්‍රියාත්මක කර මෙම සිසුන්ට සාධාරණයක් ඉෂ්ට කර දෙන මෙන් ගරු අධිකරණ ඇමතිතුමා හරහා රජයෙන් ඉල්ලා සිටිමි."

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
යෝජනාව ස්ථිර කිරීම, ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.19]

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මා ස්ථිර කරනවා. එතුමාත් ප්‍රකාශ කළ අන්දමට අපි දන්නවා, පෞද්ගලික විශ්වවිද්‍යාලවලින් LLB උපාධිය සාර්ථකව අවසන් කර නීති විද්‍යාලයට ඇතුළත් වෙන්නට අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කරන්න තිබෙන විභාගයක් තමයි මේ ප්‍රවේශ විභාගය. මේ විශේෂ ප්‍රවේශ විභාගය 2020.12.30වැනි දින දරන ගැසට් පත්‍රයට අනුව පවත්වපු එකක්. මෙහි තිබෙන විශේෂම කාරණය තමයි පසුගිය අවුරුද්දේ පැවැත්වුණු විභාගයෙන් සියලුදෙනා අසමත් වීම. එම විභාගයට මුහුණ දුන් LLB සිසුන් කිසිම කෙනෙකුට නීති විද්‍යාලයට යන්න අවස්ථාව ලැබිලා නැහැ. ඒ සියලුදෙනා අසමත්. *[බාධා කිරීමක්]* Last year, Sir. එතකොට එතැනින්ම පෙනෙනවා, යම් කිසි ප්‍රශ්නයක් තිබෙන බව. ඒක බැලූ බැල්මටම පේනවා. දැන් මේ අවුරුද්දේ මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ විභාගයට ගිවිසුම් නීතිය, වාණිජ නීතිය, පරිපාලන නීතිය යනුවෙන් question papers තුනක් තිබෙනවා. මේ දුක්ගැනවිල්ල ඉදිරිපත් කරන දරුවන් 20 දෙනෙක් පමණ සිටිනවා. ඒ දරුවන්ගේ ප්‍රශ්න පත්‍ර දෙකක ලකුණු සියයට 65යි, සියයට 70යි, සියයට 75යි. ඒ විධියට තමයි ලකුණු තිබෙන්නේ. නමුත් එක ප්‍රශ්න පත්‍රයකට විතරක් සියයට 30යි, සියයට 35යි. සාමාන්‍යයෙන් A/L කළත්, O/L කළත්, එහෙම සිද්ධ වෙන්න තිබෙන සම්භාවිතාව අඩුයි කියලා අපට තේරෙනවා. ඒක නිසා මේ ගැන යම් සැකයක් තිබෙනවා කියන එක තමයි මේ දරුවන්ගේ ආයාචනය බවට පත් වෙලා තිබෙන්නේ. අපිත් මේ වෙනුවෙන් ඉදිරිපත් වෙන්නේ ඒ නිසායි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඇත්තටම එහෙම ප්‍රශ්නයක් තිබෙනවා නම්, පිළිතුරු පත්‍ර නැවත සමීක්ෂණය කිරීමේ අවස්ථාවක් තිබෙන බව අපි දන්නවා. O/Lවලට, A/Lවලට, විභාග දෙපාර්තමේන්තුවෙන් පවත්වන විභාග සඳහා මේ අවස්ථාව තිබෙනවා. හැබැයි, මේ විභාගයට නැවත සමීක්ෂණයක්, re-correction කියන අවස්ථාව ලබා දෙන්නේ නැහැ කියන එකයි අපට දැනගන්නට ලැබිලා තිබෙන්නේ. 201දෙනෙකුගේ පුරප්පාඩු තිබෙනවා. 217දෙනෙක් පමණ තමයි විභාගය කරලා තිබෙන්නේ. 201දෙනෙක් ගන්න තමයි 217ක් විභාගය කරලා තිබෙන්නේ. ගිවිසුම් නීතිය කියන ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඇත්තටම 140දෙනෙක් පමණයි මේ කඩඉම් ලකුණු - cut-off marks - ලබා ගෙන තිබෙන්නේ. 201ක් පුරප්පාඩු තිබියදී, 140දෙනෙක් විතරක් මේ වෙනකොට ඇතුළට අරගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, නීති විද්‍යාලයේ ඉගෙන ගත් ශිෂ්‍යයකු විධියට මා එක දෙයක් පිළිගන්නවා. LLB විභාගය හෝ පිටස්තර යම් විභාගයක් කරලා නීති විද්‍යාලයට පිවිසෙනවා නම්, යම් කිසි standard එකක් තිබෙන්න ඕනෑ. There should be some standard. එතකොට ඒක ගැන කිසි ප්‍රශ්නයක් නැහැ. හැබැයි, මෙතැන බැලූ බැල්මටම පෙනෙන යම් කිසි ප්‍රශ්නයක් තිබෙන බව තමයි අපට කියන්නට තිබෙන්නේ. මේ වෙනුවෙන් තව අවුරුද්දක් බලාගෙන ඉන්න සිද්ධ වුණොත්, ඒක මේ දරුවන්ගේ අනාගතයට විශාල ප්‍රශ්නයක්. ඒ නිසා අපි ඉතාම කරුණාවෙන් ඉල්ලා සිටින්නේ තව අවුරුද්දක් ඒ දරුවන්ගේ කාලය කන්නේ නැතිව මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න කියලායි. තව පුරප්පාඩු 65ක ප්‍රමාණයක් ඉතිරි වෙලාත් තිබෙනවා; ඉඩත් තිබෙනවා. 140දෙනෙක් පමණයි මේ වෙනකොට අරගෙන තිබෙන්නේ. අද නීති විද්‍යාලයේ විදුහල්පතිතුමා පාර්ලිමේන්තු සංකීර්ණයේදී හමුවුණාම මට කිව්වේ, "Cut-off mark එකට ඇවිත් තිබෙන්නේ 140දෙනායි. එතැනින් එහාට කරන්න දෙයක් නැහැ" කියලායි. ඒක කථාවක් විධියට හරි. හැබැයි, මෙතැන ප්‍රශ්න පත්‍රවල ඇති වෙලා තිබෙන ගැටලුව මූලික කරගෙන ඒ ගැන සලකා බලා මේ කටයුත්ත කරන්න කියන එකයි අපි ඉල්ලා සිටින්නේ. මොකද, ප්‍රශ්න පත්‍ර දෙකකට සියයට 70, 80 ගත්ත ළමයෙකුට එක විෂයයකට විතරක් ලකුණු සියයට 30ක්, 35ක් එන්න විධියක් නැහැ. එම නිසා නැවතත් මම ඉතාම ගෞරවයෙන් සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ මෙම යෝජනාව ස්ථිර කරනවා. මේ අවස්ථාවේ අධිකරණ ඇමතිතුමා ගරු සභාවේ නැහැ. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඉන්නවා. එතුමා මෙයට පිළිතුරක් ලබා දෙයි කියා බලාපොරොත්තු වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුසන්ත දොඩාවත්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.23]

**ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම හිතන විධියට අද සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් වෙලා තිබෙන යෝජනාවේ මූලික වශයෙන් වැරදි තොරතුරු කිහිපයක් ඇතුළත් වෙලා තිබෙනවා.

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කරමින් චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, ගිවිසුම් නීතිය පිළිබඳ වූ ප්‍රශ්න පත්‍රයේ ගැටලුසහගත තත්ත්වයක් පැවති බැවින් ඒ පිළිබඳව නීති විද්‍යාලයට දැනුම් දුන්නා කියලා. නමුත්, එවැනි දැනුම් දීමක් කර නැති බවට තමයි තොරතුරු ලැබෙන්නේ. ඔවුන් ප්‍රකාශ කරන්නේ, ගිවිසුම් නීතියට අදාළ ප්‍රශ්න පත්‍රයේ එවැනි කිසිදු ගැටලුවක් තිබුණේ නැහැ කියලායි. මේ ප්‍රතිඵල නැවත සමීක්ෂණය සඳහා නිශ්චිත ආයතනයක් නොමැති බවත් ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවේ සඳහන් වෙනවා. ආයතනයක් නැහැ නොවෙයි, එවැනි නෛතික ප්‍රතිපාදනයක් නැහැ. මෙවැනි තරග විභාගවල ප්‍රතිඵල නැවත සමීක්ෂණය සඳහා නෛතික ප්‍රතිපාදනයක් නැහැ. ඒ වාගේම එතුමාගේ යෝජනාවේ සඳහන් වෙනවා, "මෙම විභාගය මත පදනම්ව නීති විද්‍යාලයට සිසුන් 201දෙනෙක් බඳවා ගැනීමට තීරණය කර තිබූ නමුත්" කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි ගැසට් පත්‍රයට අනුව, "The number of candidates to be selected will not exceed the number of students who qualified at the Sri Lanka Law College General Entrance Examination ....." යනුවෙන් දැක්වෙනවා. ඒ කියන්නේ, සාමාන්‍ය ප්‍රවේශය යටතේ නීති විද්‍යාලයට බඳවා ගන්නා ශිෂ්‍ය ප්‍රමාණය නොඉක්මවිය යුතුයි කියලායි. ඒ නිසා අනිවාර්යය වශයෙන් සිසුන් 201දෙනෙක් බඳවා ගැනීමේ අවශ්‍යතාවක් නැහැ.

යෝජනාව ස්ථිර කරමින් විපක්ෂයේ චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා සඳහන් කළා, ශිෂ්‍යයන් 20දෙනෙක් මේ එක ප්‍රශ්න පත්‍රයක් පමණක් අසමත් වීම ගැටලුසහගත තත්ත්වයක් කියලා. නමුත්, මේ විභාගය සඳහා පෙනී හිටපු සම්පූර්ණ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 63ක් මේ විභාගය සමත් වෙලා තිබෙනවා. ඊට කලින් වසරේ මේ විභාගයට පෙනී හිටපු කිසිදු ශිෂ්‍යයෙක් සමත් වෙලා නැහැ කියලාත් කිව්වා. ඒ අවස්ථාවේ විෂයයන් 6ක් තිබුණා. මේ වන විට ඒ තත්ත්වය වෙනස් වෙලා විෂයයන් තුනක් දක්වා ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම මේ විභාගය සඳහා පෙනී සිටි ශිෂ්‍යයන් විදේශ විශ්වවිද්‍යාල හරහා නීතිවේදී උපාධිය හදාරා තමයි නීති විද්‍යාලයට ඇතුළත් වීම සඳහා වූ විශේෂ ප්‍රවේශ විභාගයට පෙනී සිටින්නේ. මේ ශිෂ්‍යයන්ට නීති විද්‍යාලයේ දේශන සඳහා ප්‍රවේශය ලබා දී තිබෙනවා. ඒ වාගේම මේ විෂයයන්වලට අදාළ model papers ලබා දීම කරලාත් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)
හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මේ සියල්ල සලකා බැලුවාම පෙනී යනවා, ඔවුන් නීතිවේදී උපාධියක් හදාරා යම් නීති දැනුමක් සහිතව තමයි මේ විභාගයට පෙනී ඉඳලා තිබෙන්නේ කියන එක. නමුත් මේ විභාගයට යම් අධ්‍යාපනයක් සහිතව පෙනී සිටපු කණ්ඩායමක යම් ප්‍රමාණයක් ඒ අවශ්‍ය මට්ටම පූරණය කර නැත්නම්, ඒ පිළිබඳව නැවත සලකා බැලීමේ හැකියාවක් කිසිම provision එකකිනුත් සපයා නැත්නම් එතැන යම් ගැටලුවක් තිබෙනවා. ව්‍යවස්ථාදායකය විධියට මෙවැනි කාරණාවලට මැදිහත් වීමේ හැකියාවක් පාර්ලිමේන්තුවට තිබෙනවා කියලා මම හිතන්නේ නැහැ. කොහොම වුණත්, මේ ශිෂ්‍යයන්ට නැවත මේ විභාගයට පෙනී සිටීමේ හැකියාව තිබෙනවා. ඔවුන්ට ඒ විභාගයට පෙනී සිටීමේ අවස්ථා සීමා කරලාත් නැහැ. ඒ නිසා අදාළ අධ්‍යාපන සුදුසුකම් සහිතව නැවත මේ විභාගයට පෙනී ඉඳලා ඔවුන්ගේ ප්‍රවේශය ලබා ගැනීමේ හැකියාව තිබෙනවා. මේ තිබෙන කරුණු මත එවැනි අසාධාරණයකට ඔවුන් ලක් වෙච්ච බවක් පෙනෙන්න නැහැ.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ මෙම යෝජනාව මගේ පෞද්ගලික යෝජනාවක්වත්, මගේ මතයක්වත් නොවෙයි. මෙය නීති විද්‍යාලයේ ශිෂ්‍යයන් ඇවිල්ලා කරපු ඉල්ලීමක්, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි. ඒ අනුව තමයි අද මේ සභාව කල් තැබීමේ යෝජනාව මම ඉදිරිපත් කළේ. අපේ උගත්, බුද්ධිමත් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා කියපු විධියට මේකේ වැරැද්දක් නැත්නම්, ඒ ගැන බලමු.

සමහර දරුවන් පොළොන්නරුවේ ඉඳලා ඇවිල්ලායි මේ ඉල්ලීම කළේ. ඒ නිසා මේකේ වැරැද්දක් නැති වෙන්න බැහැ. වැරැද්දක් තිබෙනවා. මොකද, පිළිතුරු පත්‍ර නැවත පරීක්ෂා කිරීම ගැන විමසීම් කිරීමේදී නීති විද්‍යාලය කියා තිබෙනවා, ඒක විභාග දෙපාර්තමේන්තුවෙන් බලන්න කියලා. විභාග දෙපාර්තමේන්තුවෙන් කියා තිබෙනවා, ඒක නීති විද්‍යාලයෙන් බලා ගන්න කියලා.

එම නිසා මෙතැන මතුවෙලා තිබෙන්නේ පරස්පර විරෝධී ප්‍රශ්නයක්. මේ ඉන්නේ, මේ රටේ ජීවත් වෙන, අධ්‍යාපනය ලබන, නීති විද්‍යාලයට ඇතුළත් වීමේ බලාපොරොත්තුව තිබෙන, අහිංසක දෙමව්පියන්ගේ දරුවෝ. රජයට මේ වෙනුවෙන් මැදිහත් වීමට වගකීමක් තිබෙනවා. ඒක නැහැයි කියන්න බැහැ. මේවාට ව්‍යවස්ථාදායකයට මැදිහත් වෙන්න බැහැ කියලා කොහේවත් ලියලා නැහැ. ව්‍යවස්ථාදායකයට මැදිහත් වෙන්න පුළුවන්. ව්‍යවස්ථාදායකයට මැදිහත් වෙන්න සිද්ධ වෙනවා. ඒ නිසා තමයි මම මේ යෝජනාව ගෙනැල්ලා, නීතිඥවරයෙක් මේ යෝජනාව ස්ථිර කළේ. ඒ නීතිඥ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාට මේ යෝජනාව

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

ඉදිරිපත් කරන්න කලිනුත්, අද උදේත් මේ ගැන මම කිව්වා. ඒ දරුවෝ එතුමාටත් කථා කළා. මේක වගකිව යුතු ප්‍රශ්නයක්. මේ වාගේ දෙයක් වෙන්න පොඩි පොඩි දේවල් හේතු වෙලා ඇති, පාර්ලිමේන්තු මන්ත්‍රීතුමනි. නමුත්, මේ දරුවන්ගේ කාලය තව අවුරුද්දක් පස්සට දමන්නේ නැතිව මේ ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන් නම් හොඳයි. ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමනි, 61ක් පුරප්පාඩු තිබෙනවා නම්, ශිෂ්‍යයන් ඒ කියන විධියට ගන්න පුළුවන් නම්, ගන්න එක නේ තිබෙන්නේ. ඒක ප්‍රශ්නයක් කර ගන්න එපා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.30]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මේක law studentsලාගේ exam එක පිළිබඳ ප්‍රශ්නයක්. අපේ අවධානය බරපතළ විධියට මේ ප්‍රශ්නයට යොමු කරන්න ඕනෑ කියා මම විශ්වාස කරනවා. හැබැයි, මට පොඩි doubt එකක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මේ වාගේ - *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, තාක්ෂණික උපකරණ භාවිත කරන්න තහනම්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Right.

නමුත්, මම මේක අනිවාර්යයෙන්ම පෙන්වන්න එපායැ. පාර්ලිමේන්තුව වට කරන්න කියපු, පාර්ලිමේන්තුව පුච්චමු කියපු අය දැන්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

වෙලා ඉන්නකොට, මේ වාගේ ප්‍රශ්නවලට ඒගොල්ලන් මැදිහත් වෙලා ඒ අයට සාධාරණයක් ඉෂ්ට කරයි කියන එක ගැන මට නම් කිසිම විශ්වාසයක් නැහැ. ඔබතුමියත් දකින්න ඇති, නීතිඥයන් කියන ප්‍රශ්නය අපේ රටේ ලොකුවට මතුවෙලා තිබෙනවා කියලා. ඒකට හොඳම උදාහරණයක් මම කියන්නම්. උතුරේ ඉන්න ඔක්කෝම නීතිඥයන් මාරු කරලා ඉවරයි. දකුණ ගත්තොත්, දකුණේ හිටපු ඔක්කෝම නීතිඥයන්, -

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
නීතිඥයන් නොවෙයි, judgesලා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sorry, වචනය වැරදුණා, මට සමාවෙන්න. Judgesලා මාරු කරලා ඉවරයි. තවත් එහාට ගිහිල්ලා law studentsලාගේ education පැත්තටත් අත දමනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේක කොයි මට්ටමට ගිහිල්ලා නවතියිද කියන්න දන්නේ නැහැ.

දැන් බලන්න, එකපාරටම අපේ රටේ කවදාවත් නැති විධියට කන්ටේනර් ගණන් අයිස් සහ කුඩු අහු වෙනවා. මම නම් කියන්නේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියලා. හැබැයි, අද වෙනකන්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

arrest කරලා නැහැ. ඉස්සරහට එන්න ඉන්න ජනාධිපතිතුමාත් මෙතැන වාඩිවෙලා ඉන්නවා. නලින්ද ජයතිස්ස ඇමතිතුමා. මම ඔබතුමාට ආදරෙයි. මම අද ඉඳන් ඔබතුමාට support කරනවා. ඒක මතක තබා ගන්න. ඒ කියන අය arrest කරලාත් නැහැ, එයාගේ තාත්තා arrest කරලාත් නැහැ, බෑනා arrest කරලාත් නැහැ. කවුරුවත් arrest කරලා නැහැ. හැබැයි, arrest කරන්නේ යම්කිසි ප්‍රශ්නයකට මම වාගේ yellow line එකේ වාහනය නවත්වපු අය. බලන්න, හෙට මම arrest කරයි. හැබැයි, මම අනිද්දා ඇප අරගෙන එයි. මම yellow line එකේ වාහනය නැවැත්තුවා කියලා පොලීසිය ඇවිල්ලා මගෙන් ඒ ගැන ඇහුවා. මම කිව්වා, "Officer, මගේ වාහනයේ technical error එකක් තිබෙනවා, engine එක heat වෙනවා, ඒ නිසා මට විනාඩියක්, තත්පරයක් වාහනය නවත්වන්න දෙන්න, නැත්නම් පිච්චෙනවා" කියලා. ඒක මාධ්‍යයට ගිහිල්ලා තිබුණා. ඊට පස්සේ හැමෝම අහනවා, අර්ච්චුනාව අත්අඩංගුවට ගත්තේ නැත්තේ ඇයි කියලා. මම OIC මහත්මයාගෙන් ඇහුවා, "ඔබතුමා මෙතැනට ඇවිල්ලා මා අත්අඩංගුවට ගන්නවාද, නැත්නම් මම පොලීසියට එන්නද?" කියලා. එතුමා කිව්වා, මාධ්‍යයට දැම්ම එක අපට අදාළ නැහැ, අපි ගිහිල්ලා, B Report එක ඉදිරිපත් කරලා arrest කරන්නම් කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම ඉවර කරනවා.

දැන්, දකුණෙන් කිලෝ ගණන් හෙරොයින් අහු වෙනවා. හැබැයි, අල්ලන්නේ අපි කරන ඒවා. මම අද ලැහැස්ති වෙලා ආවේ. සෙරෙප්පු දෙකයි, පැදුරකුයි, pillow එකකුයි මම ලැහැස්ති කර ගත්තා. මම හෙට උදේට පාර්ලිමේන්තුවට එන්නේ නැතිව police station එකට යන්න ලැහැස්ති වෙලා ඉන්නේ. ඒ තරමට අද මේ දේවල් පත් වෙලා තිබෙන්නේ. වාහනය පාරේ yellow line එක කපලා නවත්වපු එක රටේ ලොකු අවුලක් බවට පත් වෙලා තිබෙන්නේ. නමුත්, මිනිස්සුන්ට කවදාවත් මේ රටේ තිබෙන වැදගත් දේවල් මතක නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
**(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)**
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
**(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)**
(The Hon. (Dr.) Ramanathan Archchuna)
සමහර විට මට, නලින්ද ජයතිස්ස ඇමතිතුමා එක්ක 2029 අවුරුද්දේ ජනාධිපතිවරණයට ඉල්ලන්න වෙයිද දන්නේ නැහැ. ඒ තරමටම මා famous කරවනවා. ඒ නිසා මම විශ්වාස කරනවා, නලින්ද ජයතිස්ස ඇමතිතුමා - ඉස්සරහට එන්න ඉන්න ජනාධිපතිතුමා - මේවා ගැන පොඩි හරි අවධානයක් යොමු කරලා law studentsලාට වෙන්න ඕනෑ දේවල් ටික හදලා දෙයි කියලා.

Thank you.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
**(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)**
(The Hon. Deputy Chairperson of Committees)
ගරු උපුල් අබේවික්‍රම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.33]

**ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**
**(மாண்புமிகு சட்டத்தரணி யூ.பீ. அபேவிக்ரம)**
(The Hon. U.P. Abeywickrama, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ යෝජනාව ගැන අපි පුදුමයට පත් වෙන්නේ නැහැ. මේ මොහොත වන විටත් ලංකාව වාගේම ලෝකයේ බොහෝ රටවල නීතිඥ වෘත්තිය සැහෙන තරගකාරී, ඒ වාගේම පිළිගත් වෘත්තියක් බවට පත් වෙලා තිබෙන තත්ත්වය තුළ මේ වෘත්තියට පිවිසීමට විශාල තරගයක් ඇති වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ලංකාව ගත්තොත්, නීතිඥවරුන් බඳවා ගැනීම ශ්‍රේෂ්ඨාධිකරණයේ කටයුත්තක්. ඒ වාගේම එම අධ්‍යාපනය ලබා දීමේ සහ ඒ සුදුසුකම් සැපිරීම පිළිබඳ සම්පූර්ණ වගකීම තිබෙන්නේ සංස්ථාගත නීති අධ්‍යාපන සභාවට, to the Incorporated Council for Legal Education. එහි ප්‍රධානියා අග්‍ර විනිශ්චයකාරතුමා. එතකොට මේ ආයතනයට තමයි රටට ප්‍රමිතිගත නීතිඥවරුන් බිහි කිරීම සම්බන්ධ වගකීම පැවරෙන්නේ. එහිදී වරින් වර මේ වෘත්තියට පිවිසෙන තැනැත්තන්ගේ සුදුසුකම් සම්බන්ධයෙන් තීරණය කරනු ලබනවා. මේ මොහොත වන විට අපි දන්නවා, ලංකාවේ නීති විද්‍යාලය තමයි එම වෘත්තියට පිවිසීම සඳහා වන වෘත්තීය පාඨමාලාවට අදාළ කටයුතු කරන්නේ කියන එක. නීති විද්‍යාලයට ප්‍රවේශ වීම සඳහා සැහෙන තරගකාරී විභාගයක් තිබෙන්නේ.

පසුගිය වසරේ 201දෙනෙක් මේ තරග විභාගයෙන් නීති විද්‍යාල ප්‍රවේශය ලබා තිබෙනවා. ඊට අමතරව, මේ වෘත්තියට ප්‍රවේශ වීමේ ක්‍රම කිහිපයක් මේ වනකොට ලංකාවේ තිබෙනවා. එකක් තමයි, නීති විද්‍යාල ප්‍රවේශය මඟින් නීති විද්‍යාලයට ඇතුළත් වෙලා වසර 3ක් අධ්‍යාපනය ලබා නීතිඥවරයෙකු බවට පත්වීම. අනෙක් ක්‍රමය තමයි, ශ්‍රී ලංකාවේ රජයේ විශ්වවිද්‍යාල වන කොළඹ විශ්වවිද්‍යාලයේ, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සහ යාපනය විශ්වවිද්‍යාලයේ Law Facultiesවලින් නීති උපාධිය pass කරලා, නීති විද්‍යාලයේ අවසාන විභාගය කරලා නීතිඥ වෘත්තියට ප්‍රවිෂ්ට වීම.

නීති විද්‍යාලය පිළිගත්, Incorporated Council for Legal Education පිළිගත් පෞද්ගලික විශ්වවිද්‍යාලයකින් LLB උපාධිය ලබා ගත් අයට තමයි දැන් මේ ගැටලුව මතු වෙලා තිබෙන්නේ. මෙතෙක් කල් -2023 වනකල්- තිබුණේ මේ තරගකාරිත්වය ඇතුළේ පෞද්ගලික විශ්වවිද්‍යාලයකින් LLB උපාධිය ලබා ගත් අයට නීති විද්‍යාලයට ප්‍රවේශ වීම සඳහා, නීති විද්‍යාලයේ අවසාන විභාගය සඳහා entrance exam එකක් පැවැත්වීම. මේ exam එකට තමයි මේ විෂයන් තුන තිබෙන්නේ. විශේෂයෙන්ම Law of Contract, Commercial Law, Administrative Law කියන විෂයන් තුනට අදාළව ලකුණු 40ක් අරගෙන මූලික සුදුසුකම් සපුරලා, අවසාන වසරේ විභාගයට පෙනී සිටින්න පුළුවන්. මම හිතන විධියට, මනා දැනීමක්, මනා චරිතයක් සහ හැකියාවක් තිබෙන අය තමයි මේ වෘත්තියට තෝරා ගන්නේ. සංස්ථාගත නීති අධ්‍යාපන සභාව තමයි වරින් වර මේ තීරණ ගන්නේ. ඒ අනුව අපි හිතනවා, මේ සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සපුරන්න ඕනෑය කියලා. ඒ නිසා විශේෂයෙන්ම මේ කාරණය තර්කයක් හැටියට ගත්තොත් එච්චර සාර්ථක වෙන්නේ නැහැ. Law of Contract සඳහා විතරක් ලකුණු 30ක්, 35ක් ගත් අය බඳවා ගත්තොත් එය සාර්ථක නැහැ. අනෙක් විෂයයන් දෙකටත් ලකුණු 30-39 අතර ගත් ළමයි ඉන්න පුළුවන්. මේ ආකාරයට ගත්තොත් අපට ප්‍රමිතියකට මේ කටයුත්ත කරන්න පුළුවන්කම ලැබෙන්නේ නැහැ. අපි විශ්වාස කරනවා, මේකේ සම්පූර්ණ වගකීම තිබෙන්නේ සංස්ථාගත නීති අධ්‍යාපන සභාවට සහ නීති විද්‍යාලයට කියලා.

අපි අහලා තිබෙනවා, විශේෂයෙන්ම මීට පෙර පැවති රජයන්වල ඇමතිවරු තමන්ගේ දරුවන් දමා ගන්න මේවාට බලපෑම් කරලා කටයුතු කරපු තත්ත්වයක් තිබුණු බව. හැබැයි ආණ්ඩුවක් විධියට අපි විශ්වාස කරනවා, අපි බලාපොරොත්තු වන අධ්‍යාපන පරිවර්තනයට අනුව මේ වෘත්තීන්ට ප්‍රවිෂ්ට වීමේදී ප්‍රමිතිගත අධ්‍යාපනයක් ලබා දිය යුතුයි කියලා. ඒ සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම තිබෙන්නේ නීති විද්‍යාලයට සහ සංස්ථාගත නීති අධ්‍යාපන සභාවටයි කියන එක මේ වෙලාවේ මම මතක් කරන්න කැමැතියි.

බොහොම ස්තුතියි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
**(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)**
(The Hon. Chamara Sampath Dasanayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
**(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)**
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
**(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)**
(The Hon. Chamara Sampath Dasanayake)
අපේ නීතිඥතුමා කිව්වා, මීට කලින් දේශපාලනඥයන්ගේ දරුවන් නීති විභාගයට ලියපු කථාවක්. මගේ දරුවෝ දෙන්නා යන්නේ බදුල්ල මහා විද්‍යාලයට. නැත්නම් මේක ගැන වැරදි අවබෝධයක් යයි. මගේ වැඩිමහල් දරුවා තවම ඕලෙවල් කරනවා. පොඩි දරුවා ඉන්නේ 9 වසරේ. ඔබතුමා කියපු විධියට චාමර සම්පත් සභාව කල් තබන අවස්ථාවේ මේ යෝජනාව ගෙනාවේ වැරදි අදහසකින් කියලායි රටේ මිනිස්සුන්ට පණිවුඩය යන්නේ. ඔබතුමා කියපු විධියට එහෙම නේ වෙන්නේ. මේක මේ අහිංසක දරුවන් වෙනුවෙන් ගෙනා යෝජනාවක්. මේ, ඒ ළමයි කියපු දේවල්. නීතිඥවරුන් දෙදෙනෙක් මේ දෙපැත්තෙන් ඉන්නේ. මම නීතිඥයෙක් නොවෙයි. තර්කය තේරුම් අරගෙන නැහැ නේ, නීතිඥවරුන් දෙදෙනෙක් කථා කළාට.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
පොඩ්ඩක් ඉන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ඒ ළමයින්ගේ ඉල්ලීම තිබෙන්නේ එම විභාග ප්‍රතිඵල නැවත සමීක්ෂණය කරන්න සහ නීති විද්‍යාලය විභාගය පැවැත්වූ විධියයි, විභාග දෙපාර්තමේන්තුව විභාගය පැවැත්වූ විධියයි අතර පවතින පරස්පර විරෝධීභාවය ගැන. බඳවා ගැනීමේ ප්‍රශ්නයක් නැහැ. බඳවා ගන්නේ අග්‍ර විනිශ්චයකාරවරයායි, ඒ මණ්ඩලයයි. ඒක හරි. ඒක අපි පිළිගන්නවා. බඳවා ගන්න එක ගැන නොවෙයි ළමයි කියලා තිබෙන්නේ. ළමයි කියලා තිබෙන්නේ බඳවා ගන්න එක නොවෙයි, විභාගවල පරස්පරතාවක් තිබෙනවා කියන එකයි. ඒක තමයි මේ යෝජනාවේ තිබෙන්නේ. ඒක පොඩ්ඩක් පිළිගන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

[5.39 p.m.]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Hon. Deputy Chairperson of Committees, this is a quite interesting Debate. I must first point out the key features of this Special Law Entrance Examination. This Examination is actually designed to ensure that only the suitable, qualified graduates of local institutions or foreign universities not recognized by the UGC are admitted to the Sri Lanka Law College.

ඇත්තවශයෙන්ම මේ ඉදිරිපත් වෙලා තිබෙන ප්‍රශ්නය දෙස අපි පොඩ්ඩක් සාධාරණව සහ මධ්‍යස්ථව බැලුවොත් ඇත්තටම මේකේ දෙපැත්තේම පොඩි වැරදි තිබෙනවා. 2023.05.15 දිනැති අංක 2332/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ Rule 12(c)හි මෙසේ සඳහන් වනවා:

> "in order to be selected for admission to the Sri Lanka Law College a candidate shall satisfy the cutoff mark and be selected in order of merit, based on the marks obtained at the said Special Entrance Examination and the existing number of vacancies as determined by the Council from time to time:"

ඒ නිසා අපිට පිළිගන්න වෙනවා, සභාවක් තිබෙනවා කියන එක. ඒ කියන්නේ, නීති අධ්‍යාපනය පිළිබඳ සංස්ථාපිත සභාවක් තිබෙනවා. ඒ Incorporated Council for Legal Education තමයි යම්කිසි අවුරුද්දක සිසුන් ඇතුළත් කර ගැනීමේදී තිබිය යුතු අවම කඩඉම් ලකුණ තීරණය කරන්නේ, ඒ කඩඉම් ලකුණ සහ තිබෙන vacancies සන්සන්දනාත්මකව බලලා. ඒ අතරේම ඒ සභාවටත් යම්කිසි වගකීමක් තිබෙනවා, to maintain the quality.

මෙතැන දැන් විශේෂ ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. නමුත් සභාවක් හැටියට අපට යම්කිසි මතයක් ප්‍රකාශ කරන්න පුළුවන්. ඇත්ත, ඒක හරි. අපේ චාමර සම්පත් මන්ත්‍රීතුමා කියන විධියට අපට අයිතිය තිබෙනවා, ජනතාව වෙනුවෙන් මතයක් ඉදිරිපත් කරන්න. නමුත්, Incorporated Council for Legal Education headed by the Chief Justice තමයි අන්තිමට ඒක තීරණය කරන්නේ. මේ වාගේ ප්‍රශ්න මීට ඉස්සෙල්ලාත් වෙලා තිබෙනවා. මම ඒ සිසුන්ට යම්කිසි පණිවුඩයක් දෙන්න කැමැතියි. Incorporated Council for Legal Education කියන්නේ අග්‍රවිනිශ්චයකාරතුමා විතරක් නොවෙයි. ඒකේ ඉන්නවා, Bar Association of Sri Lankaහි President. තව Principal, Sri Lanka Law College ඉන්නවා. ඊට අමතරව තවත් සාමාජිකයෝ කිහිපදෙනෙකුම ඉන්නවා. ඒ සිසුන්ට පුළුවන් මේ කාරණාව පිළිබඳව ඒ අයට විශේෂ ඉල්ලීමක් කරන්න.

මටත් ආරංචි වුණා, ගිවිසුම් නීතිය පිළිබඳ වූ ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නයක් තිබුණා කියලා. නමුත් ඒ ගැන අපට අහන්න බැහැ. හැබැයි, Incorporated Council for Legal Education එකට පුළුවන්, ඒ පිළිබඳ වාර්තාවක් විභාග දෙපාර්තමේන්තුවෙන් කැඳවලා, එහෙම විෂමතාවක් තිබෙනවා නම් කඩඉම් ලකුණ - cutoff point - අඩු කරලා යම්කිසි සහනයක් ලබා දෙන්න. ඒගොල්ලන්ටත් ඒ සම්බන්ධයෙන් අයිතියක් තිබෙනවා. ඒ කාරණාව අපි පිළිගන්න ඕනෑ. ඒ සම්පූර්ණ අයිතිය තිබෙන්නේ Incorporated Council for Legal Education එකට. ඒගොල්ලන්ට පුළුවන් යම්කිසි නීත්‍යනුකූල පෙත්සමක් ආවාම විභාග දෙපාර්තමේන්තුවෙන් ඒ ගැන විමසන්න. මේ දරුවන්ට මම කියා සිටින්නේ, ඔබ සියලුදෙනාම එකතු වෙලා පෙත්සමක් ඉදිරිපත් කරන්න කියලායි. ඊට පසුව ඒගොල්ලන් විභාග දෙපාර්තමේන්තුවෙන් ඉල්ලයි, මේ වාගේ ප්‍රශ්නයක් ගිවිසුම් නීතිය පිළිබඳ වූ ප්‍රශ්න පත්‍රයේ තිබුණාද කියලා. මොකද, it is a matter within their purview; අපි දන්නේ නැහැ. එහෙම තිබුණා නම් ඒ Council එකට පුළුවන්, යම්කිසි විශේෂ කඩඉම් ලකුණක් තීරණය කරන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මට තව පොඩි වෙලාවක් ඕනෑ, විශේෂ කාරණයක් කියන්න. So, give me half a minute.

I am just trying to say something very important. 10 வருடங்களுக்கு முன்னர், எங்களுடைய தலைவர் கௌரவ ரஊப் ஹகீம் அவர்கள் நீதி அமைச்சராக இருந்தபோது, இலங்கை சட்டக் கல்லூரியின் Entrance Examination results தொடர்பில் பிரச்சினை ஒன்று ஏற்பட்டபோது, அதை அவர் செய்ததாக மக்களுக்குக் காட்டினார்கள். இலங்கை சட்டக் கல்லூரிக்கு studentsஐ உள்வாங்கும் விடயத்தில் அமைச்சருக்கும் பாராளுமன்றத்துக்கும் எந்தச் சம்பந்தமும் இல்லை என்பது இன்று மீண்டும் நிரூபிக்கப்படுகின்றது. இது Incorporated Council for Legal Educationஉம் Examination Departmentஉம் செய்கின்ற வேலையாகும். இந்த விடயம் தொடர்பில் student யாருக்காவது பிரச்சினை இருந்தால், அது சம்பந்தமாக Incorporated Council for Legal Educationக்கு petition ஒன்றைக் கொடுங்கள்! அவர்களுக்கு Examination Departmentஇடமிருந்து இது சம்பந்தமாக special report ஒன்றைப் பெற்று, cut-off pointஐக் குறைக்க முடியுமெனக் கூறி, எனது உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
පිළිතුරු කථාව, ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

[අ.භා. 5.44]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**

(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)

(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ දරුවන්ගේ ප්‍රශ්නය පාර්ලිමේන්තුවට ගෙන ඒම ගැන චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම මෙවැනි ප්‍රශ්නයක් ආණ්ඩු පක්ෂයේ වේවා, විපක්ෂයේ වේවා මන්ත්‍රීවරයෙකු හමුවේ තැබුවාම, ඒක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා සහනයක් ගන්න උත්සාහ කරන එක තමයි මහජන නියෝජිතයෙකුගේ වගකීම. නමුත්, දැන් මෙතැන තිබෙන ගැටලුව මේකයි. Council of Legal Education එහෙම නැත්නම් Sri Lanka Medical Council වාගේ ආයතනවල කාර්යභාරය තමයි, වෘත්තියේ ගුණාත්මකභාවය සහ වෘත්තීයමයභාවය ආරක්ෂා කිරීම වෙනුවෙන් නිර්ණායක සකස් කරන එක. ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා හරියටම ඒ ගැන කිව්වා. ඒ ආයතන ඒ වෙනුවෙන් බැඳී සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ නිසා අධිකරණ අමාත්‍යාංශය වේවා, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වේවා ඒකට ඇඟිලි ගහන්න ගියොත්, ඒ වෘත්තියේ ගුණාත්මකභාවය රැක ගැනීමේ ප්‍රශ්න මතු වෙනවා. මම ඒ ගැන උදාහරණයක් කියන්නම්. Sri Lanka Medical Council එකේ registration එක ගන්න බැරි විදේශ වෛද්‍ය උපාධිධාරීන් හැට ගණනක් ඉන්නවා. ඒ අයට අවුරුදු 10ක්, 15ක් තිස්සේ සමහර examsවල, සමහර papers පාස් වෙන්න බැරිව අපි ළඟට ඇවිල්ලා කියනවා, registration එක විතරක් දෙන්න, රජයේ සේවයට ඇතුළත් වෙන්න ඕනෑත් නැහැ, කොහේ හරි practise කරන්නම් කියලා. මේකත් එවැනි ප්‍රශ්නයක්. නමුත්, එහෙමයි කියලා අපට නීති අධ්‍යයන සභාවට බලපෑම් කරන්න බැහැ. විශේෂයෙන්ම අමාත්‍යාංශය විසින් එහෙම කරන්න වුවමනාවකුත් නැහැ, කළ යුතුත් නැහැ කියායි මම හිතන්නේ.

මෙතැන කරුණු කිහිපයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. එකක් තමයි, 2023 මැයි 15 දිනැති අංක 2332/02 දරන අති විශේෂ ගැසට් පත්‍රය. ඒ ගැසට් පත්‍රයෙන් තමයි මේ special entrance එක එන්නේ. ඒක අත්සන් කරන්නේත් ඇත්තටම අධිකරණ ඇමතිතුමා හෝ උසස් අධ්‍යාපන ඇමතිතුමා නොවෙයි. Incorporated Council of Legal Education වෙනුවෙන් තමයි අත්සන් කරන්නේ. මේ Exam එක 2024 අවුරුද්දේ තිබුණාම, ඒ සඳහා 47දෙනෙක් පෙනී ඉඳලා තිබෙනවා. හැබැයි, එක්කෙනෙක්වත් සමත් වුණේ නැහැ. 2025දී 225ක් පෙනී ඉඳලා 140ක් සමත් වෙනවා. *[බාධා කිරීමක්]* 225දෙනෙක් Exam එකට පෙනී ඉඳලා ඒකෙන් 140දෙනෙක් සමත් වෙනවා. ඒ කියන්නේ, දරුවන් සියයට 63ක් මේ පරිපාලන නීතිය, ගිවිසුම් නීතිය සහ වාණිජ නීතිය කියන විෂයන් තුනෙන් එක් එක් විෂයට සියයට 40ට වඩා වැඩි ලකුණු ප්‍රමාණයක් අරගෙන සමත් වෙනවා. ඒ අනුව මේ විභාගයේ ප්‍රශ්නයක් තිබෙනවාය කියලා තර්ක කරන එක එතරම් සාධාරණ නැහැ. මොකද, තුනෙන් දෙකකට ආසන්න ප්‍රමාණයක් සියයට 40ට වඩා ලකුණු අරගෙන තිබෙන නිසා. මේ හැම විෂයකටම සියයට 40ට වඩා ලකුණු ගන්න ඕනෑ. 201දෙනෙක් බඳවා ගන්න පුළුවන් කියන්නේ, සාමාන්‍ය ප්‍රවේශයෙන් ගන්න පුළුවන් ප්‍රමාණය නොඉක්මවා තමයි ශිෂ්‍ය ප්‍රවේශය ගන්න පුළුවන්කම ලැබෙන්නේ. සාමාන්‍යයෙන් ගත්තොත්, මෙවැනි වෘත්තීයමය සභාවක එහෙම නැත්නම් Council of Legal Education වාගේ එකකදී අදහස් වෙන්නේ නැහැ, ඒ තිබෙන සියලු ප්‍රමාණය බඳවා ගන්නවා කියලා, ඒ වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කරන්නේ නැතුව. එහෙම කරන්න ගියොත් මම හිතනවා, ඒ ගුණාත්මකභාවය පවත්වා ගෙන යන්න බැහැ කියලා.

දරුවන් 20දෙනෙකුගේ ප්‍රශ්නයක් තිබෙනවා, ගිවිසුම් නීතිය පිළිබඳව වූ ප්‍රශ්න පත්‍රය සම්බන්ධයෙන්. මම හිතන විධියට, මේකට තිබෙන සාධාරණ විසඳුම තමයි නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමාත් යෝජනා කළේ. අපටත් යෝජනා කරන්න තිබෙන්නේ, මේ දරුවන්ට යම් අසාධාරණයක් වුණා නම් ඒ පිළිබඳව අගවිනිසුරුතුමා ප්‍රමුඛ නීති අධ්‍යයන සභාව විසින් සලකා බලන්න කියන එකයි. එහෙම නැතුව අධිකරණ අමාත්‍යාංශය හෝ විභාග දෙපාර්තමේන්තුව අයත් වන උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මේකට directives දෙන්න ගියොත් ගරු මන්ත්‍රීතුමනි, ඒකෙන් අනාගතයට වැරදි පූර්වාදර්ශයක් ලැබෙන්නත් ඉඩකඩ තිබෙනවා. මේ දරුවන්ට ප්‍රශ්නයක් තිබෙන බව අපට තේරෙනවා. ඒගොල්ලන් විදේශයකට ගිහිල්ලා උපාධියක් හදාරා ඇවිල්ලා එක subject එකකට ලකුණු සියයට 40ක් ගන්න බැරි වීම - ඒගොල්ලන් කියන හැටියට සියයට 35 - 39ක් අරගෙන තිබෙනවා - මත ඒ අයට නීතිඥයෙක් වීමට තිබෙන අවස්ථාව අහිමි වෙනවා කියන එක සලකා බලා තීන්දුවක් ගැනීමේ අයිතිය සහ පූර්ණ නිදහස නීති අධ්‍යයන සභාවට ලබා දීම තමයි කළ යුතු වන්නේ. මම හිතනවා, අග්‍ර විනිශ්චයකාරතුමා ප්‍රමුඛ ඒ සියලුදෙනාම නීතිඥ වෘත්තියේ ගරුත්වයත්, මේ දරුවන්ගේ තත්ත්වයත් සැලකිල්ලට අරගෙන ඒකට සාධාරණ විසඳුමක් ලබා දෙන්න කටයුතු කරයි කියලා.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**

(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)

(The Hon. M. Nizam Kariapper, PC)

ශක්‍යතාව, ගණන, Examinations Department එක -

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**

(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)

(The Hon. (Dr.) Nalinda Jayatissa)

ඔව්. ගිය අවුරුද්දේ ඒ විභාගයට පෙනී හිටපු දරුවන් කිසිවෙකු සමත් නොවීමත් සැලකිල්ලට ගන්න ඕනෑ. හැබැයි, දැන් මේ වතාවේත් එහෙම වුණා නම්, 225දෙනෙකු පෙනී ඉඳලා 10දෙනෙකු සමත් වුණා නම්, අපට කිසි ප්‍රශ්නයක් නැතුව කියන්න පුළුවන්, මෙතැන ප්‍රශ්නයක් තිබෙනවාය කියලා. නමුත් 140දෙනෙකු සමත් වෙලා තිබෙනවා කියන්නේ, සියයට 63ක් සමත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ වෙලාවේදී මට අමාත්‍යාංශය පැත්තෙන් කියන්න තිබෙන්නේ මේකයි, ගරු මන්ත්‍රීතුමනි. මේ කරුණ අපිත් නීති අධ්‍යයන සභාවට යොමු කරන්නම්. එතැනට අපි අවස්ථාව ලබා දෙමු, මේ සම්බන්ධයෙන් තීන්දුවක් ගන්න.

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.49ට, 2025 සැප්තැම්බර් 24වන බදාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால், மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.49க்கு , பாராளுமன்றம் 2025 செப்ரெம்பர் 24, புதன்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.49 p.m. until 9.30 a.m. on Wednesday, 24th September, 2025.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.